**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් නියෝග සහ නියමය සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 4(2)වගන්තිය සමඟ කියවිය යුතු 27 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023 ජනවාරි 14 දිනැති අංක 2314/80 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 29අ(2) වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023 අප්‍රේල් 21 දිනැති අංක 2328/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ ඇමතිතුමාගෙන් කාරණා කීපයක් දැනගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මම මේ කාරණාව අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් ඉදිරිපත් කළා, මේ ගරු සභාවේදීත් ඉදිරිපත් කළා. නීති විද්‍යාල ප්‍රවේශ ගාස්තු සියයට 257කින් වැඩි වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, රුපියල් 67,500ක මුදල ගෙවා ගන්න බැරි නිසා ඒක රුපියල් 40,000ක් සහ රුපියල් 27,500ක් වශයෙන් කොටස් දෙකකට සිසුන්ට ගෙවන්න දුන් බව. හැබැයි, දැන් ඒකත් ගෙවා ගන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඒ වාගේම විභාග ගාස්තුවත් රුපියල් 2,500කින් වැඩි කරලා තිබෙනවා. ඇත්තවශයෙන්ම නීති විද්‍යාලයේ වැඩකටයුතු ක්‍රියාත්මක වෙන්නේ සිසුන්ගෙන් අය කරන මුදල්වලින් කියන එක අපි දන්නවා. නමුත්, මේ කාරණාව ගැන සානුකම්පිතව සිතා බලා ගාස්තු වැඩි කිරීමේ ප්‍රතිශතයේ අඩු කිරීමක් හෝ කරන්නට කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

දෙවැනි කාරණාව මෙයයි. ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා දන්නවා මුලතිව් මහේස්ත්‍රාත් හා දිසා විනිසුරුතුමාගේ ඉල්ලා අස්වීම බොහොම බරපතළ කාරණාවක් බව. එය අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් බරපතළ කාරණාවක්. එතුමා කියා සිටිනවා, එතුමාට මරණ තර්ජන, විවිධ බලපෑම් තිබෙනවා කියලා. ඒ වාගේම, එතුමාගේ නියෝග පිළිබඳවත් කරුණු කාරණා ඇතුළත් බරපතළ ප්‍රකාශයක් එතුමා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, කෙටියෙන් කාරණය කියලා අවසන් කරන්න. වාචික ප්‍රශ්නවලට තිබෙන වේලාව තමයි අඩු වෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අධිකරණ ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ පිළිබඳව ස්වාධීන පරීක්ෂණයක් කරලා, ඒ පිටුපස තිබෙන සත්‍යය මේ ගරු සභාවට හෙළිදරව් කරන්න කියලා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ ගාස්තු පිළිබඳව මීට කලිනුත් මම පැහැදිලි කළා. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් ඒ පිළිබඳව කරුණු සාකච්ඡා කළා. නීති විද්‍යාලය 10,000කට ආසන්න ශිෂ්‍ය සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබා දෙනවා, විභාග පවත්වනවා. නමුත්, රජයෙන් හෝ කිසිම ආයතනයකින්, කිසිම මුදලක් ඒ විද්‍යාලයට ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ විද්‍යාලයට මුදල් උපයා ගැනීම සිද්ධ කරන්න වෙනවා. ඒ අනුව, කොළඹ පවතින අනෙකුත් අධ්‍යාපන ආයතනවල අය කරනු ලබන ගාස්තු එක්ක සංසන්දනය කළොත්, ඒ ගාස්තුවලින් සියයට 20ක 25ක ප්‍රමාණයක් තමයි මේ ආයතනය දැනට නියම කර ගෙන තිබෙන්නේ. ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරමින් පවතිනවා. එම ගාස්තු ගෙවා ගැනීමට අපහසු දරුවන්ට කවුන්සලය මඟින් යම් කිසි සහනයක් ලබාදීමටත් ඔවුන් කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා දෙවනුව ඉදිරිපත් කළා, මුලතිව් මහේස්ත්‍රාත් හා දිසා විනිසුරුතුමා සම්බන්ධ කාරණය. එතුමා රටින් ගියාට පස්සේ තමයි අධිකරණ සේවා කොමිෂන් සභාවට ලිපියක් ලැබෙන්නේ, එතුමාගේ මානසික ආතතිය හා එතුමාට තිබෙන බලපෑම් නිසා ඉල්ලා අස් වෙනවා කියලා. හැබැයි, එහෙම මානසික ආතතියක්, එහෙම බලපෑමක් තිබුණා නම් එතුමා විදේශ රටකට ගිහිල්ලා මෙහෙට ලිපිය ලැබෙන්න සලස්වන්න වුවමනාවක් නැහැ. අනෙක් එක තමයි, විනිසුරුවරයෙකුට බලපෑමක් තිබෙනවා නම්, ඒ බලපෑම කරන්නේ ආණ්ඩුවෙන්ද, මන්ත්‍රීවරයෙක්ද, සාමාන්‍ය පුරවැසියෙක්ද කියන එක අදාළ නැහැ. ඒ විනිසුරුවරයාට සම්පූර්ණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දීලා තිබෙනවා.

ඒ අනුව, ඒ බලපෑම් කළ පුද්ගලයාට සිතාසි නිකුත් කරලා ගෙන්වා ගන්න පුළුවන්, වරෙන්තුවක් නිකුත් කරන්න පුළුවන්, නඩුවක් විභාග කරලා දඬුවම් දෙන්න පුළුවන්. එහෙම නැත්නම් අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන්න පුළුවන්. ඒ සියලු බලතල තිබෙන්නේ විනිසුරුවරයාටමයි. ඒ බලය ඔහු පාවිච්චි නොකළා නම් එහි වගකීම ඔහු භාර ගත යුතුයි.

දෙවැනි කාරණය, මේ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් ආණ්ඩුවේ ගිණුමට බැර කරන්න සූදානම් වෙන්න එපා. හේතුව, මහේස්ත්‍රාත්වරු, දිසා අධිකරණ විනිසුරුවරු පත් කිරීම් කරන්නේ, පාලනය කරන්නේ සහ ඒ කටයුතුවල සම්පූර්ණ විනය බලධරයා වන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව. අධිකරණ සේවා කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ස්ථාපිත කළ ස්වාධීන කොමිෂන් සභාවක්. එහි ස්වාධීනතාව ආරක්ෂා කරන්න අපි පසුගිය කාලයේ දිගින් දිගටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ප්‍රතිපාදන ඇතුළත් කළා. ඒ නිසා ඒ විනිසුරුවරයා පිළිබඳ පරීක්ෂණ පවත්වන්න ආණ්ඩුවටවත්, ජනාධිපතිවරයාටවත් බලයක් නැහැ. ඒ බලය තිබෙන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවට පමණයි. යම්කිසි කෙනෙකුට ඒ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා නම් කරුණාකරලා අධිකරණ සේවා කොමිෂන් සභාවට යොමු කරන්න. ඒ සම්බන්ධව නියෝග දෙන්න අපට බලයක් නැහැ, ඒකට කරුණු ඉදිරිපත් කිරීමට අපට හැකියාවක් නැහැ. ඒ සියලු බලතල සහිත, ගරු අගවිනිසුරුවරයාගේ සභාපතිත්වයෙන් යුතු අධිකරණ සේවා කොමිෂන් සභාවට යොමු කරලා, එහෙන් උත්තරයක් ලබා ගන්න මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ඒ කොමිෂන් සභාව අවශ්‍ය නම් පරීක්ෂණ කරලා තමුන්නාන්සේලාට උත්තර ලබා දෙයි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon.  Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

විජයදාස රාජපක්ෂ ඇමතිතුමා දැන් ප්‍රකාශ කළේ ජේන්න තිබෙන දේ. නමුත් තිරය පිටුපස ඇත්ත වශයෙන්ම සිදු වුණේ, එතුමා දුන්නු තීන්දුව වෙනස් කරන්න කියලා බලපෑම් ආපු එක. ඒක තමයි ඇත්ත. ඊයේ ආණ්ඩුවේ පුවත් පත්වලත් ඒක පළ වුණා. ඔබතුමා බලන්න, ආණ්ඩුවේ පුවත් පත්වල තිබෙනවා, එතුමා දුන්න  තීන්දුව වෙනස් කරන්න කියලා එතුමාට බලපෑම් ආවා කියලා. ආතතිය කිව්වේ ඒකයි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, කෙටියෙන් උත්තර දෙන්න. නැත්නම් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා තිබෙන කාලය තමයි අඩු වෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මට විනාඩි භාගයයි අවශ්‍ය වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා කියපු කාරණයට උත්තරයක් දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කියනවා, ඒ විනිසුරුතුමා දීපු නියෝග වෙනස් කරන්න කියලා බලපෑමක් ආවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් බලපෑම කරපු මනුස්සයා කවුද කියාත් දැනගන්න ඕනෑ නේ. එහෙම නම්, උසාවියට අපහාස කළා කියලා ඔහුට විරුද්ධව නඩුවක් දමන්නකෝ. ඒක නොකර තමුන්නාන්සේලා ඒ චෝදනාව ආණ්ඩුව පැත්තට දමන්නේ ඇයි? අපි අධිකරණය පාලනය කරනවාද? අපි නීති හදලා දෙනවා; පහසුකම් දෙනවා. අධිකරණය පාලනය කිරීම අපට අයිති එකක් නොවෙයි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා කිහිපදෙනෙකු නැඟී සිට අවස්ථාව ඉල්ලනවා. මම ඔබතුමන්ලා සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා තිබෙන වේලාවෙන් පසුව මේ ගැන ගරු ඇමතිතුමාගෙන් විමසන්න කියලා. ඒ සඳහා අවස්ථාව දෙන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහන්නේ වෙනත් කාරණයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ඔබතුමා කියන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ඡන්දයෙන් පත් වුණු මන්ත්‍රීවරයෙකුට තිබෙන මූලික අයිතිවාසිකමක් තමයි ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න කිරීම. දැන් රජය සමාජ මාධ්‍ය මර්දනය කරන අතරවාරයේ අද ඉඳලා පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අහන්න තිබෙන කාලය පැයකට සීමා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න අහන්න තිබෙන අයිතිය නැති කරන්න එපා. ඇමතිවරු පැය ගණනක් දිගින් දිගට උත්තර දෙන එක පාලනය කරලා මූලාසනයෙන් කාලය කළමනාකරණය කළා නම් මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ කළමනාකරණය කිරීම තමයි මේ කරන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ප්‍රශ්න සඳහා පැයක් පමණක් වෙන් කරනවාය කියන තීරණයට ඔබතුමා අවසර දෙන්න එපා. මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ තීරණය මම ගත්ත එකක් නොවෙයි. ඒක පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉඳලාම තිබුණු දෙයක්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
නැහැ, නැහැ, ඇමතිවරු දීර්ඝ පිළිතුරු දෙන එක මූලාසනයෙන් පාලනය කරන්න. එතකොට ඔක්කෝම හරියනවා නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් පොඩි වෙලාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපරාදේ කාලය නාස්ති කරන්න එපා. අපි වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙලාවෙන් පසුව ඔය ගැන කථා කරමු.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Deputy Speaker -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Deputy Speaker, give me a moment.

Hon. Minister of Justice, you cannot take the position that there has been no pressure on him. In this House, even you yourself had made a statement on that. Lawyers have demonstrated, walked out and for more than a month, this has been going on. So, you cannot say that if there was pressure, he could have taken steps. We all know and the whole world knows that there was pressure. Even in this House, you also made a statement about that.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ අධිකරණයට විශාලම තර්ජනයක්, බලපෑමක් කරපු මේ පාර්ලිමේන්තුවේ ඉන්න එකම මන්ත්‍රීවරයා තමයි ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තමයි 2022 ඔක්තෝබර් 20වැනි දා මේ පාර්ලිමේන්තුවට කිව්වේ, අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය ගැන කිසි විශ්වාසයක් නැහැ කියලා. ඔබතුමා කිව්වේ නැද්ද, ශ්‍රේෂ්ඨාධිකරණය ගෙදර යවන්න කියලා? කිව්වාද, නැද්ද? මේ රටේ අධිකරණයේ ස්වාධීනතාවට වැඩියෙන්ම බාධාවක් කළ මන්ත්‍රීතුමා අද අධිකරණයේ ස්වාධීනතාව ගැන අඬනවා. නවාස් විනිසුරුතුමා ගරු පිල්ලෙයාන් රාජ්‍ය ඇමතිතුමාගේ නඩුව සම්බන්ධව නියෝගයක් දුන්නා කියලා ඔබතුමා කිව්වේ නැද්ද? Confession statement එක වලංගු නැහැ කියලා ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ කිව්වාද, නැද්ද? නවාස් විනිසුරුතුමා එහෙම තීන්දුවක් දීලා නැති බව දැන දැන නේ ඔබතුමා කිව්වේ. ඉතින්, ඔබතුමා නේ අධිකරණය හෑල්ලුවට ලක් කරන්නේ. ඔබතුමා නේ ශ්‍රේෂ්ඨාධිකරණය ගෙදර යවන්න ඕනෑ කියලා වැඩිම බලපෑම කරපු පුද්ගලයා, ලංකාවේ ඉන්න. වෙන මිනිහෙක් ඔය කථාව කිව්වා නම් අද අවුරුදු දෙකක් හිරේ නේද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Deputy Speaker, - *[Interruption]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා, විනාඩියෙන් අවසන් කරන්න.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Okay. Sir, he mentioned my name. The question that I asked him was about something else and he goes and says something totally different. Hon. Minister, are you not able to answer that question? "යන්නෙ කොහෙද, මල්ලෙ පොල්" වාගේ උත්තර නේ දෙන්නේ. That is what it is. I never mentioned any judge's name.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමා රීති ප්‍රශ්නයක්ද අහන්නේ?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ගන්නා තීන්දුව පිළිබඳව අපි සතුටු වෙනවා. ඒක හොඳයි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ නීතියක් නොවුණත් සම්ප්‍රදායක් තිබුණා, සතියක් තුළ රට තුළ තිබෙන ප්‍රශ්න ගැන ආණ්ඩුවෙන් අහන්න විපක්ෂයට ඉඩ ලබා දෙන.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හරි. ඒකට අවස්ථාව තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. නමුත්, මේ මොහොතේම අවශ්‍ය නැහැ නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මට විනාඩියක් දෙන්න. මම ඔබතුමාට ගෞරවයක් දෙන්න මේ හදන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ඒ ප්‍රශ්නය අහන්න තිබෙනවා. ඊළඟට, අධිකරණ ඇමතිතුමා දැන් කියපු කාරණය ගැනත් කියන්න ඕනෑ. ආණ්ඩුවේ මන්ත්‍රීවරු විනිශ්චයකාරවරුන් පාර්ලිමේන්තුවට ගෙන්වලා ප්‍රශ්න කළා. එවැනි තත්ත්වයක් තුළ කොහොමද,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තර්ජන පිළිබඳව කථා කරද්දී මටත් කියන්න කාරණයක් තිබෙනවා.

"The Sunday Times" පුවත් පතේ පළ වී තිබෙනවා, මුදල් ලේකම්තුමාට ජීවිත තර්ජනයක් තිබෙනවා, ඔහු සහ ඔහුගේ දරුවන් ඇතුළු පවුල පිළිබඳව ගැටලුවක් තිබෙනවා කියලා. ඔහු කියනවා, Defence Secretaryටත්, පොලීසියටත් ඒ බව දැනුම් දුන්නා කියලා. තර්ජන තිබෙන බව වර්තමාන මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත් කියලා තිබෙනවා. ඒ නිසා තිරයට යටින් සිදු වන දේවල් ගැනත් පොඩ්ඩක් සොයා බලන්න කියා මා කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන්න.

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් යෝජනා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මත (235 අධිකාරිය); සහ

(ii) විගණකාධිපතිවරයාට රුපියල් 50,000.00ක විශ්‍රාම වැටුප් හිමිකම සහිත දීමනාව ලබාදීමේ යෝජනාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මුදල් කාරක සභාවේ සාකච්ඡා කරලා මෙතැනට යොමු කර තිබෙනවා කාරණා දෙකක්. ඉන් පළමුවැන්න තමයි, රේගු ආඥාපනත යටතේ වන යෝජනා සම්මත (235 අධිකාරිය). ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැනදී වෙන්නේ මේකයි. ශ්‍රී ලංකාව සිංගප්පූරුව සමඟ නිදහස් වෙළඳ ගිවිසුමක් අත්සන් කළා. නමුත්, ඒක ක්‍රියාත්මක වුණේ නැහැ, අවුරුදු 5ක් තිස්සේ.

ඒ අවුරුදු 5 තුළ ක්‍රියාත්මක විය යුතු රේගු බදු නිදහස් කිරීම් සිදු නොවුණු නිසා, සිංගප්පූරු රජයත් සමඟ සාකච්ඡා කරලා ඊළඟ අවුරුදු හයේදී පසුගිය අවුරුදු 5 තුළ ක්‍රියාත්මක කරන්න බැරි වෙච්ච රේගු බදු නිදහස් කිරීම් කරන්න එකඟ වුණා. ඒ හරහා රේගු HS codes 1,238ක් බදුවලින් නිදහස් වෙනවා. ඒක තමයි මේ පළමුවැනි යෝජනා සම්මතයෙන් සිදු වෙන්නේ.

දෙවැනි එක තමයි, විගණකාධිපතිවරයාට රුපියල් 50,000ක විශ්‍රාම වැටුප් හිමිකම සහිත දීමනාවක් ලබා දීමේ යෝජනාව. මේ හා සම මට්ටමේ ඉන්න අනෙක් නිලධාරීන්ගේ වැටුප් වැඩිවීම් සිදු වන්නේ පාර්ලිමේන්තුව හරහා නොවෙයි, අමාත්‍යාංශ හරහායි. නමුත්, විගණකාධිපතිවරයාගේ වැටුප සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ පාර්ලිමේන්තුව. ඒ නිසා පාර්ලිමේන්තුවට ඒ යෝජනාව ඉදිරිපත් කරනවා. ඒ යෝජනාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සම්මත වුණා. බොහොම ස්තුතියි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කපිල අතුකෝරල මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොරණ, නර්තනගල, 3 වන අදියර, අංක 81 දරන ස්ථානයෙහි පදිංචි නන්දනී සීතා රත්නවීර මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කුමාරසිරි රත්නායක මහතා**
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොනරාගල, කුඹුක්කන, පාරවිලවත්ත යන ලිපිනයෙහි පදිංචි සින්නයියා සුප්පයියා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1 -1463/2023- (1), ගරු චින්තක අමල් මායාදුන්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -1510/2023- (1), ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -1548/2023- (1), ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

### මැණික් අපනයනය සහ ප්‍රතිඅපනයනය: විස්තර
### இரத்தினக்கல் ஏற்றுமதியும் மீள் ஏற்றுமதியும்: விபரம்
### EXPORT AND RE-EXPORT OF GEMS: DETAILS

1583/2023

**4.** **ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)

කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා අපනයනය කර ඇති මැණික් ප්‍රමාණය කැරට්වලින් කොපමණද;

(ii) එම මැණික් අපනයනය කර ඇති අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් කාලය තුළදී මැණික් අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආදායම සම්පූර්ණයෙන් ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවට වෙනත් රටවලින් මැණික් ආනයනය කර ඒවා ප්‍රතිඅපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම මැණික් වර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2019ஆம் ஆண்டு தொடக்கம் இதுவரை ஏற்றுமதி செய்யப்பட்டுள்ள இரத்தினக்கற்களின் அளவு 'கெரட்' களின் அடிப்படையில் யாது என்பதை யும்;

[ගරු සංජීව එදිරිමාන්න මහතා]

(ii) அவற்றை ஏற்றுமதி செய்துள்ள ஏற்றுமதியாளர் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்குறிப்பிட்ட காலப்பகுதியில் இரத்தினக்கல் ஏற்றுமதியினால் ஈட்டப்பெற்ற வருமானம் ஒவ்வோராண்டு வாரியாகத் தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(iv) அந்த வருமானம் நாட்டுக்கு முழுமையாகக் கிடைத்துள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கைக்கு வேறு நாடுகளிலிருந்து இரத்தினக் கற்கள் இறக்குமதி செய்யப்பட்டு, அவை மீள் ஏற்றுமதி செய்யப்படுகின்றனவா என்பதையும்;

(ii) அவ்வாறாயின், அத்தகைய இரத்தினக்கற்களின் வகைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industries:

(a) Will he inform this House -

(i) the quantity of gems exported from the year 2019 to date in carat;

(ii) the number of exporters who had exported aforesaid gems;

(iii) separately, the income generated from gem exports during the aforesaid period according to each year; and

(iv) whether Sri Lanka has received the aforesaid total income?

(b) Will he also inform this House -

(i) whether gems are being re-exported after being imported to Sri Lanka; and

(ii) if so, what the aforesaid types of gems are?

(c) If not, why?

**ගරු චාමර සම්පත් දසනායක මහතා (ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க - ஆரம்பக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Chamara Sampath Dasanayake - State Minister of Primary Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2019 වර්ෂයේ සිට 2023 අගෝස්තු දක්වා අපනයනය කර ඇති මැණික් ප්‍රමාණය (කැරට්)

| වර්ෂය | බර (කැරට්) |
|---|---|
| 2019 | 8,305,840 |
| 2020 | 2,696,897 |
| 2021 | 5,363,971 |
| 2022 | 4,884,725 |
| 2023 අගෝස්තු දක්වා | 2,985,315 |
| එකතුව | 24,236,748 |

(ii) 2019 වර්ෂයේ සිට 2023 අගෝස්තු දක්වා අපනයනය කර ඇති අපනයනකරුවන්ගේ සංඛ්‍යාව

| වර්ෂය | අපනයනකරුවන් සංඛ්‍යාව |
|---|---|
| 2019 | 1,105 |
| 2020 | 1,206 |
| 2021 | 1,435 |
| 2022 | 1,537 |
| 2023 අගෝස්තු දක්වා | 964 |
| එකතුව | 6,247 |

(iii) 2019 වර්ෂයේ සිට 2023 අගෝස්තු දක්වා මැණික් අපනයන ආදායම (ඇමෙරිකානු ඩොලර්)

| වර්ෂය | අපනයන ආදායම (ඇමෙරිකානු ඩොලර්) |
|---|---|
| 2019 | 103,675,253 |
| 2020 | 67,647,105 |
| 2021 | 107,501,818 |
| 2022 | 205,033,250 |
| 2023 අගෝස්තු දක්වා | 135,918,281 |
| **එකතුව** | **619,775,707** |

(iv) ඔව්.

මැණික් අපනයනය මඟින් ලැබිය යුතු විදේශ ප්‍රේෂණ (Remittances) සම්පූර්ණයෙන් ශ්‍රී ලංකාවට ලැබී තිබේද යන්න පිළිබඳව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට වාර්තා නොවේ. එසේ වුවද 2023 වර්ෂයේ සිට රේගු නිෂ්කාසනය අනිවාර්ය කර දින 180 ඉක්මවා ඇති අපනයනකරුවන්ගේ අපනයන ආදායම ඇතුළත් විස්තර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාසිකව යවනු ලැබේ.

(ආ) (i) ඔව්.

ශ්‍රී ලංකාවට වෙනත් මැණික් නිධි ඇති රටවලින් මැණික් ආනයනය කරනු ලැබේ. එම මැණික් නැවත රට තුළ අගය එකතු කිරීමෙන් (කපා ඔප දැමීමෙන් පසුව) ප්‍රතිඅපනයනය කරනු ලැබේ. මැණික් ප්‍රතිඅපනයනයේ දී අගය එකතු කර එම වැඩි කරන ලද අගයට පමණක් සේවා ගාස්තු ගෙවීමට බලාපොරොත්තු වන අපනයනකරුවන් පමණක් අධිකාරිය වෙත පැමිණ ආනයනය කරනු ලබන මැණික් ගල් ඉදිරිපත් කර වාර්තාගත කිරීම සිදු වේ.

(ii) ඔව්.

**Corundum**

Eg:- Blue Sapphire, Pink Sapphire, Yellow Sapphire, White Sapphire, Bi-colour Sapphire, Green Sapphire, Ruby et cetera.

**1. Semi-precious Gems**

Eg:

- Quartz (Rose Quartz, Amethyst, Green Quartz, Smoky Quartz)
- Garnet (Tsavorite, Rhodolite, Green Garnet, Hessonite, Pyrope, Alamandine, Spessartine)
- Tourmaline, Spinel, Moonstone, Zircon, Beryl, Topaz, Jeremejevite, Feldspar, Opal, Amber

**2. Emerald**

**3. Ornamental Gemstones**

- Lapis Lazuli, Rhodochrosite, Chrysocolla, Amazonite, Malachite, Onyx, Agate

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
අතුරු ප්‍රශ්න නැහැ. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 5 - 1621/2023- (1), ගරු තිස්ස අත්තනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන්: වැටුප්, දීමනා සහ රක්ෂණ ආවරණය

## தேசிய நீர் வழங்கல் வடிகாலமைப்புச் சபை ஊழியர்கள்: சம்பளம், கொடுப்பனவு மற்றும் காப்புறுதி

## EMPLOYEES OF NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD: SALARIES, ALLOWANCES AND INSURANCE COVERAGE

1641/2023

**6.** **ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)
ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් සංඛ්‍යාව විධායක නිලධාරීන් හා කනිෂ්ඨ සේවකයන් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විධායක නිලධාරීන් හා කනිෂ්ඨ සේවකයන් සඳහා අනුමත මාසික වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන්ට ගෙවනු ලබන වාර්ෂික රක්ෂණාවරණයේ වටිනාකම කොපමණද;

(ii) වර්ෂ 2019 සිට මේ දක්වා එම රක්ෂණාවරණය ලබා ගැනීම වෙනුවෙන් අදාළ රක්ෂණ ආයතනයට ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல் மற்றும் தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய நீர் வழங்கல் வடிகாலமைப்புச் சபையிலுள்ள ஊழியர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவ்வூழியர்களின் எண்ணிக்கையானது நிறைவேற்றுத் தர உத்தியோகத்தர்கள் மற்றும் கனிஷ்ட ஊழியர்கள் எனும் அடிப்படையில் தனித்தனியே எத்தனையென்பதையும்;

(iii) நிறைவேற்றுத் தர உத்தியோகத்தர்கள் மற்றும் கனிஷ்ட ஊழியர்களுக்காக அங்கீகரிக்கப்பட்டுள்ள மாதாந்த சம்பளம் மற்றும் கொடுப்பனவுகள் தனித்தனியே யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தேசிய நீர் வழங்கல் வடிகாலமைப்புச் சபையின் ஊழியர்களுக்குச் செலுத்தப்படும் வருடாந்த காப்புறுதியின் பெறுமதி யாதென்பதையும்;

(ii) 2019ஆம் ஆண்டு தொடக்கம் இன்று வரை மேற்படி காப்புறுதியைப் பெற்றுக்கொள்வதற்காக குறித்த காப்புறுதி நிறுவனத்திற்குச் செலுத்தப்பட்டுள்ள தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Estate Infrastructure Development:

(a) Will he inform this House -

(i) the number of employees at the National Water Supply and Drainage Board;

(ii) the number of executive officers and junior employees, separately; and

(iii) the approved monthly salaries and allowances for the executive officers and the junior employees, separately?

(b) Will he also inform this House of -

(i) the value of the annual insurance coverage paid to the employees of National Water Supply and Drainage Board; and

(ii) the amount that has been paid to the relevant insurance company from 2019 up to now to obtain that insurance coverage?

(c) If not, why?

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා (ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜீவன் தொண்டமான் - நீர் வழங்கல் மற்றும் பெருந்தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Jeevan Thondaman - Minister of Water Supply and Estate Infrastructure Development)
Hon. Deputy Speaker, the Answer is as follows:

(a) (i) The number of employees of the National Water Supply and Drainage Board is 8,621.

(ii)

| | |
|---|---|
| No. of Executive Officers | - 1,551 |
| No. of junior employees | - 7,070 |
| Total | **- 8,621** |

[ගරු ජීවන් තොණ්ඩමන් මහතා]

(iii)

| Designation | Salary Code | Basic Salary (Rs.) | Allowances | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 5% | 3% | COL Allow. | Prof. Allow. | Eng. Allow. | Other Allow. | |
| | | | | | | | | Tea Allow. | Tele Allow. |
| Addl. General Manager | HM 2-3 | 242,106.00 | 8,421.10 | 5,052.66 | 7,800.00 | 10,000/8,000 | 15,000.00 | 650.00 | 3367.58 |
| Deputy General Manager | HM 2-2 | 229,461.00 | 7,981.25 | 4,788.75 | 7,800.00 | 10,000/8,000 | 15,000.00 | 650.00 | 2993.40 |
| Assistant General Manager | HM 1-3 | 211,328.00 | 7,350.50 | 4,410.30 | 7,800.00 | 10,000/8,000 | 15,000.00 | 650.00 | 2245.05 |
| Manager | HM 1-1 | 192,644.00 | 6,700.65 | 4,020.39 | 7,800.00 | 10,000/8,000 | 15,000.00 | 650.00 | 1496.70 |
| JM | Grade 6 | 129,855.00 | 4,516.70 | 2,710.02 | 7,800.00 | - | - | 650.00 | 748.35 |
| | Grade 7 | 104,704.00 | 3,641.85 | 2,185.11 | 7,800.00 | - | - | 650.00 | 748.35 |
| | Grade 8 | 88,683.00 | 3,084.60 | 1,850.76 | 7,800.00 | - | - | 650.00 | 748.35 |
| MA 2-2 | MA 2-2 | 64,598,00 | 2,246.85 | 1,772.91 | 7,800.00 | - | - | 650.00 | |
| MA 1-2 | MA 1-2 | 60,065.00 | 5,937.85 | 1,441.56 | 7,800.00 | - | - | 650.00 | |
| PL 3 | PL 3 | 54,056.00 | 2,329.80 | 1,397.88 | 7,800.00 | - | - | 650.00 | |
| PL 2 | PL 2 | 55,338.00 | 1,924.80 | 1,154.88 | 7,800.00 | - | - | 650.00 | |
| PL 1 | PL 1 | 51,301.00 | 1,831.10 | 1,098.60 | 7,800.00 | - | - | 650.00 | |

(b) (i) The value of the annual insurance coverage is Rs. 188, 035, 121.47

(ii) Amount paid from 01/01/2022 to 31/12/2022 - Rs. 155,135,739.54

Amount paid from 01/04/2023 to date - Rs. 188,035,121.47

----------------------------

**Total -** Rs. **343,170,861.01**

===============

(c) Not relevant.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ජලනල එළීම සඳහා මේ වනවිට කම්කරුවන් විශාල පිරිසක් manpower companiesවලින් අරගෙන තිබෙනවා. ඇත්තටම එම සේවකයන්ට ලැබෙන්නේ ඉතාම අඩු වැටුපක්.

නමුත්, ඒ ආයතන මේ කටයුතුවලින් අධික මුදලක් උපයන බව අපි දන්නවා. ඒ නිසා එම සේවකයන් සම්බන්ධයෙන් යම් කිසි ස්ථිර වැඩ පිළිවෙළක් සකස් කරලා, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ආදේශක පදනමෙන් හෝ ඔවුන් බඳවාගෙන ඒ අයගේ රැකියා සුරක්ෂිත වෙන විධියට කටයුතු කරලා, මේ ජල නළ එළීමේ කටයුතු තවත් කාර්යක්ෂම කරන්න හැකියාවක් තිබෙනවාද, ගරු ඇමතිතුමනි?

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Member, I would like to explain that when I took over the Ministry of Water Supply and Estate Infrastructure Development, we had to deal with an unusually high number of political appointments. Today, close to 70 per cent of the labour force of the Water Supply and Drainage Board stands being unskilled. And, we are short-staffed in many areas and overstaffed in some. So, when that is the case, we have to do its restructuring. At the same time, we cannot give permanent appointments. The recent tariff hike that had been made was the first in ten years. With the initial 66 per cent electricity tariff increase, we have to pay close to Rs. 425 million a month. Apart from that, for our loan component, Rs. 2.8 billion has been going every month. So, basically, it is not sustainable for us to get on board more permanent workers. What we are trying to do is, upskill or provide skills to the existing unskilled workers. And, all those we could take in, would be taken in. Unfortunately, for that, we have to wait and see, Hon. Member.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දකින්න ඇති, පසුගිය දවසක අපටත් රූපවාහිනියෙන් දකින්න ලැබුණා, උදේ පාන්දර පාසල් යද්දී දරුවෙකුත්, පියාත් ගොතටුවේ ෆොන්සේකා මාවතේ තිබුණු විශාල වතුර වළකට වැටිලා අනතුරට පත් වුණු ආකාරය.

මේ වාගේ විශාල බාදනයකට ලක් වෙච්ච මාර්ග නිසා, කාපට් එක දැම්මාට පස්සේ ජල නළ එළන්න නැවත පාර කඩලා ඒ ස්ථාන නොහදපු මාර්ග නිසා මේ වෙනකොට අනතුරු විශාල සංඛ්‍යාවක් මේ මාර්ගවල සිද්ධ වෙනවා. ගරු අමාත්‍යතුමනි, එදා ඒ දරුවාට හෝ පියාට ජීවිත හානියක් වුණා නම්, විපක්ෂයේ මන්ත්‍රීවරු ටික මේ වෙනකොට ඒ සම්පූර්ණ චෝදනාව ඔබතුමාටයි එල්ල කරන්නේ. කොන්ත්‍රාත් දීලා මුදල් ගෙවලා මේ ව්‍යාපෘති කරන්න භාර දීපු කොම්පැනි පිළිබඳව යම් පරීක්ෂණයක් කරලා ඒ පිළිබඳව වාර්තාවක් අරගෙන ඒ කොන්ත්‍රාත් කරපු සමාගමෙන් හෝ ආයතනයෙන් මේ සම්බන්ධයෙන් යම් අය කිරීමක් කර ගන්න කටයුතු කර තිබෙනවාද, මෙවැනි ක්‍රියා ඉදිරියේදී වළක්වා ගන්න ඔබතුමා මේ වෙනකොට යම් ක්‍රමවේදයක් සකස් කර තිබෙනවාද කියන එක පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න, ගරු ඇමතිතුමනි,

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

I would like to explain to the Hon. Member that regardless of whether the Opposition is going to blame me or not on that incident, I do not wish to politicize it. I do express my regrets over what has happened. I think one thing that we must explain is, around April, the Hon. President called for a meeting between the Road Development Authority and the National Water Supply and Drainage Board because, not just in this particular place but across the country, there are various projects such as that where roads have been dug out but not been filled and that has caused issues for the commuters. However, with this particular issue, I have directly gotten myself involved; I had spoken to the family also. One thing we are working on is, how we can work with the RDA and sort this out. You know that when we do projects such as water supply and lay pipes, the RDA gets involved to work for road safety. Unfortunately, due to lack of money and funding, some of the contractors have backed out. So, right now, we are in the process of reviewing all the incomplete or irregular projects and planning to remove those contractors and put in new ones to complete those.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා අතුරු ප්‍රශ්න දෙක අහලා අවසානයි නේ.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

ගරු ඇමතිතුමාගෙන් මට පොඩි ඉල්ලීමක් කරන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

කෙටියෙන් කියන්න.

**ගරු මිලාන් ජයතිලක මහතා**
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

ගරු ඇමතිතුමනි, මාර්ග නඩත්තු කිරීමට කොන්ත්‍රාත් ලබා දෙන ආයතන සම්බන්ධයෙන් පසුවිපරමක්, නිසි වැඩ පිළිවෙළක් නැති නිසා තමයි එහෙම දේවල් වෙන්නේ. ඒ අය මේ ජල නළවලින් වතුර leak වෙනවා දැක-දැක තමයි ඒවා වහන්නේ. එතකොට තමයි ඒවා කඩාගෙන යන්නේ. ඒ නිසා ඒ ආයතන blacklist කරන්න හෝ ඒ අයට කුමක් හෝ දඬුවමක් ලබා දෙන වැඩ පිළිවෙළකට යන්න කියන ඉල්ලීම අපි කරනවා.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Member, I can assure you that we have already taken a provincial report three months back on all the contractors who have abandoned those projects. We are already in the process of blacklisting certain contractors. However, it still does not address the main issue, which is lack of funding due to the crisis we face. So, one option is, we have to look towards public-private partnerships in order to complete such projects because we are not able to fund projects like these. Starting from Ambatale, many other projects like this are directly affected due to lack of funds. But, I can assure you that both the President and the Prime Minister have directly inquired about this matter and also their direct supervision is being given to this.

Thank you.

## කල්ලාරු ජලාශ පානීය ජල යෝජනා ක්‍රමය: වත්මන් තත්ත්වය
## கல்லாறு நீர்த்தேக்க குடிநீர்த் திட்டம்: தற்போதைய நிலைமை
## KALLARU RESERVOIR DRINKING WATER SUPPLY SCHEME: CURRENT STATUS

1681/2023

7. **ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ සඳහා ජල සම්පාදන මණ්ඩලය විසින් ලබා දෙන පානීය ජලය, පාෂාණ ආශ්‍රිතව ලබා ගන්නා භූගත ජලය වන බැවින් සෞඛ්‍යයට අහිතකර බවත්;

(ii) පසුගිය කාලයේදී ජල සම්පාදන මණ්ඩලය විසින් කල්ලාරු ජලාශ පානීය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන ලද නමුත්, මේ වනතෙක් එම යෝජනා ක්‍රමයේ වැඩකටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) කල්ලාරු ජලාශ පානීය ජල යෝජනා ක්‍රමය ආරම්භ කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම යෝජනා ක්‍රමයේ වැඩකටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல் மற்றும் பெருந்தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மன்னார் மாவட்டத்தின் பெரும்பாலான பிரதேசங்களுக்கு நீர்வழங்கல் சபையினால் வழங்கப்படும் குடிநீரானது, கற்பாறைகளை அண்டியதாகப் பெறப்படும் நிலத்தடி நீர் என்பதால் சுகாதாரத்திற்குத் தீங்கானது என்பதையும்;

[ගරු චාල්ස් නිර්මලනාදන් මහතා]

(ii) கடந்த காலங்களில் நீர் வழங்கல் சபையால் கல்லாறு நீர்த்தேக்க குடிநீர்த் திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கான முயற்சிகள் எடுக்கப்பட்டபோதிலும், இதுவரை அத்திட்டத்தின் பணிகள் ஆரம்பிக்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) கல்லாறு நீர்த்தேக்க குடிநீர்த் திட்டத்தை ஆரம்பிப்பதற்கு நடவடிக்கைகள் எடுக்கப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி திட்டத்தின் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Estate Infrastructure Development:

(a) Is he aware that -

(i) the drinking water supplied by the Water Supply and Drainage Board for many parts of the Mannar District is unhealthy as it is groundwater that is supplied; and

(ii) although the Water Supply and Drainage Board, in the recent past, attempted to implement the Kallaru Reservoir Drinking Water Supply Scheme, the project has not been commenced so far?

(b) Will he inform this House -

(i) whether steps will be taken to start the Kallaru Reservoir Drinking Water Supply Scheme; and

(ii) if so, the date on which the scheme will commence?

(c) If not, why?

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Sir, the Answer is as follows:

(a) (i) The current water supply consistently meets drinking water quality standards on most days. However, given the significant increase in water demand, the surge in new connection requests and the prevailing drought conditions, there is a heightened risk of over-extracting groundwater, potentially leading to saltwater intrusion and increasing water quality parameter levels.

(ii) Yes.

(b) (i) The National Water Supply and Drainage Board initiated the project, which has subsequently been incorporated into the NWSDB's Corporate Plan and has taken every step outlined therein.

(ii) The project is scheduled for implementation from 2024 to 2028, subject to obtaining land consent for the proposed Kallaru Reservoir from the Forest Department.

(c) Not relevant.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கட்டுக்கரை குளத்துக்கு அண்மித்த பகுதியிலிருந்து பெறப்படுகின்ற நிலத்தடி நீரிலிருந்துதான் தற்போது மன்னார் மாவட்டத்துக்குக் குடிநீர் வழங்கப்படுகின்றது. கட்டுக்கரை குளத்திலிருந்து நீரையெடுத்து வழங்குவதற்கான முயற்சிகளை தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை எடுத்து வருகின்றது. என்னைப் பொறுத்தளவில், ஏற்கெனவே மன்னார் மாவட்ட விவசாயிகளுக்குக் கட்டுக்கரை குளத்திலுள்ள நீர் போதாமல் இருப்பதால், அதிலிருந்து நீரை எடுக்காமல் இருப்பது நல்லது. கல்லாறு நீர்த்தேக்கக் குடிநீர்த் திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கு உங்களுடைய அமைச்சு நீண்டகாலமாக முயற்சி எடுத்து வருகின்றது. அண்மையில் வன இலாகா அதற்குத் தடை விதித்ததாகத் தங்களுடைய அதிகாரிகள்மூலமாக நான் அறிந்துகொண்டேன். நான் அது சம்பந்தமாக இந்தச் சபையில் கௌரவ அமைச்சர் பவித்ராதேவி வன்னிஆரச்சி அவர்களிடம் கேட்டபோது, தனது அமைச்சின் செயலாளர் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையின் அதிகாரிகளுடன் இவ்விடயம் தொடர்பில் கலந்துரையாட இருப்பதாகக் கூறினார். ஆகையால், தற்போது கல்லாறு நீர்த்தேக்கக் குடிநீர்த் திட்டத்தை நடைமுறைப்படுத்தும் பணிகள் எந்த நிலையில் இருக்கிறது என்பதைக் கூற முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ உறுப்பினர் அவர்களே, இந்தத் திட்டத்தை நடைமுறைப்படுத்துவதற்காக நீண்ட காலம் முயற்சித்து வருவதாக நீங்கள் சொன்னீர்கள். ஆனால், நான் இந்த அமைச்சைப் பெறுப்பேற்று சிறிது காலமே ஆகிறது. ஆகையால், நான் இந்தத் திட்டம் சம்பந்தமாக விசாரித்து விட்டு, உங்களுடனும் உங்களுடைய மாவட்டத்திலுள்ள ஏனைய மக்கள் பிரதிநிதிகளுடனும் கலந்துரையாடுவேன். மாகாண ரீதியாகக் கலந்துரையாடல்களை நடாத்தப் போவதாக நான் ஏற்கெனவே சொல்லியிருந்தேன். ஆனாலும், சில பிரச்சினைகள் ஏற்பட்டதன் காரணமாகத்தான் எங்களால் அவற்றை நடாத்த முடியவில்லை. இத்திட்டம் சம்பந்தமாகக் கதைப்பதற்கு நீங்கள் குறித்ததொரு நேரத்தை ஒதுக்கிவிட்டு, என்னை அழையுங்கள்! நான் என்னுடைய அமைச்சின் அதிகாரிகளையும் அழைத்து வருகிறேன். இத்திட்டம் சம்பந்தமாக என்னென்ன தெளிவுபடுத்தல்கள் வேண்டுமோ, அவற்றை நான் கட்டாயம் வழங்குவேன்.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, முல்லைத்தீவு மாவட் டத்தின் துணுக்காய் மாந்தை கிழக்குப் பிரதேச செயலாளர் பிரிவில் WaSSIPஇன்கீழ் வருகின்ற கரும்புள்ளியான் குடிநீர்த் திட்டம் நடைமுறைப்படுத்தப்படாமல் இருந்தது. நான் இது தொடர்பில் உங்களிடம் விடுத்த கோரிக்கைக்கு அமைவாக, நீங்கள் இதனை நடைமுறைப்படுத்துவதற்கான முயற்சிகளை எடுத்துள்ளீர்கள். WaSSIPஇன்கீழ் வருகின்ற கரும்புள்ளியான் குடிநீர்த் திட்டத்தை எப்போது ஆரம்பிப்பீர்கள் என்பதைக் கூற முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු ජීවන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ உறுப்பினர் அவர்களே, இன்னும் சில வாரங் களில் வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட இருக்கிறது. நீர் வழங்கல் துறையிலுள்ள பிரச்சினைகளை நாங்கள் இப்பொழுதுதான் படிப்படியாகத் தீர்த்து வருகின்றோம். நாங்கள் இப்பொழுதுதான் cost-cutting measuresஐயும் எடுத்திருக்கிறோம். இவற்றையெல்லாம் நாங்கள் செய்து கொண்டு இருக்கும்போது, சமீபத்தில் மின் கட்டணம் அதிகரித்தது. அது பற்றி நீங்களும் அறிந்திருப்பீர்கள்! அதனால் திரும்பவும் எங்களுக்குச் சிறிய சிக்கல் ஏற்பட்டிருக் கிறது. அடுத்த வருடத்துக்கான வரவு செலவுத்திட்டம் நிறைவேற்றப்பட்ட பின்னர், எங்களால் இத்திட்டத்தை ஆரம்பிக்க முடியும். அந்தப் பகுதியில் எங்களால் preliminary worksஐ -

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

அது World Bank Project

ගරු ජීවන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

அது World Bank Projectஆக இருந்தாலும், இலங்கை அரசாங்கத்தின் component என்று ஒன்று இருக்கிறது. நாங்கள் WaSSIPமூலமாக நிறைய projects செய்துகொண்டு இருக்கின்றோம். அதேபோல், World Bankமூலமாகவும் Projectsஐச் செய்துகொண்டு இருக்கின்றோம். இவ்வாறு எங்களிடம் கிட்டத்தட்ட 30 Projects இருக்கின்றன. அந்த 30 Projectsஉம் அப்படியே stalled ஆகியிருக்கிறது. நாங்கள் இதுதொடர்பில் World Bankஇன் தவிசாளரான Chiyo Kanda உடன் பேசியிருக்கிறோம். எங்களால் எவ்வளவு முடியுமோ அந்தளவுக்குக் கட்டாயம் ஒத்துழைப்போம் என்று அவரிடம் சொல்லியிருக்கிறோம். இந்தத் திட்டம் எப்பொழுது ஆரம்பிக்கப்படும் என்பதற்கு exactஆக திகதி ஒன்றைச் சொல்வது கஷ்டம்! ஆனால், சமர்ப்பிக்கப்பட இருக்கும் வரவு செலவுத்திட்டத்துக்குப் பின்னர், இத்திட்டத்தை ஆரம்பிக்க முடியும். நன்றி!

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව: බදු දී ඇති ඉඩම්
## இலங்கை புகையிரதத் திணைக்களம்: குத்தகைக்கு வழங்கியுள்ள காணிகள்
## SRI LANKA RAILWAY DEPARTMENT: LANDS LEASED OUT

1761/2023

**8.** ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු මේ වනතෙක් භාවිතයට ගෙන නොමැති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තුව සතු එක් එක් දිස්ත්‍රික්කයෙහි පිහිටි ඉඩම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(iii) දෙපාර්තමේන්තුවේ ඉඩම් මේ වනවිට බදු දී තිබේද;

(iv) එසේ නම්, බදු දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එම ඉඩම් බදු දීමේදී නිවැරදි ක්‍රමයක් අනුගමනය කර තිබේද;

(vi) එම ඉඩම් බදු දීම මඟින් වාර්ෂිකව උපයා ගනු ලබන බදු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை புகையிரதத் திணைக்களத்திற்குச் சொந்தமானதும் இதுவரை பயன்படுத்தப் படாததுமான காணிகளின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) அத்திணைக்களத்திற்குச் சொந்தமான ஒவ்வொரு மாவட்டத்திலும் அமைந்துள்ள காணிகள் தொடர்பில் ஆவணமொன்று பேணப்படு கின்றதா என்பதையும்;

(iii) திணைக்களத்தின் காணிகள் இன்றளவில் குத்தகைக்கு வழங்கப்பட்டுள்ளனவா என்ப தையும்;

(iv) ஆமெனில், குத்தகைக்கு வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு எவ்வளவென்பதையும்;

(v) மேற்படி காணிகளை குத்தகைக்கு வழங்கும் போது, சரியான முறையியல் பின்பற்றப் பட்டுள்ளதா என்பதையும்;

(vi) மேற்படி காணிகளை குத்தகைக்கு வழங்குவதன் மூலம் வருடாந்தம் ஈட்டப்படுகின்ற குத்தகை வருமானம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Highways:

(a) Will he inform this House -

(i) the extent of lands owned by the Sri Lanka Railway Department, which remain unused till now;

(ii) whether a register is maintained regarding the lands owned by that Department, located in each district;

(iii) whether the lands owned by the Department have been leased out, as of now;

(iv) if so, the extent of lands leased out;

(v) whether a correct methodology has been followed in leasing out the above lands; and

(vi) the annual tax revenue earned by leasing out the above lands?

(b) If not, why?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ඉඩම් හෙක්ටෙයාර 5,739.85ක ප්‍රමාණයක් පවතින අතර, ඉන් මේ වනතෙක් භාවිතයට ගෙන නොමැති ඉඩම් ප්‍රමාණය නිශ්චිතව දැක්වීමට අපහසුය.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා ]

(ii) එවැනි ලේඛනයක් දැනට පවත්වා ගෙන නොයන නමුත්, ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කොට තිබෙනවා.

(iii) ඔව්, බොහෝ ඉඩම් බදු දී තිබෙනවා.

(iv) ඉඩම් අක්කර 1,520ක් පමණ බදු දී ඇත.

(v) මේ සඳහා පිළිතුර "ඔව්" කියලා තිබෙනවා. නමුත් මම ඒ පිළිබඳව සෑහීමට පත් වෙන්නේ නැහැ. මෙම ඉඩම් බදු දීමේ ක්‍රමවලදී විවිධ අයථා ක්‍රියා සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ඉතාම අඩු බදු ආදායමක් තමයි ලැබෙන්නේ.

| වර්ෂය | වාර්ෂික ඉඩම් බදු ආදායම - (වැට් සහිතව) |
|---|---|
| 2018 | රු. මි. 141.03 |
| 2019 | රු. මි. 187.53 |
| 2020 | රු. මි. 130.96 |
| 2021 | රු. මි. 104.98 |
| 2022 | රු. මි. 182.53 |
| 2023 ජුනි දක්වා | රු. මි. 85.6 |

(vi) බොහොම අමාරුවෙන් උත්සාහ කරලා 2022දී ආදායම මිලියන 182ක් දක්වා වැඩි කරගෙන තිබෙනවා. මෙය කිසිසේත්ම ප්‍රමාණවත් බදු ආදායමක් නොවෙයි.

(ආ) පැන නොනඟී.

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

ගරු ඇමතිතුමනි, ඇත්තටම මෙය ඉතාම ශෝචනීය පිළිතුරක්. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අද අපි ඉන්නේ තාක්ෂණය අතින් ඉතා දියුණු ලෝකයක බව. මම ඔබතුමාට දොස් කියනවා නොවෙයි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ඉඩම් හෙක්ටයාර 5,789ක් තිබෙනවා කියා පිළිතුරේ සඳහන් වුණා. එයින් මේ වනතෙක් භාවිතයට ගෙන නොමැති ඉඩම් ප්‍රමාණය නිශ්චිතව කියන්න බැහැ කියලා ඔබතුමා කිව්වා. ඉතින්, අපි තවමත් ඉන්නේ ගල් යුගයේද, එහෙම නැත්නම් වැදි යුගයේද කියන කාරණය තමයි ඇත්තටම මට අහන්න වෙන්නේ.

ගරු ඇමතිතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. දුම්රිය දෙපාර්තමේන්තුව සතුව තිබෙන ඉඩම් අද වෙනකොට එක එක්කෙනාට ඕනෑ ඕනෑ විධියට පරිහරණය කරනවා; එක එක්කෙනාට අවශ්‍ය අවශ්‍ය විධියට පරිහරණය කරනවා. අපට නිශ්චිත වශයෙන් දැන ගන්න පුළුවන් වන්නේ කවදාද, දුම්රිය දෙපාර්තමේන්තුව සතුව මෙතරම් නිශ්චිත ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා කියලා? ගොවිජන සේවා දෙපාර්තමේන්තුව තාක්ෂණය භාවිත කරමින් කුඹුරු ඉඩම් මනිනවා. දුම්රිය දෙපාර්තමේන්තුවට තවමත් බැරිව ගිහින් තිබෙනවා, තමන් සන්තකයේ තිබෙන ඉඩම් ප්‍රමාණය නිශ්චිතව හොයා ගන්න. ඒක බරපතළ කාරණයක්. ගරු ඇමතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවට මෙන්න මෙච්චර ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා, මෙච්චර ප්‍රමාණයක් බදු දීලා තිබෙනවා, මෙච්චර ප්‍රමාණයක් අයථා විධියට පරිහරණය කරනවා කියලා අපට කවදාද දැන ගන්න ලැබෙන්නේ කියන කාරණය මම අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ඔබතුමා ජාතික වශයෙන් වැදගත් ප්‍රශ්නයක් ඇහුවේ, ගරු මන්ත්‍රීතුමනි. මක්නිසාද යත්, ලංකාව පුරාම පැතිරිච්ච රජයේ ඉඩම් වැඩිම ප්‍රමාණයක අයිතිකරු දුම්රිය දෙපාර්තමේන්තුවයි. ඒ ඉඩම් විශාල ලෙස අයථා හා අක්‍රමවත් ක්‍රමවලට බදු දීලා තිබෙනවා. ඒ වාගේම, බදු නොදී අනවසරයෙන් අල්ලාගෙන තිබෙනවා. ඉතා වැරැදි ලෙස ඉඩම් පරිහරණයක් සිදු වෙන බව දැනගෙන මම ඒ සඳහා විධිමත් ක්‍රමයක් සකස් කිරීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, දුම්රිය දෙපාර්තමේන්තුවේ තිබෙන ගැටලු හේතුවෙන් මේ ක්‍රමය සකස් කරන්න බැරි නිසා දුම්රිය දේපළ වත්කම් කළමනාකරණය සඳහා වෙනම සමාගමක් පිහිටුවන්න ඉඩ දෙන්න කියලා. කැබිනට් මණ්ඩලය විසින් මට උපදෙස් දෙනු ලැබුවා, එසේ නව සමාගමක් පිහිටුවන්න දෙන්න බැහැ, දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙනම අංශයක් ඒ සඳහා යොදන්න කියලා. ඒ අනුව එවැනි වෙනම ඒකකයක් ඇති කරලා මම කිව්වා, 400 ගණනක් විතර දුම්රිය නැවතුම්පොළවල වගකීම දුම්රිය ස්ථානාධිපතිවරයාට පවරලා, ඒ නැවතුම්පොළක ඉඳන් කිලෝමීටර දෙකක් මෙහා පැත්තටත්, කිලෝමීටර දෙකක් අනෙක් පැත්තටත් තිබෙන අනවසර පදිංචිවීම් ඉවත් කරලා, නිසි ලෙස දීර්ඝ කාලයක් පදිංචි වෙලා සිටි අයට බදු වශයෙන් එම ඉඩම් ලබා දීම සඳහා ක්‍රමයක් සකස් කරලා, දෙපාර්තමේන්තුවේ ආදායම වැඩි කරලා, ඒ වැඩි වෙන ආදායමෙන් ප්‍රතිශතයක් - සියයට ප්‍රමාණයක්- දුම්රිය ස්ථානාධිපතිවරු ඇතුළු ඒ කාර්ය මණ්ඩලයට ගෙවලා හෝ ඒ බදු ආදායම වැඩි කරන්න කියලා. ඒ ක්‍රමය ඉවර කරලා තව මාස හයක් විතර යන කොට සම්පූර්ණ ඉඩම් ලැයිස්තුගත කිරීම නිම කරනවා. සමහර තැන්වල මැනුම් කටයුතු අවසන් කරලා තිබෙනවා. සමහර තැන්වල මැනුම් කටයුතු අවසන් කරලා නැහැ. මේක බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ සිට තිබෙන ප්‍රශ්නයක්.

එම නිසා මේ ප්‍රශ්නයට කෙටි කාලයකදී විසඳුම් හොයන්න අමාරුයි. අපි පිළිගන්න ඕනෑ, ඉතා විශාල වැරැද්දක් කුමන ආණ්ඩු කාලයක වුණත් සිද්ධ වෙලා තිබෙන බව. එය නිවැරැදි කිරීම ජාතික වැඩ පිළිවෙළකින් මිසක්, පැලැස්තරවාදී විසඳුමකින් කරන්න බැහැ. සමහර ඉඩම් අයථා ලෙස පවරලා දීලා තිබෙන අයට විරුද්ධව මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබෙනවා. අනවසරයෙන් පදිංචි වී සිටින සියලුදෙනා පිළිබඳව විධිමත්ව කටයුතු කරන්න ඕනෑ. දුම්රිය සාමාන්‍යාධිකාරීට ඉඩම් බදු දෙන්න පුළුවන් අවුරුදු පහකට පමණයි. ඕනෑම කෙනෙක් දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළොත්, එය සලකා බලා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය යටතේ දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දෙන්න මම සූදානම්. රටේ ඕනෑම පුරවැසියෙකුට ඒ අයිතිය තිබෙනවා. තමන් ජීවත් වන ප්‍රදේශයේ දුම්රිය රක්ෂිතයේ ඉදිරි සංවර්ධනයට අදාළ නොවන කොටසට යෝජනාවක් ඉදිරිපත් කළොත්, ඒ යෝජනාව අධ්‍යයනය කරලා බලලා, ඒක අපි කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනවා. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය යටතේ මිසක් හිතුවක්කාර ලෙස ඉඩම් ලබා දෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, දුම්රිය සාමාන්‍යාධිකාරීට ඉඩම් බද්දට දෙන්න බලය තිබෙන්නේ අවුරුදු පහකට විතරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, ඒවා කරන්න තමයි අපට බලය දීලා තිබෙන්නේ. මේ කරුණු නිලධාරින්ට දැඩිව අවධාරණය කරලා අවශ්‍ය කඩිනම් පියවරක් ගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අපේ රටේ දුම්රිය සේවාව ඉතාම ශෝචනීය තත්ත්වයක තිබෙන්නේ. අද ලෝකයේ බොහෝ රටවල තාක්ෂණයත් එක්ක, සංවර්ධනයත් එක්ක දුම්රිය සේවාව නවීකරණය වෙලා තිබෙනවා. හැබැයි, අපේ රටේ එහෙම නැහැ.

ඊළඟට, සේවකයන්ගේ දැඩි වෘත්තීය ක්‍රියා මාර්ග නිසා මේ රටේ අහිංසක ජනතාව විශාල වශයෙන් පීඩාවට ලක් වෙනවා. අපි දන්නවා, මීට සති කිහිපයකට කලින් දුම්රිය වැඩ වර්ජනයක් හේතුවෙන් අහිංසක තරුණයෙකුගේ ජීවිතය අහිමි වුණ බව. හැබැයි, ඒ සියලු දෝෂාරෝපණ පාර්ලිමේන්තුවේ ඉන්න අපි සියලුදෙනාටයි එල්ල වෙන්නේ. එම නිසා විශේෂයෙන්ම අපට වගකීමක් තිබෙනවා. ඒ අයගේ වෘත්තීය අයිතිවාසිකම රැක ගත්තාට කමක් නැහැ. බොහෝ විට දුප්පත්, අහිංසක ජනතාව ඒ අයගේ ගමනාන්තවලට ළඟා වෙන්න යොදා ගන්නේ කරන්නේ ඉතාම ලාභදායී දුම්රිය සේවය. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඒ මිය ගිය තරුණයා වෙනුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුව කළ මැදිහත් වීම මොකක්ද කියලා. ඒ අහිංසක දෙමව්පියන්ට තමන්ගේ අහිංසක දරුවා අහිමි වුණා. ඒ ඉතාම අහිංසක දරුවෙක්. අධ්‍යාපන මධ්‍යස්ථානයට යන්න දුම්රියේ වහලය උඩ නැගලා ගිහිල්ලා තමයි ඒ තරුණයාගේ ජීවිතය අහිමි වෙන්නේ. ඒ තරුණයා වෙනුවෙන් මොකක්ද කළ මැදිහත් වීම? ඒ මිය ගිය තරුණයා වෙනුවෙන් සාධාරණයක් ඉටු කරන්න දුම්රිය දෙපාර්තමේන්තුව මැදිහත් වුණාද? දුම්රිය අත්‍යවශ්‍ය සේවාවක් ලෙසට දැන් ගැසට් කරලා තිබෙනවා. මෙතැනින් එහාට යම් වගකීමක් අරගෙන අපේ රටේ ජීවත් වන ජනතාව වෙනුවෙන් දුම්රිය සේවාව යහපත් සේවාවක් විධියට ස්ථාපිත කරන්න යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු අගමැතිතුමනි, විශේෂඥ දැනුම තිබෙන, උගත්, බුද්ධිමත් නිලධාරින් ඇතුළු කණ්ඩායම් ජනාධිපතිතුමාත් එක්ක විදේශ සංචාරවලට ගියාට කිසිම ගැටලුවක් නැහැ. හැබැයි, අර උගතුන් පිරිසක් ද UN එකට අරගෙන ගියේ? රට විනාශ කරපු, පොහොර ටික නැති කරපු, ඇමති පොරොන්දු ඉෂ්ට නොකළ පිරිසක් තමයි UN එකට අරගෙන ගියේ. ඒ, විනිසුරුවරුන්ට, මැතිවරණ කොමිසමට විරුද්ධව Privilege Motions ගෙනාපු අයට ලබා දුන් සන්තෝසම්. අද වතුකරයේ මිනිස්සුන්ට කෑම නැහැ. වතුකරය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. දේශපාලන අල්ලසක් හැටියට විපක්ෂයේ මිනිහෙකුත් UN එකට අරගෙන යනවා. මොකක්ද මේ විහිළුව? ඔබතුමා දන්නවාද Business Class ticket එකක ගණන? මේ හැමෝටම *per diem* දුන්නා; හැමෝටම මහා වියදමක් දැරුවා. බංකොලොත් රටක මෙහෙම කටයුතු කරන එක හරිද කියලා මම අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාත් සභාවේ ඉන්න නිසා මම බරපතළ ප්‍රශ්නයක් මතු කරනවා. ගරු අගමැතිතුමනි, ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක්. මමත් ඒකේ සාමාජිකයෙක්. අපි දූෂණ විරෝධී පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තා. මේ දූෂණ විරෝධී පනත, තිබුණාටත් වැඩියෙන් දූෂණ විරෝධී ක්‍රමය ශක්තිමත්

---

** පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

කරන වැඩ පිළිවෙළක්. අපි හැමෝම ඒක පිළිගන්නවා. දූෂණ විරෝධී පනතේ 3 (1) උපවගන්තියේ තිබෙනවා, "the Commission to Investigate Allegations of Bribery or Corruption" කියලා. ඒ කොමිසම ඉතා වැදගත් වෙනවා. ඇත්ත වශයෙන්ම ඒකේ සංයුතියක් තිබෙනවා. ඒක පනතේ 4 (1) උපවගන්තියේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා. එම කොමිසමට සාමාජිකයන් පත් කරන්නේ ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත. හැබැයි දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේකේ නම සඳහන් වෙලා තිබෙන්නේ, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" කියලා. හැබැයි මේ පනතේ ස්ථාන 11ක එහි නම සඳහන්ව තිබෙන්නේ, "ව්‍යවස්ථාදායක මණ්ඩලය" කියලා. මේ පනතේ ඉංග්‍රීසි පිටපතයි, සිංහල පිටපතයි අතර පරස්පරතාවක් තිබෙනකොට ඔබතුමන්ලාම දන්නවා, සිංහල පිටපත තමයි ප්‍රමුඛස්ථානය ගන්නේ කියන එක.

එතකොට නිවැරදිව, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" යන්න මේ පනතේ සඳහන් නොවීම තුළ Commission එකේ සාමාජිකයන් පත් කරන්නට Constitutional Council එකට බැරි වෙලා තිබෙනවා. ගරු අගමැතිතුමා ඒක දන්නවා. අපි සාමාන්‍යයෙන් Constitutional Council එකේ දේවල් එළියේ කථා කරන්නේ නැහැ. නමුත් මේක බරපතළ ප්‍රශ්නයක්. IMF එක කියනවා, දූෂණය ඉහ වහා ගිහිල්ලා කියලා. ඒ නිකම් දූෂණ නොවෙයි, කුඩා පරිමාණයේ දූෂණ නොවෙයි, මහ පරිමාණයේ දූෂණ. ගරු අගමැතිතුමනි, එහෙම නම් අපි මේ පාර්ලිමේන්තුවේ කාලය උපයෝගි කරගෙන ඇත්තටම කරන්නට ඕනෑ, ඒ වරද නිවැරදි කිරීමයි. "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" කියන වචනය, ඒ නිවැරදි වචනය පනතට ඇතුළත් කරන්නට ඕනෑ. එතැන ව්‍යවස්ථාදායක මණ්ඩලයක් ගැන කථා කරන්නේ කවුද? ඒක තිබෙනවා, මේ පනතේ. ඒ නිසාම Constitutional Council එකට මේ පත් කිරීම් ටික කරන්නට බැරි වෙලා තිබෙනවා. මම හිතන්නේ නැහැ, benevolent jurisdiction ක්‍රමය හරහා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා. මොකද, මේක fundamental flaw එකක්; මූලික අඩුපාඩුවක්. අපි ඒ අඩුපාඩුව අනිවාර්යයෙන්ම හදන්නට ඕනෑ.

අවසාන වශයෙන් මම තව කරුණු කිහිපයක් මතු කරන්නට ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමනි, දැන් බරපතළ කඩා වැටීමක් තිබෙනවා. දැන් මහ ලොකුවට සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරන්නට හදනවා. SriLankan Airlines එකේ ඒ වුණු සිදුවීම් එක්ක සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරන්නේ කොහොමද? ඒ සිදුවීම් නිසා රටට වූ අලාභය ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක්; රුපියල් බිලියන 1.9ක්. මෙහෙම වෙන්නේ කොහොමද ? මේවා හරිද? මේ තත්ත්වයට රජය ගන්නා පියවර මොකක්ද?

රජය අද කථා කිරීමේ නිදහස හැම අතකින්ම නතර කරන්නට යනවා; ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන්නට යනවා. මේ ගෙනෙන්නට යන Anti-Terrorism Bill එක අනුව, යමක් කථා කළොත් හිරේ. රටේ අඩුපාඩු ගැන කථා කළොත්, ඒ ගොල්ලන් ත්‍රස්තවාදීන්. ඒවා හරිද? Online Safety Bill කියලා එකක් ගෙනැල්ලා, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? Apple, Amazon, Google, Meta, X, LinkedIn, Pinterest, Booking.com, Expedia, Rakuten, Shopify, Snap, Spotify, Grab, GoTo and LINE මේවා අඩංගු Asia Internet Coalition එක මේකට බරපතළ විරෝධය පළ කරලා තිබෙනවා. දැන් ඒ අයත් එළවා ගන්නද හදන්නේ? එහෙම එළවා ගෙන, රටක විදේශ ආයෝජන ප්‍රවර්ධනය කරන්න පුළුවන්ද? මොනවාද, මේ කරන බහුබූත ක්‍රියා? මම කාරුණික ඉල්ලීමක් කරනවා. මේ Anti-Terrorism Bill එකයි, Online Safety Bill එකයි ගෙනැල්ලා මොකක්ද කරන්න හදන්නේ? Online එකේ කිසිම safety එකක් නැහැ.

මේකෙන් රජයේ ආරක්ෂාවයි තහවුරු කරන්නේ; ජනාධිපතිගේ ආරක්ෂාවයි තහවුරු කරන්නේ; ආණ්ඩුවේ ආරක්ෂාවයි තහවුරු කරන්නේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත වහාම ඉල්ලා අස් කර ගන්න. මේක ආඥාදායක, ඒකාධිපති, ඉතා දරුණු වැඩ පිළිවෙළක්. ඒ නිසා මේ පනත් කෙටුම්පත වහාම ඉල්ලා අස් කර ගන්න කියා ඉල්ලීමක් කරමින්, මම ස්ථාවර නියෝග 27(2) යටතේ අසා තිබෙන ප්‍රශ්නවලට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. කරුණාකරලා එම ප්‍රශ්නවලට පිළිතුර ලබා දෙන්නට කටයුතු කරන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් මතු කරන ලද Anti-Corruption Act එකේ වචන පරිවර්තනයේ තිබූ දෝෂය නිවැරදි කිරීමට මේ වනවිට පියවර ගනිමින් සිටිනවා, ඒ නිසි ක්‍රියාදාමය අනුගමනය කරමින්.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කළ පළමුවන ප්‍රශ්නය යොමු වුණේ විශේෂයෙන්ම IMF එක හා සම්බන්ධ වූ කරුණු රාශියක් සම්බන්ධයෙන්. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමා හෙට දිනයේ ඒ සඳහා සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීමට බලාපොරොත්තුවෙන් ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල තරුණ නියෝජනය වැඩි කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත්

## சிறப்புரிமை: பாராளுமன்ற, மாகாண சபை மற்றும் உள்ளூர் அதிகாரசபை மட்டங்களில் இளைஞர் பிரதிநிதித்துவத்தை அதிகரித்தல் தொடர்பில் சமர்ப்பிக்கப்பட்ட தனியார் உறுப்பினர் சட்டமூலங்கள்

## PRIVILEGE: PRIVATE MEMBERS' BILLS SEEKING TO INCREASE YOUTH REPRESENTATION AT PARLIAMENTARY, PROVINCIAL AND LOCAL GOVERNMENT LEVELS

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරප්‍රසාද කඩවීම පිළිබඳව වූ මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සඳහා මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිය පුද කරනවා.

මන්ත්‍රීවරයකු ලෙස මගේ කාර්යභාරය ඉටු කිරීමේ දී සිදුවෙලා තිබෙන වෙනස්කම්, බාධා කිරීම්, විරුද්ධකම් මෙන්ම, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සභාවේ නියෝග පැහැර හැරීම

[ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා]

වැනි කරුණු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට මෙන්ම පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ වලංගුභාවය තදබල ලෙස උල්ලංඝනය කරන තත්ත්වයක්. මේ ගැන කිසිවෙකු වෙත ද්වේෂසහගතව ඇඟිල්ල දිගු කිරීම කිසිසේත් මගේ අරමුණ නොවෙයි. පාර්ලිමේන්තුවේ බලතලවලට මෙලෙස අභියෝග කිරීම, නොසලකා හැරීම මෙන්ම පාර්ලිමේන්තුවේ තිබිය යුතු අපක්ෂපාතී හැසිරීම ප්‍රශ්නකාරී තත්ත්වයකට පත් වීම වැනි තත්ත්ව තවදුරටත් මින්මතු ඇති වීමට ඉඩ නොතැබිය යුතුය යන සද්චේතනාවෙනුයි මේ වරප්‍රසාද කඩ කිරීම පිළිබඳ කරුණ ඔබතුමාගේ අවධානයට යොමු කළ යුතු යැයි මම තීන්දු කළේ. සිදුව ඇති මේ ක්‍රියාදාමය ගැන බෙහෙවින් අධ්‍යයනය කිරීමෙන් සහ සිතා බැලීමෙන් අනතුරුව තමයි මම අද මේ ප්‍රකාශය කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මා විසින් මුලින්ම ඉදිරිපත් කළේ මෙම යොවුන් නියෝජනත්වය පිළිබඳව වූ පනත් කෙටුම්පතයි. ඒ සම්බන්ධයෙන් කටයුතු කර ඇති ආකාරය නිසා, 1988දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ප්‍රථම වරට පත්ව දශක දෙකකට අධික කාලයක් මේ උත්තරීතර සභාවේ කටයුතු කරන මන්ත්‍රීවරයකු වන මගේ වගකීම් සහ කාර්යභාරය ඉටු කිරීමේදී චේතනාන්විතව බාධා කරමින්, හිරිහැර කරමින්, අපහාසාත්මක ලෙස ක්‍රියා කරමින් මන්ත්‍රීවරයකු වශයෙන් මට හිමි වරප්‍රසාද දැඩි ලෙස උල්ලංඝනය කර තිබීම ගැන ගරු කථානායකතුමාට මේ අයුරින් පැමිණිලි කරන්නට සිදු වන තත්ත්වයක් උද්ගතව තිබීම ඇත්තෙන්ම කනගාටුදායක තත්ත්වයක්.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ - Parliament (Powers and Privileges) Act එකේ - උපලේඛනයේ "ආ" කොටසේ 1, 2 සහ 4 වන වගන්ති කෙරෙහි ගරු කථානායකතුමන්ගේ කාරුණික අවධානය යොමු කරවන්න මම කැමැතියි. ඒ අනුව මේ කාරණය තුළින් මන්ත්‍රී වරප්‍රසාද බරපතළ ලෙස උල්ලංඝනය කිරීමකින් ඔබ්බට යන පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වයට, අභිමානයට, අපක්ෂපාතිත්වයට ප්‍රශ්නාර්ථ සහ කැලල් ඇති කරන තත්ත්වයක් නිර්මාණය වෙනවා.

පාර්ලිමේන්තුව වෙනුවෙන්, ගරු කථානායකතුමා වෙනුවෙන් ක්‍රියා කරන, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ නියෝග ඉටු කිරීම දිගින් දිගට පැහැර හැරීම තුළින් මෙහිදී සිදු කර ඇත්තේ චේතනාන්විතව පාර්ලිමේන්තුවේ බලතලවලට අභියෝග කිරීමක් නොවේ ද, හෑල්ලු කිරීමක් නොවේ ද යන්න කළු-සුදු මෙන් පැහැදිලිව දැක ගන්න හැකිව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රකාරව පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වූ මැතිවරණ ආඥාපනත් සංශෝධනය කිරීම සඳහා මා පෞද්ගලික පනත් කෙටුම්පත් තුනක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට 2021 ජනවාරි මාසයේදී භාර දෙනු ලැබුවා.

මාගේ මෙම පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් තුනෙන් මා අපේක්ෂා කළේ පළාත් පාලන ආයතන, පළාත් සභා සහ පාර්ලිමේන්තු යන මහජන නියෝජිතයන්ගෙන් සමන්විත මේ වැදගත් කේන්ද්‍රීය ස්ථානවල සාධාරණ තරුණ නියෝජනත්වයක් සහතික කර ගැනීමයි. මේ පනත් කෙටුම්පත් තුන ගැසට් කර අනතුරුව පාර්ලිමේන්තුවට 2022 ජූලි 6වන දින පළමුවර ඉදිරිපත් කළ පසු ඒ සඳහා අදාළ අමාත්‍යාංශයේ වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කිරීම පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට අනුව සිදු කෙරෙන්නක්. ඒ අනුව එය අදාළ අමාත්‍යාංශයට යොමු කළ ද, 2023 ජනවාරි පළමු දිනය තෙක්ම ඒ පනත් කෙටුම්පත් සඳහා අදාළ වාර්තා පාර්ලිමේන්තුවට එවීම සිදු වුණේ නැහැ.

අදාළ පනත් කෙටුම්පත් සඳහා වාර්තා අදාළ අමාත්‍යාංශයෙන් මාස 6ක් ඇතුළත නොලැබුණහොත්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (7) අනුව අදාළ මන්ත්‍රීවරයාගේ කැමැත්ත පරිදි දෙවැනි වර කියවීම සඳහා එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැකිව තිබෙනවා. ඒ අනුව පර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල තරුණ නියෝජනත්වය සඳහා වූ මා ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස මා විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත 2023 ජූනි 9වෙනි දා ලිපියක් යවමින් ඉල්ලා සිටියා. ඒ පිළිබඳ කිසිදු පියවරක් නොගැනීම හේතුවෙන් මා විසින් යළිත් වරක් 2023 සැප්තැම්බර් 22 දාතම ලිපියකින් ගරු කථානායකතුමන් අමතමින් ලිඛිතව එම ඉල්ලීම නැවත වරක් සිදු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී එම ලිපි දෙකේම පිටපත් **සභාගත*** කරමින් ඔබතුමන් වෙත භාර දෙනවා.

පාර්ලිමේන්තුව සහ පළාත් සභාව තුළ සාධාරණ තරුණ නියෝජනත්වයක් ලබා දෙන යෝජනාවන්ට අනුව ඒ සාධාරණ තරුණ නියෝජනත්වයට අවකාශ සැලසීමට ආණ්ඩුව පසුබාන බවක් පැහැදිලිව පෙනෙනවා.

මේ අතර ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු විසින්, මා ඉදිරිපත් කරන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත් කෙටුම්පතේ අරමුණ සඳහාම වූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් 2022 නොවැම්බර් මස 08වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සිදුවෙනවා. 2022 නොවැම්බර් මස 10වැනි දින එය පාර්ලිමේන්තුව විසින් විෂය භාර අමාත්‍යවරයාට ද යොමු කර තිබෙනවා. මා විසින් පනත් කෙටුම්පත ඉදිරිපත් කර මාස ගණනකට පසු ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරයෙකු ඉදිරිපත් කළ පනත් කෙටුම්පත සම්බන්ධ වාර්තාව මගේ පනත් කෙටුම්පත සමඟින් සම්බන්ධ කර, එක් වාර්තාවක් වශයෙන් අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් 2023 ජනවාරි මස 05වැනි දින පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලදුව, එම වාර්තාව පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් 2023 පෙබරවාරි මස 28වැනි දින සලකා බැලීම සිදු වුණා. එසේ සලකා බැලීමෙන් අනතුරුව නීති කෙටුම්පත් දෙකක් වන හෙයින්, වෙන් වෙන් වශයෙන් වාර්තා දෙකක් ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් අමාත්‍යාංශයට නියෝග කර තිබෙනවා.

මෙම යෝජිත කෙටුම්පත් දෙකේ වාර්තා පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කිරීම පිණිස නැවතත් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ රැස්වීමක් 2023 ජූනි මස 09වැනි දින පැවැත්වූ අතර, පනත් කෙටුම්පත් දෙක සම්බන්ධව වෙන් වෙන්ව වාර්තා ඉදිරිපත් කිරීමට කලින් දෙන ලද නියෝග පිළිනොපැදීම හේතුවෙන් එදින නැවතත් විෂය භාර අමාත්‍යාංශයේ නිලධාරින්ට මෙම යෝජිත කෙටුම්පත් දෙක සම්බන්ධයෙන් වාර්තා වෙන් වෙන්ව ඉදිරිපත් කරන ලෙස පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව නියෝග කර තිබෙනවා. පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ නියෝග පිළිනොපැදීම, පැහැදිලිවම පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත උල්ලංඝනය කිරීමක්.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කරුණු මෙසේ තිබියදී මගේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී නියෝග පරිදි කටයුතු නොකොට විෂය භාර අමාත්‍යාංශය විසින් මගේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් මාස 4කට පසුව අමාත්‍යාංශ වාර්තාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරයාගේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පමණක් අමාත්‍යාංශ වාර්තාවක් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරන ලදුව, එම වාර්තාව සම්බන්ධයෙන් පමණක් ඉදිරි කටයුතු කිරීමට දැන් තීරණය කර ඇති බව දැනගන්නට ලැබී තිබෙනවා. මෙවැනි තත්ත්වයක් උද්ගත වන්නේ නම් එය කිසිවෙකු අනුමත කරන තත්ත්වයක් වන්නේ නැහැ.

ස්ථාවර නියෝග 52 (7) අනුව අමාත්‍යවරයා වෙතින් කැඳවන ලද වාර්තාවක් එදින සිට මාස හයක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත නොලැබුණි නම්, එම පනත් කෙටුම්පත භාර මන්ත්‍රීවරයා රිසි දිනයක එය දෙවැනිවර කියැවීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු වෙනවා. එහෙත් මේ සඳහා මා පාර්ලිමේන්තු මහ ලේකම් සහ ගරු කථානායකතුමා වෙතින් කළ ඉල්ලීම් පිළිබඳව පියවර ගැනීම් මෙතෙක් සිදුවී නැහැ. ඒ අනුව මෙම කෙටුම්පත අදාළ ගරු අමාත්‍යවරයාට ඉදිරිපත් කර මාස හයකට වැඩිමනත් කාලයක් ඉකුත්වී ඇති හෙයින්, මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට අනවශ්‍ය ප්‍රමාද කිරීම්වලින් තොරව, අප්‍රමාදව ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සලසා දෙන ලෙස ගරු කථානායකතුමන්ගෙන් මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ "ආ" කොටසේ, 1, 2 සහ 4වන උපවගන්ති කෙරෙහි ඔබතුමන්ගේ විශේෂ අවධානය යොමු කරගැනීම උදෙසා ඒ වගන්ති තුන කියැවීමට මට අවසර දෙන්න.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ "ආ" කොටසේ මෙසේ සඳහන් වෙනවා:

> "පාර්ලිමේන්තුව විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කළහැකි වැරදි
>
> 1. මේ පනත යටතේ පාර්ලිමේන්තුවේ යම් නියමයකට හෝ යෝජනා සම්මතයකට නැතහොත් මේ පනත යටතේ විධිමත් ලෙස කරන ලද සභාපතිවරයාගේ හෝ කථානායකවරයාගේ හෝ යම් මන්ත්‍රීවරයකුගේ නියමයකට අවනත වීම සිතාමතා පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම."

පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව යෝජිත පනත් කෙටුම්පත් දෙක සම්බන්ධව වෙන් වෙන්ව වාර්තා එවන ලෙස කළ නියෝගයන්ට සිතාමතාම අවනත නොවීම, පැහැර හැරීම, ප්‍රතික්ෂේප කිරීම පැහැදිලිවම සිදු කර තිබෙනවා.

එම "ආ" කොටසේ දෙවන වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "පාර්ලිමේන්තුව විසින් හෝ තත්කාර්ය සඳහා විධිමත් ලෙස බලය දෙනු ලැබූ යම් කාරක සභාවක් විසින් පැමිණීම සඳහා හෝ ලියවිලි, පොත්, වාර්තා හෝ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා හෝ කරන ලද යම් නියමයකට පනතේ 13 වන වගන්තියෙන් හා 15 වන වගන්තියෙන් විධිවිධාන සැලැස්වෙන පරිදි පැමිණීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් නිදහස් කරනු ලැබුවහොත් මිස, සිතා මතා අවනත නොවීම."

පැහැදිලිවම මේ වගන්තිය උල්ලංඝනය කර තිබෙනවා, ඉදිරිපත් කරන ලෙස නියෝග කළ වාර්තා සිතාමතාම ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීමෙන්.

එම "ආ" කොටසේ හතරවන වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "පාර්ලිමේන්තුව තුළ දී හෝ කාරක සභාව තුළ දී හෝ පාර්ලිමේන්තු භූමිය තුළ දී යම් මන්ත්‍රීවරයකුට පහර දීම, නින්දා කිරීම, හෝ සිතාමතා බාධා පැමිණවීම."

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මාගේ කටයුතුවලට චේතනාන්විතව බාධා කිරීමක් සිදු වී තිබෙන බව මා ඉදිරිපත් කළ කරුණු අනුව ඕනෑම කෙනෙකුට අවබෝධ කර ගන්නට පුළුවන්කම තිබෙනවා. කමිටුව වෙන් වෙන්ව වාර්තා ඉදිරිපත් කිරීමට දී ඇති නියෝග පිළිපැදීම පැහැර හැර තිබෙනවා. එය පනතේ දෙවන සහ තුන්වන වගන්ති අනුව දඬුවම් කළ හැකි වරදක්.

හතරවන වගන්තිය උල්ලංඝනය කරමින් මන්ත්‍රීවරයෙකු වශයෙන් මාගේ වගකීම් සහ කාර්යයන් ඉටු කිරීමෙහිදී ඊට චේතනාන්විතව බාධා පැමිණවීම, හිරිහැර කිරීම සහ ඒ තුළින් අවමානයට සහ නින්දාවට ලක් කිරීම සිදු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එබැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස අපගේ වගකීම්, කාර්යයන් බාධාවන්ගෙන්, හිංසාවන්ගෙන් තොරව ඉටු කිරීමට අවශ්‍ය වාතාවරණය ආරක්ෂා කර දීම ගරු කථානායකතුමාගේ පරම වගකීමක් හැටියට මා සලකනවා; විශ්වාස කරනවා. පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරන, අනවශ්‍ය ඉදිරිපත් කිරීමක් සිදු කරන්නට මට කිසිසේත් අවශ්‍ය නැහැ. මේ සිදු කර ඇති අසාධාරණය, මේ වරද කළු-සුදු මෙන් ඉතා පැහැදිලි තත්ත්වයක්. පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වයට, අපක්ෂපාතිත්වයට, ගරුත්වයට ප්‍රශ්නාර්ථයක්, අවමානයක්, කැළලක් සිදු නොවන අයුරින් පාර්ලිමේන්තුවේ කටයුතු සිදුවීම ඉතාම වැදගත්. මේ කාරණයේ ඇති බැරෑරුම් බව සලකමින් මේ කරුණ ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කිරීමට මම කල්පනා කළා. මන්ත්‍රීවරයෙකුගේ කටයුතුවලට අසාධාරණ ලෙසින් බාධා කිරීම්, හිංසා කිරීම්, අගෞරව කිරීම් පිළිබඳව වන මෙවැනි ක්‍රියාදාම මින් ඉදිරියට මේ පාර්ලිමේන්තුව තුළ සිදුවීමට ඉඩ නොතැබීම ගරු කථානායකතුමාගේ වගකීමක් වෙනවා. ඒ නිසා මේ කාරණය වරප්‍රසාද කමිටුවට යොමු කරලා, එම කමිටුව ඉක්මනින් කැඳවා, කාලයට යටපත් වෙන්න ඉඩ නොදී මේ සඳහා සාධාරණත්වය ඉටු කිරීම සඳහා ගත යුතු සියලු පියවර ගන්නා මෙන් ගරු කථානායකතුමාගෙන් මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

වරප්‍රසාද පිළිබඳ එම ප්‍රශ්නය ගරු කථානායකතුමාගේ අවධානය සඳහා යොමු කරනවා.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට මගේ නම නොකිව්වත්, ඒ අදාළ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා මා බව හැඟවෙන ආකාරයට තමයි ගරු ඉම්තියාස් මන්ත්‍රීතුමා කථා කළේ. දින වකවානු අනුව බැලුවාම මෙතුමා මට පූර්වයෙන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු බව ඇත්ත. මම ඊට පසුව ඉදිරිපත් කරපු බවත් ඇත්ත. හැබැයි

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

ඔබතුමා දෙවන වර කියවීම සඳහා ඉල්ලීම කරලා තිබෙන්නේ, 2023 සැප්තැම්බර් මාසයේදීයි, ගරු මන්ත්‍රීතුමනි. ජනවාරි මාසය වෙනකොට අප දෙදෙනාම ඉදිරිපත් කළ පනත් කෙටුම්පත්වල වාර්තා ඇවිල්ලා ඉවරයි. 2023 අවුරුද්ද ආරම්භයේ ඉඳලාම තරුණ නියෝජනය ගෙනෙන්න කියලා අපි හඬ නඟද්දී මෙතුමා නිද්‍රාශීලීව හිටියා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතුමන්ලාගේ ප්‍රධාන තර්කය වුණේ අපි මේකෙන් මැතිවරණය කල් දමන්න හදනවා කියන එකයි. ඇති තරම් මා විවේචනය කරලා, පනත් කෙටුම්පත ඉදිරිපත් කළාට පසුව දැන් වෙන කාරණයක් කියනවා. කමක් නැහැ, අපි දෙගොල්ලන්ම එකතු වෙලා මේ කටයුත්ත කරමු. හැබැයි, මම මහා ලොකු අපරාධයක් කළා, ආණ්ඩු පක්ෂය මහා ලොකු අපරාධයක් කළා කියලා බොරුවට මවන්න එපා. මොකද, නොවැම්බර් මාසයේදී මම කෙටුම්පත ඉදිරිපත් කළත් ජනවාරි මාසය වෙනකොට වාර්තාව ලැබිලා මේ ක්‍රියාවලිය මෙතැනට එනකල් ආවා. හැබැයි, ඔබතුමන්ලා ජනවාරි මාසයේ ඉඳලා සැප්තැම්බර් මාසය වෙනකල් මොකක්ද කළේ? ඔබතුමා පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමට ඉල්ලීම කළේ කවදාද? ඒ ඉල්ලීම කරලා තිබෙන්නේ 2023 සැප්තැම්බර් මාසයේදී. නිකම් අසත්‍ය දේවල් කියන්නේ නැතුව අපි එකතු වෙලා මේ කාර්යය කරමු; ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අසත්‍ය කාරණා කියන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා මේ සභාව සම්පූර්ණයෙන් නොමඟ යවනවා නේ.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රවුෆ් හකීම් මැතිතුමා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම පිළිබඳව මේ මන්ත්‍රීවරු දෙගොල්ලෝ අතර ඇති වෙලා තිබෙන මේ අර්බුදය පිටුපස වෙනත් කාරණාවකුත් තිබෙනවා. අපි එහෙම සැක කරනවා. සාමාන්‍යයෙන් පනත් කෙටුම්පතක් සකස් කිරීම, ඒක ඉදිරිපත් කිරීම, ඒක publish කිරීම වැනි කටයුතුවල ඉඳලා ඒවායේ අඩුපාඩුවලට පිළියම් යෙදීම දක්වා කටයුතු කිරීම සැහෙන්න අමාරු කාර්යයක්. ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමාගේ ඉල්ලීම මෙයයි. එතුමා ඊට කලින් මීට අදාළ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබුණත්, මේ පනත් කෙටුම්පත් දෙකම එකවර යවලා ඉන් පසුව පාර්ලිමේන්තුවේ Legislative Standing Committee එකේ නියෝගය එහි ලේකම්තුමාට දුන්නාට පස්සේ, එතුමා ඒ එක පනත් කෙටුම්පතක් විතරක් යවලා තිබෙන එක පිළිබඳව තමයි ප්‍රශ්නය පැන නැඟිලා තිබෙන්නේ. මෙතැන වක්‍රාකාරව වෙනත් දෙයක් සිදු වෙලා තිබෙනවා. ඒකයි අපට තිබෙන සැකය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. ඒ ගැන හොයා බලන්නම්.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මොකද, ආණ්ඩු පක්ෂයේ වුවමනාවක් තිබුණා, පනත් කෙටුම්පතක් ගෙනැල්ලා පළාත් පාලන මැතිවරණය කල් දමාගන්න. මේක තනිකරම ඒ වුවමනාවෙන් කරපු දෙයක් හැටියටයි අප දකින්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ඔය කාරණය විවාදයක් කරගන්න එපා. ඒ ගැන කාරක සභාවේදී සලකා බලන්නම්.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
වෙන උපක්‍රමයක් හැටියටයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. ඒක තමයි අපට තිබෙන සැකය.

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය මාසයේ ඉන්ධන මිල සංශෝධනය කරන අවස්ථාවේදී වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී ඉල්ලීමක් කළා, සෑම මාසයකම ඉන්ධන මිල සංශෝධනය කිරීමේදී ඊට අදාළ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා. අපි පසුගිය මාසයේත් ඉන්ධන මිල සංශෝධනයෙන් පසුව ඒ වාර්තාව සභාගත කළා. පසුගිය ඔක්තෝබර් පළමුවැනි දා කරපු ඉන්ධන මිල සංශෝධනයෙන් පසු, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේත්, ලංකා අයිඕසී පොදු සමාගමේත්, සිනොපෙක් ලංකා පෞද්ගලික සමාගමේත් ඉන්ධන ආනයනය කිරීමේ, බෙදා හැරීමේ සහ අළෙවි කිරීමේ වියදම් පිළිබඳ සාරාංශ වාර්තාව මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස මම **සභාගත*** කරනවා.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කෙටියෙන් කියන්න, ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය මෙතැන විවාදයක් කරගන්න මට අවශ්‍ය නැහැ. මම අදාළ මන්ත්‍රීවරයාගේ නමවත් සඳහන් කළේ නැත්තේ ද්වේශසහගතව කාටවත් ඇඟිල්ල දිගු කරන්න මට වුවමනා නැති හින්දායි. හැබැයි මෙතැනදී වරදක් වෙලා තිබෙනවාද, මේ කාරණයේදී පාර්ලිමේන්තුව හැසිරිලා

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

තිබෙන විධිය හරිද කියන එක පිළිබඳව ආචාර ධර්ම සහ වරප්‍රසාද කමිටුව වහාම කැඳවලා, සාධාරණ තීන්දුවක් ගන්න. ඒ හැර, මෙතැන වාද විවාද කරලා බොරුවට මඩ ගහගන්න එකේ තේරුමක් නැහැ.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ මන්ත්‍රීතුමා මගේ නම කිව්වේ නැහැ. හැබැයි කවුරුත් දන්නවා, පළාත් පාලන ආයතනවල තරුණ නියෝජනය වෙනුවෙන් ආණ්ඩු පක්ෂයෙන් පනත් කෙටුම්පත් ගෙනාපු මන්ත්‍රීවරයා මම කියලා. දැන් මෙතැන ගැටලුව තිබෙන්නේ-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අපි කාරක සභාවේදී ඒ ගැන කථා කරලා බලමු.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් මේ පුංචි ප්‍රශ්නයක් අහන්නේ. ඔබතුමා නැවත වතාවක් මේ සභාවට කියන්න, ඒ පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමට ඔබතුමා ඉල්ලීම කරලා තිබෙන්නේ කවදාද කියලා? 2023 සැප්තැම්බර් මාසයේ තමයි ඒ ඉල්ලීම කර තිබෙන්නේ. ඔබතුමා ඒකට ප්‍රමාද වෙලා තිබෙනවා. ඔබතුමා ඇයි මේ සභාව නොමඟ යවන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය කථානායකතුමාගේ අවධානයට යොමු කරන්නම්.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
අපි එක්කහු වෙලා මේ කටයුත්ත කරමු. රටේ තරුණ පරම්පරාව වෙනුවෙන් අපි එකතු වෙලා මේක කරමු. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමායි, මමයි එකතු වෙලා මේ කටයුතු කරමු.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)
ගරු මන්ත්‍රීතුමනි, උසාවියේ ප්‍රශ්න අහනවා වාගේ අපෙන් ප්‍රශ්න අහලා වැඩක් නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නේ. ඒ නිසා මේ ගැන කාරක සභාවේදී කථා කරමු.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු ඉම්තියාස් මන්ත්‍රීතුමා, ඔය විධියට අසත්‍ය කියන්න එපා. අපි එකතුවෙලා මේ කටයුත්ත කරමු. මේක කල් දමන්න උත්සාහ කරන්න එපා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමාගේ ක්‍රියා කලාපය තුළින් එතුමා කෙරෙහි ගොඩනැඟුණු ප්‍රතිරූපය ගැන ඔබතුමාත් ඇතුළුව පක්ෂ, විපක්ෂ සියලුදෙනාම දන්නවා. ඒ වාගේම ඒ ගැන මුළු රටේම අය දන්නවා. සියලුදෙනාම තුළ එතුමා පිළිබඳ බොහොම ලොකු ගෞරවයක් තිබෙනවා. එතුමා පාර්ලිමේන්තුවේ කාලය උපයෝගී කරගෙන බොරුවක් කියන්න උත්සාහ කරන්නේ නැහැ නේ. මෙතැන සිදුවෙලා තිබෙන්නේ, එතුමා කරපු යෝජනාව hijack කිරීම. එහෙම කරන්න එපා. Hijack කරන්නේ නැතිව මේවා ගැන කථාබහ කරමු. මොකද, ඒක අපි හැමෝටම වැදගත් වෙන කාරණාවක්.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න. දොලවත්ත මන්ත්‍රීතුමා, ඔබතුමාට කථා කරන්න අයිතියක් තිබෙනවා වාගේම, මටත් අයිතියක් තිබෙනවා. කරුණාකර ඒකට ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ කාරණය විවාදයක් කර ගන්න එපා, කෙටියෙන් අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විවාදයක් කර ගන්න එපා කියලා ඔබතුමා කිව්වාට ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමාගේ ප්‍රතිරූපයට ගරහන ආකාරයේ ප්‍රකාශ කරනවාට අපි විරුද්ධයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා බොහොම හොඳ, සුපිරිසිදු චරිතයක් තිබෙන කෙනෙක්. ඒ නිසා එතුමා ඉදිරිපත් කරපු කාරණාව විභාග කරලා තීන්දුවක් ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම මට තව පොඩි කාරණාවක් කියන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ගරු සභානායකතුමාගෙන් බොහොම නම්‍යශීලීව ඉල්ලීමක් කරන්න කැමැතියි. ඔබතුමාගේ එකඟතාව මත lunch interval සඳහා වෙන්කර ඇති කාලයත් අපි Debate එක සඳහා අරගෙන සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Lunch interval සඳහා වෙන්කර ඇති කාලයත් ලබාගෙන Debate එක ඉදිරියට කරගෙන යාමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි කාරණාවක් කියන්න තිබෙනවා.

"නෙත් FM" රේඩියෝවේ ප්‍රවෘත්ති ප්‍රධානියා වන හේමන්ත කහවලගේ සහ මාධ්‍යවේදීන් වන සචින් රවීෂ, සජ්නා කාවින්දි, පවිත්‍රා මදුහර්ෂණී යන අය අද ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට කැඳවා තිබෙනවා. ඒ මොනවාටද? චේතනාන්විතව බොරු කිව්වා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම පිළිවෙතක් අනුගමනය කරනවා නම්, මට විරුද්ධව කොච්චර මඩ ගහලා තිබෙනවාද? එහෙම නම් කී දෙනෙක් ආචාර ධර්ම සහ වරප්‍රසාද කමිටුවට ගෙන්වන්න ඕනෑද? මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා, මාධ්‍ය නිදහස අහුරන ක්‍රියාවලින්ට යොමු වෙන්න එපා කියලා. මේ Online Safety Bill එකත් ඒ වාගේම ක්‍රියාවලියක්. ඒ නිසා ඒකට ඉඩ දෙන්න එපා. මම ගරු අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා මැදිහත්වෙලා හරි "නෙත් FM" රේඩියෝවේ මාධ්‍යවේදීන් ගෙන්වලා අද නටන්න හදන පිස්සුව, ක්‍රියාත්මක කරන්න හදන පිස්සුව වහාම නතර කරන්න කියලා. මොකක්ද මේ විහිළුව? මාධ්‍ය නිදහසට ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

විපක්ෂ නායකතුමනි, කාරක සභාව කියන්නේ නරක තැනක් නොවෙයි. ඒක කරුණු කාරණා පැහැදිලි කර ගන්න තිබෙන තැනක්. ඒ නිසා ඒ ගැන අවිශ්වාස කරන්න එපා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා මතු කරපු ප්‍රශ්නය ගැන මම පාර්ලිමේන්තුවේදී කිහිප සැරයක්ම කථා කළා. එතැන සිද්ධ වුණේ මෙයයි. ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා ඒ යෝජනාව ගෙනාවා. ආණ්ඩු පක්ෂයෙන් ඒ හා සමාන යෝජනාවක් ගෙනාවේ ඊට මාස 4කට පස්සේ; It was four months later.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ගැන පසුව කථා කරමු. එහෙම නැත්නම් මේක ලොකු විවාදයකට යනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

මෙතැන වෙලා තිබෙන දේ පැහැදිලියි. ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා ඒ යෝජනාව ගෙනාවා. ආණ්ඩු පක්ෂයෙන් ඒ Private Members' Bill එක ගෙනාවේ මාස 4ක් පහුවෙලා. එහෙම මාස 4ක් පරක්කුවෙලා ආපු එක කොහොමද මුලින් ගන්නේ? ඒක මුලින් ගන්න බැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණාව පැහැදිලියි. *[බාධා කිරීමක්]*

ගරු දොලවත්ත මන්ත්‍රීතුමා, අවසාන වශයෙන් කථා කරලා විවාදයකට යන්නේ නැතිව මේ කාරණය අවසන් කරන්න.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

මේ කාරණයට අදාළව කිසිම වෙලාවක කිසිම කෙනෙකුට අගෞරව කරන්න මට අවශ්‍ය නැහැ. හැබැයි, අපේ පැත්තට - ආණ්ඩුව පැත්තට- ඇඟිල්ලක් දිගු කරනවා අපි එතුමාගේ යෝජනාව බලහත්කාරයෙන් hijack කළා කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මටත් ගෞරවයක් තිබෙනවා. අපටත් කිසිම චෝදනාවක් නැහැ, නඩුවක් නැහැ. අපි බොහොම ගෞරව ආකාරයට තමයි මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් හැකියාවක් තිබෙනවා. ඒ නිසා තමයි මම නීතිඥයකු හැටියට, තරුණයකු හැටියට ඒ යෝජනාව ගෙනාවේ. මෙතැන තිබෙන ගැටලුව ඒ යෝජනාව මුලින්ම ගෙනාවේ කවුද කියන එක නොවෙයි. ඒ ක්‍රියාවලියට මාස 6ක් ගත වුණා නම්, ඒ කාලයෙන් පස්සේ නිසි උනන්දුවකින් ක්ෂණිකව දෙවැනි වර කියවීමට ඉදිරිපත් කරන්න ඕනෑ. නමුත් ඒක කළේ නැහැ. ඒ කාරණය මෙතැන හංගනවා. ඒකයි මෙතැන සිදුවෙලා තිබෙන වැරැද්ද.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

කාරණාව පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ ගැන සලකා බලන්නම්.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ගලහ භද්‍රවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පනත් කෙටුම්පත
### கலஹா பத்ரவதி தேசிய பிக்குமார் பராமரிப்பு நிலைய நம்பிக்கைப்பொறுப்பு சட்டமூலம்
### GALAHA BHADDRAWATHIE NATIONAL BHIKKHU CARE CENTRE TRUST BILL

"ගලහ භද්‍රවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.***

***2023 ඔක්තෝබර් 17වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.***

*சுகாதார அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2023 ஒக்ரோபர் 17, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Minister of Health; to be read a Second time upon Tuesday, 17th October, 2023*

*and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත

நிகழ்நிலைக் காப்பு சட்டமூலம்

ONLINE SAFETY BILL

"මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද; ශ්‍රී ලංකාව තුළ සිද්ධියක් පිළිබඳ ඇතැම් ප්‍රකාශ මාර්ගගත ලෙස සන්නිවේදනය කිරීම තහනම් කිරීම පිණිස විධිවිධාන සැලසීම සඳහා ද; තහනම් කාර්ය සඳහා මාර්ගගත ගිණුම් සහ ව්‍යාජ මාර්ගගත ගිණුම් භාවිත කිරීම වැළැක්වීම සඳහා ද; ශ්‍රී ලංකාව තුළ තහනම් කාර්ය සඳහා භාවිත කරනු ලබන මාර්ගගත ස්ථාන හඳුනාගැනීම සඳහා සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; සිද්ධියක් පිළිබඳ අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම සඳහා මුදල් සැපයීම සහ අනෙකුත් ආධාර ලබාදීම මැඩපැවැත්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ මහජන ආරක්ෂක අමාත්‍ය ගරු ටිරාන් අලස් මහතා විසිනි.***

***2023 ඔක්තෝබර් 17වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.***

*பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் மாண்புமிகு டிரான் அலஸ் அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2023 ஒக்ரோபர் 17, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Tiran Alles, Minister of Public Security; to be read a Second time upon Tuesday, 17th October, 2023 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම මම විපක්ෂය වෙනුවෙන් කියන්න ඕනෑ අපි මේ පනත් කෙටුම්පතට විරුද්ධයි කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Just give me a minute, Sir.

මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් විශාල විරෝධතාවක් ඇවිල්ලා තිබෙනවා. අපි ජාත්‍යන්තරව ඉන්නේ විත්ති කූඩුවේ. පොඩ්ඩක් අහගෙන ඉන්න මේක. අපි ජාත්‍යන්තරව ඉන්නේ විත්ති කූඩුවේ. මේ පනත් කෙටුම්පත සම්මත වුණාම, විත්ති කූඩුවෙන් අපි එල්ලුම් ගස්. Internationally, we are already in the dock. අපේ විජයදාස රාජපක්ෂ ඇමතිතුමා ඒක දන්නවා. එතුමා ගිය සැරේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයට ගියා, මේ සැරේ ගියේ නැහැ. මොකද, ගිය සැරේ ගිහිල්ලා එතුමාට එපා වුණා. මේ සැරේ ගියේ නැහැ. ඇමතිවරයා ගියෙත් නැහැ- *[බාධා කිරීමක්]*

අනෙක් කාරණය මේකයි. සන්නිවේදනය කියන විෂය අයිති මාධ්‍යයට නේ. සන්නිවේදනය අයිති මාධ්‍යයට. ඉතින්, පොලීසිය භාර ඇමතිතුමා කොහොමද, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ? මේ විෂය පොලීසියට භාර දීලා. සන්නිවේදනය කියන විෂය පොලීසියට භාර දීලා. කෝ, මාධ්‍ය ඇමතිතුමා සභාවේ නැහැ නේ.

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
සන්නිවේදනය කියන විෂයය අයිති ජනමාධ්‍ය ඇමතිතුමාට. පොලීසිය භාර ඇමතිතුමා කොහොමද, සන්නිවේදන විෂයයට සම්බන්ධ වෙන්නේ? ආණ්ඩුවේ අරමුණ ඒකෙන් පෙනෙනවා. සන්නිවේදනය කියන විෂයය පොලීසියට භාර දෙනවා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජී.එල්. පීරිස් මැතිතුමා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු ටිරාන් අලස් ඇමතිතුමා.

**ගරු ටිරාන් අලස් මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிரான் அலஸ் - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Tiran Alles - Minister of Public Security)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මුලින්ම ක්‍රියා කර තිබුණේ Law Commission එක, මෙතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ. ඒ document එක තමයි Justice Ministry එකේ තිබිලා ඊට පසුව පොඩි-පොඩි adjustments කරලා අපට භාර දීලා තිබුණේ, පනත් කෙටුම්පත ගෙනෙන්න. මේක, 2016දී Law Commission එකෙන් හදපු document එකක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. ගරු ජී.එල්. පීරිස් මැතිතුමනි, ඔබතුමාගේ අදහස කෙටියෙන් දක්වන්න.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශේෂයෙන්ම ගරු අධිකරණ ඇමතිතුමාගේ අවධානයට කාරණයක් යොමු කිරීමට කැමැතියි. එතුමා දන්නවා, මේ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන්න පුළුවන් වන්නේ සති දෙකක කාලයක් තුළ බව. සති දෙකයි. ඒ සති දෙක ආරම්භ වෙන්නේ අද සිට නොවෙයි. ගරු ටිරාන් අලස් ඇමතිතුමා අද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ පළමුවර කියවීම මේ ගරු සභාවට ඉදිරිපත් කළා. හැබැයි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, පනත් කෙටුම්පතක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට යා හැකි සති දෙකක කාලය ආරම්භ වන්නේ එම පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් කළ දා සිටයි. අපේ ගරු සභානායකතුමාත් ඒක හොඳින් දන්නවා. ඒ අනුව මේ පනත් කෙටුම්පතට අදාළව ඒ සති දෙකේ කාලය ආරම්භ වන්නේ අද නොවෙයි. කවදාද, මේ පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් කළේ? ඒ, ගිය බදාදා, ඒ කියන්නේ සැප්තැම්බර් 27වන දා. එතකොට 28, 29, 30 සහ ඔක්තෝබර් 01 කියන දවස් හතරම නිවාඩු දින. සාමාන්‍ය සම්ප්‍රදාය අනුව නම්, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට පනත් කෙටුම්පතක් ඇතුළත් කරන්නේ සිකුරාදා දවසකයි, බදාදා නොවෙයි. එතකොට අර නිවාඩු පෙළ තිබුණේ නැත්නම් මේ පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ 29 වැනි දා. හැබැයි, ඇත්තවශයෙන්ම ඇතුළත් කළේ 27 වැනි දා. ගරු සභානායකතුමනි, මේකේ ප්‍රතිඵලය කුමක්ද?

මේ රටේ ඕනෑම පුරවැසියෙකුට මෙවැනි පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න අයිතිය තිබෙනවා. මමත් ශ්‍රේෂ්ඨාධිකරණයට යනවා. හැබැයි, දැන් අර සති දෙකේ කාලය සතියක් දක්වා අඩු වෙලා තිබෙනවා. මම මේ කාටවත් චෝදනා කරනවා නොවෙයි. මේක කවුරුවත් චේතනාන්විතව කරපු දෙයක් නොවෙයි. මේ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කිරීමට සති දෙකක කාලයක් තිබිය යුතුයි. ඒක අනිවාර්යය අයිතිවාසිකමක්, අපි සියලු දෙනාගේම. හැබැයි, නිවාඩු දින හතරක් තිබුණු නිසා අවසාන ප්‍රතිඵලය තමයි ඒ සති දෙකේ කාලය දැන් සතියකට අඩු වෙලා තිබෙන එක. ඒක මම දකින්නේ ඉතාම අසතුටුදායක දෙයක් හැටියටයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා සඳහන් කළ පරිදි මේ පනත් කෙටුම්පතට අදාළ කාරණය සම්බන්ධයෙන් ජාත්‍යන්තරයේ විශාල උනන්දුවක්, උද්‍යෝගයක් තිබෙනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පත සම්බන්ධව ඒ අයගේ විශාල විරෝධයක් තිබෙනවා. මම හොඳහැටි දන්නවා, නීතිඥ සංවිධාන, සිවිල් සංවිධාන මේ පනත් කෙටුම්පත අනිවාර්යයෙන්ම අභියෝගයට ලක් කරනවා,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඒවා ගැන නොවෙයි, මම කියන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණයට යෑමට සති දෙකක කාලයක් තිබෙන්න ඕනෑ. අවසාන තීරණය දෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය. ඉතින් ඒ සති දෙකක කාලය මේ විධියට එක සතියකට අඩු කිරීම ඉතාම අසාධාරණයි, අසතුටුදායකයි කියන මතය තමයි මම ප්‍රකාශ කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අධිකරණ ඇමතිතුමා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළාට පසුව ඒක ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කිරීම සඳහා අවශ්‍ය කාල පරාසය සති දෙකක් තිබියදී, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ඒ කාල සීමාව සතියකට අඩු කරන්න මෙතුමා -ගරු ජී.එල්. පීරිස් මැතිතුමා- අමාත්‍ය ධුර දරපු කැබිනට් මණ්ඩලයෙන් තීන්දුවක් ගත්තා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒකට එකඟ වුණා නේ. ඔබතුමා තමයි ඒ පක්ෂයේ මහ ලේකම් සහ නීති විශාරදයා. එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සියල්ල කළේ ඔබතුමාගෙන් අහලා. ඔබතුමා දවස් 7කට ඒක අඩු කළේ නැද්ද? කළා නේ. ඒක අපි දින 14 කළා. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන කොට ඔබතුමන්ලා සහයෝගය දුන්නා. අපි ඒක අගය කරනවා. ඒකට ස්තුතියි. ඒක හොඳ ලක්ෂණයක්. ඔබතුමන්ලා හකුළපු ප්‍රජාතන්ත්‍රවාදය තමයි අපි පුළුල් කළේ, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න. පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝග කරන්න දැන් දින 14ක් තිබෙනවා. පනත් කෙටුම්පතක් න්‍යාය පත්‍රයට ඇතුළු කළාට පස්සේ තිබෙන ඒ දින 14න් එක දිනයක්වත් අපි කපන්නේ නැහැ. ආණ්ඩුවට කපන්නත් බැහැ. ඒ දින 14 නියම විධියට ශ්‍රේෂ්ඨාධිකරණය ගණනය කරලා ඒ ඉදිරිපත් කරන පෙත්සම් විභාගයට ගනීවි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණය මෙයයි. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා, මේ පනත් කෙටුම්පතෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙනවා, නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම සීමා වෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ඕනෑ වුණත්, ආණ්ඩුවට ඕනෑ වුණත් එහෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සීමා ඉක්මවලා, කඩාගෙන ගිහිල්ලා අපට මේ පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් සම්මත කරන්න බැහැ. ඒකට අවශ්‍ය ආරක්ෂණය - safeguard එක - තමයි 121 වන ව්‍යවස්ථාව යටතේ දීලා තිබෙන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වොත් මේකේ තිබෙන ඔක්කෝම වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවා කියලා, ඔක්කෝම අයින් කරන්න වෙනවා. මේක අපි ගන්න තීන්දුවක් නොවෙයි. මිනිසුන්ගේ අයිතිවාසිකම් කොහොමද උල්ලංඝනය වෙන්නේ, මොන ප්‍රමාණයටද මේ නීති ගෙනෙන්න පුළුවන් කියලා බලලා අවසානයේ ශ්‍රේෂ්ඨාධිකරණය දෙන තීන්දුවට අනුවයි අපි කටයුතු කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජී.එල්. පීරිස් මැතිතුමනි, දින 14ක කාලයේ වෙනස් වීමක් සිදු වන්නේ නැහැ. අද දින සිට තමයි දින 14 ගණනය වෙන්නේ. *[බාධා කිරීමක්]*

ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය මොකක්ද?

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම අද බොරු බිල්ලෙක් මවන්න උත්සාහ කරනවා. ජී.එල්. පීරිස් මැතිතුමා

ආණ්ඩුව පැත්තේ ඉන්න කොට කියපු දේ නොවෙයි අද අනික් පැත්තට ගිහිල්ලා කියන්නේ. අපි දැක්කා, ගොඩාක් මැති-ඇමතිවරු ආණ්ඩුව පැත්තේ ඉන්න කොට කියන දේවල් නොවෙයි අනික් පැත්තට ගියාම කියන්නේ. නමුත් සමාජ මාධ්‍ය නිර්මාණය කරපු සමාගම් පවා තුෂ්ණීම්භූත වෙලා ඉන්නවා, විශාල සමාජ විනාශයක් වන නිසා. මිනිසුන්ගේ භාෂණයේ නිදහස ආරක්ෂා කරමින් මේ කරන කාරණය පිළිබඳව වැරදි මත හදන්න එපා කියන එකයි මම මේ අවස්ථාවේදී කියන්නේ.*[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජී.එල්. පීරිස් මැතිතුමා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා වගකීමෙන් කියනවාද, සති දෙකක කාලය ආරම්භ වෙන්නේ අද සිට කියලා? මගේ වැටහීම තමයි, සති දෙකක කාලය-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මට ඒ සම්බන්ධයෙන් උපදෙස් ලැබුණා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඔබතුමා වගකීමෙන් කියනවා ද, "සති දෙකේ කාලය ආරම්භ වෙන්නේ අද සිට. එම නිසා මෙම පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කිරීමට ඕනෑම පුරවැසියෙකුට අද සිට සති දෙකක් තිබෙනවා" කියලා?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අද දින සිට තමයි දින 14 ආරම්භ වෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී කථා වුණා ආණ්ඩුව පැත්තේ ඉන්න කොට එකක් කියනවා, විපක්ෂයට ගියාම තව දෙයක් කියනවා කියලා. මම අහන්න කැමැතියි, අද ජනාධිපතිතුමා ළඟට ගිහිල්ලා දණින් වැඳ වැටෙන ඒ පැත්තේ ඉන්න අය එතුමාට කිව්වේ නැද්ද, මහ බැංකු හොරා කියලා? "මහ බැංකු හොරා අපට එපා. මහ බැංකු හොරා සම්පූර්ණයෙන්ම පරාජය කරන්න" කිව්වේ නැද්ද? එහෙම කිව්වේ නැද්ද? එහෙම "මහ බැංකු හොරා" කියලා දැන් ගිහිල්ලා එතුමා ළඟ දණින් වැටිලා "ශ්‍රීමත් අතිගරු ජනාධිපතිතුමනි" කියනවා. මොනවාද මේ දිව දෙකේ කථා?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ ගැන වාද කළා ඇති.*[බාධා කිරීමක්]* ගරු මධුර විතානගේ මැතිතුමා.

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
ඒ "බැංකු හොරා" කතන්දරය කිව්වාට, "footnote කල්ලියේ" අයත් ඔය පැත්තේ ඉන්නවා. ඒ නිසා මම විපක්ෂ නායකතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඒ "footnote කල්ලියේ" විස්තරත්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජී.එල්. පීරිස් මැතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121වන ව්‍යවස්ථාව කියවන්නද? ඔබතුමා මට වඩා හොඳට ඒ ගැන දන්නවා නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
121 වන ව්‍යවස්ථාවේ ඒක තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "ඉහත කී පරිදි වූ එවැනි යම් ප්‍රශ්නයක් පිළිබඳව සාමාන්‍යයෙන් තීරණය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති අධිකරණ බලය අග්‍ර විනිශ්චයකාරවරයා අමතා ජනාධිපතිවරයා විසින් යවනු ලබන ලිඛිත යොමු කිරීමක් මගින් නැතහොත් ශ්‍රේෂ්ඨාධිකරණය අමතා කවර වූ හෝ පුරවැසියකු විසින් යවනු ලබන ලිඛිත පෙත්සමක් මගින් ක්‍රියාත්මක කරවා ගත හැක්කේ ය. ඒ යොමු කිරීම හෝ පෙත්සම ඉදිරිපත් කිරීම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ තැන් පටන් [දින දාහතරක් ඇතුළත] කළ යුතු වන්නේ ය. තව ද, ඒ යොමු කිරීමේ නැතහොත් පෙත්සමේ පිටපතක් ඒ අවස්ථාවේ දී ම කථානායකවරයාට භාර දිය යුත්තේ ය. මේ අනුව්‍යවස්ථාවෙහි "පුරවැසියා" යන්නට සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නා වූ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක් ඇතුළත් වේ."

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඔබතුමා කියවපු එම අනුව්‍යවස්ථාවේ එය බොහොම පැහැදිලිව සඳහන්ව තිබෙනවා නේ. "න්‍යාය පත්‍රයට ඇතුළත් කරපු දවසේ සිට" කියලා නේ තිබෙන්නේ. කවදා ද මේ පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් කළේ? ගිය බදාදා; 2023 සැප්තැම්බර් 27වැනි දා. එතකොට, එදා සිට තමයි ඒ සති දෙකක කාලය ගණනය කළ යුතු වෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජී.එල්. පීරිස් මන්ත්‍රීතුමනි, අද දිනය තමයි පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ඇතුළත් කළ දිනය හැටියට සැලකෙන්නේ.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
හැබැයි ඔබතුමා කියවපු එම අනුව්‍යවස්ථාවේ පැහැදිලි අර්ථය මම ඉහතින් කී අදහසයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, ගරු මන්ත්‍රීතුමා. අපි හදන න්‍යාය පත්‍රය මුද්‍රණය කරන දවස නොවෙයි ගන්නේ. අද තමයි අප මේ න්‍යාය පත්‍රය මුල් වතාවට සාකච්ඡා කරන්නේ. එම නිසා අද තමයි පළමු දිනය.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඒ මතය මම පිළිගන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ පිළිබඳ විවාදයක් අවශ්‍ය නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, එය අධිකරණයේදී සාකච්ඡා කළ හැකියි.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
අපේ විරෝධය ප්‍රකාශ කරනවා. මොකද, මේ විධියේ පනත් කෙටුම්පතක් අභියෝගයට ලක් කරන්න ඒ සති දෙකක කාලය තිබෙන්න ඕනෑ. ඉස්සෙල්ලා තිබුණු තත්ත්වය වෙනම එකක්. වර්තමානයේ පවතින නීතිය නේ අපි අද ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ නිසා ඒ කාලය අඩු වීම-

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද සාකච්ඡා කරන්නේ, අද දින න්‍යාය පත්‍රය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාරණය පැහැදිලිව සඳහන්ව තිබෙනවා නේ. එතකොට, න්‍යාය පත්‍රයට ඇතුළත් වූ දිනය කියන්නේ, අද දිනය. අද දිනයේ සිට දින 14ක් තිබෙනවා. කිසිම අවුලක් නැහැ.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දොලවත්ත මන්ත්‍රීතුමා, ඉක්මනින් අවසන් කරන්න. මේ කාරණය සම්බන්ධයෙන් ගත්තු කාලය වැඩියි.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මතකයි "ශ්‍රීමත්", "අතිගරු" වාගේ ගරු වචන අපි ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමාට කියපු බව. අපි එතුමාට තමයි එහෙම කිව්වේ. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අපි එතුමාට ගරු කළා. "ශ්‍රීමත්", "අතිගරු" කියලා අප එතුමාට කියන්න සුදුසුයි. ඒ කාලයේ ඉතින් අපිත් කිව්වා. එහෙම කියපු බව අහලාත් තිබෙනවා.

අනෙක් කාරණය මෙකයි. ඒ දින 14 ගණනය කිරීම පිළිබඳව අපි විවාදයකට යන්න අවශ්‍ය නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) අනුව්‍යවස්ථාවේ ඒ කාරණය නිවැරදිව ඇතුළත් කර තිබෙනවා. න්‍යාය පත්‍රයට ඇතුළත් කළ දින සිට, එනම් අද දින සිට දින 14ක් ඇතුළත කියන කාරණය පැහැදිලියි. පාර්ලිමේන්තුව දැන් එය පිළිගන්නවා. අද තමයි එම පනත් කෙටුම්පත ගෙන එන්නේ. ඒ නිසා ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමනි, මෙහි ගැටලුවක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කථානායකතුමා වෙනුවෙන් දැන් ඔබතුමා මූලාසනය දරන්නේ. ඔබතුමාට බලය තිබෙනවා. ඔබතුමා ප්‍රකාශයක් කළා, "අද දින සිට දින 14ක්" කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රධාන වැඩකටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
## குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
## CIVIL PROCEDURE CODE (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව න්‍යාය පත්‍රයේ විෂය අංක 2, 3 සහ 4 දරන යෝජනාද මා ඉදිරිපත් කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විවාදය ආරම්භ කිරීම, ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 30ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.22]

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ විෂයයන් හතරක් යටතේ මා පනත් සංශෝධන, නියෝග සහ නියමයක් ඉදිරිපත් කර තිබෙනවා. මුලින්ම 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 29අ(2) වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද නියමය පිළිබඳව කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණවල, විශේෂයෙන් සිවිල් අධිකරණවල ගොඩගැසී තිබෙන, ප්‍රමාද වී තිබෙන නඩු කටයුතු අවසන් කිරීම සඳහා පසුගිය වකවානුව තුළ අපි පියවර ගණනාවක් ගත්තා. ඒවායෙන් එකක් තමයි, සුළු හිමිකම් අධිකරණය අලුතින් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම. සුළු හිමිකම් අධිකරණ මූල්‍ය සීමාව නියම කිරීම සඳහා අමාත්‍යවරයාට තිබෙන බලතල යටතේ එහි උපරිම සීමාව ලෙස රුපියල් ලක්ෂ 20ක මුදලක් මෙම අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අපි නියම කර තිබෙනවා. ඒ අනුව මින් ඉදිරියට දිසා අධිකරණවල පැවරිය යුතු මිලියන 2කට අඩු නඩු කටයුතු සුළු හිමිකම් අධිකරණයේ පැවරීම සඳහා පියවර ගෙන තිබෙනවා.

ඊළඟට, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 205 වගන්තියට අපි සංශෝධනයක් ඉදිරිපත් කරනවා. ඒ සංශෝධනය ඉදිරිපත් කරන්න හේතුව මා කියන්නම්. සිවිල් අධිකරණවලට එන පාර්ශ්වකරුවන් දීර්ඝ කාලයක් තිස්සේ විශාල කාලයක් ගත කරලා වාගේම විශාල වියදමක් දරලා අවසානයේ නඩු තීන්දුව දුන්නාට පසුව, නඩු තීන්දුව ලබා ගැනීම සඳහාත් අද කාලයේ හැටියට විශාල මුදලක වියදමක් දරන්න සිදු වෙනවා. ඒ නිසා මේ සංශෝධනය මඟින් කරන්නේ, ඒ නඩුවල පාර්ශ්වකරුවන්ට තමන්ගේ නඩුවේ අවසාන තීන්දුව සහ තීන්දු ප්‍රකාශය ගෙවීමකින් තොරව ලබා ගැනීමට අවස්ථාව ලබා දීමක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ එක්කම, සමහර පාර්ශ්වයන්ට නඩුවල පිටපත් ලබා ගැනීමේ ගැටලු තිබෙනවා. මොකද, ඒ පිළිබඳ නීතිය පැහැදිලි නැති නිසා. මේ මඟින් අපි ඒ පිළිබඳ නීතිය පැහැදිලිව සම්පාදනය කරලා අයිතිවාසිකමක් විධියට ඒවා ලබා දෙනවා වාගේම පෞද්ගලික නඩු කටයුතු සම්බන්ධව, එනම් වෛවාහික, දරුවන්ගේ භාරකාරත්වය - adoption - යනාදිය පිළිබඳ නඩුවලදී පෞද්ගලිකව තබාගත යුතු තොරතුරු ඕනෑම කෙනෙකුට මුදල් ගෙවලා සහතික පිටපත් විධියට ලබා ගැනීමට තිබෙන අවස්ථාව සීමා කර තිබෙනවා.

තුන්වෙනුව අපි ඉදිරිපත් කරනවා, මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙමඟින් බලාපොරොත්තු වෙන්නේ, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත, පළාත් සභා ඡන්ද විමසීම් පනත සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යන පනත්වලට මූලික වශයෙන් සංශෝධන දෙකක් ගෙනෙන්න. මේ පනත් යටතේ යම් තැනැත්තෙකු වරදකරුවෙකු බවට ඔප්පු වුණොත් දඩ වශයෙන් ගෙවන්න තිබෙන්නේ රුපියල් 50ක්, රුපියල් 100ක් වාගේ ඉතා සුළු මුදල් ප්‍රමාණයක්. ඒ නිසා වරදේ ස්වභාවය අනුව අපි ඒ මුදල රුපියල් 50,000, රුපියල් 100,000 යනාදී වශයෙන් වෙනස් කරන්න මේ පනත් තුනට අදාළවම සංශෝධන ඉදිරිපත් කළා. ඒක එක සංශෝධනයක්. ඒ එක්කම, වර්තමාන නීතියේ පවතින විධියට ඔය කියපු පනත් තුන යටතේම යම් කෙනෙකු මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරනවා නම්, ඒ පෙත්සම ඉදිරිපත් කළ යුත්තේ දවස් 21ක කාල සීමාව තුළදීයි. හැබැයි, අපි පනතක් පාර්ලිමේන්තුවේ සම්මත කරගත්තා. ඒ පනත තමයි, 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත. ඒ අනුව, මැතිවරණයකට ඉදිරිපත් වන අපේක්ෂකයන්, පක්ෂ සහ සංවිධාන දැරිය හැකි උපරිම වියදම් ප්‍රමාණය අපි සීමා කර තිබෙනවා. එතකොට ඒ මුදල් ප්‍රමාණය ඉක්මවා හෝ එමඟින් තහනම් කළ ආයතනවලින් මුදල් ලබාගෙන වියදම් කර තිබෙනවා නම්, ඒවා සොයා ගැනීමේ ක්‍රමවේදයක් විධියට මැතිවරණය අවසන් වෙලා දින 21ක් ඇතුළත දිවුරුම් ප්‍රකාශයක් මඟින් ගිණුම් ප්‍රකාශන මැතිවරණ කොමිෂන් සභාවට ලබා දිය යුතුයි. එතකොට ඒවායින් ලැබෙන තොරතුරුත් එක්ක අගතියකට පත් යම්කිසි පාර්ශ්වයකට මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන්න වුවමනා නම් ඒ සඳහා කාල ප්‍රමාණය මදි. ඒ නිසා ඒ කාල ප්‍රමාණය මේ පනත් හතරටම අදාළව දින 21 වෙනුවට දින 42 දක්වා වැඩි කිරීමට කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හතරවෙනි කාරණය විධියට, 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 4වන වගන්තියේ 2වන උපවගන්තියට අදාළව සමථකරුවන් ලෙස පත් කරනු ලබන තැනැත්තන්ගේ සුදුසුකම් පිළිබඳ නිර්ණායක මේ නියෝග මඟින් ඉදිරිපත් කර තිබෙනවා. මම විශ්වාස කරනවා, මේ පාර්ලිමේන්තුවේ සියලු ගරු මැති ඇමතිතුමන්ලාගේ සහයෝගය ඇතිව මේ පනත් කෙටුම්පත්, නියෝග සහ නියමය පාර්ලිමේන්තුවේදී සම්මත කරගන්න හැකියාව ලැබෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන් මම බලාපොරොත්තු වුණේ අද දිනයේ මේ කථාව ගරු කථානායකතුමා ඉදිරියේ කරන්නයි. නමුත්, මේ අවස්ථාවේදී එතුමා මූලාසනයේ නොසිටියත් මෙහි තිබෙන වැදගත්කම නිසා ඔබතුමා ඉදිරියේ මම මේ කථාව කරනවා. මොකද, අද උදේත් පක්ෂ විපක්ෂ දෙපර්ශ්වයෙන්ම කියැවුණා -ගරු විපක්ෂ නායකතුමාත් කිව්වා- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පත් කිරීම් පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒක ඇත්ත, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දූෂණ විරෝධී පනත, අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ ඉතාම වෙහෙසකර ක්‍රියාවක යෙදිලා, එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියටත් අනුකූල වන පරිදි සකස් කරලා, ජාත්‍යන්තර විශේෂඥයන් පවා කියවා බැලුවාට පස්සේ තමයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා බොහෝ බාධා මැද්දේ අප විසින් සම්මත කරගනු ලැබුවේ. පක්ෂ, විපක්ෂ දෙපැත්තෙන්ම ඒවාට බාධා තිබුණා. ඒ බාධා තිබුණා වුණත් අපි ඒක සම්මත කරගත්තා, මේ රටේ සියලු ජනතාවගේ ජයග්‍රහණයක් සනිටුහන් කරමින්. එහිදී අප මූලික වශයෙන් ඉංග්‍රීසි භාෂා කෙටුම්පත තමයි අධ්‍යයනය කරලා, නිවැරදි කරලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. සාම්ප්‍රදායික ක්‍රමයට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් එය සිංහල භාෂාවටත්, දමිළ භාෂාවටත් පරිවර්තනය කරලා ඉදිරිපත් කළා. සිංහල භාෂා පිටපතේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" වෙනුවට සමහර ස්ථානවල "ව්‍යවස්ථාදායක මණ්ඩලය" කියලා යෙදිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාත් මතු කළා, මේ පත් කිරීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා කියන කාරණය. මේ පත් කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින් තැනැත්තකු පත් කිරීම සභාවේ නිර්දේශය මත හැර, කරනු නොලැබිය යුත්තේ ය."

ඊට පස්සේ කියනවා, ඒ නිර්ණායක මොනවාද, කවුද ඒකට පත් කරන්න පුළුවන් කියලා. ඊට පස්සේ උපලේඛනය තිබෙනවා. උපලේඛනයේ (ඊ) යන්නෙහි තිබෙනවා, "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව" කියලා. ඒ වාගේම, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව තමයි සියලු අණ පනත් අර්ථ නිරූපණය -නිර්වචනය- කරන්න පුළුවන් වෙන්නේ. මෙම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම සම්බන්ධව දූෂණ විරෝධී පනතේ 4 වැනි වගන්තියේ තිබෙනවා. ඒක විපක්ෂ නායකතුමාත් කියෙව්වා. ඒකේ තිබෙන්නේ කොහොමද? "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පහත දැක්වෙන තැනැත්තන් අතුරින්..." යනුවෙන් එහි සඳහන් කරලා තිබෙනවා. ඒක නිසා බොහොම පැහැදිලියි, ඒ සාමාජිකයන් පත් කළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා ]

අනුමැතිය ඇතිව බව. අපි පිළිගන්නවා, සිංහල පරිවර්තනයේ දී ඒ නමේ වෙනසක් සිද්ධ වෙලා තිබෙනවා කියලා. එය වෙනස් කිරීම සඳහා අපි පියවර අරගෙන තිබෙනවා. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන මුඛ්‍ය නීතිය යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කළ යුතුයි.

මේ දූෂණ විරෝධී පනත් කෙටුම්පත සම්මත කරද්දි අපට ප්‍රශ්න විශාල සංඛ්‍යාවක් තිබුණා, මේ නිශ්චිත කාල සීමාව තුළ ඒ අවශ්‍ය යටිතල පහසුකම් හා ක්‍රමය හදා ගන්න පුළුවන්ද කියලා. ඒ නිසා මේ දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කිරීම සඳහා අපි කාලය ගත්තා, මාස 18ක කාලයක් ඇතුළත ඇමතිවරයාට බලය දීලා මෙය ගැසට් පත්‍රයේ පළ කරලා ක්‍රියාත්මක කරන්න. මම හිතන විධියට මේ පනත් කෙටුම්පත සම්මත කරලා ගරු කථානායකතුමා අත්සන් කළේ අගෝස්තු 08වැනි දා. හැබැයි, අපි මාස එකහමාරකටත් අඩු කාලයකදී, සැප්තැම්බර් මාසයේ 15වැනි දා වෙනකොට මේ දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කළ යුතුයි කියලා ගැසට් පත්‍රයේ පළ කරලා තිබෙනවා. අද වෙනකොට මේ පනත ක්‍රියාත්මකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා විධියට ගරු කථානායකතුමාට මම ඒ පිළිබඳ ලිපියක් යැව්වා. ඒ තමයි මේ පිළිබඳව ක්‍රියා කරන්න, ඒ සාමාජිකයන් පත් කරන්න කියලා. මම එක ඉල්ලීමක් කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීමේදී ස්වාධීන බවක් නැති බවට සමහරු තර්ක කළා. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට උඩින් අලුත් මණ්ඩලයක් පත් කරන්න කියලා යෝජනා කළා. අපි ඒකට එකඟ වුණේ නැහැ. මොකද, අපි කටයුතු කළ යුත්තේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සන්දර්භය ඇතුළත පමණයි. නමුත්, අපි පොරොන්දුවක් දුන්නා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් ඒ උදවිය පත් කරනකොට වුණත්, ඒකට අදාළ නිර්ණායක හා රෙගුලාසි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගන්න කටයුතු කරනවා කියලා. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට තිබෙන බලයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] took the Chair.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ බලය තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට. හැබැයි, අපි සූදානම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඒ කටයුතු සාර්ථකව කර ගන්න උදවු කරන්න. දැන් තර්කයක් මතු වෙලා තිබෙනවා, මේ සංශෝධන කරනතුරු මොනම හේතුවක් නිසාවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කරන්නේ නැහැ කියලා. ඒ කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පැහැදිලිව කියනවා, ඒ උදවිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවා කියලා. අධ්‍යක්ෂ ජනරාල් පත් කිරීමේ වගන්තියේ ඉඳලා කිහිපයක, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" වෙනුවට "ව්‍යවස්ථාදායක මණ්ඩලය" කියලා තිබෙනවා. ඒක ඇත්ත, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි. ඒ භාෂා පරිවර්තනයේ වෙනසක් තිබෙනවා. අපි ඒක හදනවා. හැබැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුනෙන්ම බලය දීලා තිබෙනවා, සාමාජිකයන් පත් කරන්න. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ආණ්ඩුවත් ඉන්නවා; විපක්ෂයත් ඉන්නවා; සුළු පක්ෂත් ඉන්නවා. සිවිල් සමාජයේ උගත්, වැදගත්, බුද්ධිමත් වෘත්තිකයන් හා අධ්‍යාපනඥයින් ඉන්නවා. ඒ උදවියට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තේරෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොතේරෙන කෙනෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්න බැහැ. එතකොට මේ දූෂණ විරෝධී පනතේ සිංහල භාෂාවෙන් තිබෙන පිටපතක් අපි ඒ ගැන විවාද කරන්න මාස ගණනකට කලින් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225දෙනාටම බෙදුවා. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමන්ලා ඔක්කොම ඇවිල්ලා තිබෙන්නේ එක දෙයකට. අපි ඔක්කොම ව්‍යවස්ථා සම්පාදකයෝ. ඒ වාගේම රටේ මූල්‍ය කළමනාකරණය, මූල්‍ය පාලනය පිළිබඳව වගකීම දරන්නෝ. එහිදී විපක්ෂයෙනුත් වැඩකට ඇති සහ වැඩකට නැති සංශෝධන ලැයිස්තුවක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේ අපට කවුරුවත් මේ තිබෙන වරද පෙන්වා දුන්නේ නැහැ. අපි මේ මන්ත්‍රීතුමන්ලා පිට වරද පටවනවා නොවෙයි. හැබැයි, හැමෝටම වගකීමක් තිබෙනවා. පක්ෂව හෝ විපක්ෂව අත උස්සන්න පෙර මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් කියවලා බලලා ඒවායේ අඩු පාඩුවක්, වැරැද්දක් තිබෙනවා නම් පෙන්වා දෙන්න ඒ ගොල්ලන්ටත් වගකීමක් තිබෙනවා. එහෙම පෙන්වා දුන් අඩු පාඩු ඔක්කෝම අපි හැදුවා, නිවැරදි කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් ප්‍රශ්නයක් තිබෙනවා. ව්‍යවස්ථාදායක සභාව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව පත් කරන්නේ නැත්තේ ඇයි? පවතින කොමිසමට විශාල චෝදනාවක් තිබෙනවා, අපිත් ඒක පිළිගන්නවා. ඒ තමයි දේශපාලන පත්වීම්. ඒ, විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ කළ දේශපාලන පත්වීම්. මේ කොමිසමට දාපු පැමිණිලි දහස් ගණනක් ගොඩ ගැහිලා තිබෙනවා. සමහර ඒවා ඉදිරිපත් කරලා ඉල්ලා අස් කර ගන්නවා. ඉල්ලා අස් කර ගත්තාට පස්සේ සමහර ඒවා ආපහු file කරනවා, සමහර ඒවා එහෙම file කරන්නේ නැහැ. ඒ පිළිබඳ විශ්වාසයක් නැති නිසා තමයි අලුත් ක්‍රමයක් හැදුවේ. මේ රටේ ජනතාව ඉල්ලුවේ මොකක්ද? ජනතාව system change එකක් ඉල්ලුවා. System change එක ගෙනෙන්න පටන් ගත්ත ආණ්ඩුවට ඒක කරන්න බැරි වුණා. ඒ ආණ්ඩුව ගෙදර යවන තැනට මේ රටේ ජනතාව පෙළගැහුනා. හරි හෝ වැරදි හෝ මේ රටේ මහජන විප්ලවයක් සිදු වුණා. එහෙම වුණාට පසු අපි අලුතින් වගකීමක් භාර ගත්තා. ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ ඡන්දයෙන් ජනාධිපති වෙලා අපි අමාත්‍යවරු විධියට යම් වගකීමක් භාර ගත්තා. යම් වගකීමක් නොවෙයි, අපි කාගේ වුණත් ඔළුවකට ඔරොත්තු නොදෙන වගකීමක් ගත්තා. අපි භාර ගන්නකොට ඔය භාණ්ඩාගාරයේ එක ඩොලරයක්වත් තිබුණේ නැහැ. එහෙම නේද, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි? එක ඩොලරයක්වත් නැති භාණ්ඩාගාරයක් තමයි අපි භාර ගත්තේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔක්කොම විස්තර හංගලා තිබුණේ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඔව්, හංගපුවත් මම දැන් එළියට දානවා.

ඒ කාලයේ පැය 13ක් ලයිට් කපනවා. අපට දවස් 5ක් විතර පෙට්‍රල් පෝලිමේ, ඩීසල් පෝලිමේ, ගෑස් පෝලිමේ ඉන්න වුණා. එහෙම තිබුණු රටක් භාර අරගෙන අපි අද වෙනකොට ආහාර උද්ධමනය ඍණ අගයක් දක්වා ගෙනැල්ලා තිබෙනවා. ඒක ආණ්ඩුව තනියම කළා කියනවා නොවෙයි. රටේ සියලු ජනතාවගේ දායකත්වය ඇතිව තමයි ඒක කළේ. අපේ ගොවි මහත්වරුන්ගේ නිෂ්පාදන වැඩි කරලා, නිර්යාතකයන්ගේ - exportersලාගේ - ආදායම වැඩි කළා. මේ රටට සංචාරකයෝ ගෙනාවා. විදේශ රටවල ඉන්න අපේ ජනතාව ඒ ගොල්ලන්ගේ remittances මේ රටට එවලා -ඒ ඔක්කෝම කරලා- අද මේ රට හුස්ම ගන්න පුළුවන් තැනකට ගෙනැල්ලා තිබෙනවා. IMF එකෙන්, World Bank එකෙන් ආපු කණ්ඩායම් පවා අපට කියපු දේ තමයි පසුගිය වකවානුවේ වැටුණු රටවල් තිහ හතළිහ අතරින් අවුරුද්දක් වාගේ කාලයක් තුළ ආර්ථිකය මේ මට්ටමට ගන්න පුළුවන් වුණු එකම රට ශ්‍රී ලංකාව කියලා. ඉතින්, ඒක අපි සතුටු වෙන්න ඕනෑ කාරණයක්. දේශපාලන ඉලක්ක තියාගෙන ඒවා විවේචනයට ලක් කළාට කමක් නැහැ, අපට ඒක ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, අපි කොච්චර මහන්සි වෙලාද ප්‍රතිඵල අත්පත් කර ගත්තේ කියන කාරණය මේ රටේ ජනතාව දන්නවා.

එතකොට මේ අල්ලස, දූෂණය හැමෝටම එපා. අපි ඒවාට විරුද්ධයි. අපි මේ ක්‍රමය වෙනස් කරන්න නේ අවේ. අපි ක්‍රමය වෙනස් කළා. මේ පවතින ක්‍රමය, දූෂිත ක්‍රමය නතර කර ප්‍රශස්ත ප්‍රජාතන්ත්‍රවාදයක්, විනිවිදභාවයක් ඇති ප්‍රජාතන්ත්‍රවාදයක්, වග කිව යුතු දේශපාලනඥයන්, වග කිව යුතු රාජ්‍ය නිලධාරින් නිර්මාණය කරන ක්‍රමය අපි හදලා තිබෙනවා. තවම ඒක හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. විසි එක්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් මේ රටේ ඉහළ තලයේ විනිසුරුවරු ඇතුළු රාජ්‍ය නිලධාරින් පත් කරන ක්‍රමය ස්වාධීන කරන්න ක්‍රමයක් හැදුවා. මේ රටේ රාජ්‍ය සේවය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, පොලිස් කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව කියන මේ සියල්ලට ස්වාධීනව කටයුතු කරන්න පුළුවන් ක්‍රමයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හැදුවා. ඒක ඓතිහාසික ජයග්‍රහණයක්. මාස පහක් තිස්සේ මේ රටේ ජනතාව දැනුවත් කරලා, මේ ජනතාවගේ බලපෑම දේශපාලනඥයාගේ පිටට හරවලා තමයි ඒක කළේ. ඒකට හුඟක් විරෝධතා තිබුණා. ඔබතුමන්ලා ඒක දන්නවා. ඒක කළේ මුළු රටේම දේශපාලන සන්දර්භයෙන් රාජ්‍ය තන්ත්‍රය වෙනස් කරන්න, හොරකම සහ දූෂණය නැති කරන්නයි.

ඊළඟ පියවර විධියට අපි 2023 අංක 3 දරන පනත සම්මත කර ගත්තා. ඒ සම්මත කර ගත්ත පනත මොකක්ද? දූෂණය ආරම්භ වෙන්නේ මේ මැතිවරණ ක්‍රමයත් එක්ක කියලා මුළු රටම පිළිගන්නවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය 1994දී සියයට 62ක ජනප්‍රිය ඡන්ද ප්‍රතිශතයක් ලබා ගන්නේ මොනවා කියලාද? පළමුවෙනි පොරොන්දුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියන එක. දෙවැනි පොරොන්දුව දූෂිත මැතිවරණ ක්‍රමය වෙනස් කරලා කොට්ඨාසයකට වග කියන මන්ත්‍රීවරයෙක් පත් කරන්න ක්‍රමයක් හදනවා කියන එක. එතුමියට ඒක කර ගන්න බැරි වුණා. මම දොස් කියන්නේ නැහැ. එතුමියට තුනෙන් දෙකක බලයක් ලැබුණෙත් නැහැ, මේ පාර්ලිමේන්තුව එතුමියට සහයෝගය දුන්නෙත් නැහැ. ඊට පස්සේ අපි 2015දී යහ පාලන ආණ්ඩුව හැදුවා. ඒක 47දෙනෙක් හිටපු පුංචි ආණ්ඩුවක්. අපි දහ නවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා.

දවස් දෙකක් විවාද කරලා අවසාන දවසේ, අවසාන පැයේත් ඡන්ද 47ක් පමණයි අපට තිබුණේ. නමුත්, අපි විපක්ෂයේ සිටින මන්ත්‍රීතුමන්ලාට, එදා හිටපු ඇමතිතුමන්ලාට -ඔක්කෝටම- කථා කරලා මෙහි තිබෙන යහපත් ප්‍රතිඵලය පෙන්වා දුන්නා. ඒ වාගේම අපි එදා තව පොරොන්දුවක් දුන්නා, පාර්ලිමේන්තුව විසුරුවන්න කලින් අලුත් මැතිවරණ ක්‍රමයක් හදනවා කියලා. එම නිසා තමයි එදා අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළේ. හැබැයි, අවාසනාවකට වාගේ ඒක සම්මත කර ගන්නට ප්‍රථම පාර්ලිමේන්තුව විසුරුවා හැරපු නිසා අදටත් ඒ වෙනස කර ගන්න බැරිවෙලා තිබෙනවා.

එම නිසා අපි ගෙනාවා, මැතිවරණවලදී සල්ලි වියදම් කිරීම සීමා කරන්න පනතක්. කුඩුකාරයින්ගේ සල්ලිවලින්, ගංජාකාරයින්ගේ සල්ලිවලින්, පාතාල සාමාජිකයින්ගේ සල්ලිවලින් පාසල් පොත් බෙදලා, හාල් සේරු බෙදලා, අරක්කු බෙදලා, මේ පාර්ලිමේන්තුවට, පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට මහජන නියෝජිතයන් තෝරන ක්‍රමය නතර කරන්න ඕනෑ. ඒක නතර කරන්න ඕනෑ නිසා තමයි මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත අපි ගෙනාවේ. ඒක ගැන අපි මේ පාර්ලිමේන්තුවේ විවාද කළා. මොකක්ද, ඒකේ තිබෙන අඩුපාඩුව? මොකක්ද, ඒකේ තිබෙන වැරැද්ද? ඒ පනතේ කියනවා, රාජ්‍ය සම්පත් මැතිවරණ සඳහා පාවිච්චි කරන්න බැහැ, පිට රටවලින් මුදල් අරගෙන පිට රට න්‍යාය පත්‍රවලට කටයුතු කරමින් මැතිවරණ ව්‍යාපාර ගෙන යන්න බැහැ, ඒ වාගේම අල්ලස් හෝ තුටු පඬුරු දෙන්න බැහැ, නියමිත සීමාව ඉක්මවා මුදල් වියදම් කළොත් මන්ත්‍රී ධුරය අහෝසි වෙනවා, වරදකාරයා වුණොත් දඩ ගහනවා, හිරේ යනවා කියලා. මේවා නරකද?

මේ ක්‍රමය හදන්න, මේ රටේ තිබෙන නීති පද්ධතිය හදන්න තිබෙන එකම තැන තමයි, පාර්ලිමේන්තුව. මේ පාර්ලිමේන්තුවට එන තැනැත්තන් filter කරලා ගේන්න; සුපිරිසිදු අය තෝරලා ගේන්න ජනතාවට ක්‍රමය හදලා දෙන්නත් ඕනෑ අපිනේ. ජනතාවට ගෙදර ඉඳලා ඒ සඳහා ක්‍රමයක් හදන්න බැහැ. ලක්ෂ 220කගේ පරමාධිපත්‍ය තමයි 225කට දීලා තිබෙන්නේ. එහෙම නම් මේ 225දෙනාට වගකීමක් තිබෙනවා, අඩු ගණනේ ඊළඟ පාර්ලිමේන්තුවේ ඉඳලා හෝ මහජනතාවට ගැළපෙන, රටට ආදරය කරන, හොරකමට දූෂණයට විරුද්ධ මන්ත්‍රීවරු පිරිසක් මේ පාර්ලිමේන්තුවට ගේන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න. අපි ඒ වැඩ පිළිවෙළ හැදුවා. හැබැයි, මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සිටින ඔබතුමන්ලා ඒකට විරුද්ධ වුණා. එහෙම නේද, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා? ඔබතුමන්ලා විරුද්ධව ඡන්දය දුන්නා. ඔබතුමන්ලා දූෂණයට විරුද්ධයි වාගේම දූෂණය වැළැක්වීම සඳහා අණ පනත් ගෙනෙනවාටත් විරුද්ධයි. එම නිසා ඔබතුමන්ලා ඒ පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දුන්නා. හැබැයි, අද විපක්ෂ නායකතුමා ලොකු දේශනාවක් දුන්නා, "මේක හොර තක්කඩි ආණ්ඩුවක්, හොර තක්කඩි රැළක් පාලනය කරන රටක්" කියලා. ඇත්තනේ, ඔබතුමන්ලානේ ඔවුන්ව ආරක්ෂා කරන්නේ. අද මම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කියනවා, මේ රටේ වංචා දූෂණ වැළැක්වීමේ බලය -කඩුව- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවට දීලා තිබෙනවා කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Vasudeva Nanayakkara?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාට කියනවා, අපි දූෂණ විරෝධී පනත් කෙටුම්පතට විරුද්ධ වුණේ නැති බව. අපි ඒකට පක්ෂව ඡන්දය දුන්නා. ඒකට විරුද්ධව ආණ්ඩු පක්ෂයේ සමහරු පෙළ ගැහුණා. ගරු ඇමතිතුමනි, ඒ ඔක්කෝම පරාජය කරගෙන ඔබතුමා සමඟ එකතුවෙලා අපි දූෂණ විරෝධී පනත් කෙටුම්පත සම්මත කළා. එම නිසා ඔබතුමා "විපක්ෂය" කියලා කියනකොට, අපිව ඒකෙන් බේරන්න ඕනෑ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

බොහොම ස්තුතියි. මම ඔබතුමාට ගරු කරනවා. ඔබතුමා විපක්ෂ නායකතුමාගේ කණ්ඩායමේ නැහැ කියලාත් අපි පිළිගන්නවා. ඔබතුමන්ලා ඒ පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා අපට සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. විශේෂයෙන්ම මේ පැත්තේ ඉඳලා ගිහිල්ලා මේකට සහයෝගය ලබා දුන් ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා, ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමා ඇතුළු කණ්ඩායමට අපි එදාත් ගරු කළා, අදත් ගරු කරනවා. කුමන මත විරෝධතා තිබුණත්, හැලහැප්පීම් තිබුණත් රට වෙනුවෙන් තීන්දු ගන්න ඕනෑ තැනදී ඔබතුමන්ලා අවශ්‍ය තීන්දු ගත්තා. ඒ ගැන අපි ගරු කරනවා, ඒක අගය කරනවා. ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා දූෂණ විරෝධී පනත් කෙටුම්පතට විරුද්ධ වුණා. ඔබතුමා විරුද්ධ වුණා කියන්නේ මේ රටේ,- *[බාධා කිරීමක්]* පනත් කෙටුම්පතට විරුද්ධවයි ඔබතුමාගේ නායකයා ඡන්දය දුන්නේ. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ගරු විපක්ෂ නායකතුමා පනත් කෙටුම්පතට විපක්ෂවයි ඡන්දය දුන්නේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

දූෂණ විරෝධී පනත් කෙටුම්පතටද?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

නැහැ, නැහැ. ජනවාරි මාසයේදී මැතිවරණ දූෂණ නවත්වන්න ගෙනාපු 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පතට. ඒ උදවිය මේකට විරුද්ධව ඡන්දය දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ අල්ලස, දූෂණය නතර කරන්න අධිකරණ ඇමතිට බලයක් නැහැ. ඒ සඳහා කවුරුවත් මගේ අතට කඩුවක් දීලා නැහැ. ඒක කරන්න මේ රටේ ජනාධිපතිටත් බැහැ, අගමැතිටත් බැහැ. ඒක වෙනුවෙන් අපට තිබෙන බලය අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවට පවරලා තිබෙනවා. එතකොට, එම කොමිෂන් සභාව ඒක කරන්න ඕනෑ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවට සුදුසු නිර්ණායක පනතෙන්ම දීලා තිබෙනවා. සුදුසු සාමාජිකයෝ පත් කරන එක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වගකීමක්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒ සඳහා අවශ්‍ය නිර්ණායකය තවම හදාගෙන නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ආණ්ඩු පක්ෂයේ සාමාජිකයිනුත් ඉන්නවා, විපක්ෂයේ සාමාජිකයිනුත් ඉන්නවා, කුඩා පක්ෂවල සාමාජිකයිනුත් ඉන්නවා, සිවිල් සමාජය තුළ හොඳයි, ගෞරවනීයයි කියා පිළිගත් සාමාජිකයෝ තුන්දෙනෙකුත් ඉන්නවා. එහෙනම්, කවුද මේක කරන්න ඕනෑ? මේක කරන්න ඕනෑ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ රටේ ජනතාවට කියනවා, මීට පස්සේ දූෂණ, වංචා සම්බන්ධව ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීවරු 225ට ඇඟිල්ල දිගු කරන්න එපා කියලා. මේ මන්ත්‍රීවරු 225දෙනාට කරන්න පුළුවන් උපරිමය කරලා තිබෙන්නේ. මේක මේ මන්ත්‍රීවරු 225දෙනාට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒකට රාජ්‍ය යන්ත්‍රණයක් ඕනෑ. ඒ රාජ්‍ය යන්ත්‍රණය මේ පාර්ලිමේන්තුව තුළින් සම්මත කරලා තිබෙනවා. මේකට විරුද්ධව අදහස් තිබුණත්, මේක හොඳයි කිව්වත්, මේකට වෛර කළත් ඒක අදාළ නැහැ. හේතුව, මේක සම්මත කරලා දුන්නා. සම්මත කරලා, දැන් බලය දීලා තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට. හැබැයි, දැන් සිදුවන වංචා, දූෂණ පිළිබඳවත්, කලින් වෙච්ච දේවල් පිළිබඳවත් පැමිණිලි කරපුවාට නීතිය ක්‍රියාත්මක කරන්නේ නැත්නම් ජනතාවට අපි කියනවා, මන්ත්‍රීවරු 225ට නොවෙයි ඔය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිටින කථානායකතුමා ඇතුළු ඒ දහදෙනාට ඇඟිල්ල දිගු කරන්න කියලා. ඒ දහදෙනා එම වගකීම භාරගන්න. මීට පස්සේ පාර්ලිමේන්තුව වටලන්න එන්න එපා. ඒ දහදෙනා වටලන්න. අපිත් එන්නම්. විපක්ෂ නායකතුමාත් ඉන්නවා, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ. ඊළඟට වටලන්න, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව. අපිත් එන්නම්. ඒකේ අපි දාපු පැමිණිලිත් තිබෙනවා, එකක්වත් විභාග කෙරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රට කඩාගෙන වැටුණා. මේ රටේ ආර්ථිකය විනාශ වුණා. ඒක කෙරුවේ කවුද, ඒකට හේතු මොනවාද කියලා අලුතින් කිය කියා, හෝද හෝදා මඬේ දමා පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරන්න බැහැ. මොකද, පාර්ලිමේන්තුවේ කාලය අපට වටිනවා. අපට නැතත් ජනතාවට වටිනවා. ඒ නිසා මම ඒවා ගැන නැවත කියන්නේ නැහැ. හැබැයි, දැන් මේ වැටිච්ච ආර්ථිකය ගොඩගන්න බැරිවීම මේ රටේ සමස්ත ජනතාවට -පාරේ හිඟාකන මනුස්සයාගේ ඉඳලා ධනපතියා දක්වා සියලුම මනුෂ්‍යයන්ට- බලපෑවා. විශේෂයෙන්ම අද මේ රටේ සිටින දුප්පත් පන්තියේ සියයට 50ක් විතර මූලික අවශ්‍යතා ඉටු කරගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියලා වාර්තාවලින් කියනවා. ඒ සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ සිටින අප සියලු දෙනා වග කියන්න ඕනෑ. අපි වග කියන්න ඕනෑය කියන එකෙන් කියන්නේ මොකක්ද? අපට ආහාර ගෙනැල්ලා බෙදා දීලා වග කියන්න බැහැ නේ. එහෙනම්, නැවත එවැනි දෙයක් නොවන විධියට මේ රටේ නීති පද්ධතිය ශක්තිමත් කරන්න ඕනෑ. නීති රාමුවක් හදන්න ඕනෑ. ඒ නීති රාමුව හැදුවා. එහෙම හැදුවාට පස්සේත් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් මොකක්ද කරන්න ඕනෑ?

මම කිව්වා, පසුගිය කාලයේ ඩොලර් එකක්වත් නැති පුස් කාපු භාණ්ඩාගාරය අපි භාරගත්තා කියලා. දැන් අපි IMF එකත් එක්ක ලොකු සටනක් කරනවා. සටනක් කරනවා කියන්නේ, IMF වාරික ටික ගන්න සංවාදයක් කරනවා. අවුරුදු 4කට අපට කීයද හම්බ වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? ඩොලර් බිලියන 2.9යි. මේකෙදි අවශ්‍ය කොන්දේසි අපි උපරිම මට්ටමින් සපුරාලනවා. මේකේ හොඳ පැතිත් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Minister, you have two more minutes.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

නැහැ, මම තව විනාඩි 15ක් විතර ගන්නවා, අධිකරණ රාජ්‍ය ඇමතිතුමාගේ කාලයෙන්.

මේකේ හොඳ පැතිත් තිබෙනවා, නරක පැතිත් තිබෙනවා. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, අපි දන්නවා, අපි IMF එකට ගියාට ඔබතුමන්ලා විරුද්ධ බව. හැබැයි, අපට වෙන විකල්පයක් තිබුණේ නැති නිසා අපි එතැනට ගියා. රටේ ජනතාව බඩගින්නේ තබන්න බැරි නිසා තමයි අපි එතැනට ගියේ. මේ දෙවැනි වාරිකය ලැබෙන්නේ නැහැ කියලා සමහර අය නම් පුදුම සතුටකින් කථා කරනවා මම දැක්කා. ඒ කියන්නේ, ආපසු මේ රටේ මිනිස්සු හිඟමනට වැටියන් කියලා ඔවුන් හිත යටින් ප්‍රාර්ථනා කරනවා. මොකද, ආණ්ඩුව කඩා වැටුණොත් ඔවුන්ට ආපසු ආණ්ඩුව ලැබෙයි කියලා හිතනවා. ඒක තමයි මේ රටේ දේශපාලන සංස්කෘතිය. මේ කුහක සංස්කෘතිය, මේ අවලාද නඟන සංස්කෘතිය නතර කරන්න ඕනෑ. අපෙන් system change එකක් ඉල්ලුවා. අපි එම system change එක කළා. දැන් ඒ system change එකට යන්න ප්‍රායෝගිකව ගත යුතු ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඔබතුමා දන්නවා, පසුගිය කාලයේ හැම දාම වාගේ විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා දූෂණ ගැන ෆයිල් මිටි ගණන් හදාගෙන මාධ්‍ය ඉස්සරහට ගිහිල්ලා එවා පෙරළමින් පෙන්වූ බව. හැබැයි, මාධ්‍යයට කරන්න දෙයක් නැහැ. මාධ්‍යයට කරන්න පුළුවන් ඒ ගැන හැන්දෑවේ ප්‍රවෘත්තිවල විකාශය කරන එක විතරයි. වෙන මොකවත් කරන්න බැහැ නේ. එහෙම කරලා මේ රට හදන්න බැහැ නේ. එහෙනම්, ඒවාට නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඔන්න, දැන් අපි අලුත් පනත යටතේ ඒ සඳහා පූර්ණ බලතල දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ මුදල් විශුද්ධිකරණය කිරීමේ වරද කරලා විදේශ රටවලට ගිහිල්ලා සමහරු මුදල් හංගාගෙන ඉන්නවා. මම වාසුදේව මන්ත්‍රීතුමා එක්ක එකඟ වන එක් කාරණයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මුදල් විශුද්ධිකරණයෙහි මේ සීමා කිරීම් ඔක්කෝම කරන්නේ මේ අපි වාගේ දුප්පත් රටවලටයි. මේ රටින් ඩොලර් බිලියනයක් ගෙන ගියොත් ඒ රටවල කවුරුවත් ප්‍රශ්න කරන්නේ නැහැ.

අපේ මිනිහෙක් රස්සාවක් කරලා හරි ඩොලර් 10,000ක් ගෙනාවොත් මෙහේ බැංකුකාරයෝ අහනවා, කොහෙන්ද ගෙනාවේ කියලා. ඉතින්, ජාතකයත් එක්ක පෝරම පුරවන්න ඕනෑ. දුප්පත් රටවල් තවදුරටත් දුප්පත්කමේ තියන්න ඕනෑ නිසා මේවා ජාත්‍යන්තරය හදපු නීති, සම්මුති. ඉතින්, අපි ඒවාට අනුගත වෙලා. හිඟන්නන්ට උණුබත් නැහැ වාගේ තමයි. අපට ඒක වෙලා තිබෙනවා. පසුගිය කාලයේ තිබුණා Panama Papers කථාව. ඒ ගැන සිවිල් සමාජයේ පුරවැසියන් දිගින් දිගටම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහින් පැමිණිලි කළ ආකාරය අපි දැක්කා. මම ඒක අගය කරනවා. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, "මාසයක් ඇතුළත මට මේ සම්බන්ධව වාර්තාව ඕනෑ" කියලා නියෝගයක් දුන්නා. ඒක ඔබතුමන්ලාට මතක ඇති. එතකොට මේ Panama Papersවලට මොකද වුණේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Pandora Papers.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
සමාවෙන්න, Pandora Papers. කලින් Panama Papers ආවා. දැන් මෙතැන Panama Papers සහ Pandora Papers කියන දෙකම තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව දැන් මොකක්ද කරලා තිබෙන්නේ? මේ ලැයිස්තු ගැන අපි දන්නවා. මොකද, මේ ගැන මාධ්‍යයේ පළ වුණා. ඒ නම් සියයට 100ක් නිවැරදිද, ඒවායේ කියපු ගණන් හරිද වැරදිද කියලා අපට සහතිකයක් දෙන්න බැහැ. හැබැයි, ඔය නම් ලැයිස්තුවත් එක්ක කියපු විධියට ඩොලර් බිලියන නවයක විතර මුදලක් ලංකාවේ පුරවැසියන් විදේශීය රටවල හංගාගෙන ඉන්නවා. ඩොලර් බිලියන නවයක් කියන්නේ ලොකු ගණනක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ජාතික ආදායම කීයද? 2023 අවුරුද්දේ අපි බලාපොරොත්තු වෙන ජාතික ආදායම අපට ලැබෙන්නේ නැහැ. හැබැයි, අපි 2023 වර්ෂයට බලාපොරොත්තු වෙන්නේ රුපියල් බිලියන 2,915යි. ඩොලර් බිලියන නවයක් කියන්නේ ඊට වඩා වැඩි මුදලක්. මේ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට බලය තිබෙනවා; අපි අලුතින් බලය දීලාත් තිබෙනවා. වැරදි විධියට හෝ නීතිවිරෝධී ක්‍රමයට ගෙනිහිල්ලා විදේශීය රටක යම් මුදලක් සඟවාගෙන ඉන්නවා නම්, දේපළක් අත්පත් කරගෙන ඉන්නවා නම්, අදාළ පනතේ 114වැනි වගන්තිය යටතේ අධිකරණ නියෝග අරගෙන ඒ දේපළ මෙහාට ගේන්න පුළුවන්. ඒ දේපළ ලබාගන්න අපට ප්‍රායෝගික ගැටලු තිබෙනවා.

මම ළඟදී මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ - UNODCහි - ප්‍රධාන නිලධාරින් ගෙන්වලා සාකච්ඡා කළා. ඒ ගොල්ලන් එකඟතාව පළ කළා, අපට සහයෝගය ලබා දෙන්න. මේ Pandora Papers සහ Panama Papersවල තිබෙන සල්ලි ටික අපේ රටට ගෙනාවා නම්, අපි IMF එකෙන් ඉල්ලනවා වාගේ තුන් ගුණයක් අපට ලැබෙනවා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ පාර්ලිමේන්තුවට මෙහෙම යෝජනාවක් කරනවා. අපි කැබිනට් මණ්ඩලයේ හිටියාට මූල්‍ය බලය මේ පාර්ලිමේන්තුවට නේ තිබෙන්නේ. අපි ඒක පිළිගන්න ඕනෑ. මම මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරනවා, විදේශීය රටවල හංගාගෙන ඉන්න සල්ලි සම්බන්ධයෙන්. මේ ඔක්කොම සල්ලි පගා ගහපුවා, අල්ලස් ගත්ත ඒවා නොවෙයි කියලා අපි දන්නවා. ධාර්මිකව හම්බ කරගත්ත අයත් ඉන්නවා. හේතුව කුමක් වුණත් නීති විරෝධී ලෙස මේ සල්ලි රටින් පිට කරලා තියාගෙන ඉන්නවා. ඔබතුමාට මේ කාරණය මතක ඇති. Global Financial Integrity Report එකේ පැහැදිලිව කිව්වා, අපේ exportersලා ලංකාවේ සල්ලි ඩොලර් බිලියන 53.5ක් විදේශ රටවල park කරලා තිබෙනවා කියලා. ඒ ගොල්ලන් කිව්වා, 2022ට තව ඩොලර් බිලියන 3ක් ඒකට එකතු වෙනවා කියලා. එහෙම නම් ඩොලර් බිලියන 56.5ක් ඒ රටවල park කරගෙන ඉන්නවා. ගිය අවුරුද්දේ ජූලි මාසයේ ඉඳලා මේවා ඔක්කොම monitor කරනවා. වර්තමාන මහ බැංකුව ඒක කරනවා. හැබැයි, ඊට පෙර මේ කටයුත්ත කරලා නැහැ. ඩොලර් බිලියන 56.5ක් විදේශ රටවල රඳවාගෙන ඉන්නවා නම් මේ රට බංකොලොත් වෙන්නේ කොහොමද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? අපේ විදේශ ණය තිබෙන්නේ ඩොලර් බිලියන 41යි. අපේ මුදල් ඩොලර් බිලියන 56ක් එතැන තිබෙනවා. Pandora Papers සහ Panama Papersවල ඩොලර් බිලියන නවයක් තිබෙනවා ලු. සංඛ්‍යා පැහැදිලිව කියනවා. මේක ස්ථිර කරන්න අපට බැහැ. අපට ඒකට බලයක් නැහැ. හැබැයි, දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඒවා ලබා ගන්න බලය තිබෙනවා. පොලීසියට ඒ බලය දීලා තිබෙනවා. මේවා ලබාගන්න ඕනෑ. මම යෝජනා කරනවා, නීති විරෝධී විධියට පිටරටවල තියාගෙන ඉන්න සල්ලි ලංකාවට ගේන්න කියන්න කියලා. අපි මාසයක් නැත්නම් මාස දෙකක් ලබා දෙනවා. පොදු සමාවක් දෙනවා, මේ සල්ලි ලංකාවට ගේන්න. ඒ කාලසීමාව තුළ මේ සල්ලි ලංකාවට ගේන්නේ නැත්නම් අපට ලැබී තිබෙන ලැයිස්තු මම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්. ඩොලර් මිලියන 150ට වැඩිය තිබෙනවා කියලා වාර්තා වෙන බව කියන සමහර ඇමතිවරුන්ගේ ලේකම්ලාත් ඉන්නවා.

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

අපි මේ ලැයිස්තුව පාර්ලිමේන්තුවට දෙන්නම්. පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කරලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට නියම කරමු, මේ මුදල් ගෙන්වා ගන්න කියලා.

මම මේ කටයුත්ත 2007 වසරෙත් කරන්න ගියා. 2007 අගෝස්තු මාසයේ මම COPE වාර්තාවෙන් පෙන්නුවා, රුපියල් බිලියන 700ක් ආදායම තිබෙන රටේ රුපියල් බිලියන 300කට වැඩි වත්කම් ප්‍රමාණයක් අපට අහිමි වෙලා තිබෙනවා කියලා.

මේ පාර්ලිමේන්තුවට ඒ වාර්තාව ඉදිරිපත් කළා. මගේ යෝජනාවක් මත අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කිව්වා, ඒ ගැන පරීක්ෂණ කරන්න කියලා. එදා හිටපු කථානායක ගරු වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා කොන්දේසියක් දැම්මා, ඒ විමර්ශනය කරලා සති දෙකකට වරක් ප්‍රගති වාර්තාවක් එවන්න කියලා; මාසයක් එව්වා. ඊට පස්සේ අල්ලස් කොමිසම නිදාගෙන වාගේ හිටියා; ඊට පස්සේ කිසිම වාර්තාවක් එවා නැහැ. ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් අරගෙනත් නැහැ. ඒකෙන් මොකද වුණේ? එදා මම කිව්වා, විපක්ෂයේ ඉන්න මිනිස්සුත් දූෂිතයි කියලා. *[බාධා කිරීමක්]* ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, දවස් 14යි ගියේ, ඊට පසු සතියේ ඉඳලා විපක්ෂයේ දූෂිතයි කියපු 18දෙනෙක් ආණ්ඩුව පැත්තට ආවා. මට විපක්ෂයට යන්න සිද්ධ වුණා. **ඔබතුමාට මතකයි** නේ. ඔබතුමා නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සම්බන්ධයෙන් නඩුව පැවරුවේ. ඒක මේ පාර්ලිමේන්තුවේ අතීතය. ඒක තවදුරටත් මේ විධියට ගෙනියන්න දෙන්න බැහැ. ඒවා මේ රටේ ජනතාවගේ ලේ, දහඩිය, කඳුළුවලින් උපයපු ඩොලර්. ඒවා ඒ ගොල්ලන්ට තමයි අයිති. අපි ඒක දන්නවා. හැබැයි, ඒවා රටට ගෙනැල්ලා රට තුළ ඕනෑම දෙයක් කරගත්තාට අපට ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒ රටේ සම්පත් නේ. අද මිනිස්සු මෙච්චර දරිද්‍රතාවට පත් වෙලා තිබෙන්නේත්, ඩොලරය රුපියල් 330ට, 325ට ගිහිල්ලා තිබෙන්නේත් ඇයි? අපේ ඩොලර් පිටරට හංගාගෙන ඉන්න නිසායි. ඒ ඩොලර් ටික අපේ රටට ආවා නම්, ඩොලරය රුපියල් 100ටවත් කවුරුවත් ඉල්ලන්නේ නැහැ. ඒකට කවුද විසඳුම් ගෙනෙන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ Anti-Corruption Act එකේ වචන දෙකක් අල්ලාගෙන සමහරු කථා කරනවා. මේක ගිනි කන්දක් උඩ ඉඳගෙන පන්දු කෙළින වෙලාවක් නොවෙයි; බෝල ගහන වෙලාවක් නොවෙයි. මේ රටේ මිනිස්සු අමාරුවෙන් ජීවත් වෙන වෙලාවක්, මේ. මේ රටට ප්‍රශ්න තිබෙන වෙලාවක්, සංවර්ධනය අඩාළ වෙලා තිබෙන වෙලාවක්, ආර්ථිකය සෘණ වෙච්ච වෙලාවක්. මුළු ලෝකයම කියනවා, මෙයින් ගොඩ එන්න නම් ඔයගොල්ලන්ගේ දූෂණය නැති කරන්න කියලා. සමහරු මේ රටේ මිනිහෙක් වෙනුවෙන්වත් රුපියලක් ආයෝජනය කරන්න කැමති නැහැ. ඇයි ඒ? මේ රාජ්‍ය යන්ත්‍රණයේ තිබෙන දූෂිතභාවය නිසායි. අද විදේශිකයෙක්, ආයෝජකයෙක් අපේ රටට එන්නේ නැත්තේ ඇයි? දූෂණය තිබෙන නිසායි. ඉතින් ඒ දූෂණය වළක්වා ගන්න ක්‍රමය හදලා දුන්නාම, ඒ හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ 10දෙනා එකතු වෙලා පන්දු කෙළින්න සූදානම් වෙනවා නම්, ඒ ගැන මේ රටේ ජනතාවට අපි කියනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයන් දෙදෙනා එකතු වෙලා මේක සෙල්ලමට අරගෙන තිබෙනවා නම්, අපි ඒ ගැන මේ රටේ ජනතාවට කියනවා. ඒ 13දෙනා පිට මේ වරද පටවන්න, මේ චෝදනාව එල්ල කරන්න අපි සූදානම්. ඒක නිසා මේ පිළිබඳව වහාම පියවර ගන්න කියලා ගරු කථානායකතුමාට දැනුම් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම මීට පෙරත් මේ ගැන කියලා තිබෙනවා.

ඔක්කෝම කිව්වා, මේ රාජ්‍ය යන්ත්‍රණය දූෂිතයි කියලා. කට කහනවා වාගේ හැම කෙනාම කියනවා, මේක දූෂිතයි, දූෂිතයි කියලා. ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට නම් සමහර වෙලාවට නැහැ කියනවා. විපක්ෂයට ගියොත්, කටේ තිබෙන්නේම දූෂණය විතරයි. වෙන මොකුත් නැහැ. ඒක මහා පරිමාණ දූෂණයක් කියනවා. ඉතින්, ඒ දූෂණය වළක්වා ගන්න කරනදේත් කියන්නකෝ. දූෂණය නවත්වන්න පනතක් ගෙනාවාම ඒකටත් විරුද්ධව අත උස්සනවා. සමහර ඒවාට පක්ෂව අත උස්සනවා.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බිලියන 905ක් අය කරගෙන නැහැ. ඇයි ඒ? මේ වාර්තා අනුව පෙනෙනවා, රේගුවෙන් අපේ රජයට එන්න ඕනෑ ආදායමෙන් සියයට 40ක්වත් එන්නේ නැහැ කියලා. මේක තමයි යථාර්ථය. පසුගිය කාලයේ පිටරටින් ගෙනෙන භාණ්ඩ දහස් ගණනක් -ලැයිස්තු පිටින්- තහනම් කළා. එහෙම තහනම් කළාට, පිටරටින් ගෙනාපු නැති එක දෙයක් ගැන මට කියන්න, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි. ඒ ඔක්කෝම ගෙනාවා. ලක්ෂ 50ක් දුන්නාම ඕනෑම කන්ටේනර් එකක් එතැනින් පන්නනවා. එහෙම නොවෙයි කියලා කවුරුහරි කියනවාද? කවුරුහරි නැඟිටලා කියන්න එහෙම නොවෙයි ද වෙන්නේ කියලා. පිටරටින් ගේන්න තහනම් කරපු හැම භාණ්ඩයක්ම මේ රටේ වෙළඳ පොළේ තිබුණා; හැම එකක්ම තිබුණා. පිටකොටුවේ පදික වේදිකාවට ගියා නම් ඒවා දැකගන්න තිබුණා. ඒ හැම එකම වික්කා. ඒ ඔක්කෝම තහනම් කරලා අවුරුදු ගණනක් වෙනවා. නමුත් ඒවා තිබෙනවා. තහනම් කරපු ඒවායින් ගේන්න බැරිවුණේ වාහන විතරයි. අනෙක් ඔක්කොම ගෙනාවා. හැබැයි, වාහනවලත් කෑලි ගෙනැල්ලා සවි කළා. මේ ඔක්කෝම Sri Lanka Customs හරහා තමයි ගෙනාවේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අපට අහිමි කරන මුදලයි, Sri Lanka Customs එකෙන් අහිමි කරන මුදලයි, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙන් - Excise Department එකෙන් - අහිමි කරන මුදලයි ලැබෙනවා නම්, අවුරුද්දෙන් දෙකෙන් පිටරට ණය ටික ඔක්කෝම ගෙවන්න පුළුවන්.

සුරාබදු දෙපාර්තමේන්තුවෙන් පසුගිය කාලයේ මත්පැන් බෝතල්වල ස්ටිකර් ගැහුවා. ඒ ස්ටිකර් ගහන්න ගිහිල්ලා මොකක්ද කළේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිළිබඳව මම පෞද්ගලිකව සේවාදායකයෙක් ඉදිරිපත් කරවලා අභියාචනාධිකරණයේ නඩුවක් පැවරුවා.

මත්පැන් බෝතල්වල අලවන ඒ ස්ටිකර් එක අරගෙන බැලුවාම මට හිනා ගියා. ඒක මුද්‍රණය කරලා තිබෙන්නේ "දිනමිණ" පත්තරය මුද්‍රණය කරන කඩදාසිය වාගේ එකකින්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ස්ටිකර් එක ලේක් හවුස් එකේ හෝ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ හෝ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ හෝ print කරන්න පුළුවන් එකක්. නමුත් විශාල මුදලක් දීලා Madras Security Printers කියලා කොම්පැනියකට ඒක මුද්‍රණය කරන්න දුන්නා. ඒ ගොල්ලන් මොකද කළේ? ආණ්ඩුවට මිලියන සියයක ස්ටිකර් විකුණනකොට, අරක්කු කොම්පැනිකාරයාට තව මිලියන දෙසියයක ස්ටිකර් විකුණනවා දහ පහළොස් ගුණයක් සල්ලි අය කරලා. ඒක එහෙම කළා. එහෙම කරලා රටවල් තුනකින් blacklist වෙච්ච සමාගමක්, ඒක. ඒ blacklist වෙච්ච සමාගමට ඒ කටයුත්ත භාර දීලා අද මොකද වෙලා තිබෙන්නේ? අද හොර ස්ටිකර් හැම තැනම. මට කවුරු හරි කියනවා ඇහුණා, පසුගිය කාලයේ මේ හොර ස්ටිකර් අල්ලන්න ගත්ත නිසා විතරක් ගිය මාසයේ ආදායම රුපියල් බිලියනයකින් පමණ ඉහළ ගියා කියලා. ඒ කියන්නේ එක මාසයකට. කාවද මේ රවට්ටන්නේ? නඩුවට ඇවිල්ලා මොකක්ද කිව්වේ? අභියාචනාධිකරණයට ඇවිල්ලා

සුරාබදු කොමසාරිස් ජනරාල් වෙනුවෙන් පෙනී හිටපු නීතිඥ මහත්වරු කිව්වා, "නැහැ මේක අත්‍යවශ්‍යයි, මේකෙන් අපේ ආදායම දහ ගුණයක් විතර වැඩි වෙනවා" කියලා. කෝ, වැඩි වුණාද? දැන් තිබ්බ එකත් නැහැ. විනිසුරුවරු මම ඉල්ලපු තහනම් නියෝගය දුන්නේ නැහැ. ඇයි? ඇවිල්ලා බොහොම උජාරුවට ඉදිරිපත් කළා, සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම සරු කර ගන්න, ආදායම හත් අට ගුණයකින් වැඩි කර ගන්න මෙන්න හොඳ chance එකක් තිබෙනවා කියලා. කවුද ඇවිල්ලා මෙහෙම කිව්වේ? සුරාබදු කොමසාරිස් ජනරාල්. විනිසුරුතුමන්ලාත් හිතුවා ඇත්තයි කියලා. එහෙම හිතෙනවා නේ. සුරාබදු කොමසාරිස් ජනරාල් එහෙම කියලා දැන් ඔහුම නියෝග දෙනවා, මේවා වටලන්න කියලා. ඒකත් ඒ ගොල්ලන්ගේ වුවමනාවට නොවෙයි, අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමන්ලා ගණනාවක් මේ කාරණය මතු කළාට පස්සේ.

මට මතකයි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු ගණනාවක් මේ කාරණය මතු කළ බව. ඊට පස්සේ දැන් වටලනවා. දැන් වටලනකොට අපි කියපු එක ඇත්ත බව පෙනෙනවා. නමුත් දැන් නැව ගිහිල්ලා. අවුරුද්දක් තිස්සේ බිලියන තුන් හාරසියයක ආදායම අහිමි වෙලා ඉවරයි. අපට ඒක අධිකරණය හරහාවත් වළක්වා ගන්න බැරි වුණා. එහෙම නම් මේ මුදල් අවභාවිතය, මුදල් හොරකම, අල්ලස, දූෂණය නවත්වන්නේ කොහොමද? මේක නවත්වන්න ආණ්ඩුවට භාර දීලා නැහැ. ආණ්ඩුවකට මේක කරන්න බැහැ. අධිකරණ ඇමතිට කරන්නත් බැහැ. මේක මේ පාර්ලිමේන්තුව එකතු වෙලා කරන්න ඕනෑ දෙයක්. ඒ නිසා අපි ඔබතුමන්ලා එකතු කරගත්තා. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළා; දූෂණ විරෝධී පනත් කෙටුම්පත සම්මත කළා. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පත සම්මත කළා. ඔබතුමන්ලා දීපු ඒ සහයෝගයට ඔබතුමන්ලා ඔක්කෝටම ස්තුතියි. හැබැයි, මේක ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේකෙදි අපි කරන පසුවිපරම මොකක්ද? මේක ක්‍රියාත්මක නොවෙනවා නම් මොකක්ද අපි කරන්නේ? අපට තිබුණු ඔක්කෝම බලය ගෙඩිය පිටින් එකතු කරලා දුන්නා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නිදාගෙන වාගේ ඉන්නවා නම් කාටද කියන්නේ?

ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට බලය දුන්නා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිසමට සුදුසු අය පත් කරන්න. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිසමේ දැන් ඉන්න වැඩ බලන සාමාජිකයන්ට බලය දීලා තිබෙනවා. ඒ ගොල්ලනුත් ඉන්නේ නිදාගෙන වාගේ නම් කාටද ජනතාව කියන්නේ? ජනතාව මේවා කියන්නේ මහජන නියෝජිතයන්ට.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Lakshman Kiriella?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, දූෂණ විරෝධී පනතේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" වෙනුවට "ව්‍යවස්ථාදායක මණ්ඩලය" කියලායි තිබෙන්නේ. 11 වතාවක් එසේ සඳහන් වෙලා තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මම ඒක පැහැදිලි කළා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මේ ඔබතුමාට කරන අභියෝගයක් නොවෙයි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
නැහැ, ඔබතුමා කියන්න.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා මේක නිවැරදි කරන්න ඕනෑ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
කරනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
අන්න ඒකයි විපක්ෂ නායකතුමා පෙන්නුවේ. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස් වුණාම, " ව්‍යවස්ථා සභාව" වෙනුවට "ව්‍යවස්ථාදායක මණ්ඩලය" කියන වචනය තිබෙන නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඉස්සරහට යන්න බැරි වුණා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන තර්කය මම දන්නවා. ඔය ඒ ගොල්ලන්ගේ තර්කය නේ. ඒ 10දෙනාම වැරදියි. ඔබතුමාට මම පෙන්වන්නම්.*[බාධා කිරීමක්]* නැහැ, නැහැ, මම පෙන්වන්නම්.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ආණ්ඩුවේ කට්ටිය තමයි එහි බහුතරය ඉන්නේ; ආණ්ඩුවට හිතවත් කට්ටිය තමයි බහුතරයක් ඉන්නේ; the majority belongs to the Government. But, all the 11 members have agreed, ඒ 11දෙනාම පිළිගෙන තිබෙනවා, ගරු ඇමතිතුමා මේ පිළිබඳව සංශෝධනයක් ගේන්න ඕනෑ කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Kiriella, let the Hon. Minister clarify that.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
I will clarify that.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මොකද, දූෂණ විරෝධී පනතේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" කියලායි සඳහන් වෙන්න ඕනෑ. නමුත් ව්‍යවස්ථාදායක මණ්ඩලය කියලායි එහි තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
We will allow the Hon. Minister to clarify.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි. ඔබතුමාත් එක්ක මා ඒ ගැන ගැටුමකට යනවා නොවෙයි. හැබැයි, ඔබතුමා මටත් වැඩිය හුඟක් ජ්‍යෙෂ්ඨ නීතිඥ මහත්මයෙක්. මහනුවර අධිකරණයේ හිටපු දක්ෂතම නීතිඥ මහත්මයෙක් ඔබතුමා. ඔබතුමා දන්නවා, අපේ රටේ අනිකුත් අණපනත් අර්ථ නිරූපණය කළ යුත්තේ මේ රටේ මුඛ්‍ය නීතියට යටත්ව බව. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ කියනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවට පත් කරන්න කියා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ජනාධිපතිවරයාට නිර්දේශ යැවිය යුතුයි කියලා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩු පාඩුවක් නැහැ නේ. දූෂණ විරෝධී පනතේ යම්කිසි දෝෂයක් සිද්ධ වුණු බව අපි පිළිගන්නවා. ඒ දෝෂය තමයි අධ්‍යක්ෂ ජනරාල් පත් කිරීම සම්බන්ධයෙන් වන වගන්තියේ ඉඳලා "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව"වෙනුවට "ව්‍යවස්ථාදායක මණ්ඩලය" කියා යොදා තිබීම. ඒක අපි නිවැරදි කරන්න ඕනෑ.

හැබැයි ඔබතුමා බලන්න, මේ මණ්ඩලය පත් කිරීම සම්බන්ධයෙන් පනතේ තිබෙන වගන්තිය දිහා. ඒ, 4 (1) වගන්තිය. එහි තිබෙනවා, "කොමිෂන් සභාව ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත පහත සඳහන් අය පත් කළ යුතුයි" කියලා. එතැන තිබෙන්නේ "ව්‍යවස්ථාදායක සභාව" කියලායි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඔක්කොම ඉන්නේ උගතුන්, බුද්ධිමතුන් නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒගොල්ලන්ට මේක තේරෙන්නේ නැතිකමක් නැහැ නේ. ඒ නිසා බලතල දීපු එක ක්‍රියාත්මක කරන්න බැරිකමක් නැහැ නේ. එක්කෝ මේකේ යටි අරමුණක් තිබෙනවා. මේගොල්ලන්ටත් ඕනෑ, හොරු, දූෂිතයෝ රකින්න. ඒගොල්ලන්ටත් ඕනෑ, හොරු, දූෂිතයෝ රකින්න නොවෙයි නම් මොකක්ද මේක කරන්න බැරිකම? මොකක්ද එහෙම කරන්න බැරි ප්‍රශ්නය?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඒ නිසා සිංහල වචනයක් එහාට මෙහාට වුණා කියලා ඒක නිකම් පාපන්දුවක් වාගේ එහාට මෙහාට දමමින් ඔක්කොම අය මේ මොකක්ද කරන්නේ? මම දන්නේ නැහැ, සාමාජිකයෝ දහදෙනාගෙන් කී දෙනෙකු මොන මතය දරනවාද කියලා. ඒක මට අදාළ නැහැ. ඒගොල්ලන් ආණ්ඩුවේද, විපක්ෂයේද කියන එකත් මට අදාළ නැහැ. එතුමන්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෝ විධියට පත් කළේ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා, දේශපාලනය කරන්න නොවෙයි, ඒ සභාව ඇතුළේදී ස්වාධීනව කටයුතු කරන්නයි.

අපි පාර්ලිමේන්තුවේදී දේශපාලනය ගැන කථා කරනවා. හැබැයි, අපි කාරක සභාවකට ගිහිල්ලා, වාඩිවෙලා දේශපාලනය කරන්නේ නැහැ නේ. එදා COPE එකේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයා විධියට මම ඒ ආකාරයෙන් කටයුතු කළා නම් මම ඉදිරිපත් කරන්නේ නැහැ, බිලියන තුන්සියයක් හොරකම් කරපු මිනිස්සු මේක ඇතුළේ ඉන්නවා කියලා. ඒක එදා ඉදිරිපත් නොකළා නම් සමහර හොරු තවමත් මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නවා. එදා කරුණු ඉදිරිපත් කළ නිසා ජනතාවට පුළුවන්කම ලැබුණා, ඒගොල්ලන් හඳුනාගෙන එළියට දාන්න. ඒ නිසා මෙවැනි බොළඳ තර්ක දාලා, උත්තරීතර පරමාර්ථයක් ඇතිව සම්මත කර ගත් මේ පනත විකාරරූපී කරන්නේ නැතිව කටයුතු කළ යුතුයි. මේ රටේ ජනතාව නැවතත් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව වාගේම නීතියේ ආධිපත්‍යය පිළිබඳව හොඳ බලාපොරොත්තුවක් දල්වාගෙන ඉන්න වෙලාවේ ආපසු මේක අනික් පැත්තට හරවා ප්‍රජාතන්ත්‍රවාදයයි, මේ පාර්ලිමේන්තුවයි දෙකම මිනිස්සුන්ට එපා කරවන්න එපා කියලා ඉල්ලා සිටිමින්, මේ පිළිබඳව ක්‍රියාත්මක නොවුණොත් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න අපි සූදානම් බවත්, ඒ වාගේම ජනතාව ඒ වෙනුවෙන් පෙළ ගස්වනවා කියාත් මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Lakshman Kiriella. You have 10 minutes.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
I will take a little more time, Sir.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, දූෂණ විරෝධී පනතට සංශෝධනයක් ගෙනෙනවාද කියලා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
සංශෝධනයක් ගේනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒක තමයි විපක්ෂ නායකතුමාත් අහන්නේ. ඔබතුමා කියන විධියට, වැරැද්දක් වෙලා නැත්නම් සංශෝධනයක් ගේන්න ඕනෑ නැහැ නේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි. විපක්ෂ නායකතුමා පෙන්නුවේ ඒ වැරැද්ද.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාගේවත් වැරැදි හොයන්න තරම් මට වෙලාවක් නැහැ. මට ඊට වඩා වැදගත් වැඩ තිබෙනවා. මම කිව්වේ ඒ වචනය පිළිබඳව සංශෝධනයක්

ගේනවා කියන එකයි. හැබැයි, ඒ වෙනතුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට මේ පත් කිරීම් කරන්න බාධාවක් නැහැ කියායි මම කියන්නේ.

[අ.භා. 12.07]

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒක ඉතින් ගරු කථානායකතුමාත් එක්ක සාකච්ඡා කරලා විසඳා ගන්න ඕනෑ ප්‍රශ්නයක්.

අපි දූෂණ විරෝධී පනතට ඡන්දය දුන්නා; we voted for it. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතට අපි විරුද්ධව ඡන්දය දුන්නා. මොකද, අපි සංශෝධන වගයක් ගෙනාවා; we brought in some Amendments. නමුත් ගරු ඇමතිතුමා ඒ සංශෝධන පිළිගත්තේ නැහැ. ඒ නිසා අපි එම පනතට විරුද්ධව ඡන්දය දුන්නා. ඒක අපි පිළිගන්නවා.

අද ගරු ඇමතිතුමා ආර්ථිකය ගැන කථා කළා. නමුත් අද අපිට කථා කරන්න තිබෙන්නේ ආර්ථිකයට වඩා අධිකරණ නිදහස ගැන. මොකද, මුලතිව් මහෙස්ත්‍රාත්වරයා එම ධුරයෙන් ඉල්ලා අස් වුණා විතරක් නොවෙයි, රට අත්හැර දාලාත් ගියා. ඉතිහාසයේ ප්‍රථම වතාවට එහෙම වුණේ. එච්චරට බයවෙලා, එච්චරට ආතතිය. විනිශ්චයකාරවරු අස් වෙනවා. හැබැයි, ඒගොල්ලන් රට දාලා යන්නේ නැහැ නේ. ඇයි, එතුමා රට දාලා ගියේ? එතුමාගේ ජීවිතයට තර්ජන ආපු නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන් අද වෙනකොට මේ සිද්ධිය අපේ රටේ පමණක් නොවෙයි, මුළු ලෝකයේම රැව් පිළිරැව් දෙනවා. ඒ නිසා අධිකරණ නිදහස ගැන කථා කරන්න ඕනෑ. මම අවංකව කියන්න ඕනෑ, යහ පාලන ආණ්ඩුව කාලයේ අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, අධිකරණයට යම් ස්වාධීනත්වයක් ලබා දුන්නු බව.

එය අංගසම්පූර්ණ එකක් නොවෙයි. අඩු පාඩු තිබෙනවා. නමුත්, තිබුණු එකට වඩා හොඳයි. පසුව, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආවා. ආයෙත් පරණ තත්ත්වයට ගියා. එදා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනකොට අපි කිව්වා ඒ සංශෝධනය ගේන්න එපා කියලා. නමුත්, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවුරුදු තුනක් තියාගෙන ඉඳලා එය වෙනස් කළා විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්. අපි කියපු දේ ආණ්ඩුව පිළිගත්තා; they accepted what we said about the Twentieth Amendment to the Constitution. ඉතින් මම කියන්නේ මේකයි. අද මේ පොහොට්ටු ආණ්ඩුවයි, ඊට කලින් මෙතුමන්ලාගේ පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුවයි මොනවාද කරලා තිබෙන්නේ?

බලන්න, අද අධිකරණ නිදහසක් තිබෙනවාද කියලා. පළාත් පාලන මැතිවරණය කල් දැම්මා. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නා, මැතිවරණය පවත්වන්න කියලා. ආණ්ඩුව සල්ලි දුන්නේ නැහැ. ඒ අධිකරණ තීන්දුව දියාරු කරන්න නේද සල්ලි දුන්නේ නැත්තේ? ඇයි, සල්ලි දුන්නේ නැත්තේ? අධිකරණයේ නිදහස ගැන කථා කළ යුතු අද දවසේ අපි ආර්ථිකය ගැන කථා කරලා වැඩක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් වරප්‍රසාද කමිටුවට ගෙනාවා. ඒ, විනිශ්චයකාරවරුන් බය කරන්න. මොකද, ඒ ගොල්ලෝත් අප වාගේ මිනිස්සු නේ. රැකියා නැති වෙයි ද කියන ප්‍රශ්න ඔවුන්ට තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන් පාර්ලිමේන්තුව තමයි අධිකරණයට බලපෑම් කරන්නේ. ඒක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. තවම පළාත් පාලන මැතිවරණය නැහැ. දැනට මාස 8ක් වෙනවා. මොකක්ද, මෙතුමන්ලා කළේ? මැතිවරණය පවත්වන්නේ නැතිව පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ගෙනාවා. ඒ Private Members' Bill එක ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ගෙන ආවා, දැනට සිටින ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, නාගරික මන්ත්‍රීවරුන් ආයෙත් ඒ සභාවලට පත් කරන්න. මේ පාර්ලිමේන්තුව හදන්නේ මැතිවරණ පවත්වන එක කල් දම දමා උප්පරවැට්ටි දමන්න. හැබැයි, නීතිපතිවරයා කියා තිබුණා දැනට ඉන්න මන්ත්‍රීවරුන් ආයෙත් සභාවලට පත් කරන්න නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක කැමැත්තක් ඕනෑ, ජනමත විචාරණයකුත් පවත්වන්න ඕනෑ කියලා. ඒ නිසා ඒක කරන්න බැරි වුණා.

IMF එකේ සාකච්ඡාවලින් පසුව අර්ථසාධක අරමුදල ප්‍රශස්තකරණය කරන්න ගියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රට මීට පෙර 16 වතාවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියා. කවදාවත් ඒ තීරණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. ඒවා ප්‍රතිපත්ති තීරණ, policy decisions. ඒවා පාර්ලිමේන්තුවට ගෙනෙන්න ඕනෑ නැහැ. නමුත්, මෙතුමන්ලා ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ මොකද? ඒ, යටි අරමුණක් ඇතිවයි. කලින් අවස්ථාවල වාගේ ප්‍රකාශයක් කරලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි ප්‍රකාශයට පත් කළා නම් අපේ රටේ ජනතාව උසාවි යනවා. මෙතුමන්ලා මොකක්ද කළේ? ඒ කොන්දේසි ප්‍රකාශයට පත් කරලා ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එහෙම කරන්න අවශ්‍ය නැහැ. ඊට පසුව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු ලවා වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කෙරෙව්වා. ගරු කථානායකතුමා තීන්දුවක් දුන්නා, "අධිකරණය ඉදිරියේ මේ නඩුව විභාග කරන්න බැහැ" කියලා. ඉතින් අධිකරණය කැමති වුණේ නැහැ, ව්‍යවස්ථාදායක සභාවත් එක්ක හැප්පෙන්න. ඒ ගොල්ලන් ඒක අත් හැරියා. ඉතින් අද පාර්ලිමේන්තුව නේද අධිකරණයේ නිදහස නැති කරලා තිබෙන්නේ? අධිකරණයට යන්න තිබෙන ඉඩ කඩ අහුරා තිබෙන්නේ? විනිශ්චයකාරවරුන් බය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එක් දෙයක් කියන්න ඕනෑ. අපේ ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා පසුගිය වතාවේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයට ගියා; ගරු අලි සබ්රි ඇමතිතුමාත් ගියා. හැබැයි, මේ අවුරුද්දේ ගියේ නැහැ. ඇයි, මේ අවුරුද්දේ ගියේ නැත්තේ? මා හිතන විධියට ගිය අවුරුද්දේ කියපු ඒවා අහගෙන ඉඳලා මේ අවුරුද්දේ යන්න අදි මදි කළා. මොකද, මේ අවුරුද්ද ගිය අවුරුද්දට වඩා අන්තයි. අපේ රටට විරුද්ධව ආර්ථික අපරාධ - economic crimes - සම්බන්ධව චෝදනා ඉදිරිපත් කර තිබෙනවා. පළාත් පාලන මැතිවරණය කල් දමලා මාස 8ක් වෙනවා. මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කරලා තිබෙනවා. නීතියේ හැටියට මාස දෙකෙන් ඒ කටයුතු අවසන් වෙන්න ඕනෑ. පළාත් පාලන මැතිවරණය කල් දමලා දැනට මාස 8යි. මාස 8ක් වෙලාත් තවමත් තීන්දුවක් ලැබිලා නැහැ. මේ රටේ ජනතාවට ඡන්ද අයිතිය නැත්නම්, අධිකරණයෙන් අප බලාපොරොත්තු වන සහනය ලැබෙන්නේ නැත්නම් ජනතාව කරන්න ඕනෑ මොකක්ද? ඔබතුමා කියන්න, මොනවාද කරන්න ඕනෑ කියලා? අද ප්‍රාදේශීය සභා සභාපතිවරුන් නොමැති නිසා ගම්වල විශාල ඇද වැටීමක් තිබෙනවා.

අද ගමේ ප්‍රශ්න සාකච්ඡා කරන්න තැනක් නැහැ. ගමේ ප්‍රශ්න කවුරු එක්ක ද සාකච්ඡා කරන්නේ? අපි පාර්ලිමේන්තුවේ වැඩ කරන්නේ. නමුත්, අද ගම්වලට ලබා දෙන සේවාවන් සම්බන්ධයෙන් විශාල ඇද වැටීමක් තිබෙනවා.

[ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

අග්‍ර විනිශ්චයකාරතුමාට අපේ ගරු කිරීමක් තිබෙනවා. ඒ වාගේම, නීතිපති දෙපාර්තමේන්තුවටත් අපි ගරු කරනවා. ඒවා ස්වාධීන ආයතන වෙන්න ඕනෑ. මේ විධියට රජයෙන් බලපෑම් කරනවා නම් කොහොමද ඒවා ස්වාධීන වෙන්නේ? දැන් පනත් බොහොමයක් ගේනවා. ගිය අවුරුද්ද තුළ මේක පනත් කෙටුම්පත් ෆැක්ටරියක් වාගේයි. පනත් කෙටුම්පත් බොහොමයක් ගෙනාවා මම ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට මේ කාරණය මතක් කරන්න ඕනෑ. දැන් මාසයකට විතර කලින් මම ගරු ඇමතිතුමාට අනතුරු ඇඟවීමක් කළා. පනත් කෙටුම්පත් හදලා ඉක්මනට ගේනවා, හරියට බලන්නේවත් නැතිව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක පනත් කෙටුම්පතක් ශ්‍රේෂ්ඨාධිකරණය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළා; they totally rejected it. ඒක, හදිසියේ ගෙනාපු පනත් කෙටුම්පතක්. පනත් කෙටුම්පත් ගෙන එන එක නොවෙයි වැදගත්කම. ඒ පනත් කෙටුම්පත් දිහා බලලා සාධාරණ විනිශ්චයක් දෙන්න අධිකරණයට නිදහස තිබෙනවා ද? අද ඒ නිදහස අහුරා තිබෙනවා; ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට පීඩනය ඇති කර තිබෙනවා. එක විනිශ්චයකාරවරයෙක් රට දාලා ගිහින් තිබෙනවා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු දවසේ ඉඳලා මම මේ පාර්ලිමේන්තුවේ කරපු කථා දිහා බලන්න. මම හැමදාම කිව්වා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් නීතියේ උත්තරීතරභාවය නැති කරලා තිබෙනවා කියලා. නීතියේ උත්තරීතරභාවය නැති වනකොට කවදාවත් ආයෝජන එන්නේ නැහැ. හැබැයි, ගිය සතියේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු කියනවා මම දැක්කා, දශමයකින් ආයෝජන වැඩි වෙලා තිබෙනවා කියලා. අපේ රට ගොඩ ගන්න දශමයකින් ආයෝජන වැඩි වෙලා වැඩක් නැහැ. රට එහෙම ඉදිරියට ගෙන යන්න බැහැ. අපේ රටට ආයෝජන පිම්මක් තිබෙන්න ඕනෑ; there should be a leap of investments. ඒක අපට තිබෙනවා ද? අද වැදගත් දේ මොකක්ද?

මේ ආණ්ඩුවේ පැටිකිරිය දිහා බලන්න. මේ ගොල්ලන් තමයි මේ පාර්ලිමේන්තුව යොදාගෙන, හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය එළෙව්වේ. එදා ශිරානි බණ්ඩාරනායක මැතිනිය දිවි නැගුම පනත් කෙටුම්පතට විරුද්ධව නඩු තීන්දුවක් දුන්නා කියලා තමුන්නාන්සේලා එතුමියව එළෙව්වේ නැද්ද? එළෙව්වේ නැද්ද? පාර්ලිමේන්තුවට දෝෂාභියෝගයක් ගෙනැල්ලා එතුමියව තනතුරින් ඉවත් කළා.

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture)
ඒකට සහයෝගය දක්වපු අය ඔබතුමන්ලාගේ පැත්තේත් ඉන්නවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම නම් ඒ පැත්තේ හිටියේ නැහැ. හොඳ ද? මම නම් හිටියේ නැහැ. මම අවුරුදු 20ක් තිස්සේ එකම පැත්තේ. මම නම් ඒ වෙනුවෙන් පෙනී හිටියේ නැහැ.

එහෙම කරපු මේ ගොල්ලන් තමයි අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන්නේ. ඒ හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය ගෙනැල්ලා මොකක්ද කළේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ අවසාන යෝජනාව කියවන්න කියලා. අපේ විජයදාස රාජපක්ෂ මැතිතුමාට බුද්ධිය තිබෙනවා. එතුමාත් එම යෝජනාවට විරුද්ධව එදා ඡන්දය දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා ඒක නිකම් විනෝදය සඳහා කියවා බලන්න. ශිරානි බණ්ඩාරනායක හිටපු අග විනිසුරුවරියට විරුද්ධව සාක්ෂි මෙහෙයවන්න දෝෂාභියෝග කමිටුවක් පත් කෙරුවා. අවසාන දවසේ යෝජනාවක් ගේන්න ඕනෑ, එතුමියව ඉවත් කරන්න. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා දන්නවා නේ වෙච්ච දේ. ශිරානි බණ්ඩාරනායක මැතිනිය ඉවත් කිරීමේ යෝජනාවක් ගේන්නේ නැතිවම පාර්ලිමේන්තුව ඡන්දය දුන්නා. ගරු අධිකරණ ඇමතිතුමනි, මම කියන එක ඇත්ත නේ. ශිරානි බණ්ඩාරනායක මැතිනිය ඉවත් කිරීමේ යෝජනාවක් නැතිව එදා ඡන්දය දුන්නා. අපි අන්තිම දවසේ ඡන්දය දුන්නේ මොකටද? දෝෂාභියෝග කමිටුව පත් කිරීමේ යෝජනාව තමයි අවසාන දවසේ ඉදිරිපත් කෙරුවේ. එහෙම නේද, ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඔව්, හරි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මේ විධියට තමයි එදා පාර්ලිමේන්තුවේ කථානායකතුමා කටයුතු කළේ. එදා විජයදාස රාජපක්ෂ මැතිතුමාත් නැඟිටලා කථා කෙරුවා; මමත් කථා කෙරුවා. අවසන් කථාව කරමින් මම කිව්වා, "There is no Motion to expel the Chief Justice" කියලා. There was no Motion. On the last day, the Motion they brought was to appoint the Select Committee on the Impeachment. You have a look at it now. Now, we cannot turn back the clock, but you just have a look at it. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා ඒ යෝජනාව බලන්න. ඒක හාස්‍යජනක සිද්ධියක්. මම මේ අවස්ථාවේදී ඒකත් කියන්න ඕනෑ.

දැන් පළාත් පාලන මැතිවරණයේ නාම යෝජනා cancel කරන්න යනවාය කියලා කසුකුසුවක් තිබෙනවා නේ. පත්තරවල තිබෙනවා, ඡන්දය කල් දමන්න අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී අපිත් කැමති වුණාය කියලා. ආණ්ඩුවට හිතවත් සමහර ඉංග්‍රීසි පත්තරවල එහෙම තිබුණා. නමුත් එදා විපක්ෂයේ කිසිම කෙනෙක් හිටියේ නැහැ. ඒ තීන්දුව අරගෙන තිබෙන්නේ ආණ්ඩු පක්ෂය. අපි කවදාවත් ඡන්දය කල් දමන්න, නාම යෝජනා අහෝසි කරන්න කැමැත්ත දීලා නැහැ. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා පිළිගන්නවාද දන්නේ නැහැ, නාම යෝජනා cancel කරන්නත් තුනෙන් දෙකක බලයක් ඕනෑ, ජනමත විචාරණයක් ඕනෑ කියලා. නමුත් මොකක්ද මේ ආණ්ඩුව කරන්නේ? ඔක්කෝම හරි කියනවා, සාර්ථකයි කියනවා, ආර්ථිකය හොඳට යනවා කියනවා. ඡන්දය පවත්වන්න බයයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ආණ්ඩුවේ ඇමතිවරයෙක්. ඉතින්, එතුමා ආණ්ඩුව ගැන ගුණ කියන්න ඕනෑ. එතුමා කිව්වා ආර්ථිකය හොඳට යනවා කියලා. නමුත් අපි මාස 17ක් ණය ගෙවලා නැහැ. We have not paid the loans. ඒක තමයි ඇත්ත. ණය ගෙවන්නේ නැති වුණාම සාක්කුවේ සල්ලි ටිකක් තිබෙනවා. අපි මාස 17ක් ණය ගෙවන්නේ නැතුව තමයි මේ යන්නේ. IMF එකේ දෙවැනි ණය කොටස කවදා හම්බ වෙයිද කියලා දන්නේ නැහැ. ඉතින් කොහොමද සාර්ථකයි කියන්නේ? අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල හොඳටම වැඩි වෙලා. අද මිල පාලනයක් නැහැ; there is no price control.

මට මතකයි, අපි උසාවි යන කාලයේ හැම සඳුදාම මහනුවර අධිකරණයට ව්‍යාපාරිකයන් 200දෙනෙක් විතර අරගෙන එනවා, වැඩි මිලට බඩු විකුණලා. ව්‍යාපාරිකයන් 200දෙනෙක් විතර අරගෙන එනවා. ඒ හැම එක්කෙනාටම දඩ ගැහුවා. අද මිල පාලනයක් නැහැ; there is no price control. රට දඩාවතේ යනවා. අනෙක් එක, පසුගිය අවුරුද්ද තුළ අපේ රට ගොඩ දමන්න ආධාරයක් හම්බ වෙයි කියලා අපි හිතුවා. නමුත් එවැනි ආධාරයක් හම්බ වෙලා නැහැ. අපට මොනවාද හම්බ වෙලා තිබෙන්නේ? IMF එකෙන් ඩොලර් මිලියන 300ක් - US Dollars 300 million - හම්බ වුණා. ඉන්දියාවෙන් ණයට කෑම ගෙනෙන්න පුළුවන් අරමුදලක් හම්බ වුණා. අනෙක් ඒවා බෙහෙත් ගන්න, දුගී දුප්පත් අයගේ දුප්පත්කම නැති කරන්න ලැබුණු සුළු ආධාර. ණයෙන් ගොඩ එන්න, මේ අර්බුදයෙන් ගොඩ එන්න අපට ආධාරයක් හම්බ වෙලා නැහැ. දැන් බටහිර රටවල් කියනවා, චීනය එකඟ වුණොත් ණය ප්‍රතිව්‍යුහගත කරන්න පුළුවන් කියලා. නමුත් තවම චීනයේ එකඟතාවක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, චීනය ඒකට එකඟ වෙන්න ඕනෑ; they must agree. මොකද, අපි මේ ණය උගුලට අහු වුණේ චීනය නිසා නේ. ඒක ආණ්ඩුව කථා කරලා කියන්න එපා යැ. හම්බන්තොට harbour එකක් හැදුවා. ඒකෙන් සත පහක ආදායමක් තිබෙනවාද? මත්තල Airport එකක් හැදුවා. ඒකෙන් ආදායමක් තිබෙනවාද? නෙළුම් කුලුන හැදුවා. ඒකෙන් ආදායමක් තිබෙනවාද? එවැනි return එකක් නැති ආයෝජන නිසා තමයි අපේ රට අමාරුවේ වැටුණේ. ඒක පිළිගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂ නායකතුමාත් අද උදේ මේ ගැන කිව්වා. IMF Report එකේ තිබෙනවා, අපේ රට වැටුණේ මේ රජයේ පළමුවැනි අය වැයෙන්ම රුපියල් බිලියන 800ක බදු සහන දුන් නිසාය, බදු කපා හැරිය නිසාය කියලා. IMF එක එහෙම කියනවා. We lost Rs. 800 billion. තමුන්නාන්සේලා ඔක්කෝම ඒකට පක්ෂව ඡන්දය දුන්නා නේ. රුපියල් බිලියන 800ක් නැති කර ගන්න ඡන්දය දුන්නේ අපිද? අපි ඡන්දය දුන්නේ විරුද්ධව, ඒක කරන්න එපා කියලා. ඉතින් තමුන්නාන්සේලා ඒකට පක්ෂව අත උස්සලා රට බංකොලොත් කළාට අපි පළිද? මම ඔබතුමන්ලාට හොඳ උදාහරණයක් දෙන්නම්, එංගලන්තයෙන්. පොඩ්ඩක් අහගන්න. එංගලන්තයේ ලිස් ට්‍රස් කියලා අගමැතිවරියක් හිටියා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බොරිස් ජොන්සන්ගෙන් පසුව අගමැති ධුරයට පත් වෙලා එතුමිය මොකක්ද කළේ? එතුමිය බලයට පත් වුණා විතරයි, මේ ලංකාවේ වාගේම ව්‍යාපාරිකයන්ට පනවා තිබුණු බදු ඉවත් කළා. ඒක විශාල මුදලක්. එතකොට එතුමියගේ පක්ෂයේ අය ඇහුවා, බදු ඉවත් කළාම ආදායම නැති වෙනවා, කොහොමද ඒ ආදායම හොයා ගන්නේ කියලා. එදා රුපියල් බිලියන 800ක් කපා හැරපු වෙලාවේ ඔබතුමන්ලාටත් තිබුණා ගෝඨාභයගෙන් අහන්න, රුපියල් බිලියන 800ක් කපනවා, කොහොමද ඒ මුදල හොයා ගන්නේ කියලා.

එක්කෙනෙක්වත් ඒ ගැන ඇහුවාද? ඇහුවේ නැහැ. නමුත් එංගලන්තයේ මොකක්ද වුණේ? ලිස් ට්‍රස් කිව්වා, "අපට බදු ආදායම නැති වෙනවා, අපි ණය ගන්නවා" කියලා. මොකක්ද එතුමියට වුණේ? මන්ත්‍රීවරු එතුමියට විරුද්ධව කැරැල්ලක් ගහලා කිව්වා, "එහෙම කරන්න බැහැ, ඔයා යන්න" කියලා. මන්ත්‍රීවරු තමයි එතුමියව එලෙව්වේ; පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තමයි පක්ෂ නායිකාව එලෙව්වේ. ඇය බලයට පත් වෙලා මාස තුනයි. "අපට බදු ආදායමෙන් විශාල මුදලක් ආවා. ඔබතුමිය ඒක නැති කරගෙන ඒක පියවන්න ණය ගන්නවා" කියලා ඒ මන්ත්‍රීවරු කිව්වා. ඒක හරිද? බදු සහන දෙන එකට තමුන්නාන්සේලා විරුද්ධ වුණේ නැහැ. ඒක තමුන්නාන්සේලාගේ වැරැද්ද. ඔබතුමන්ලා තමයි අත ඉස්සුවේ ඒ බදු සහන දෙන්න. ඉදිරියේ දී හරි මෙවැනි වැරදි කරන්න එපා. රජයට සහයෝගය දෙන්න අපි සූදානම්. දූෂණ විරෝධී පනත සම්මත කරන්න අපි සහයෝගය දුන්නා. නමුත් ඒකේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒක නිවැරදි කරනවා කියලා විෂය භාර ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. මම කියන්නේ මේකයි. The rule of law ක්‍රියාත්මක වෙන්නේ නැතුව ආයෝජන එන්නේ නැහැ. Port City එක පටන් ගත්තා නේ. කැමරන්ට ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක් - US Dollars 6 million - දීලා කැමරන් එහි උපදේශකවරයෙකු හැටියට අරගෙන තිබෙනවා. ඒක හොඳයි. නමුත් කැමරන්ට පඩි ගෙව්වා කියලා ආයෝජකයෝ එන්නේ නැහැ. මොකද, කැමරන් සල්ලි ඒකට දාන්නේ නැහැ නේ. ආයෝජකයෝ නේ, සල්ලි දාන්නේ. නීතියේ උත්තරීතරභාවය නැති රටකට ආයෝජකයෝ එන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාට තව එක කාරණයක් කියන්නම්. 1977න් පස්සේ චීනය ඒ ගොල්ලන්ගේ ආර්ථිකය විවෘත කළා. එහිදී ඒ ගොල්ලෝ මොකක්ද ඉස්සෙල්ලාම කළේ? ඒ ගොල්ලෝ චීන පාර්ලිමේන්තුවට පනතක් ගෙනාවා, foreign investmentsවලට වෙනම නීතියක් හඳුන්වා දෙමින්. ඒ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති වුණාට, රටේ ඡන්ද නැති වුණාට investments ආරක්ෂා කරන්න නීතියක් ගෙනාවා. ඒ නීතිය හැදුවාට පස්සේ තමයි බටහිර ව්‍යාපාරිකයන් චීනයට ගියේ.

අද අපේ රටේ අධිකරණය විශාල පීඩනයකින් ඉන්නේ. අපට අග්‍ර විනිශ්චයකාරතුමා ගැන විශ්වාසයක් තිබෙනවා. මොකද, එතුමා නීතිපති හැටියට හිටපු කාලයේ නඩු 45ක් දැම්මා නේ. විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා නේ. ඒවා දූෂණ නඩු, ආර්ථික අපරාධ නඩු. අග්‍ර විනිශ්චයකාරතුමා නීතිපති හැටියට හිටපු කාලයේ නඩු 45ක් දැම්මා. ඒවාට මොකක්ද වුණේ? ඊට පස්සේ ආණ්ඩු වෙනසක් ඇති වුණා. කොමිෂන් එකක් පත් කළා ඒ නඩු තීන්දු ගැන හොයන්න. මේක විහිළුවක් නේ. ශ්‍රේෂ්ඨාධිකරණය දුන් නඩු තීන්දු ගැන හොයන්න කොමිෂන් එකක් පත් කළා! ඒ කොමිෂන් එක මේ නඩු තීන්දුවල අඩුපාඩුකම් පෙන්වුවා. මේ වාගේ දේවල් නේ කළේ. ඉතින් කොහොමද අධිකරණය ගැන විශ්වාසයක් තබන්නේ? ඒ විශ්වාසය ඇති කරන්න විජයදාස රාජපක්ෂ ඇමතිතුමා උත්සාහයක් ගන්නවා. එතුමා ආර්ථිකය ගැන කියපු දේ ඇත්ත. ඔය අපනයනකරුවන් ඇමෙරිකානු ඩොලර් බිලියන 54ක් පිටරට තියාගෙන ඉන්නවා කියලා එතුමා අවුරුදු ගණනක් මේ පාර්ලිමේන්තුවේ කිව්වා. මහ බැංකුව ඒක ගණන් ගත්තේ නැහැ. Central Bank එක අපටත් බොරු කිව්වා. මේ රට බංකොලොත් වෙනකම් මහ බැංකුව ඒ ගැන කිව්වේ නැහැ. මහ බැංකු අධිපතිවරයා මැයි මාසයේ Parliament එකට ආවා. මම ඔහුගෙන් ඇහුවා, කොච්චර foreign reserves තිබෙනවාද කියලා. මොකක්ද ඔහු කිව්වේ? අපිට foreign reserves තිබෙන්නේ US Dollars 20 million කියලා ඔහු කිව්වා. ඔහුගේ statement එකේ තිබෙන්නේ US Dollars 2.5 million කියලා. එතකොට මම ඔහුගෙන් ඇහුවා, statement එකේ US Dollars 2.5 million තිබෙනවා, ඔබතුමා US Dollars 20 million කියලා දැන් කියනවා, ඔබතුමා වැඩි කරලා නේද මේ ගණන දාලා තිබෙන්නේ කියලා. මහ බැංකුව ඒ විධියට තමයි අප නොමඟ යැව්වේ. අනෙක් එක, ඔය Central Bank එකේ කට්ටිය කලින් ආණ්ඩුව එක්කත් කටයුතු කළා නේ. ඒ කාලයේ යහපාලන ආණ්ඩුවට වඩා දහ ගුණයකින් බැඳුම්කර විකුණුවා. විජයදාස රාජපක්ෂ ඇමතිතුමා ඒ ගැන දන්නවා නේ. එතුමන්ලා ඒ කාලයේත් මේ ගනුදෙනු තුළ හිටියා. අපි Central Bank එකයි, Sri Lanka Customs එකයි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවයි හදා ගත්තොත්, අපේ රට ගොඩගන්න පුළුවන්. විජයදාස රාජපක්ෂ ඇමතිතුමා ඒ සඳහා උත්සාහයක් ගන්නවා. ඒ උත්සාහයට අපි සහයෝගය දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Mahinda Amaraweera. You have 14 minutes.

[අ.භා. 12.29]

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විජයදාස රාජපක්ෂ මැතිතුමා අද ඉතා වැදගත් පනත් කිහිපයක සංශෝධන, නියෝග සහ නියමයක් පිළිබඳව අදහස් ඉදිරිපත් කළා. ඒ වාගේම එතුමා මේ රටේ ඇති වී තිබෙන ආර්ථික අර්බුදයටත්, ආර්ථික පසුබෑමටත් හේතු වුණු කරුණු රාශියක් ගැන හෙළිදරව් කළා. ඒ පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ පනත් පිළිබඳව කථා කරන අවස්ථාවේදී මම පළමුවෙන්ම යම් අදහසක් ඉදිරිපත් කළ යුතුයි, කිරිඇල්ල මැතිතුමා ඉදිරිපත් කළ කාරණාවක් සම්බන්ධයෙන්. මුලතිව් අධිකරණයේ නඩු ඇසූ විනිශ්චයකාරවරයෙකු එක පාරටම විදේශ ගතවෙලා තිබෙනවා. ඒ සම්බන්ධව සම්පූර්ණ පරීක්ෂණයක් කරන්න කියලා ජනාධිපතිතුමා දැනටමත් උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මහජන ආරක්ෂක අමාත්‍යතුමාත් CID එක ලවා මේ සිද්ධිය සම්බන්ධයෙන් වෙනම පරීක්ෂණයක් කරමින් පවතිනවා. සාමාන්‍යයෙන් ඒ වාගේ වගකීමක් සහිත තනතුරක් දරන විනිශ්චයකාරවරයෙකුට තර්ජනයක් එල්ල වුණා නම්, අඩුම ගණනේ පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න තිබුණා. නමුත්, එතුමා කිසිම තැනකට පැමිණිල්ලක් කරලා නැහැ. ඒ සම්බන්ධව අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුවත් කරලාත් නැහැ. ඒ නිසා මෙතැන ලොකු කුමන්ත්‍රණයක් තිබෙන බව අපට ඉතා පැහැදිලියි. ඒ වාගේම ආරංචියක් පැතිර යනවා, එතුමා රට යන්න පෙර බටහිර තානාපති කාර්යාලවල තානාපතිවරු දෙදෙනෙකු මුණ ගැහුණා කියලා. ඒ වාගේම එතුමා ලබා දුන් නඩු තීන්දුවලට විරුද්ධව වෙනම පරීක්ෂණයක් සිදුවෙන බව අධිකරණ සේවා කොමිෂන් සභාව තුළ කථා බහට ලක්වෙන බවත් අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ වාගේම එතුමාට විරුද්ධව එතුමාගේ බිරිඳ යම් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබීම පිළිබඳවත් සාකච්ඡා වෙනවා. එතකොට එතුමා රට දාලා යන්නේ තර්ජනයක් නිසාද, එහෙම නැත්නම් තමන් කරපු වැරදිවලින් බේරෙන්නද කියන එක පිළිබඳවත් අපි සොයා බලන්න ඕනෑ. මොකද, විදේශ රටකට ගිහිල්ලා පුරවැසිභාවය ලබා ගන්න නම්, ජීවිත තර්ජනයක් තිබෙනවා කියන එක හොඳම උත්තරය බවට පත් වෙනවා. ඒ නිසා අපිත් ඉතා කැමැත්තෙන් ඉන්නවා, එතුමාට එහෙම සිද්ධියක් වෙලා තිබෙනවා නම්, ඒ ගැන දැනගන්න. එතුමාට තර්ජනයක්, පැමිණිල්ලක් තිබුණා නම්, ඒ සම්බන්ධයෙන් අධිකරණයෙන් වරෙන්තුවක් නිකුත් කිරීමේ හැකියාව තිබුණා. නමුත්, එවැනි දෙයක් පිළිබඳව මෙතෙක් වාර්තා වෙලා නැහැ. ඒ නිසා මෙතැන කුමන්ත්‍රණයක් තිබෙනවාද, ඒ කුමන්ත්‍රණයට විපක්ෂයත් සම්බන්ධද කියලා බලන්න ඕනෑ. මොකද, අපි හිතුවේ නැති විධියට ඒ වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් ඉන්නවා, මේ පාර්ලිමේන්තුවේ. ඒ නිසා අපට ඒ පිළිබඳව සැකයක් තිබෙනවා. මෙම සිදුවීම මේ රට අපකීර්තියට පත් කරන්න ගත් උත්සාහයක්ද කියන එක පිළිබඳවත් අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම අපි ඒ පිළිබඳව සොයා බැලීමක් කරනවා. ඒ වාගේම එ් සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් සිදු කිරීම සඳහා ජනාධිපතිතුමාත්, රජයත් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

ඒ වාගේම අපි අමතක කරන්න හොඳ නැහැ, මෙහෙම දෙයක් සිදුවුණු පළමුවැනි වතාව මේක නොවෙයි කියන එක. මොකද, 88 -89 කාලයේත් කිරිඇල්ල මන්ත්‍රීතුමා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ, තෙල්දෙණිය ප්‍රදේශයේ සේවය කළ මහෙස්ත්‍රාත්වරයෙකුත් මේ විධියටම රට අතහැරලා ගියා. ඒ කාලයේ රටේ භීෂණයක් පැවතුණා. ඒ කාලයේත් මේ වාගේ සිද්ධීන් වෙලා තිබෙනවා. ඒ කාලයේ උසාවි විසි ගණනක් පමණ ගිනි තැබුවා. ඒ වාගේම මඩුවල නඩු අහන තත්ත්වයක් ඇති වුණා. ඒ නිසා මේ වාගේ සිද්ධීන් මේ රටේ ඇති වුණු පළමුවැනි වතාව මෙය නොවෙයි. මීට පෙරත් විනිශ්චයකාරවරු රට අත්හැර ගිහිල්ලා තිබෙනවා. හැබැයි, ඒ අය ඒ සඳහා සාධාරණ හේතු ඉදිරිපත් කරලා තිබුණා. නමුත්, එහෙම සිද්ධියක් නොවෙයි මෙතැන වෙලා තිබෙන්නේ. මේ දිහා බලන ඕනෑම කෙනෙකුට - සාමාන්‍ය පුරවැසියෙකුට වුණත්- පැහැදිලිව පෙනෙනවා, මෙතැන යම් කුමන්ත්‍රණයක්, රට අපකීර්තියට පත් කරන වැඩ පිළිවෙළක් දියත් කරන්න සූදානමක් තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තවත් කාරණා ගණනාවක් සම්බන්ධයෙන් කථා වුණා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා, මැතිවරණ ක්‍රමය සහ මැතිවරණ කල් දැමීම ගැන. මේ රටේ දූෂණයට ප්‍රධාන හේතුවක් තමයි, මේ මැතිවරණය ක්‍රමවේදය. ඒ පිළිබඳව අපි අවුරුදු ගණනක් කථා කර තිබෙනවා. ඒ වාගේම කමිටු පත් කර තිබෙනවා. නමුත්, කිසිම ආකාරයක වෙනසක් සිදු කර ගන්න බැරි වුණා. මැතිවරණ ක්‍රමවේදය සම්බන්ධයෙන් ගත් හැම වෙනස් කිරීමක්ම ඒ තත්ත්වයට තවත් අත් උදවු දීමක් මිස දූෂණ, වංචා වැළැක්වීමට හේතු වුණු තීන්දු නොවෙයි.

දැන් මෙතැනදී ප්‍රකාශ වුණා, මැතිවරණ කල්දැමීම ලෝකයෙන්ම අපට එල්ල වෙන ප්‍රශ්නයක් කියලා. මැතිවරණ පැවැත්වුවා නම් ඔක්කෝම හරි යනවා කිව්වා. මැතිවරණ පැවැත්වුවා නම් ඔක්කෝම හරි යන්නේ කොහොමද? දැන් ඔබතුමන්ලාම කියන විධියට මේ රට බංකොලොත්, මිනිස්සුන්ට කන්න-බොන්න නැහැ, මිනිස්සු ආර්ථික අමාරුකම්වලින් ඉන්නේ. අපි ඒක පිළිගන්නවා. එතකොට ආණ්ඩුවේ සල්ලි සහ අපේක්ෂකයින්ගේ සල්ලි තවත් රුපියල් මිලියන අටක්-දහයක් වියදම් කරලා මැතිවරණයක් පැවැත්වූවා නම් මේ ප්‍රශ්න විසඳෙනවාද? මැතිවරණයක් පවත්වා ආයෙත් 8,000කට වැඩි මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් පත් කරනවා නේ. පඳුරකට පයින් ගැහුවත් මන්ත්‍රීවරුන් එළියට එන විධියේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් පත් කරන්න කටයුතු කර තිබෙනවා නේ. ඉතින් මේ ක්‍රමයේ අසාර්ථකත්වය දැකලා දැන් හෝ මේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව අඩු කරලා නිවැරැදි ක්‍රමයකට මැතිවරණයකට යනවා මිසක්, එහෙම නැතුව මැතිවරණයකට ගියා කියලා මේ රටේ ජනතාවට ඒකෙන් සෙතක් වෙන්නේ නැහැ. මැතිවරණයක් පැවැත්වූවා කියලා මේ රටට ලැබෙන ආයෝජන වැඩි වෙනවාද, මේ රටේ මිනිස්සුන්ගේ ආර්ථිකය හරි යනවාද?

මැතිවරණ කල් දමන්න ආණ්ඩුවට වුවමනාවක් නැහැ. මැතිවරණ පවත්වන්න ඕනෑ. අපි අවශ්‍ය තීන්දු-තීරණ අරගෙන නියමිත වෙලාවට මැතිවරණ පවත්වනවා. ලබන අවුරුද්දේ සැප්තැම්බර්-ඔක්තෝබර් වෙනකොට මේ රටේ ජනාධිපතිවරණයක් පවත්වාවි. එය නතර වෙන්නේ නැහැ. ඒක කොහොමටත් පවත්වනවා. ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණය 2025 වර්ෂයේ අගෝස්තු තමයි පවත්වන්න තිබෙන්නේ. නමුත්, ඊට මෙහා එය පවත්වන්න ජනාධිපතිවරයාට බලය තිබෙනවා. ඉදිරියේදී ඒ මැතිවරණ පවත්වනවා. රටේ පවතින පාලනය වෙනස් කරගන්න පුළුවන්, රටට යම් තීරණයක් ගන්න පුළුවන් තීන්දුගත, තීරණාත්මක මැතිවරණ එකක්වත් කල් යන්නේ නැහැ. ඒ මැතිවරණ පවත්වනවා. ඒවාට ආණ්ඩුව බය වෙන්නේත් නැහැයි කියන එක මේ අවස්ථාවේදී මම පැහැදිලිව කියන්න කැමැතියි.

අද තිබෙන ප්‍රශ්නය මොකක්ද? දැන් මෙතැන සාකච්ඡා වුණා, විජයදාස ඇමතිතුමාත් කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිටින දහදෙනා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිසමට සාමාජිකයන් පත් කිරීම මඟ හැරියා කියලා. මම දන්නා විධියට විපක්ෂ නායකතුමා තමයි තර්කයක් ගොඩනඟා තිබෙන්නේ, "මණ්ඩලය" සහ "සභාව" කියන එක ගැන. මම නම් කියන්නේ විරුද්ධ පක්ෂයේ නායකතුමා තමයි අල්ලස් කොමිසම ශක්තිමත් කරන්න මූලිකව කටයුතු කරන්න ඕනෑ කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඒ සඳහා ඉතා පැහැදිලිව, හොඳටම ඉඩකඩ තිබෙනවා. ඒ නම වෙනස් කිරීම සම්බන්ධ ප්‍රශ්නයක් නැහැ, නම නිවැරදි කිරීමට කැබිනට් අනුමැතියත් ලබා දීලා තිබෙනවා. ඒ කටයුත්ත සිද්ධ වෙයි. එතෙක් මේ සාමාජිකයන් පත් කිරීමට කිසිම බාධාවක් නැහැ කියලා දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් පෙන්වා දුන්නා. එහෙම නම් උදේම පාර්ලිමේන්තුවට ඇවිල්ලා "හොරු ඉන්නවා, අල්ලස් ගන්නවා, වංචා දූෂණ තිබෙනවා" කියලා විපක්ෂ නායකතුමා බොරුවට කිව්වට වැඩක් නැහැ. අද උදේත් ඇවිල්ලා මෙතැන නිකම් බෙරිහන් දුන්නා. ඒ දේවල් වළක්වන්න තිබෙන අවස්ථාව එතුමා ඇතුළු කණ්ඩායම විසින් තමයි මූලිකත්වය අරගෙන නතර කර තිබෙන්නේ. කවුරු වුණත් -ආණ්ඩු පක්ෂය වුණත්, විරුද්ධ පක්ෂය වුණත්- අල්ලස් කොමිසම ශක්තිමත් කරන්න උදවු නොකර ඒකට බාධා කරලා දැන් අල්ලස ගැන, දූෂණය ගැන කථා කළාට වැඩක් වෙන්නේ නැහැ. හරි විධියට නම් ඒක පත් කරන්න මූලිකත්වය ගත යුත්තේ විරුද්ධ පක්ෂයයි. සාමාන්‍යයෙන් විරුද්ධ පක්ෂය නේ, වැරදි හොයන්නේ. ආණ්ඩු පක්ෂයෙන් වෙන වැරදි හොයන එක තමයි විරුද්ධ පක්ෂයේ සාමාන්‍ය කාර්ය භාරය. එහෙම නම් ඒ කටයුත්ත තමයි කරන්න ඕනෑ. නමුත්, අවාසනාවට ඒ කටයුත්ත සිද්ධ වෙන්නේ නැහැ. වචනයක් මුල් කරගෙන ඒ තත්ත්වය නතර කර තිබෙනවා කියන එක මම කියන්න ඕනෑ.

ඒ වාගේම තවත් එකක් මෙතැන සඳහන් වුණා. මේ අල්ලස් කොමිසම ශක්තිමත් කළා නම්, පිටරටවල තිබෙනවා කියන සල්ලි ලබා ගැනීමේ හැකියාව ලැබෙනවා. දැන් එක එක දේවල් කියනවා. Pandora Papers ගැන කියනවා, එක එක රටවල බිලියන ගණන් තිබෙනවා කියනවා. දැන් මෙතැනදී කිව්වා, අපේ ඩොලර් බිලියන 56ක මුදලක් විදේශ රටවල තිබෙනවා කියලා. අපේ රටේ සමහර අපනයනකරුවන් පිට රටවල මුදල් රඳවා ගෙන ඉන්නවා කියලාත් කිව්වා. ඒවා ඒ අය මහන්සි වෙලා හම්බ කරපු මුදල් වෙන්න පුළුවන්. හැබැයි, ඒවා ගෙන්වා ගන්න පුළුවන්. අපේ රටේ අපනයනකරුවන් එහෙම පිට රටවල මුදල් තැන්පත් කර තිබෙනවා නම්, ඒවා ගෙන්වා ගැනීම සඳහා යම් සහන කාලයක් ලබා දීලා, ඒ අය දිරි ගන්වන ක්‍රමවේදයකුත් සකස් කර දුන්නා නම්, ඒ මුදල් ටික මේ රටට ගෙනෙන්න පුළුවන්. හොරකම් කරපු ඒවා එහෙම ගන්න බැහැ. ඒවා එහෙම ගෙනෙන එකක් නැහැ. හොරකම් කරලා පිටරට ගිණුම්වල මුදල් දමාගෙන ඉන්නවා නම්, ඒවාට නීත්‍යානුකූලව කටයුතු කරන්න පුළුවන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිසමට සාමාජිකයන් පත් නොකිරීම තුළ සිද්ධ වෙලා තිබෙන්නේ ඒ සියලු කටයුතු නතර වෙලා තිබෙන එකයි; හිර වෙලා තිබෙන එකයි. ඒ කටයුතු මාස ගණනක් නතර වෙලා තිබෙනවා. ඒ නිසා මම හිතන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්නා දහදෙනාම නැවත සාකච්ඡා කරලා කඩිනමින් මේ අල්ලස් කොමිසම ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළ දියත් කරන්න ඕනෑ. එහෙම නැතුව හැම දාම උදේට බැණ-බැණ පාර්ලිමේන්තුවේ කථා කළා කියලාවත්, හවසට ගිහිල්ලා රැස්වීම් වේදිකාවල අල්ලසට, දූෂණයට විරුද්ධව කථා කළා කියලාවත් ප්‍රතිඵලයක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා දූෂණයට වැට බඳින වැඩ පිළිවෙළ ශක්තිමත් කර, අල්ලස්-දූෂණ සිදු වෙලා තිබෙනවා නම් ඒ මුදල් ආපසු ලබා ගන්නා වැඩ පිළිවෙළ දියත් කිරීම තමයි කළ යුතු වෙන්නේ. නමුත්, ඒ කටයුත්ත සිද්ධ වෙන බවක් අපට පෙනෙන්න නැහැ.

බොරුවට බෙරිහන් දෙනවා. බොරුවට රැස්වීම්වල කථා කරනවා, "මෙච්චර අල්ලස් ගත්තා, මෙච්චර දූෂණ සිදු වුණා, මෙච්චර නාස්තියක් වුණා" කියලා. ඇයි, ඒ වෙනුවෙන් කටයුතු කරන්න මැදිහත් වෙන්න බැරි? ඇයි, මාස ගණනක් කර අරින්නේ? ඒකේ ඉන්නේ දහදෙනායි. ඒ දහදෙනා අතර ආණ්ඩු පක්ෂයේ අයත් ඉන්නවා. විරුද්ධ පක්ෂයේ අයත් ඉන්නවා. ඒ දහදෙනා එකතු වෙලා හෙටම ඒ කටයුත්තට මැදිහත් වෙලා අල්ලස, දූෂණය නතර කරන්න ඒ වාගේම ඩොලර් බිලියන 56ක් විදේශ රටවල තිබෙනවා නම් ඒවා ගෙනෙන්න, එහෙම නැතනම් මේ රටේ කොහේ හරි තිබෙනවා නම් ඒවා ගෙනෙන්න කඩිනමින් ඒ අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම තමයි වැදගත් වෙන්නේ. එහෙම කරන්නේ නැතුව නිකරුණේ අපි බැණුම් අහලා වැඩක් නැහැ. මිනිස්සු මන්ත්‍රීවරුන් 225දෙනාටම බණින එකයි කරන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාම හොරු කියනවා. නමුත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225දෙනාගෙන් බහුතරයක් එකතු වෙලා අවශ්‍ය අණපනත් සම්මත කරලා දීලා තිබෙනවා; අවශ්‍ය අණපනත් සංශෝධනය කරලා දීලා තිබෙනවා; බලය දීලා තිබෙනවා. බලය ක්‍රියාත්මක කරන්න ඒ දහදෙනා මේ කටයුත්ත කිරීම තමයි වැදගත් වෙන්නේ.

පසුගිය කාලයේ අපේ රටින් අපනයනය කරන දේවල්වලට ලැබෙන ඩොලර් මේ රටට ආවේ නැහැ. අපි මහ බැංකුවේ අධිපතිතුමා ඇතුළු කණ්ඩායමට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මාස 6කට ඉස්සෙල්ලා ඒ කටයුත්ත නියාමනය කළා. ඊයේත් කැබිනට් මණ්ඩලයට ඇවිල්ලා වාර්තාවක් ලබා දුන්නා. අපනයනය කරන ඒවාට ලැබෙන ඩොලර් දැන් අපේ රටට එන්න පටන් අරගෙන තිබෙනවා. කොහේ හරි වැරැද්දකින් ඒ නියාමනය මෙච්චර කාලයක් අපට කරගන්න බැරි වුණා. දැන් ඒක පටන් අරගෙන තිබෙනවා. දැන් කරන්න ඕනෑ, පරණ ඒවා ටික එකතු කර ගන්නා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමයි. මේ වෙලාවේ රට වැටිලා තිබෙන තත්ත්වයෙන් ගොඩ එන්න අපි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. අපි ඒ සඳහා යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මේ රට භාර ගන්න කවුරුවත් ඉදිරිපත් වුණේ නැති වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉදිරිපත් වුණා. අපි එතුමාට සහයෝගය ලබා දුන්නා. හැබැයි අපි පිළිගන්නවා, මේ අවුරුද්දකට පොඩ්ඩක් වැඩි කාලයක් ඇතුළත සම්පූර්ණ ප්‍රශ්නය විසඳිලා නැහැ කියන එක.

අදත් මිනිස්සු ඉන්නේ අමාරුවෙන් බව අපි පිළිගන්නවා. හැබැයි යම් යම් ක්‍රමවේද, සහන අපි ඇති කරලා තිබෙනවා. ආහාර උද්ධමනය සෘණ මට්ටමට ගෙනෙන්න පුළුවන් වුණා. අපි නැවත පොහොර ටික දීලා, ගොවියා ගැන විශ්වාසය තියලා, ගොවිතැන් කරන්න ගොවි බිම්වලට ඒ මිනිසුන් යවලා ඒ අවශ්‍ය සහනය ලබා දීමේ ප්‍රතිඵලයක් විධියට ආහාර උද්ධමනය දැන් සෘණ මට්ටමට ඇවිල්ලා තිබෙනවා. ඒක හොඳ ලක්ෂණයක්. ඒ අය තවත් දිරි ගන්වනවා මිසක් අධෛර්යවත් කිරීම නෙවෙයි, දේශපාලනඥයන්ගේ සහ ඒ අංශ භාරව ඉන්න අයගේ වගකීම වන්නේ. ගොවි ජනතාව, කම්කරුවා, වැඩ කරන මිනිස්සු ටික දිරි ගැන්වුවොත් අපේ රටේ ආර්ථිකය මීට වඩා ඉස්සරහට ගෙනෙන්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කවුරුත් එකතු වෙන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. වංචාවට, දූෂණයට විරුද්ධව පක්ෂ, පාට භේදයෙන් තොරව අපි එකතු වෙන්න ඕනෑ. එහෙම එකතු වුණොත් අපට මේ රට තිබෙන තත්ත්වයෙන් මුදා ගන්න පුළුවන්. කවුරු හරි කිව්වොත්, "නැහැ, අපි බලයට ආවාට පස්සේ තමයි හදන්නේ" කියලා, ඒක බොරුවක්. විරුද්ධ පක්ෂයේ ඉන්දෙද්දීම පෙන්වන්න ඕනෑ, "අපි වංචාවට, දූෂණයට විරුද්ධයි. ඒක නිසා ඒවා වැළැක්වීමට ආණ්ඩුව ගෙනෙන සංශෝධනයන්ට අපි සහයෝගය දෙනවා" කියලා. ඒ වාගේම රට ගොඩනඟන්න ගෙන යන වැඩ පිළිවෙළට විරුද්ධ පක්ෂයේ හිටියත් අපි සහයෝගය දෙනවා කියලා පෙන්වන්න ඕනෑ. එතකොට තමයි ඒවා මිනිස්සු පිළිගන්නේ, ජනතාව පිළිගන්නේ. රට ගොඩනඟන්න වුවමනාවක් තිබෙන කණ්ඩායමක් විධියට කටයුතු

[ගරු මහින්ද අමරවීර මහතා ]

කරන්න ඕනෑ. එහෙම නැත්නම් අපට ප්‍රතිඵලයක් අත්කර ගන්න පුළුවන්කමක් නැහැ.

IMF එකෙන් ලැබෙන්නේ සුළු මුදලක් තමයි. අපි දන්නවා, IMF එකට යනකොට අපට යම් යම් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙන බව. ඒ තුළ හොඳ දේවලුත්, නරක දේවලුත් තිබෙනවා. නමුත් අපට වෙන විකල්පයක් නැති නිසා තමයි ඒ තත්ත්වයට යන්න සිදු වුණේ. ඒකේ දෙවන වාරිකය ප්‍රමාද වෙනවා කිව්වාම සතුටු වෙන කණ්ඩායම්, බොහොම උද්දාමයට පත් වෙච්ච කණ්ඩායම්, ඒකට බොහොම සතුටු සිතින් කටයුතු කරන කණ්ඩායම් ඉන්නවා. ඒ පිළිබඳව අපි කනගාටු වෙන්න ඕනෑ. මොකද ඒ හැම එකකින්ම මේ අහිංසක ජනතාවටයි පාඩු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ රටේ අල්ලස සහ දූෂණය නතර කරන්න ඒ වාගේම රාජ්‍ය ආදායම වැඩි කර ගන්න අපි කවුරුත් හැමදාම කථා කරන ආයතන තුන සම්බන්ධයෙන් කඩිනමින් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. විශේෂයෙන්ම ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව නිවැරදි විධියට පාලනය කර ගන්න බැරි වුණොත් අපට මේ රට ගොඩගන්න බැහැ. ඒකට ආණ්ඩු පක්ෂයට විතරක් කටයුතු කරන්න බැහැ, විරුද්ධ පක්ෂයත් එකතු වෙන්න ඕනෑ. අර කිව්වා වාගේ සමහර බඩු ආනයනය තහනම් කරන්න, කරන්න ඒකේ වාසිය එන්නේ Sri Lanka Customs එකට. දැන් මුංඇට සහ උඳු ගෙනෙන එක තහනම් කරලා තිබෙනවා. ඒවා මේ රට ගෙන්වනවා නම් රුපියල් තුන්සියයක බද්දක් තිබෙනවා. එහෙමත් ගෙනෙන්න බැහැ.

නමුත්, ඒ ඔක්කෝම ගෙනෙනවා. පසුගිය දවස්වල රූපවාහිනියෙන් පෙන්නුවා, ගෙන්වපු උඳු කන්ටේනර් ගණනක් අල්ලපු ආකාරය; මුංඇට කන්ටේනර් ගණනක් අල්ලපු ආකාරය. අපටත් සමහර දේවල් ගෙන්වීම සම්බන්ධව ඔත්තු දෙන්න සිද්ධ වුණා. අපි ඔත්තුකරුවෝ වුණා. මටත් සමහර වෙලාවට කියන්න සිද්ධ වුණා, "අන්න මුංඇට ගෙනෙනවා. පිටකොටුවේ බානවා" කියලා. අපට ලැබෙන තොරතුරු අනුව අපට එහෙම කියන්න සිද්ධ වුණා. ඒ මොකද? රුපියල් 8ක බද්දක් ගෙවා ඒවා ගෙනෙන්නේ, රුපියල් 300ක් වන බද්දට නොවෙයි. ඒකට නිලධාරින් සම්බන්ධ කරගෙන ඉන්නේ. කඩල ගෙන්වන්න අයකරන බද්ද යටතේ මුංඇට ගෙන්වනවා; උඳු ගෙන්වනවා. මේ වාගේ තහනම් කරපු හැම දෙයම මේ රටට ගෙනෙනවා. ඒ බඩු නිදහස් කර ගන්න නම් කරන්න වෙන්නේ රේගුවට සල්ලි කීයක් හෝ දෙන්න විතරයි. ඒ තත්ත්වය වළක්වා ගන්න ආණ්ඩුව යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනකොට විරුද්ධ පක්ෂය ඊට විරුද්ධව නැඟී සිටිනවා. ඒ අය වෘත්තීය සමිතිත් එක්ක එකතු වෙනවා. තවම CCTV cameras ටිකක් සවි කරන්න දෙන්නේ නැහැ. මොකක්ද තිබෙන තත්ත්වය? CCTV cameras ටිකක් සවි කරන්න දෙන්නේ නැහැ. අඩු ගණනේ රහස් පොලිසියට ගිහින් ඒවා පරීක්ෂා කරන්න දෙන්නේ නැහැ. ඒක තමයි තත්ත්වය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කට්ටිය තමයි හොරට බදු ලිපිගොනු හදන හැටි කියලා දෙන්නේ. සුරා බදු දෙපාර්තමේන්තුවේ කට්ටිය තමයි ස්ටිකරය වෙනස් කිරීමේ ඉඳලා, හොරකම් කරන්නේ කොහොමද කියලා කියා දෙන්නේ. එම නිසා මේ ආයතන තුන ඇතුළු අනෙක් රාජ්‍ය ආයතන ටික පිරිසිදු කළේ නැත්නම් අපි කවුරු ආණ්ඩු බලය ගත්තත්, කවුරු ආණ්ඩු කළත් මේ රට ඉදිරියට ගෙන යන්න බැරි බව අපි කවුරුත් මතක තබාගන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Sivagnanam Shritharan. You have 10 minutes.

[பி.ப. 12.46]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)

(The Hon. Sivagnanam Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையில் பல சட்டமூலங்கள் சமர்ப்பிக்கப்பட்டன. தற்பொழுது, இந்த நாட்டில் மிக முக்கிய பேசுபொருளாக இருக்கின்ற முல்லைத்தீவு மாவட்ட நீதிபதி ரீ. சரவணராஜா அவர்களின் வெளியேற்றம் தொடர்பில் நான் இங்கு சில கருத்துக்களைச் சொல்ல விரும்புகின்றேன். அவர் இந்த நாட்டை விட்டுச் செல்வதற்குக் காரணமாக இருந்த இந்த நாடாளுமன்றத்திலுள்ள உறுப்பினர் உட்பட பேரினவாதிகளுக்கு எதிராக இந்த அரசாங்கம் இன்னமும் சரியான நடவடிக்கை எடுக்கவில்லை. இது இலங்கையின் நீதித்துறை சுயாதீனமாக இல்லை என்பதைத்தான் தெளிவாகக் காட்டி நிற்கின்றது.

குறிப்பாக, 1980களில் அமரர் அத்துலத்முதலி அவர்கள் "The Break-up of Sri Lanka" என்ற புத்தகத்தை எழுதிய ஏ.ஜே. வில்சன் அவர்களுக்கு அளித்த பிரத்தியேக செவ்வியின்போது, நீதிபதிகளுக்கு வீடு, கார் போன்றவற்றை நன்கொடையாகக் கொடுப்பதன்மூலம் தமிழர்களுக்கு எதிராகத் தீர்ப்புக்களைப் பெற்றுக்கொள்ளலாம் என்பதாகக் குறிப்பிட்டிருந்தார். 2005 - 2006ஆம் ஆண்டு காலப் பகுதியில் நீதிபதி ஸ்ரீநிதி நந்தசேகரன் அவர்கள் யாழ்ப்பாணத்தில் வாகனத்தில் சென்றுகொண்டிருந்தபொழுது, அவரை இராணுவ வாகனத்தால் மோதச் செய்து, கொலை செய்ய முயற்சித்தார்கள். அதேபோல, இந்த நாட்டில் பிரதம நீதியரசராக இருந்த சிறாணி பண்டாரநாயக்கா அவர்களை 2013ஆம் ஆண்டு வலுக்கட்டாயமாக அப்பதவியிலிருந்து அகற்றினார்கள்.

இந்த நாட்டில் நீதி சரியான முறையில் நிலைநாட்டப்படுவதில்லை என்பதை நாங்கள் பல சம்பவங்களினூடாகப் பார்த்திருக்கின்றோம். கொலை செய்யப்பட்ட மாமனிதர் ஜோசப் பரராஜசிங்கத்தின் குடும்பத்தினருக்கோ, மாமனிதர் ரவிராஜ் அவர்களின் குடும்பத்தினருக்கோ இந்த நாட்டில் இதுவரை நீதி கிடைக்கவில்லை. அதேபோல், திருகோணமலையில் கொல்லப்பட்ட 5 மாணவர்களின் குடும்பத்தினருக்கும் இன்னும் நீதி கிடைக்கவில்லை. அதேபோன்று, இந்த நாட்டில் கொலைசெய்யப்பட்ட பிரான்ஸ் நாட்டின் Action contre la Faim என்ற அமைப்பின் தொண்டர்களின் குடும்பத்தினருக்கும் நீதி கிடைக்கவில்லை. இவ்வாறு நீதி தொலைக்கப்பட்டுள்ள இந்த நாட்டில், வழங்கிய தீர்ப்பை மீளப்பெறுமாறு சட்டமா அதிபர் அவர்கள் ரீ. சரவணராஜா அவர்களை அச்சுறுத்தியதால், இந்த நாட்டில் இருக்க முடியாமல், அவர் நாட்டைவிட்டுப் போயிருக்கிறார். ஒரு நீதிபதியாகத் தன்னால் இந்த நாட்டில் நீதியான தீர்ப்புகளை வழங்க முடியாததால் இந்த நாட்டை விட்டுப்போவதாக அவர் தன்னுடைய resign கடிதத்தில் மிகத் தெளிவாகக் குறிப்பிட்டிருக்கிறார்.

இந்த நாட்டில் இனியும் நீதி கிடைக்கும், நல்லிணக்கம் உருவாகும் என்ற நம்பிக்கை எமக்கு இல்லை. சிங்களப் பேரினவாதச் சிந்தனைகளிலிருந்து சிங்கள மக்களும் சிங்களத் தலைவர்களும் வெளிவந்து, நியாயமான, நீதியான, கௌரவமான ஒரு நாட்டைக் கட்டிவளர்ப்பார்களென்ற எண்ணம் கிஞ்சித்தும் இல்லாத நிலையிலே இன்று இந்த நாடு போய்க்கொண்டிருக்கின்றது. மேற்குறித்த விடயம் தொடர்பாக,

நேற்றுக்கூட கிளிநொச்சி மண்ணில் ஒரு மணி நேரம் பாரிய ஆர்ப்பாட்டமொன்றை அந்த மக்கள் செய்திருந்தார்கள். அவர்கள் மேற்குறித்த விடயம் தொடர்பில் ஐக்கிய நாடுகள் சபையின் செயலாளர் நாயகம் அன்ரனியோ குட்ரெஸ் அவர்களுக்கும் கடிதமொன்றை எழுதியிருந்தார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, உங்களுடைய அனுமதியோடு அந்தக் கடிதத்தின் ஒரு பகுதியை நான் இங்கு வாசிக்கின்றேன்.

"இலங்கைத் தீவில் கடந்த எழுபது ஆண்டுகளுக்கும் மேலாக நீடித்துவருகின்ற இன முரண்பாடுகள் தொடர்பிலும், சிங்களத்தின் கட்டமைக்கப்பட்ட இன ரீதியான வஞ்சிப்புகள் தொடர்பிலும், அது இனப்படுகொலையாக வியாபகம் பெற்ற வரலாறு தொடர்பிலும், தங்கள் அறிக்கையாளர்களூடாகத் தாங்கள் அறிந்துள்ளீர்கள் என்பதை நாம் அறிவோம்.

ஒரு தேசிய இனத்தின் பாரம்பரிய வாழ்விடங்கள்மீதும், அதன் கூட்டுப் பண்பாடுகள்மீதும் மேற்கொள்ளப்பட்டு வருகின்ற நீதி, நிருவாகத்துறை ரீதியான பாகுபாடுகள் மற்றும் காலத்துக்குக் காலம் அரசியல் யாப்புச் சீர்திருத்தங்களின்மூலமாக மேற்கொள்ளப்படுகின்ற வன்பறிப்புகள் என்பவை, உலகத்தில் வாழ்கின்ற எண்ணிக்கையில் குறைந்த ஒரு தேசிய இனக் குழுமத்தை எவ்வாறு நிர்மூலமாக்கும் என்பதை உணர்ந்துகொள்வது அத்தனை சிரமமானதல்ல.

இலங்கைத் தீவில் தமிழ்த் தேசிய இனம்மீது மேற்கொள்ளப்பட்ட இனப்படுகொலையும் ஓரவஞ்சகப் போக்கும் இன்று இலங்கைத் தீவிலுள்ள தேசிய இனங்கள் அனைத்தினதும் ஜனநாயக நீதித்துறைசார் உரிமைகளைப் பறித்துள்ளது என்பது நிதர்சனமாகும். அரசுக்குப் பலம் கிடைக்கின்ற போதெல்லாம் அரசியலமைப்பில் திருத்தங்களை மேற்கொண்டு, நிருவாகத்துறையின் கைப்பொம்மையாகச் செயற்படும் விதமாகவே நீதித்துறை உருவாக்கப்பட்டு வருகிறது. நீதிச் சேவைகள் ஆணைக்குழுவை நியமிக்கும் அதிகாரத்தை ஜனாதிபதிக்கு வழங்கி, அதனூடாக நீதிபதிகளின் நியமனங்கள், பதவி உயர்வுகள், நலனோம்பு நயக்கொடைகள், பயிற்சிகள் மற்றும் பாதுகாப்பு என்பவையெல்லாம் அரசியல் அதிகார விருப்பப்படியே மேற்கொள்ளப்படுகின்றன.

இதன்மூலம் அரசு விரும்பிய தீர்ப்புகளைப் பெறவும், ஆணைகளை வழங்கவும், அரசியல் அதிகாரத்தைக் காபந்து செய்யவும் ஏற்றவகையில், இலங்கையின் நீதித்துறை ஒழுங்கமைக்கப்பட்டுள்ளது. இதனால் சட்டத்தின் ஆட்சி பறிக்கப்பட்டு, நிருவாகத்துறையின் நோக்கங்களை அடையும் வகையில், விசேடமாக அரசாங்கத்தினது போர்க்குற்றங்கள், இனப்படுகொலை விடயங்கள், நீதிக்குப் புறம்பான கொலைகள், வலிந்து காணாமல் ஆக்கப்பட்டவர்களின் விடயங்கள், மனிதப்புதைகுழி விவகாரங்கள், பௌத்த மயமாக்கல், நில மற்றும் பண்பாட்டு ஆக்கிரமிப்பு என்பவற்றைச் சட்டமுறைமைகளுக்கு முரணாகக் கையாள்வதற்கு நீதித்துறை நிர்ப்பந்திக்கப்பட்டதன் விளைவே கௌரவ நீதிபதி சரவணராஜா அவர்கள் நாட்டைவிட்டு வெளியேறிய நிகழ்வாகும்.

மதிப்பார்ந்த பொதுச் செயலாளர் அவர்களே!

சிங்கள பௌத்த மேலாதிக்கத்தைத் தனது ஆட்சியின் நோக்காகக்கொண்டு, சர்வாதிகாரச் சிந்தனைகளுக்கும் செயல்களுக்கும் ஜனநாயக முலாம் பூசிக்கொண்டு, திடமான வெளியுறவு, பொருளாதாரக் கொள்கைகள் எவையுமின்றி, உறுதியான அரசியலமைப்பு ஏற்பாடுகளின்றி, வெறும் இனத்துவேச சிந்தனைகளின்மேல் ஏறிநின்று, இலங்கையின் நீதித்துறையையும் இங்கு வாழ்கின்ற தமிழ்த் தேசிய இனத்தையும் கட்டமைக்கப்பட்ட வழிமுறைகளினூடாக அரசு அழித்து ஒழித்து வரும் உச்ச தருணமாகிய இவ்வேளையில், தாங்களும் சர்வதேச சமூகமும் நேரடியாகத் தலையீடு செய்து, அமைதி, சமாதானம், நல்லிணக்கம், நீதித்துறையின் சுயாதீனம் என்பவற்றைப் பாதுகாக்கவும் சகோதரத்துவமிக்க இலங்கையைக் கட்டியெழுப்பவும் தங்கள் எல்லாவகை வல்லமைகளும் அணுகுமுறைகளும் சமரசங்களற்ற வகையில் இலங்கைத் தீவுக்குத் தேவையெனத் தங்களை அழைத்து நிற்கிறோம்"

இக்கடிதத்தை நாங்கள் நேற்றைய தினமே பதிவுத் தபால்மூலம் ஐக்கிய நாடுகள் சபையின் இலங்கைக்கான வதிவிடப் பிரதிநிதிக்கு அனுப்பிவிட்டோம். இந்தக் கடிதத்தை அவரிடம் நேரடியாக வழங்குவதற்கான அனுமதியும் கேட்கப்பட்டிருக்கிறது.

குறிப்பாக, குருந்தூர் மலையிலிருந்த ஆதிசிவன் ஐயனார் ஆலயத்தை இடித்து நொருக்கி, அங்கேயிருந்த சிவலிங்க அடையாளங்களை அழித்து, சிவ வழிபாட்டை இல்லாமல் செய்து, அந்த இடத்தில் பௌத்த விகாரையைக் கட்ட முற்பட்டபொழுது, அங்கு கட்டுமானப் பணிகளை நிறுத்துமாறு நீதிபதி கட்டளையிட்டார். அதற்குப் பிற்பாடும், சிங்கள பௌத்த சிந்தனைகளோடும் பேரினவாத எண்ணங்களோடும் படைபட்டாளங்களோடு அங்கு சென்ற பிக்குமாரும் இங்கே இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் சிலரும் அந்த விகாரையைக் கட்டிமுடித்தார்கள். இது நீதித்துறையை மீறியதொரு செயலாகும். இதேபோல, கிழக்கு மாகாண ஆளுநர் கௌரவ செந்தில் தொண்டமான் அவர்களுடைய அறிவுறுத்தலையும் மீறி, இப்பொழுது திருகோணமலையின் அரிசிமலையில் பௌத்த விகாரையொன்று கட்டப்பட்டுக்கொண்டிருக்கிறது. அப்படியென்றால், இந்த நாட்டில் நீதி எங்கே? நீதித்துறையின் செயற்பாடுகள் எங்கே? இது இந்த நாட்டின் நீதித்துறைக்கு அடிக்கப்பட்ட சாவு மணியாகும்.

ஊடகங்கள்மீது அல்லது சமூக வலைத்தளங்கள்மீது ஏதோவொரு வகையில் கட்டுப்பாடுகளையும் தடைகளையும் விதிப்பதற்கான சட்டங்களைக் கொண்டுவருவது பற்றித்தான் இன்று நிறைவேற்றுத்துறை இரவுபகலாகச் சிந்தித்துக்கொண்டிருக்கின்றது. எவ்வகையான அடக்குமுறைகளை இந்த நாட்டில் கொண்டுவரலாம், அது தங்களுக்கு எவ்வகையில் சாதகமாக அமையும் என்பதைத்தான் இங்கே இருக்கின்ற அரசியல் தலைவர்கள் சாப்பிடும்பொழுதும் சரி, உறங்கும்பொழுதும் சரி சிந்தித்துக்கொண்டிருக்கிறார்கள். இது இந்த நாட்டுக்கு உசிதமானதல்ல. இதனால் இந்த நாடு நேர்மையான பாதையில் அல்லது நியாயமான பாதையில் செல்வதற்கு, ஒரு கௌரவமான நாடாக மிளிர்வதற்கு எந்த வாய்ப்பும் கிடைக்கப்போவதில்லை. ஏனென்றால், இவர்களிடம் உறுதியான பொருளாதாரக் கொள்கையோ, சுய பொருளாதார எண்ணங்களோ இல்லை. எப்பொழுதும் கடனும் ஊழலும் நிறைந்த ஒரு நாடாக இலங்கை இருப்பது, இந்த நாட்டின் எதிர்காலம் பூச்சியம் என்பதையே காட்டி நிற்கிறது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நீதிபதி ரீ. சரவணராஜா அவர்கள் முல்லைத்தீவு மாவட்டத்தில் நடைபெற்ற பல்வேறு விடயங்கள் தொடர்பான வழக்குகளை விசாரித்திருக்கிறார். தனியே குருந்தூர்மலை விவகாரத்தை மாத்திரமல்ல, அங்குள்ள மனிதப் புதைகுழி விவகாரத்தையும் விசாரணை செய்திருக்கிறார். அதில் இருக்கின்ற மனித எச்சங்கள் எங்களுடைய இளைஞர், யுவதிகளுடையதாக இருக்கலாம் என்ற அடிப்படையில், அதனை ஆய்வு செய்ய வேண்டும் என்று குறிப்பிட்டதுதான் அவரால் இந்த மண்ணில் நீதி வழங்க முடியாமல் போனதற்கும், அவரின் செயற்பாட்டில் மாற்றங்கள் ஏற்பட்டதற்கும் காரணமாகும்.

தியாகி திலீபனுடைய நினைவு தினத்தை அனுஷ்டிப்பதைத் தடைசெய்யுமாறு பொலிஸார் கோரியபோது, அதற்கு ஆதரவாக

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

தமிழ் நீதிபதிகள் தீர்ப்பளிக்கவில்லை என்ற காரணத்தால், "தமிழ் நீதிபதிகள் தீர்ப்பு வழங்க முடியாது" என்று இந்த உயரிய சபையில் சரத் வீரசேகர அவர்கள் குறிப்பிட்டிருந்தார். இவர் பேரினவாதச் சிந்தனையோடு, இனவாதத்தை இங்கு கக்கியிருந்தார். அதுமாத்திரமன்றி, இவருடைய அச்சுறுத்தலுக்கு நீதிபதி ரீ. சரவணராஜா அவர்களுடைய குடும்பம் உள்ளானதுடன், அவருக்கு வழங்கப்பட்டிருந்த பொலிஸ் பாதுகாப்பும் குறைக்கப்பட்டது. இந்த நாட்டில் வாழ முடியாமல், நாட்டைவிட்டு ஓடவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைமை அவருக்கு ஏற்பட்டது.

இன்று இலங்கையில் நீதித்துறை செத்துப்போய் இருக்கிறது. அதற்குச் சாவு மணி அடிக்கப்பட்டு இருக்கிறது. இந்த நாட்டிலா இன நல்லிணக்கம் வரப்போகிறது? இந்த நாட்டிலா காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு நீதி கிடைக்கப் போகிறது? இந்த நாட்டிலா நீதி நிலைநாட்டப்படப் போகிறது? அதனால்தான், இலங்கையில் 2009இல் நடைபெற்ற இனப் படுகொலை தொடர்பான விசாரணை ஒரு சர்வதேச விசாரணையாக, நீதியின் பாற்பட்ட விசாரணையாக அமையவேண்டும் என்று நாங்கள் பகிரங்கமாக இந்த உயர்ந்த சபையினூடாக ஐக்கிய நாடுகள் சபையின் செயலாளர் நாயகத்தைக் கேட்கின்றோம். அவ்வாறான ஒரு விசாரணையாக அது அமையத் தவறினால், இந்த நாட்டில் நீதி கிடைக்கப் போவதில்லை. யாராவது ஒரு நீதிபதி தீர்ப்பு வழங்க முன்வந்தாலும், தீர்ப்பு வழங்க முடியாமல் அவர் நாட்டைவிட்டு ஓடவேண்டிய நிர்ப்பந்தத்திற்கு உள்ளாவார்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டில் உருவாக்கப்பட்ட நல்லிணக்க ஆணைக்குழுவின் அறிக்கை கிடப்பிலே போடப்பட்டிருக்கிறது. அதேபோல, ஜனாதிபதி ஆணைக்குழுவின் அறிக்கை எங்கேயென்று யாருக்கும் தெரியாது. இப்பொழுது புதிய புதிய குழுக்களும் ஆணைக்குழுக்களும் உருவாக்கப்படுகின்றன. "உண்மையைக் கண்டறிதல்" என்பது மறைக்கப்பட்டு, "தேசிய நல்லிணக்கம்" என்ற சொல் கொண்டுவரப்படுகின்றது. "உண்மையைக் கண்டறிதல்" என்பது இந்த நாட்டில் குழிதோண்டிப் புதைக்கப்பட்டிருக்கின்றது. இந்த நாடு நியாயமுள்ள நாடாக, ஜனநாயகமுள்ள நாடாக, நீதியை விரும்புகின்ற நாடாக, சமத்துவத்தோடு அணுகி எல்லா இனங்களுக்கும் சம உரிமைகளைக் கொடுக்கின்ற நாடாக இருக்க வேண்டுமென்றால், முதலில் வடக்கு, கிழக்கில் நடந்த இனப்படுகொலைக்கு நீதியான விசாரணையை நியாயமான முறையில் நடத்த வேண்டும். அதுவொரு சர்வதேச விசாரணையாக இருக்க வேண்டும். அதனைத்தான் நாங்கள் இந்த உயர்ந்த சபையினூடாகப் பல தடவை அமெரிக்காவிடமும் கேட்டிருக்கிறோம்; ஐரோப்பிய நாடுகளிடமும் கேட்டிருக்கிறோம்; இன்னும் பல நாடுகளிடமும் கேட்டிருக்கிறோம். ஏனென்றால், இந்த நாட்டில் தமிழர்களுக்கு நீதி கிடைக்காது. இந்தியாவிடம்கூட, நாங்கள் பலமுறை இந்தக் கோரிக்கையை முன்வைத்திருக்கிறோம்.

அண்மையில்கூட, இந்த நாட்டில் நடந்த பல விடயங்கள் தொடர்பான செய்திகள் "Channel 4"மூலம் வெளிவந்திருக்கின்றன. அசாத் மௌலானாவின் குறித்த videoஐ நீங்கள் பார்த்திருப்பீர்கள். அதில் அவர் இரண்டு நீதிபதிகளின் பெயர்களைக் குறிப்பிடுகின்றார். எவ்வாறு அவர்கள் மாற்றப்பட்டார்கள்? எவ்வாறு தீர்ப்புகளை வழங்கினார்கள்? என்பதுபற்றி அதில் சொல்லப்பட்டிருக்கிறது. இலங்கையினுடைய நீதித்துறை ஊழல் நிறைந்ததாக மாறியிருக்கின்றது. நீதிமன்றங்களில் தீர்ப்புகளைச் சொல்லமுடியாமல் நேர்மையான நீதிபதிகள் நாட்டைவிட்டு ஓடுகிறார்கள். இந்த நாடு மிக மோசமான வழியிலே போய்க்கொண்டிருக்கின்றது. சிங்களத் தலைவர்களும் பேரினவாதச் சிந்தனையோடு இருக்கின்றவர்களும் முதலில் இது பற்றிச் சிந்திக்கத் தவறினால், நாடு அழியுமே தவிர, நாட்டை மீட்க முடியாது. அதனால்தான் நாங்கள் உலகுக்குச் சொல்கிறோம், இந்த நாட்டில் தமிழ் மக்களுக்கு நியாயமான ஒரு தீர்வு வழங்கப்படாதவரை, அவர்கள் நீதியோடு வாழாதவரை, இந்த நாடு நீதியுள்ள நாடாக இருக்கவே முடியாது என்று. நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. W.D.J. Seneviratne. You have 10 minutes.

[අ.භා. 12.57]

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ වැදගත් කාරණා හතරක් ගැන සාකච්ඡා කරන වෙලාවේ එයට සහභාගී වෙන්න අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වනවා.

පළමුව මා කථා කරන්න කැමැතියි, මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගැන. මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ මූලික අදහස වුණේ, මැතිවරණ පැවැත්වීම සම්බන්ධව අපේ රටේ ක්‍රියාත්මක වන නීතිවල, පනත්වල කාලයක් තිස්සේ පවතින අඩු පාඩු නිවැරදි කිරීමයි. මොකද, මැතිවරණ සම්බන්ධ වරදක් කෙරුණාම ඒ වරදට දඬුවමක් අය කරන්න, එහෙම නැත්නම් දඬුවම් කරන්න අධිකරණයට බලය තිබෙනවා. අපි දන්නවා 1940 ගණන්වල ඉඳලා මේ රටේ මැතිවරණවලදී සිදු වූ වැරදිවලට දඬු නියම කළා. එදා ඉඳලාම තිබුණේ සාමාන්‍යයෙන් දින 21ක් ඇතුළත අවශ්‍ය කරුණු කාරණා ඉදිරිපත් කිරීමයි. එහිදී මූලික වශයෙන් ඉදිරිපත් වුණු කාරණයක් තමයි, මැතිවරණයක් අවසාන වුණාම ඒ මැතිවරණයට තරග කරපු අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තු වනවා තමුන්ගේ වියදම් පිළිබඳ ලේඛනයක් ඉදිරිපත් කිරීම. තමුන්ට ලැබුණු මුදල් -ත්‍යාග වැනි දේවල්- ගැන විස්තරයක් ලබා දීම. ඒක කාලයක් තිස්සේ ක්‍රියාත්මක වුණත්, පසුගිය කාලයේ ඒක නැති වුණා. ඒ කියන්නේ, පැවැති මැතිවරණ ක්‍රමය අවසාන වෙලා සමානුපාතික මැතිවරණ ක්‍රමය ආවාට පස්සේ එය ක්‍රියාත්මක වුණේ නැහැ.

සමානුපාතික ක්‍රමය යටතේ ඡන්දය දෙන්නේ බොහෝ විට ඒ දිස්ත්‍රික්කයම මැතිවරණ කොට්ඨාසයක් වශයෙන් සලකලා. එතැනදී පුද්ගලයාට වඩා ඡන්ද දායකයා ඡන්දය දෙන්නේ පක්ෂයට. පක්ෂය ගැන බලලා තමයි ඡන්දය දෙන්නේ. තමුන් කැමැති පක්ෂයට ඡන්දය දෙනකොට තමුන්ගේ ප්‍රදේශයේ තමුන්ට සම්බන්ධයක් තිබෙන ඒ අපේක්ෂකයාට ඒ ඡන්දය යනවා. ඒ විධියට ඡන්ද ක්‍රමයේ වෙනසක් ඇති වුණා. ඒ වෙනස ඇති වීමත් සමඟම ඇත්ත වශයෙන්ම දූෂණත් විශාල වශයෙන් ව්‍යාප්ත වුණා. රටේ සමානුපාතික මැතිවරණ ක්‍රමය යටතේ ඡන්දයක් පවත්වනකොට මුළු දිස්ත්‍රික්කය පුරාම ඡන්ද වැඩකටයුතුවල යෙදෙන්න ඒ අපේක්ෂකයින්ට සිද්ධ වනවා. එතකොට ඒ අයගේ වියදමත් වැඩි වනවා. ඒ වියදමට අවශ්‍ය කරන මුදල් ලබා ගන්නට ඕනෑ.

එතකොට මුදල් නැති අපේක්ෂකයන් සමහර අයගෙන් පරිත්‍යාග බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම නොයෙක් විධියේ ව්‍යාපාර කරන අය ඒ අපේක්ෂකයන් සමඟ සම්බන්ධ වෙලා තමන්ගේ මුදල් -ධනය- ඒ අයගේ මැතිවරණ ව්‍යාපාරයට වැය කරලා, යම් යම් සම්බන්ධතා ගොඩ නඟා ගන්නවා. මේක සමාජ ව්‍යසනයක්. මේක ව්‍යසනයක් කියන්නේ, අපේක්ෂකයන් මැතිවරණය ජයග්‍රහණය කරලා බලයට ආවාට පසුව තමාට උදව් කරපු අයව සතුටු කරන්න හුඟක් වෙලාවට ඒ අයට සිදු වෙලා තිබීම නිසායි. එයත් වැළැක්වීම සඳහා තමයි, පසුගිය දවස්වල අපි 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ගෙන ආවේ. ඒ පනත මඟින් නිවැරදි දිසාවකට මේ ප්‍රශ්නය ගෙනිච්චා කියලා මම හිතනවා.

අද මේ සංශෝධනයෙන් බලාපොරොත්තු වන්නේ මොකක්ද? එදා නියම කර තිබුණු මුදලේ වටිනාකම අද වන විට ඉතාම අඩුයි කියලා අපි දන්නවා. සාමාන්‍යයෙන් රුපියල් 5ක් කිව්වාම එදා නම් සෑහෙන මුදලක්. නමුත්, මේ වනකොට රුපියල් 5ක්, නැත්නම් රුපියල් 50ක්, එහෙම නැත්නම් රුපියල් 500ක් කියන්නේ ඉතාම අඩු වටිනාකමක් තිබෙන මුදල් ප්‍රමාණයක්. ඒ නිසා අදාළ දඩ මුදල් වැඩි කරන්න කටයුතු කර තිබෙනවා. ඒක ඉතාම වැදගත්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත, පළාත් සභා ඡන්ද විමසීම් පනත සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත සංශෝධනය කරලා, සියලු මැතිවරණවලට බලපාන විධියට ඒ කටයුත්ත සිදු කර තිබෙනවා. මේ සංශෝධනය හොඳ දෙයක් කියලා මම කිව්වේ මේකයි. සාමාන්‍යයෙන් මැතිවරණවලදී අපි දැකපු ප්‍රධානම වරද තමයි, හොර ඡන්ද දැමීම. ඒක විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා තිබුණු දෙයක්. 2005දී පමණ හොර ඡන්ද දැමීම හුඟක් දුරට අඩු වුණා. මොකද, ඡන්දදායකයා ඡන්දය දෙන්න ගියාම හැඳුනුම්පත ඉදිරිපත් කරන්න ඕනෑ වුණා. ඡන්දදායකයා ඡන්ද දෙන්න ගියාම හැඳුනුම්පත ඉදිරිපත් කිරීම නිසා හුඟක් අයට හොර ඡන්ද දැමීම කරන්න බැරි වුණා. ඒ නිසා ඒක වැළකුණා. නමුත්, ඊට ඉස්සෙල්ලා විශාල වශයෙන් හොර ඡන්ද දැම්මා. දැනුත් සමහර විට සමහර තැන්වල හොර ඡන්ද දැමීමේ වරද සිදු වෙනවා. ඒ වරදට ඒ අය වෙනුවෙන් ලැබෙන දඬුවම ඉතාම ලිහිල්. රුපියල් 100ක, රුපියල් 200ක දඩයක් ගෙවලා ඒ ගොල්ලන් බොහොම උජාරුවට එනවා. ඒ තත්ත්වය නැති කරන්න වැඩි දඩයක් නියම කරන්නට ඕනෑ. ඒ වාගේම මැතිවරණවලදී ඒ හා සමානව කරන අනෙක් වැරැදිවලට දෙන දඬුවම බරපතළ වෙන්නට ඕනෑ. ඒ නිසා තමයි මුදලේ අද පවතින වටිනාකම අනුව ඒ දඩ මුදල වැඩි කර තිබෙන්නේ. ඒ නිසා අපි හිතනවා, ඒක ඉතා වැදගත් කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට, මෙහි තවත් විශේෂ කාරණයක් තිබෙනවා. අපේක්ෂකයන් ලබපු ත්‍යාග, එහෙම නැත්නම් මූල්‍යාධාර ආදිය සම්බන්ධ විස්තර ඇතුළත් ගිණුම් ප්‍රකාශන දවස් 21ක් වාගේ ඉතා කෙටි කාලයක් තුළ ඉදිරිපත් කරන්න සිදු වෙනවා. ඒක ඉතා අමාරු කාරණයක්. සමහර විට ඒ කෙටි කාලය තුළ ඒ විස්තර ඉදිරිපත් නොකිරීම නිසා ඡන්ද පෙත්සමක් දමන්නත් බැරි වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයත් ඒ ගැන වරක් ප්‍රකාශ කර තිබුණා. මොකද, ඡන්ද පෙත්සමක් දැමීමට තිබෙන අයිතිය උල්ලංඝනය වෙනවා, අපේක්ෂකයන් මැතිවරණයට වැය කළ මුදල් සම්බන්ධව, නැත්නම් තමන්ට ලැබුණු මුදල් සම්බන්ධව -තමන්ට ලැබුණු ත්‍යාග වෙන්න පුළුවන්, වෙනත් යම් ආකාරයකින් ලැබුණු මුදල් වෙන්න පුළුවන්- විස්තරයක් දවස් 21ක් තුළ ඉදිරිපත් නොකිරීම නිසා. මේ කාල සීමාව ගැන යම් යම් අදහස් ඉදිරිපත් වෙලාත් තිබුණා. ඒ නිසා එම දවස් 21ක කාලය දවස් 42ක් දක්වා දීර්ඝ වෙනවා, මේ සංශෝධනයෙන්. ඒක ඉතාම හොඳ දෙයක්.

අපි දන්නවා, 1988දී පැවැත්වුණු ජනාධිපතිවරණය ගැන. ඒ ජනාධිපතිවරණය වෙලාවේ ගරු ආර්. ප්‍රේමදාස මහත්මයාත්, ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් තරග කළා. ඒ තරග කරපු අවස්ථාවේදී ඉතා බරපතළ තත්ත්වයක් රටේ තිබුණා. විශේෂයෙන් එදා රටේ තිබුණේ ඉතා බිහිසුණු තත්ත්වයක්. මොකද, නොයෙක් තැන්වල බෝම්බ ගැහිලි, මිනී මැරුම්, ඡන්දදායකයන් බිය ගැන්වීම්, ඡන්දදායකයන්ට ඡන්ද පොළට යන්න එපා කියලා බලපෑම් කිරීම් කරපු වාතාවරණයක් තමයි මේ රටේ එදා තිබුණේ. ඒ වාතාවරණය නිසා හුඟක් වෙලාවට ඡන්දදායකයන් ඡන්දය දෙන්න ගියේ නැහැ. සමහර ප්‍රදේශවල ඡන්දදායකයන් ඡන්දය දීමෙන් වැළකුණා. එපමණක් නොවෙයි. විශේෂයෙන් මමත් එදා එතුමියගේ ඡන්ද නියෝජිතයෙකු වශයෙන් මා නියෝජනය කරන රත්නපුර ප්‍රදේශයේ කටයුතු කළා මට මතකයි.

එතුමියට ඡන්දය දෙන අය සිටි ප්‍රදේශවල තමයි ඒ ප්‍රචණ්ඩත්වය වැඩියෙන් තිබුණේ. ඒ නිසා ඡන්දදායකයෝ ඡන්ද පොළට යෑමෙන් වැළකුණා. ඊට පසුව ඒවා සම්බන්ධව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කළා. ඒ ඡන්ද පෙත්සමට සාක්ෂි, මුළු රට පුරා තිබුණා. නමුත්, ඒ සාක්ෂි ගොනු කර ගන්න අපට අපහසු වුණා. මොකද, ඒ සඳහා තිබුණු කාලය බොහොම මදි. දවස් 21ක් තුළ ඒ ඡන්ද පෙත්සම ඉදිරිපත් කළ යුතුව තිබුණා. ඒ නිසා තමයි ඡන්ද පෙත්සම ඉදිරිපත් කිරීමේදී නොයෙක් අපහසුතාවලට මුහුණපාන්න සිදු වුණේ. ඒ කාලය දවස් 42ක් දක්වා දීර්ඝ කිරීමෙන් ඒ අපහසුව, ඒ දුෂ්කරතාව වළක්වා ගන්න පුළුවන්කම ලැබේවි. ඒ නිසා මම හිතනවා, මේ සංශෝධනය ඉතාම හොඳ සංශෝධනයක් කියලා. ඒ වාගේම අපි දන්නවා, සිවිල් නඩු සම්බන්ධව ද ප්‍රශ්නයක් තිබෙන බව. ඊට කලින් ඉහත කී කාරණය ගැන තවත් දෙයක් කියන්න තිබෙනවා. මේ විධියට අපේක්ෂකයෙකු මැතිවරණය සඳහා වැය කරන මුදල සම්බන්ධව නිශ්චිත කාලයක් තුළ විස්තර ලැයිස්තුවක් ඉදිරිපත් කිරීම අනාගතයටත් ඉතා වැදගත්. එමගින් කටයුතු ක්‍රියාත්මක කිරීමේ පහසුවක් ඇති වෙනවා. ඒ වාගේම, අතීතයේදීත් එය ඉතාම වැදගත් වශයෙන් සැලකුවා. 1947දී මහ මැතිවරණයට එදා හිටපු වෘත්තීය සමිති නායකයෙකු වූ ටී.බී. ඉලංගරත්න මහත්මයා තරග කළා මට මතකයි. එතුමා සමඟ තරග කළේ, ජෝර්ජ් ඊ. ද සිල්වා කියලා මහත්මයෙක්. එදා ඒ මහත්මයා ඡන්ද 200 ගණනකින් ජයග්‍රහණය කළා. ටී.බී. ඉලංගරත්න මහත්මයා ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කළා. ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරලා එතුමා එය ජයග්‍රහණය කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, please wind up. Your time has already finished.

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තවත් විනාඩි දෙකක කාලයක් දෙන්න.

ජෝර්ජ් ඊ. ද සිල්වා මහත්මයා එම මැතිවරණයෙන් ජයග්‍රහණය කළාට පස්සේ ඡන්ද පෙත්සමක් දාපු නිසා එතුමාගේ පත්වීම නිෂ්ප්‍රභ වුණා. ඊට පස්සේ නැවත අතුරු ඡන්දයක් ආවාම, ටී.බී. ඉලංගරත්න මහත්මයා ඡන්ද 3,000කින් දිනුවා. එතුමා ජයග්‍රහණය කළාට පස්සේ එතුමාට එරෙහිවත් ඡන්ද පෙත්සමක් ආවා. ඒ ඡන්ද පෙත්සම ඉදිරිපත් කළාට පස්සේ එතුමාගේ පත්වීමත් නිෂ්ප්‍රභ වුණා. ඊට පසුව ටී.බී. ඉලංගරත්න මහත්මයාටත් අවුරුදු හතකට සිවිල් අයිතිවාසිකම් අහිමි වුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, please wind up.

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)

Sir, I will wind up now.

ටී.බී. ඉලංගරත්න මහත්මයාට සිවිල් අයිතිවාසිකම් අහිමි වුණා වාගේම, ඒ ඡන්ද පෙත්සම ඉදිරිපත් කළ පරාජිත අපේක්ෂකයාටත් අවුරුදු තුනකට සිවිල් අයිතිවාසිකම් අහිමි වුණා. ඒකට හේතුව, එතුමා මැතිවරණය සඳහා වැය කරපු රුපියල් 25ක මුදලක්

[ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

මැතිවරණ වියදම් ලැයිස්තුවට ඉදිරිපත් කරලා තිබුණේ නැති එක. ඒ නිසා තමයි, එතුමාට සිවිල් අයිතිවාසිකම් අහිමි වුණේ. ඒ නිසා මම පැහැදිලිව කියන්න ඕනෑ, මැතිවරණයකින් පසුව ඉදිරිපත් කරන වියදම් ලැයිස්තුව එදා ඉතා වැදගත්කමකින් සැලකුවා කියන එක. ඒ වාගේම තමයි, තමන්ට මුදල් ලැබුණු මාර්ග සම්බන්ධ ලැයිස්තුවත්. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Nimal Piyathissa. You have eleven minutes.

[අ.භා. 1.09]

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සහ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සහ අධිකරණ සංවිධාන පනත යටතේ නියමය ආදිය පිළිබඳ විවාදයයි අද දවසේ පාර්ලිමේන්තුවේදී මේ පැවැත්වෙමින් තිබෙන්නේ. රටක් විධියට ගත්තාම, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම රැකෙන ප්‍රධාන ළිප් ගල් තුන තමයි, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය. අද අප මේ කථා කරන විෂය පද්ධතිය අපේ රටේ ඉතිහාසයත් එක්ක සංසන්දනය කරද්දී පෙනෙනවා, මේ පනත් කෙටුම්පත් සම්මත කරනවා වාගේම, විවිධ පනත් දැන් තිබෙන අභියෝගයට ගැළපෙන විධියට ප්‍රතිනිර්මාණය කිරීම අත්‍යවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙන බව.

හැබැයි, මේ ගතවෙච්ච කාලය තුළ අපේ රටේ උත්තරීතර ආයතනය බවට පත් වෙච්ච මේ පාර්ලිමේන්තුව පිළිබඳව අපට සතුටු වෙන්න පුළුවන්ද, සෑහීමකට පත් වෙන්න පුළුවන්ද? නීති අණ පනත් සම්මත කරන, ජාතික ප්‍රතිපත්ති සම්මත කරන, ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදක ආයතනය බවට පත් වන්නේ පාර්ලිමේන්තුවයි. හැබැයි, මේ ගත වෙච්ච කාලය තුළ දේශපාලන පක්ෂ විධියට ගනිද්දිත්, ඉතිහාසයේ ආණ්ඩු විධියට ගනිද්දිත් මේ පාර්ලිමේන්තුව විශේෂයෙන් යොදාගෙන තිබෙන්නේ මේ කියන ප්‍රස්තුත -මූලික- අවශ්‍යතා ඉටු කිරීමටද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය ගෙන බලද්දී මම හිතනවා ඒ සම්බන්ධයෙන් අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ කියලා.

විවිධ අය තමන්ට බලය ලබා ගැනීම සඳහා -බල අරගළය සඳහා- මේ උත්තරීතර ආයතනය එදාත් පාවිච්චි කළා, අදත් පාවිච්චි කරනවා කියන එක අපට වැඩි වශයෙන් පෙනී යන කාරණයක්. ඒ අනුව මේ දේශපාලන පක්ෂවලටත්, මේ රටේ නිර්මාණය වුණු සෑම ආණ්ඩුවකටමත් මේ රටේ පුරවැසියෝ එල්ල කරන විවේචනයෙන් ගැලවෙන්න බැහැ. එම නිසා මේ කාරණා සියල්ල දැන් එල්ල වන අභියෝගයට ගැළපෙන විධියට ප්‍රතිසංස්කරණය වෙන්න ඕනෑ; සංශෝධනය වෙන්න ඕනෑ.

එදා සුද්දා හදපු අධ්‍යාපන ක්‍රමය තමයි අපේ රටේ තවමත් තිබෙන්නේ. සුද්දා හදලා ගිය පරිපාලන ක්‍රමය තමයි තවමත් අපේ රට තුළ තිබෙන්නේ. ඒ වාගේම සුද්දා හදලා ගිය අධිකරණ පද්ධතිය තමයි තවමත් අපේ රට තුළ තිබෙන්නේ. වරින් වර - විටින් විට- යම් යම් දේවල් සංශෝධනය වුණා. හැබැයි, රටේ අභියෝගයට සාපේක්ෂව එය ප්‍රතිනිර්මාණය වුණාය කියලා අපට සෑහීමකට පත් වෙන්න බැහැ. ඒ නිසා අපි ඉතිහාසය නැවත හදාරලා, නැවත නිවැරදිව කියවලා, අපි මෙන්න මේ කියන අභියෝගයට සාපේක්ෂව විසඳුම් සෙවිය යුතු කාල පරිච්ඡේදයක් මේ තිබෙන්නේ.

විශේෂයෙන්ම අද අපේ රටේ විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය ගත්තොත් අපි කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ පිළිගන්නට ඕනෑ, මේ කුලුනු තුනෙන් විධායකයයි, ව්‍යවස්ථාදායකයයි කියන ප්‍රධාන ආයතන දෙක යම් අභියෝගයකට ලක්වෙලා තිබෙන බව. ඒක ජාතික වශයෙනුත් අභියෝගයට ලක්වෙලා, ජාත්‍යන්තර වශයෙනුත් අභියෝගයට ලක්වෙලා තිබෙනවා. අද වෙනකොට යම් පමණකට හෝ ඉතිරිවෙලා තිබෙන්නේ අධිකරණය පමණයි. හැබැයි, ඒ සම්බන්ධවත් අඩු වැඩි වශයෙන් විවේචන තිබෙනවා. ඒ නිසා මූලිකව ගත්තොත් අද අපේ රටේ පරිපාලනය, -රජය- එහෙම නැත්නම් ආණ්ඩුව විවිධ බටහිර බලවේග විසින් මෙහෙයවන තැනකට දූප්පත් වෙලා තිබෙනවා, දිළිඳු වෙලා තිබෙනවාය කියලා කිව්වොත් එය නිවැරදියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා තමයි ගත වුණු කාලය තුළ තත්ත්වය සෑහීමකට පත් වෙන්න බැහැයි කියලා කිව්වේ. මේ කියන කුලුනු තුනෙන් කුලුනු දෙකක් දැන් අභියෝගයට ලක්වෙලා තිබෙනවා වාගේම, ඒකට මේ රටේ ආණ්ඩු කරපු සියලුදෙනාම වගකියන්නට ඕනෑ. ඒ වාගේම හිතා මතා, සැලසුම් සහගතව, සංවිධානාත්මකව ප්‍රජාතන්ත්‍රවාදයේ මේ කියන ළිප් ගල් විනාශ කිරීම සඳහා; සමතලා කිරීම සඳහා ජාතික වශයෙන් ක්‍රියාත්මක කරන්නා වූ ත්‍රස්තවාදයත්, බෙදුම්වාදයත්, මූලධර්මවාදයත්, අන්තවාදයත් වාගේම රට අභ්‍යන්තරයේ සමස්තය මෙහෙයවන බාහිර බලවේග විසින් මේ සියල්ල විනාශ කිරීම සඳහාත් දිගින් දිගට, දිගින් දිගට කටයුතු කරන බවත් අපි ඉතිහාසයේ ඉඳලා අත්දැකලා තිබෙනවා. ඒ නිසා මේ කියන කුලුනු විනාශ කිරීම සඳහා බටහිර රටවල තානාපති කාර්යාල, විශේෂයෙන්ම ඇමෙරිකානු තානාපති කාර්යාලය ඒ ක්‍රියාන්විතයේ බොහොම තදබල විධියට ඉන්නවා. අපේ රට හැම අතකින්ම ශක්තිමත්ව උඩට එනවාට අපේ අසල්වැසි රාජ්‍ය වුණත් කැමති නැහැ. එසේ කැමති නැති බලවේග -අකමැති බලවේග- එකට එකතුවෙලා ජාතික වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් මේ රට අභ්‍යන්තරයේ සිටින ත්‍රස්ත කල්ලි, අන්තවාදී කල්ලි, මූලධර්මවාදී කල්ලි, ඒ වාගේම බෙදුම්වාදී කල්ලි, ඒ ඔක්කෝම සමඟ අද එකට මෙහෙයවෙන්නේ අර මම කියන විෂම, නරුම, දුෂ්ට ජාතික සහ ජාත්‍යන්තර බලවේග යටතේයි. එම නිසා අපට ආපස්සට හැරිලා බලන්න වෙනවා, මෙන්න මේ කියන තත්ත්වයන් ඇතුළේ රටක් විධියට ස්වාධීනත්වය රැකෙන විධියට, රටේ පුරවැසියෝ නැත්නම් ලාංකීය ජාතිය රැකෙන විධියට අනාගතය වඩාත් නිවැරදිව, යහපත්ව මෙහෙයවන්නට පුළුවන්කම ලැබෙන්නේ කොහොමද කියලා. අද එය ප්‍රබුද්ධ සංවාදයක්, ශිෂ්ට සම්පන්න සංවාදයක් අත්‍යවශ්‍ය මොහොතක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ නිසා අපි කොයි විධියට කථා බහ කළත්, කොහොම කථා බහ කළත්, මේ කියන අඩු පාඩුකම්වලට මේ රටේ සියලු දේශපාලන පක්ෂ වාගේම ආණ්ඩු නිර්මාණය කරපු සහ ආණ්ඩුවලට සහයෝගය ලබා දුන් සියලුදෙනාම අඩු වැඩි වශයෙන් දායක වෙලා තිබෙනවාය කියලා කිව්වොත් නිවැරදියි. මොකද, අද තිබෙන්නේ සුළුපටු අභියෝගයක් නොවෙයි.

අපි දන්නවා, මාරාන්තික කොරෝනා වයිරසය මුළු ලෝකයම වැළඳගන්නකොට අපේ රටත් ඒකට ගොදුරු වුණු බව. ඒ වාගේම ආර්ථික වශයෙන් ඇති වෙච්ච අර්බුදය පියමං කරන්න බැරි තැනකට අපි ගොදුරු වෙලා තිබුණා. එය පියමං කරන්න පුළුවන් විවිධ යෝජනා, අදහස් ඉදිරිපත් වෙද්දීත් ඒ කිසිවක් ගණනකට නොගෙන ඒ කටයුත්ත ඒ ආකාරයෙන්ම ගලාගෙන යන්නට ඉඩ

දීම තුළ ඒ අර්බුදය බලසම්පන්න වුණා. අර මම කියපු විෂම, නරුම, දුෂ්ට බලවේගවල ගොදුරක් විධියට ඒ අර්බුදය පාවිච්චි වුණා. විශේෂයෙන්ම රටක අයිතිවාසිකම් වෙනුවෙන්, රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්, රාජ්‍ය සේවකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්, ගොවීන්ගේ, කම්කරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ලෝක ඉතිහාසය පුරාම පැවැත්වූ අරගළ, උද්ඝෝෂණ, විරෝධතා ව්‍යාපාර පිළිබඳව අපි අහලා තිබෙනවා. සමහර ඒවා ප්‍රජාතන්ත්‍රවාදීයි, සාමකාමීයි. සමහර අරගළ ප්‍රචණ්ඩකාරියි. සමහර වෙලාවට ඒවා ආයුධ සන්නද්ධ අරගළ බවට පත් වෙනවා. ඒ ලෝක ඉතිහාසයේ ඇතැම් අත් දැකීම්. අපේ රට අභ්‍යන්තරයේත් එවැනි අරගළ අපි අත් දැකලා තිබෙනවා; ජීවමානව අත් දැකලා තිබෙනවා. අපේ රට ගත්තොත්, සුද්දා මේ රට දාලා ගියායින් පසුවත් අපේ රටේ එවන් අරගළ මතුවෙච්ච අවස්ථා තිබෙනවා. විශේෂයෙන්ම 50 දශකයේ ඇති වෙච්ච අරගළ, 70 දශකයේ ඇති වෙච්ච අරගළ, 80 දශකයේ ඇති වෙච්ච අරගළ අපි අත් දැකලා තිබෙනවා. විශේෂයෙන්ම මෙන්න මේ කියන අර්බුදයත් එක්ක නිර්මාණය වෙච්ච 2022 අරගළය ගත්තොත්, ඒ අරගළය සාමකාමී අරගළයක්. සද්භාවයෙන් යුතුව සමහර අයගේ අඳෝනාව, අසහනය ප්‍රකාශයට පත් කරලා ඊට පිළියම් යොදාගන්න උත්සාහ ගත්තත්, ඒ කටයුතු සියල්ලම තම තමන්ගේ ග්‍රහණයට අරගෙන, ඒවා ගොදුරු බවට පත් කරගෙන රට අරාජික කරන්න, රාජ්‍යය අරාජික කරන්න අපේ රට අභ්‍යන්තරයේ සිටින ඇතැම් ත්‍රස්ත කල්ලි, අර මම කියපු වර්ගයේ විෂම කල්ලි, විවිධ මනෝරාජික කල්ලි -ඒ හැම කෙනෙක්ම- මෙන්න මේ කියන ඊනියා ගෝල්ෆේස් අරගළය,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have two more minutes.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කොපමණ වෙලාවක් වෙන් කර තිබුණාද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
A total of 13 minutes and you have already finished 11 minutes. So, you have two more minutes left.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

එදා ඔය කියන අරගළය අපේ රට අභ්‍යන්තරයේ අපි දැක්කා. අපි 71 අරගළය දැක්කා, 88-89 අරගළය දැක්කා. හැබැයි, ඒවා බාහිර බලවේග මෙහෙයවපු අරගළ නොවෙයි. විදේශ තානාපති කාර්යාල, NGO මෙහෙයවපු අරගළ විධියට නොවෙයි අපි ඒවා දකින්නේ. මමත් ඒ, 88-89 කියන කාලයේ අරගළයේ සජීවී ලෙස නියෝජනය වෙච්ච කෙනෙක්. ඒ අරගළ අපි දැක්කේ වෙන විධියකටයි. හැබැයි, 2022 අරගළය ගත්තාම, ඒ අරගළය නියෝජනය වුණේ කොහොමද? ඒවාට සල්ලි එච්චේ කවුද? රුපියල්, ඩොලර් එච්චේ කවුද, අරක්කු ටික එච්චේ කවුද කියලා අපි දන්නවා. ඒ වාගේම මේ රට අරාජික කරන්න, රාජ්‍යය අරාජික කරන්න, ලිබියානු පන්නයේ පාලන තන්ත්‍රයක් නිර්මාණය කරන්න දායක වුණේ කවුද? ඒකට ප්‍රබල දායකත්වයක් ලබා දුන්නේ කවුද, ප්‍රසිද්ධියේත්, අප්‍රසිද්ධියේත් ඒ සඳහා දායකත්වය දුන්නේ කවුද කියලා අපි දන්නවා. මේ රටේ පුරවැසියෝ බරපතළ පැටලුම් සහගත තත්ත්වයක් තුළ තමයි අද කටයුතු කරන්නේ. අද මේ තිබෙන ආර්ථික අසහනය සහ අනෙකුත් සියලු අසහනයන්වලට සැබෑ විසඳුමක්, සැබෑ පිළිතුරක් අත්‍යවශ්‍ය මොහොතක් බවට මේ මොහොත පරිවර්තනය වෙලා තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදයේ කුලුනු තුනෙන් එක කුලුනක් විධියට අධිකරණය තිබෙනවා. විධායකය සහ ව්‍යවස්ථාදායකය කියන කුලුනු දෙක දෙදරා තිබෙනවා. අපි කවුරුත් ප්‍රජාතන්ත්‍රවාදයට කැමැතියි. ප්‍රජාතන්ත්‍රවාදය ඕනෑ කියලා හඬ නඟන සියලු දෙනාගේම අනිවාර්ය වගකීම තමයි මෙන්න මේ කියන කුලුනු දෙක නැවත සවිමත් කිරීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කරුණු සම්බන්ධව කථා කරද්දී මැතිවරණ ක්‍රමය ගැනත් කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ මැතිවරණ ක්‍රමය සම්පූර්ණයෙන් ප්‍රතිනිර්මාණය වෙන්න ඕනෑ. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඕනෑ, නව මැතිවරණ ක්‍රමයක්, ප්‍රතිපත්තියක් අපට ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
ඒ කියන සියලු මූලික ප්‍රතිපත්ති වෙනස් කළොත් විතරයි අපට මේ කථා කරන විෂය පද්ධතිය ඇතුළේ රටේ අනාගත පුරවැසියාට ප්‍රයෝජනවත් වන, ඵලදායක වන වෙනස්කම් ප්‍රතිනිර්මාණය කරන්න පුළුවන් වෙන්නේ කියන කරුණත් මම මතක් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Vijitha Herath. You have nine minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Harshana Rajakaruna to the Chair?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Sir, I propose that the Hon. Harshana Rajakaruna do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. HARSHANA RAJAKARUNA took the Chair.*

[අ.භා. 1.21]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාව ආර්ථික වශයෙන් බංකොලොත් කියලා පසුගිය අප්‍රේල් මාසයේ 12වැනි දා පළමුවැනි වතාවට ප්‍රකාශයට පත් කළා. දැන් රට බංකොලොත් වෙලා මාස 17ක් වෙනවා. මේ බංකොලොත්කමෙන් රට මුදා ගන්න තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇතුළු අලුත් අමාත්‍ය මණ්ඩලය පත් වුණේ. හැබැයි, මාස 17ක් ගත වුණත්, මේ බංකොලොත්කමෙන් තවම රට මුදාගෙන නැහැ.

IMF එකට යන්න බලපෑ ප්‍රධාන හේතුව තමයි, අපි ගත්ත විදේශ ණය කපා හැරීම සහ ඒ සඳහා සහන ලබා ගැනීම. නමුත්, මේ වනතෙක් ඩොලර් එකකවත් ණය කපා හැරීමක් සිදුවෙලා නැහැ. ඒ වාගේම අපි ණය ගෙවිය යුතු කාල සීමා දීර්ඝ කරගෙන හෝ අපි ගෙවිය යුතු පොලියට සහන ලැබීමක් සිදුවෙලාත් නැහැ. ඒ වෙනුවට වෙලා තිබෙන්නේ, IMF එක අපට ඉදිරිපත් කරපු කොන්දේසි මත අපේ රටේ ජනතාව මත තවත් බදු පනවන්න සිදුවෙලා තිබීම. ඒ වාගේම භාණ්ඩවල මිල වැඩි කරන්න සිදුවෙලා තිබීම. ඒ අර්ථයෙන් තමයි විදුලි බිල වැඩි වුණේ; තෙල් මිල වැඩි වුණේ; ගෑස් මිල වැඩි වුණේ; ජල ගාස්තු වැඩි වුණේ.

IMF එක පළමුවැනි සමාලෝචනය ඉවර වෙලා ඉතා පැහැදිලිව කිව්වා, "බදු ආදායම මදි, අපේක්ෂිත ආදායම සියයට 15ක් ලැබිලා නැහැ. තවත් බදු වැඩි කරන්න. බදු ආදායම ලබා ගත්තේ නැත්නම් තවත් අමාරුවේ වැටෙනවා" කියලා. ඒ නිසා දැන් ආණ්ඩුව බදු පිට බදු ගහනවා. ලබන ජනවාරි මාසයේ ඉඳලා අවුරුදු 18ට වැඩි සියලු දෙනාට බදු ෆයිල් එකකුත් open වෙනවා. මේ වන විට හදිසියේ තෙල් මිලත් වැඩි කරලා තිබෙනවා. ආණ්ඩුව පාරම්බෑවා, දැන් උද්ධමනය අඩුයි, සියයට 1.6යි කියලා. ගිය අවුරුද්දේ උද්ධමනය සියයට 70ට තිබෙනකොට පෙට්‍රල් ලීටරයක මිල තිබුණේ රුපියල් 117ට බව අපට මතකයි. අද උද්ධමනය සියයට 1.6යි කියනවා. හැබැයි, පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 361ට වැඩි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. එදා ඩීසල් ලීටරයක මිල රුපියල් 105යි. ඊට පස්සේ ඩීසල් ලීටරයක මිල රුපියල් 341ට වැඩි වුණා. ඊයේ-පෙරේදා ඩීසල් ලීටරයක මිල රුපියල් 351ට වැඩි කළා. එදා උද්ධමනය සියයට 70යි කියනකොට ලාම්පු තෙල් ලීටරයක මිල රුපියල් 87යි. දැන් ආණ්ඩුව පාරම්බානවා, උද්ධමනය අඩුයි, සියයට 1.6යි කියලා. හැබැයි, දැන් ලාම්පුතෙල් ලීටරයක මිල රුපියල් 241යි. තුන් ගුණයකින් -සියයට 330කින්- වැඩි වෙලා තිබෙනවා. දැන් තෙල් පෝලිම් නැහැ, ගෑස් පෝලිම් නැහැ, ආර්ථිකය හොඳයි කියලා මතුපිටින් පෙන්වන්න හැදුවාට දැන් අප සතුව තිබුණු තෙල් කොම්පැනි ටිකත් නැති වෙලා අද තරගෙට තෙල් සමාගම් තෙල් මිල වැඩි කරනවා.

ප්‍රතිව්‍යුහගත කරනවා කියලා ආයතන විකුණා දැමීම ඇතුළේ අපේ රටේ තිබෙන ආර්ථිකයත් කඩා වැටෙනවා. ඊයේ මිල්කෝ ආයතනයට ලියුමක් ආවා. ඒ ඇවර කිරීමේ ලිපිය. දැන් මිල්කෝ ආයතනය සම්පූර්ණයෙන්ම ඉන්දියානු සමාගමකට පවරා දෙන්න ලැහැස්ති වෙනවා. ඒ විතරක් නොවෙයි. අද වෙනකොට සතොස සේවකයින් සිය ගණනක් මහ පාරේ උපවාසවල නිරත වෙලා ඉන්නවා. සතොස තමයි ව්‍යසන අවස්ථාවකදී, ආපදා අවස්ථාවකදී රටේ ජනතාවට සහන මිලට බඩු ටික සපයා දෙන්න තිබුණු ආයතනය. බන්දුල ගුණවර්ධන හිටපු වෙළඳ ඇමතිවරයා අවස්ථා කිහිපයකදී කිව්වා, පරිප්පු, සීනි ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ටික කොරෝනා ව්‍යසන කාලයේ, ගංවතුර කාලයේ, සුනාමි කාලයේ ගෙවල්වලට ගිහිල්ලා බෙදන යන්ත්‍රණයක් ක්‍රියාත්මක වුණේ සතොස හරහා බව. මේ ආණ්ඩුව ආවාට පස්සේ IMF පදයට නටලා සතොස ආයතනය මුළුමනින්ම විකුණලා අද එහි සේවකයින් ටික මහ පාරට වට්ටලා තිබෙන්නේ. අද ඒ සේවකයින් අඛණ්ඩ උපවාසයක නිරත වෙලා ඉන්නවා. මේ අය සේවයෙන් ඉවත් වෙනකොට අඩුම ගණනේ සාධාරණ පදනමක් මතවත් ඔවුන්ට ඒ අදාළ දීමනා ලබා දුන්නේ නැහැ. ඉතින්, සතොස ආයතනය විනාශ කරපු එක ගැන ඔවුන් විවිධ අවස්ථාවලදී කථා කළා. සතොස ආයතනය විනාශ වුණේ සේවකයින්ගේ වැරැද්දෙන් නොවෙයි, දේශපාලන මැදිහත්වීම්වලින්. දේශපාලන මැදිහත්වීම්වලින් සතොස ආයතනය මුළුමනින්ම කඩා වට්ටලා, ඒ ආයතනය සතුව තිබුණු ලොරි ඇතුළු දේපළ ටික ලංකා සතොසට දීලා -පෞද්ගලික ආයතනයට පවරලා- අද ඒ සේවකයින් ටික මහ පාරට ඇද වට්ටලා ආණ්ඩුව වගේ වගක් නැතිව ඉන්නවා. ඒ ගැන කථා කරන්නේත් නැහැ. ආණ්ඩුවේ බලධාරින්ට ඒ ගැන කිසිම සංවේදීතාවකුත් නැහැ. ඒ විධියටම මේ රටේ දහස් ගණන් ජනතාව විදුලි බිල වැඩි කිරීම නිසා, තෙල් මිල වැඩි කිරීම නිසා අද පීඩා විඳිනවා. තෙල් මිල වැඩි කළාම බස් ගාස්තු වැඩි වෙනවා; දුම්රිය ගාස්තු වැඩි වෙනවා; කර්මාන්ත නැවත වතාවක් කඩා වැටෙනවා. මේ වසරේ පළමුවැනි කාර්තුවේ කර්මාන්ත ක්ෂේත්‍රය සෘණ 23කින් කඩා වැටිලා තිබෙනවා. ඉදිරියේදී කර්මාන්ත අංශය තවත් කඩා වැටෙනවා, මේ තෙල් මිල වැඩිවීමත්, විදුලි බිල වැඩිවීමත් එක්ක.

හැබැයි, IMF එක ඉතා පැහැදිලිව ඔවුන්ගේ වාර්තාවේ ඉදිරිපත් කළා, මේ ආර්ථිකය මේ සා විශාල වූ අගාධයකට වැටෙන්න ප්‍රධාන වශයෙන් බලපෑ හේතුව වන්නේ, වංචා, දූෂණ නතර නොකිරීම, වංචා, දූෂණ තව තවත් පැටව් ගහලා වර්ධනය වීමයි කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පාර්ලිමේන්තුවට පනත් ගෙනෙනවා. හැබැයි, වැඩක් නැහැ. වංචා, දූෂණ නතර වෙන්නේ නැහැ. ලොකුම විහිළුව මෙයයි. අද මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතත් ඉදිරිපත් කර තිබෙනවා, සම්මත කරගන්න. හැබැයි, මැතිවරණයක් නැහැ. මැතිවරණ වෙනුවෙන් පනත් එනවා. හැබැයි, මැතිවරණ නැහැ. දූෂණ, වංචා පිළිබඳව පනත් එනවා. හැබැයි, දූෂණ, වංචා නතර වෙන්නේ නැහැ. ඒ විතරක්ද? නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පනත් ගේනවා, හැබැයි නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ, නීතිය වල් වැදිලා.

මේ රටේ ජනතාව දන්නවා, අධිකරණයේ ස්වාධීනත්වයට සෘජුව බලපෑම් එල්ල කළේ රටේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බව. EPF එක පිළිබඳ නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වන වෙලාවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉතා සාහසිකව ප්‍රකාශ කළා, අධිකරණයෙන් මොන තීන්දු දුන්නත් වැඩක් නැහැ, ඒවා නොවෙයි වලංගු, පාර්ලිමේන්තුවෙන් දෙන තීන්දුව තමයි වලංගු කියලා. ඒක අධිකරණයට කරපු සාහසික බලපෑමක්; අධිකරණයට සෘජුව කරපු බලපෑමක්. ඊට පස්සේ ඒ නඩු විභාගය සම්බන්ධයෙන්ම කථානායකවරයා මේ පාර්ලිමේන්තුවේ නැවත ප්‍රකාශයක් කරමින් අධිකරණයට වක්‍රව බලපාන ක්‍රියාමාර්ගයක් ගත්තා. එවැනි ක්‍රියාමාර්ග හරහා තමයි අද විනිශ්චයකාරවරුන්ට ඉල්ලා අස්වෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. සමහර මන්ත්‍රීවරු උසාවියේ විභාග වෙමින් පවතින නඩු පිළිබඳව,

විනිශ්වයකාරවරු පිළිබඳව යම් යම් තැන්වල කථා කරමින් කරපු බලපෑම් නිසා තමයි මෑත ඉතිහාසයේ පළමුවෙනි වතාවට විනිශ්වයකාරවරුන්ට ඉල්ලා අස්වෙන්න, රට දමා යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා අද ඉතා පැහැදිලිව පේන්න තිබෙන දෙයක් තමයි, මේ ආණ්ඩුව ජනතාවගේ ප්‍රශ්න විසඳන්න සමත් නොවන නිසා ජනතාවගේ ඡන්දවලට බය වෙලා මැතිවරණ හකුළමින් මර්දනකාරී ක්‍රියාමාර්ග ගන්නවාය කියන කාරණය. මැතිවරණයක් නැතුව මැතිවරණ සම්බන්ධයෙන් තිබෙන දඩ මුදල් වැඩි කරනවා. ඒ වාගේම ඡන්ද පෙත්සම් ඉදිරිපත් කරන්න තිබූ දින 21ක කාලය දින 42ක් කරනවා. ඉතින්, දින 42ක් කරලා වැඩක් තිබෙනවාද, මැතිවරණයක් නැත්නම්? පළාත් සභා මැතිවරණයත් නැහැ, පළාත් පාලන මැතිවරණයත් නැහැ. හැබැයි, මැතිවරණ පනත් විතරක් තිබෙනවා.

ඊළඟ කාරණය තමයි, මැතිවරණ පවත්වන්න ආණ්ඩුවට මුදල් නැහැ කියලා කරපු වංචාව; මුදල් නැහැ කියලා මැතිවරණ කල් දමපු එක. ඕනෑම පොඩි ළමයෙකුට තේරෙනවා, මේක පට්ටපල් බොරුවක් කියලා. අද මැතිවරණ හකුළා තිබෙනවා; ප්‍රජාතන්ත්‍රවාදය හකුළා දමා තිබෙනවා. ඒ වාගේම සමාජ මාධ්‍ය මර්දනය කරන්න, දඩයම් කරන්න ගෙනෙන Online Safety Bill එක හරහා තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය හකුළනවා. අනෙක් පැත්තෙන්, ත්‍රස්ත විරෝධී පනත ගෙනැල්ලා ප්‍රජාතන්ත්‍රවාදය හකුළනවා. ආණ්ඩුවේ බැරිකම වහගන්න මැතිවරණ කල් දමනවා; සමාජ මාධ්‍ය මර්දනය කරනවා. ඒ විතරක් නොවෙයි. මේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ගවලට එරෙහිව ජනතාව නැඟිටින එක පාලනය කරන්න, වළක්වන්න, ඒ අය දඩයම් කරන්න ත්‍රස්ත විරෝධී පනත වැනි ඒවා ගේනවා. මේ කාරණා තුනෙන්ම පේන්නේ මොකක්ද? ආණ්ඩුව ජනතාවගේ ප්‍රශ්න විසඳන්නේ නැතුව, ජනතාව මත බදු පිට බදු ගහලා, තෙල් මිල, විදුලි බිල වැඩි කරලා ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇති කළාම, ජනතාවගෙන් බුර බුරා නැඟෙන විරෝධය බලහත්කාරයෙන් යටපත් කරන්න මැතිවරණ හකුළනවා. ඒ වාගේම සමාජ මාධ්‍ය මර්දනය කරන පනත් ගේනවා. ත්‍රස්ත විරෝධී පනත වැනි ඒවා ගේනවා. හැබැයි, මේ මොන පනතක් ගෙනාවත් වැඩක් නැහැ. මේ රටේ ජනතාව දන්නවා, අත්දකිනවා, අද රටේ තිබෙන ඇත්ත තත්ත්වය. මේ රටේ තිබෙන ආර්ථික අර්බුදයෙන් අපි ගොඩ ගිහිල්ලාත් නැහැ, ප්‍රජාතන්ත්‍රවාදය වාගේම අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා වෙලාත් නැහැ. ඒ නිසා අපි අධිකරණය පිළිබඳව නීති, පනත් කොච්චර සම්මත කළත් වැඩක් නැහැ; මැතිවරණය පිළිබඳව නීති, අණ පනත් කොච්චර සම්මත කළත් වැඩක් නැහැ; වංචා, දූෂණ වැළැක්වීම පිළිබඳව නීති කොච්චර සම්මත කළත් වැඩක් නැහැ, ඒ එකක්වත් මහ පොළොවේ ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා. ඒ නිසා තමයි IMF එක කියලා තිබෙන්නේ මෙය යථාර්ථයක් වෙන්නේ, "if implemented effectively" කියලා. එහෙම නොවුණොත් සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ කියලා අවධාරණය කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද උදේ සිටම නොයෙකුත් කරුණු-කාරණා දීර්ඝ වශයෙන් මේ ගරු සභාවේ සාකච්ඡා වුණා. විශේෂයෙන්ම නිමල් පියතිස්ස මැතිතුමා මම ගරු කරන මන්ත්‍රීවරයෙක්. එතුමා කියපු කාරණා එක්ක බැලුවාම, අපේ රටේ ජනාධිපතිතුමා යම් ආකාරයකින් ලෝකයේ බලවත් රාජ්‍යයන් හමුවේ ඉතාම ඍජුව තමන්ගේ මතය ප්‍රකාශ කරන තත්ත්වයක් මේ වන විට අපි දකිනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. මම UN General Assembly එකට සහභාගි වෙච්ච අවස්ථාවේදී දැක්කා, සසකාවා පරිශ්‍රයේදී එතුමා ඉතාම පැහැදිලිව තමන්ගේ ස්ථාවරය ප්‍රකාශ කළ ආකාරය.

ඊට ප්‍රථම ජනමාධ්‍ය තුළින් මම දැක්කා, ජපානයේදී එතුමා බටහිර ප්‍රබල රාජ්‍යයන්ගෙන් ඉල්ලීමක් කළා, "කරුණාකරලා බලවත් රාජ්‍යයන්ගේ පැත්තක් ගන්න කියා අපට බල කරන්න එපා" කියලා. ඉන් අනතුරුව ඊයේ පෙරේදා එතුමා ජර්මනියේදීත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සම්බන්ධයෙන් ප්‍රධාන රාජ්‍යයන්ට, බලවත් රාජ්‍යයන්ට නිවැරදි මතවාදයක් ප්‍රකාශ කරන තත්ත්වයක් අපි දකිනවා. මම හිතනවා, මේ සාකච්ඡා රූපවාහිනිය තුළ සිංහල උපසිරැසි, දමිළ උපසිරැසි එක්ක නිරන්තරයෙන් ප්‍රචාරය කරන්න ඕනෑ කියලා. මොකද, හේතුව අපේ රට අමාරුවේ වැටිලා හිටියා වුණත්, රටේ නායකයා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සම්බන්ධයෙන් හොඳ ස්ථාවරයක් පළ කරන ස්වරූපයක් අපට පෙනෙනවා. එතුමාගේ ඒ අදීන ස්වභාවය සම්බන්ධයෙන් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි පසුගිය පාර්ලිමේන්තු සතියේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. නමුත් ඒ අවස්ථාවේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු විවේචනය කරලා තිබුණා, පාර්ලිමේන්තු පසු පෙළ මන්ත්‍රීවරයෙක් හැටියට මම UN General Assembly එකට සහභාගිවීම ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වෘත්තියෙන් නීතිඥවරයෙක්. මම අපේ රටේ දහඩිය මහන්සියෙන් වැඩ කරන අහිංසක දුගී දුප්පත් ජනතාවගේ බදු මුදලින් ඉගෙන ගෙන, අපේ රටේ නීති විද්‍යාලයට ගිහිල්ලා, කොළඹ විශ්වවිද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය ලබලා නීතිඥවරයෙක් වෙච්ච කෙනෙක්. එතැනිනුත් එහාට ගිහිල්ලා, මේ රටේ ජනතාවගේ ඡන්දයෙන් පත් වුණු කෙනෙක්. පසුගිය පාර්ලිමේන්තු කාලය තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය නිර්ණය කිරීම තුළ ඔබතුමන්ලාගේ විපක්ෂය නියෝජනය කරන කවිරත්න මන්ත්‍රීතුමිය තමයි හොඳම පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය වුණේ. ඒ වෙලාවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කළ මම තමයි ඒ කාලවකවානුව තුළ හොඳම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වුණේ. ඉතින් මේ කටයුත්තට සහභාගි වෙන්නට මාවත් තෝරා ගත්තා. මටත් ජනාධිපතිතුමා ආරාධනා කළා. ඉතින් තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට මට ඒක විශාල අත්දැකීමක් වුණා. අපි අනාගතයේ මේ රටේ නායකත්වය තුළ ඉන්නවා නම්, එවැනි අත්දැකීම් ලබා ගන්න ඕනෑ. මම දැක්කා, සහභාගි වෙච්ච කණ්ඩායම තුළ විපක්ෂයේ ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමාත් හිටියා. හැබැයි, තව මන්ත්‍රීවරයෙකුට විපක්ෂ නායකතුමා යන්න එපා කියලා බලපෑම් කරලා නවත්වා ගෙන තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, UN General Assembly එකට යන එක අමුතු දෙයක් නොවෙයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමතිවරු මේකට සහභාගි වෙනවා. නිදහසින් පසුව රටේ රාජ්‍ය නායකයා එක්ක සහභාගි වෙනවා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය, විපක්ෂ නායකතුමා වැරදි මතවාද පාර්ලිමේන්තුව තුළ දිගින් දිගටම මුදා හැරීමයි. අද උදේ විපක්ෂ නායකතුමා කිව්වා, "*per diem* එකක් ගත්තා" කියලා. මම ඉතාම වගකීමෙන් කියන්නේ, ගරු ජනාධිපතිතුමා හෝ සහභාගි වෙච්ච කිසිම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් *per diem* එකක් ගත්තේ නැහැ. මේ රටට අමාරු තත්ත්වයක් තිබෙන්නේ. අපේ අතිනුත් කීයක් හරි ගිහිල්ලා, ඒ අවශ්‍ය කටයුතුවලට අපි සහභාගි

[ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා]

වුණා. ඒක සාමාන්‍ය දෙයක්. මම හිතනවා, ඒ සඳහා තෝරා ගැනීමට මා සුදුසුයි කියලා. ඉතින් අපට දෙන්න පුළුවන් දායකත්වය ලබා දෙමින්, එය අත් දැකීමක් කර ගන්නත් අපට ඒ අවස්ථාව ලැබුණා. නමුත් මේ කාරණා පිළිබඳව මෙතුමන්ලා පාර්ලිමේන්තුවට කිව්වේ කොහොමද? අපි *per diem* එකක් ගත්තා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ විපක්ෂ නායකතුමා කියන්නේ මොනවා හරි අලකලංචියක් වෙලා එක පාරට රටේ නායකයා වෙන්නත් පුළුවන් කෙනෙකුට. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා මුලින්ම අගමැතිකම භාර ගන්න කථා කළේ එතුමාට නේ. මොකද, ඡන්ද තියන්න ඕනෑ නැහැ නේ. නමුත් එතුමා ඒක භාර ගත්තේ නැහැ. එතුමාම කියලා තිබුණේ, "මට direct flight එකකින් යන්න පුළුවන්කම තිබුණා" කියලයි. නමුත් එතුමා අගමැතිකම භාර ගත්තේ නැහැ. එහෙම ගන්න බයයි; වගකීමක් ගන්න බයයි. හැබැයි, වත්මන් ජනාධිපතිතුමා කොන්දේසි දමන්න ගියේ නැහැ, ඒ නායකත්වය භාර ගත්තා. විපක්ෂ නායකතුමා අගමැතිකම ගන්න නම්, ජනාධිපතිතුමා කවදාද යන්නේ කියන කොන්දේසි ඉදිරිපත් කරමින් බලාගෙන හිටියා. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්තයාට අගමැතිකම භාරගන්න කිව්වාම, එතුමා භාර ගත්තා. මොකද, එතුමා දන්නවා, ඒ ජනාධිපතිතුමා ගියාම එතුමාට ජනාධිපති වෙන්න පුළුවන් කියලා. ඒක තමයි දක්ෂකම. ඒක තමයි අත්දැකීම.

මම විපක්ෂ නායකතුමා ගැන අවංකව කනගාටු වෙනවා. එතුමාට බොහොම කැමැති කෙනෙක්, මම. හැබැයි, මේ වාගේ බොරු මතවාද, මිනිස්සු අවුස්සන වැරදි කථා සොයන්නේ බලන්නේ නැතුව ප්‍රකාශ කිරීම තුළ මේ ව්‍යවස්ථාදායකයේ සිටින සියලු දේශපාලනඥයන්ටයි ඒක ගැටලුවක් වෙන්නේ. මොකද, කවදා හරි දවසක එතුමා රටේ ජනාධිපති වුණොත්, -මම ඒ ගැන දන්නේ නැහැ- එතුමාටත් සිද්ධ වෙනවා, තමන්ගේ ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් එක්ක මේ අවස්ථාවට සහභාගි වෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර රටවල සම්පූර්ණ කණ්ඩායම 200කට වැඩියි. අපි කියන්නේ නැහැ, එහෙම තත්ත්වයන් නිර්මාණය කර ගන්න ඕනෑ කියලා. නමුත් මේවා සම්බන්ධයෙන් මීට වඩා වගකීමෙන් එතුමා ප්‍රකාශ නිකුත් කරයි කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිගින් දිගටම කථා කළා, පළාත් පාලන ඡන්ද විමසීම් පනතට අදාළව ගෙන ආ තරුණ නියෝජනය පිළිබඳ කෝටාව ගැන.

විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුත් මෙම තරුණ නියෝජනය පිළිබඳ කෝටාවට අදාළ යෝජනාව මට පූර්වයෙන් ගෙනැල්ලා තිබෙනවා. ඒක හොඳයි. හැබැයි, ඊට පස්සේ මම ඒ යෝජනාව ගෙනාවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැම කෙනෙකුටම ඕනෑම යෝජනාවක් ගෙන ඒමේ අයිතිය තිබෙනවා. හැබැයි, ඒ යෝජනාව identical - හරියටම සමාන - නැහැ. ඒ යෝජනාව ගෙනාවාට පස්සේ මම, මගේ කාර්යභාරය දිගින් දිගටම කරගෙන ගියා. එතැනදී බලන්න ඕනෑ, පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම පාර්ලිමේන්තුවේ සිද්ධ වුණේ කවද්ද කියන එකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා, මාස හයක කාල සීමාව ඉකුත්වෙලා, අවුරුදු ගණනාවකුත් ගත වුණාට පස්සේ තමයි එතුමාට එම පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ අවශ්‍යතාව ඇති වෙන්නේ. මොකක්ද ඒකට හේතුව? ඒ කාර්යය සම්බන්ධයෙන් එතුමාට උනන්දුවක් තිබුණේ නැහැ. හැබැයි, මගේ කාර්යය මම දිගින් දිගටම කරගෙන ගියා; නිසි අවධානයෙන්, උද්‍යෝගයෙන් යුතුව මම ඒ කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර රේස් තිබෙනවා, කොච්චර ඉස්සෙල්ලා පටන් ගත්තත්, අවසානයේ දිනන මිනිහා ගැන මිසක් ඒ රේස් එක මුලින් පටන් ගත්ත මනුස්සයා ගැන හොයන්නේ නැහැ. ඕනෑම රේස් එකක් අවසානයේ පටන් ගත්තත් බොහොම වේගයෙන් ඉදිරියට යන්න පුළුවන්. තමන්ගේ උනන්දුව නැතිකම නිසා තමන් ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතට මාස හයක් ගත වෙච්ච ක්ෂණයෙන් එහෙම නම් එය දෙවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කරන්න ඕනෑ. නමුත් එතුමා එහෙම ඉදිරිපත් කරලා නැහැ. මම මීට සුළු මොහොතකට ඉස්සෙල්ලා ලියුමකට අත්සන් කළා. දණ්ඩ නීති සංග්‍රහය පනත් කෙටුම්පතට මම සංශෝධනයක් එක් කරලා තිබෙනවා. ඒ පනත් කෙටුම්පත මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ 2023 අවුරුද්දේ අප්‍රේල් මාසයේ 04වැනි දා. මම ඒ ගැන හොයා බැලුවාම අදට තමයි ඒ පනත් කෙටුම්පතට මාස හය ඉකුත් වෙන්නේ. ඒ නිසා මම ඊට අදාළ ලියුමට අද අත්සන් කළා. ඒ අනුව මම හෙට දිනයේදී හෝ අනිද්දා දිනයේදී ඒ පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. හැබැයි, ඔය කියන මන්ත්‍රීවරයා මාස හය, හතක් බලාගෙන ඉඳලා තිබෙනවා, ඔය කියන දෙවැනිවර කියවීම පටන් ගන්න. ඒකෙන්ම පෙනෙනවා, කාගේද සද්භාවය, කාගේද අසද්භාවය කියන එක. ඒ නිසා වැරැදි චෝදනා අපිට එල්ල කරන්න එන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. සමහර කාරණා සම්බන්ධයෙන් හොඳින් පැහැදිලි කරන්න අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ඒ එක්කම අද උදේ මූලිකව මතු කරපු කාරණය සම්බන්ධයෙන් ටිකක් උත්තර දෙන්න ඕනෑ වුණු නිසා මම වෙලාව අරගෙන උත්තර දුන්නා. නමුත් මට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මම වෙලාව බලමින් තමයි කථා කරන්නේ. මට තව විනාඩි තුනක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාගේ වෙලාවට අනුව නොවෙයි කථා කළ යුත්තේ. ඔබතුමා පස් වරු 1.29ට තමයි කථා කරන්න පටන් ගත්තේ. ඒ අනුව 1.39ට කථාව අවසන් කරන්න ඕනෑ.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

මීට පූර්වයෙනුත් මූලාසනයෙන් මගෙන් විනාඩි තුනහමාරක් අඩු කරපු දිනක මම ගරු කථානායකතුමාට ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළා. ඒ නිසා මට වෙලාව ලබා දෙන්න කියා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි කථා කරපු මේ පනත් කෙටුම්පත් ඉතා සුදුසු - උචිත - පනත් කෙටුම්පත්. මේ පනත් කෙටුම්පත්වලින් සිද්ධ වන කාරණා දිහා බැලුවාම පෙනෙනවා, මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත තුළින් මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන්න

තිබෙන කාල සීමාව දීර්ඝ කරලා තිබෙන බව. ඒක ඉතා සුදුසු, විය යුතු දෙයක්. ඒ එක්කම සමහර නඩු තීන්දු බොහොම සංවේදී නඩු තීන්දු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර ඒවාට public documents කිව්වාට, දරුකමට දරුවෙකු කුලවද්දා ගැනීමේ කාරණය ගත්තාම මම හිතන්නේ අපට උප්පැන්න සහතිකය පවා වෙනස් කරන්න පුළුවන් නම් හොඳයි, අධිකරණ ඇමතිතුමනි. මොකද, උප්පැන්න සහතිකය හරියට පරීක්ෂා කළොත් ඒ දරුවා කුලවද්දා ගත් දරුවෙකුද කියලා හොයා ගන්න පුළුවන්. ඒකත් නුදුරේදී නීතිමය අයුරින් අපිට වෙනස් කරන්න පුළුවන් නම් වඩා සුදුසුයි කියා මම යෝජනා කරනවා. ඒ වාගේ සංවේදී කාරණාවලට මේ සංශෝධන අදාළ වෙනවා. ඒක සුදුසු දෙයක්. ඒ නිසා ඕනෑ ඕනෑ හැටියට එහෙම නඩු තීන්දු ගැනීමේ හැකියාවක් ලැබෙන්නේ නැහැ.

විශේෂයෙන්ම සමථ මණ්ඩල සඳහා පත් කරන පුද්ගලයන් සම්බන්ධයෙන් යම් යම් චෝදනා එනකොට යම් නිර්ණායකයක් තිබෙන්න ඕනෑ ඒ අය කවුද, කොහොමද අපි පත් කර ගන්නේ කියලා. ඒක ඉතා සුදුසුයි. ඒ වාගේම ඒකත් විය යුතු දෙයක්. ඒ එක්කම අපි කවුරුත් දන්නවා, අපේ රටේ අධිකරණ පද්ධතිය තුළ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි නඩු කල් යෑම කියන එක. සුළු සුළු කාරණා සම්බන්ධයෙන් පවා නඩු පවරා තිබෙන නිසා අධිකරණ තුළ නඩු ගොඩ ගැහිලා තිබෙනවා. හැබැයි, මේ සමථ මණ්ඩල පනත යටතේ සුළු හිමිකම් නව අධිකරණ පද්ධතියක් පිහිටුවීම තුළින් රුපියල් ලක්ෂ පහළොවකට අඩු කාරණා සම්බන්ධයෙන් විභාග කරලා, නඩු අහන්න පුළුවන්කම ලැබෙනවා. එතකොට අධිකරණ පද්ධතිය තුළ ගොඩ ගැහිලා තිබෙන නඩු ප්‍රමාණය අඩු වෙනවා. විශේෂයෙන්ම මේ වාගේ අණපනත් ගණනාවක් ගේන්න මේක හොඳ අවස්ථාවක් ලෙස මම දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, අපිට බැරි වුණා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ඔබතුමා කැමති වෙයි, මම මේ කාරණය කියනවාට.

අපිට mandate එක හම්බ වුණේ, "එක රටක් - එක නීතියක්" ගේන්න. අණපනත් ගණනාවක් අපි දිගින් දිගටම ගේනවා. හැබැයි, අපිට ලක්ෂ 69ක ජන වරම ලැබුණේ, "එක රටක් - එක නීතියක්" ගේන්න. නමුත් එදා අපිට ඒක කර ගන්න බැරිව ගියා. මම ඒක අවංකව තමයි කියන්නේ. විශේෂයෙන් මම පාපොච්චාරණයක් කරන්නේ ඒ සම්බන්ධයෙනුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් ලබා දීලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපිට එදා ඒ ජන වරම ලැබුණේ, "එක රටක් - එක නීතියක්" ගේන්න. මේ කියන කාරණා හොඳයි. නීතිය වෙනස් කරලා, අණපනත් ගෙනැල්ලා වැඩ කරන එක හොඳයි. හැබැයි, මම මතක් කරන්න ඕනෑ, "එක රටක් - එක නීතියක්" ගේන්න අපිට ජන වරමක් හම්බ වුණා. "එක රටක් - එක නීතියක්" කියන එක තමයි ලෝකයේ මම දැක්ක ඡන්ද ව්‍යාපාරයේ ආකර්ෂණීයම slogan එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් යුරෝපයේ රටවල සංචාරය කරලා තිබෙනවා, දීර්ඝ වශයෙන් ඉගෙන ගෙන තිබෙනවා. කොහේද තිබෙන්නේ ජාතීන් අතර, ආගම් අතර බෙදා වෙන් කරපු නීති? දියුණු වෙච්ච රටවල එකම නීතියක් තිබෙන්නේ. පුද්ගල නීති, දේපොළ නීති විධියට එක නීතියක් තිබෙන්නේ. හැබැයි, අවාසනාවකට ඒ slogan එක ගැන කථා කරන්න බැරි තත්ත්වයකට අද අපි පත් වෙලා තිබෙනවා. මුස්ලිම් නීතිය අනුව එම කාන්තාවට වෙලා තිබෙන හානිය බලන්න. මුස්ලිම් කාන්තාවට විවාහ වෙන්න අවුරුදු 18 වනතුරු ඉන්න තිබෙන අයිතිවාසිකම ආරක්ෂා කරන්න අපට බැරි වෙලා තිබෙනවා. අඩුම ගණනේ කාන්තාවකට තමන්ගේ වෛවාහක අයිතිවාසිකම් සම්බන්ධයෙන් අධිකරණ පද්ධතියේ පහළ උසාවියකට ගිහිල්ලා තීන්දුවක් ගන්න බැරි වෙලා තිබෙනවා. මේක ඉතාම ශෝචනීය තත්ත්වයක්. ඒ නිසා මම හිතනවා මේ වෛවාහක අයිතිවාසිකම් පිළිබඳ වැරදි සම්බන්ධයෙන් මේ තිබෙන තත්ත්වයන් වෙනස් වෙන්න ඕනෑ කියලා. අනෙකුත් කාන්තාවන් වාගේම මුස්ලිම් කාන්තාවත් කාන්තාවක්. ඒ අයගේත් අයිතිවාසිකම් ආරක්ෂා වෙන්න ඕනෑ.

ගරු අධිකරණ ඇමතිතුමාට මම මේ කාරණය කියනවා. අපිට මොන ප්‍රශ්න තිබුණත් අපේ ආණ්ඩුව තුළ මෙතෙක් සමහර තීන්දු තීරණ ගත්තා දේශපාලනය බලන්නේ නැතිව. අදේශපාලන තීන්දු තීරණ අපි අරගෙන තිබෙනවා. අද වෙනකොට අපි ගන්නා තීන්දු තීරණ එක්ක අපි ජනප්‍රිය නැහැ සමහර වෙලාවට. බදු වැඩි කරලා තිබෙනවා, විදුලි බිල වැඩි කරන්න වෙලා තිබෙනවා, සමහර අවස්ථාවලදී ජල බිල වැඩි කරන්න වෙලා තිබෙනවා. අපි එවැනි අදේශපාලනික තීන්දු තීරණ අරගෙන තිබෙනවා. හැබැයි, බොහෝ වෙලාවට කියන්නේ ආයෝජකයෝ නැහැ කියලායි. මම දකිනවා, ජපානයෙන් ආපු ආයෝජකයෝ මේ කථාව බලාගෙන ඉන්න බව. සමහර වෙලාවට ආයෝජකයෝ මේ සම්බන්ධව සුබවාදීව දකින්න ඕනෑ, සුබවාදීව හිතන්න ඕනෑ. අමාරු වුණත්, දුෂ්කර වුණත් අදේශපාලනික තීන්දු අරගෙන වුණත් කටයුතු කරන්න අපිට සිද්ධ වෙනවා. අපි ඊළඟ පාර පාර්ලිමේන්තු එනවා ද කියන එක නොවෙයි, මේ රට හරි තැනට ගෙනියන්න අවශ්‍ය නායකත්වය දෙන්න කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Prof.) G.L. Peiris. You have 10 minutes.

[අ.භා. 1.42]

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ අමාත්‍ය ගරු ආචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමා මේ ගරු සභාවට සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. පසුගිය මාස කිහිපය තුළ මේ ගරු සභාවට අණපනත් වැඩිම සංඛ්‍යාවක් ඉදිරිපත් කළේ එතුමායි. අපි එය අගයකොට සලකනවා. ශ්‍රී ලංකාවේ නීතිය හා නීති පද්ධතිය නවීකරණය

[ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා]

කිරීමට, දියුණු කිරීමට එතුමා විශේෂ උත්සාහයක් දරා තිබෙනවා. හැබැයි, පාර්ලිමේන්තුව මොන පනත් කෙටුම්පත් සම්මත කළත් අවසානයේදී ඒවා ක්‍රියාත්මක කිරීම, ප්‍රායෝගික තලයක සිට ඒවායේ ප්‍රයෝජනය අපේ ජනතාවට ලබා දීමේ කර්තව්‍යය භාර වෙන්නේ වෙන කිසිවෙකුට නොවෙයි, ශ්‍රී ලංකාවේ අධිකරණයටයි. එම නිසා අධිකරණයේ කාර්යභාරය මේ සම්බන්ධයෙන් තීරණාත්මක බව අපි සියලු දෙනා මතක තබා ගත යුතුයි.

උදාහරණයක් වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14වන ව්‍යවස්ථාව ගත්තොත්, එහි ඉතාම අංගසම්පූර්ණ විධියට මේ රටේ මානව හිමිකම් අන්තර්ගත කරලා තිබෙනවා. හැබැයි, ඇත්තවශයෙන්ම ඒක න්‍යායාත්මකව පමණක් තිබෙනවාද, වචන මාත්‍රයට පමණක් සීමා වෙනවාද, එහෙම නැත්නම් ප්‍රායෝගික තලයක ක්‍රියාත්මක වෙනවාද කියන එක තීරණය වන්නේ අධිකරණයේ කාර්යක්ෂමභාවය මතයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිව පෙනෙන කරුණක් තමයි අපේ සමාජය වැනි ව්‍යාකූල, යම් යම් ගැටුම් තිබෙන සමාජයක ස්ථාවරභාවය රැඳී පවතින්නේ යම් කිසි අඩිතාලමක් මතයි. ඒ අඩිතාලම තමයි අධිකරණයේ ස්වාධීනත්වය. ජාති, ආගම්, කුල, දේශපාලන පක්ෂ වශයෙන් බෙදීම -මේ සියල්ලක්ම- අබිබවා පොදුවේ ශ්‍රී ලංකා ජනතාවට අනිවාර්යයෙන් තිබෙන්න ඕනෑ අධිකරණය පිළිබඳ විශ්වාසය. එය කිසිසේත් පලුදු වෙන්නේ නැතිව තිබිය යුතුයි. හැමෝටම පුළුවන් වෙන්න ඕනෑ අපේ රටේ අධිකරණය පිළිබඳ සම්පූර්ණ විශ්වාසය තැබීමට. එහෙම නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පවත්වාගෙන යෑම ඉතාම අසීරු කරුණක් වෙනවා. එහිදී වැදගත්ම සාධකය තමයි විනිශ්චයකාරවරුන්ට පුළුවන් වෙන්න ඕනෑ හිතේ කිසිම භයක් නැතිව නිර්භීතව තමන්ගේ කාර්යභාරය ඉෂ්ට කිරීමට. පුද්ගලයා හා පුද්ගලයා අතර නීතිය පසිඳලීම හෝ රජය හා පුද්ගලයා අතර යුක්තිය ඉෂ්ට කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් ස්වාධීනව, හෘදය සාක්ෂියට අනුකූලව තමන්ගේ කාර්යභාරය ඉෂ්ට කිරීමේ හැකියාව මේ රටේ සියලු විනිශ්චයකාරවරුන්ට අනිවාර්යයෙන් තිබිය යුතුයි.

අපේ රටේ අධිකරණ ඉතිහාසයේ මෙතෙක් දුරට විනිශ්චයකාරවරයකු විසින් කළ බරපතළම චෝදනාව මූලතිව් මහෙස්ත්‍රාත් හා දිසා විනිසුරුවරයා කළ චෝදනාවයි. මම හිතන හැටියට ඒ විනිශ්චයකාරතුමා තමයි මේ රටේ අධිකරණ ඉතිහාසයේ ඉතාම උග්‍ර චෝදනාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ විනිශ්චයකාරතුමා ප්‍රකාශ කරනවා, එතුමාගේ අධිකරණ කාර්යභාරය නිසි පරිදි ඉෂ්ට කිරීමට එතුමාට නිදහසක් නැහැ, එම නිසා ඒ තනතුරෙන් ඉල්ලා අස්වීම පමණක් නොවෙයි, රට අතහැර යෑමට පවා එතුමාට සිදු වුණාය කියලා. ඒ චෝදනාව තමයි එතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒකේ සත්‍ය අසත්‍යතාව, කුසලතා පිළිබඳව කිසිම අදහසක් ප්‍රකාශ කිරීම උචිතයි කියලා මම හිතන්නේ නැහැ. හැබැයි, කරුණු කිහිපයක් මේ අවස්ථාවේදී සඳහන් කිරීම සුදුසුයි කියලා මම විශ්වාස කරනවා. පළමුවැනි කරුණ තමයි, මේ විධියේ බරපතළ චෝදනාවක් -වෙන කවුරුවත් නොවෙයි, මේ රටේ විනිශ්චයකාරවරයෙකු- කරන අවස්ථාවකදී ඉතාම ඉක්මනින් එය අපක්ෂපාතී, සම්පූර්ණ, අවංක විමර්ශනයකට භාජන විය යුතුයි. ඒක කල් දාන්න හොඳ නැහැ. ඉතාම ඉක්මනින් ඒ පිළිබඳව විමර්ශනය කරලා නිගමනයකට පැමිණීම අත්‍යවශ්‍යයි. තවද, ඒ විමර්ශනය කරන්න ඕනෑ ඒ පිළිබඳව නීත්‍යනුකූල බලය තිබෙන ආයතනය හෝ පර්ෂදයකයි. මේ අවස්ථාවේදී ඒ පර්ෂදය තමයි අධිකරණ සේවා කොමිෂන් සභාව. එහෙම නැත්නම් නොයෙක් නොයෙක් උපකල්පන, අදහස්, සැක සංකා පහළ වෙනවා. ඒවා වැළැක්වීමට හොඳම උපක්‍රමය තමයි කිසිම ප්‍රමාදයකින් තොරව සුදුසු ආයතනය විසින් විමර්ශනයක් කරලා ඒ නිගමනය මොකක්ද කියන එක ජනතාවට දැනුම් දීම.

මම විශ්වාස කරන අනෙක් කාරණය තමයි, විනිශ්චයකාරවරු ගැන නමින් සඳහන් කර හෝ ව්‍යංගයෙන් මේ ගරු සභාව තුළ විවේචනය කිරීම නුසුදුසුයි කියන එක. ඒක තමයි මගේ මතය. මොකද, ඒ විනිශ්චයකාරවරුන්ට ඒ චෝදනාවලට පිළිතුරු දීමට හැකියාවක් නැහැ. අපි පාර්ලිමේන්තුව තුළ විනිශ්චයකාරවරු විවේචනය කරනවා නම් ඒකේ අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ අධිකරණය පිළිබඳව ජනතාව තුළ තිබෙන විශ්වාසය පලුදු වීමයි. එම නිසා ඒකෙන් වැළකී සිටිය යුතුයි කියන එක තමයි මගේ දැඩි අදහස.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අධිකරණය සම්බන්ධයෙන් අපේ ප්‍රෞඪත්වයක් තිබෙනවා; අපි චිරාත් කාලයක් ආරක්ෂා කරගෙන ආපු අපේ ලොකු අභිමානයක් තිබෙනවා. ඒ ආයතනයේ ඒ අභිමානය, ගෞරවය රැක ගැනීම අපි සියලු දෙනාටම බාර වන යුතුකමක් වෙනවා. අපි ආණ්ඩු පක්ෂයේ හිටියත්, විපක්ෂයේ හිටියත් කිසිම විභේදයකින් තොරව අපි සියලු දෙනාම ඇප කැප වෙන්න ඕනෑ, අධිකරණයේ ස්වාධීනත්වය හා විනිශ්චයකාරවරුන්ට තමන්ගේ කාර්යභාරය ඉෂ්ට කිරීමට පුළුවන් වන විධියේ වටපිටාවක්, වාතාවරණයක් ඇතිකොට එය සුරක්ෂිත කිරීමට. ඒක අපි සියලු දෙනාගේම යුතුකමක් හා වගකීමක් වෙනවා. ඒ වගකීම ඉෂ්ට කිරීමට අපි සියලු දෙනාම උත්සුක විය යුතුයි කියන අදහස ප්‍රකාශ කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී මූලාසනය සඳහා කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු තේනුක විදානගමගේ මහතා (නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தேனுக விதானகமகே - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Thenuka Vidanagamage - State Minister of Urban Development and Housing)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.பீ. ஹேரத் - கால்நடை வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock Development)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. HARSHANA RAJAKARUNA left the Chair, and THE HON. U.K. SUMITH UDUKUMBURA took the Chair.*

[අ.භා. 1.50]

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දින ඉතා වැදගත් පනත් හතරකට අදාළව සංශෝධන, නියෝග සහ නියමයක් පිළිබඳ විවාදය පැවැත්වෙනවා. මම මේ වෙලාවේ ඒවා අතරින් වැඩි අවධානයක් යොමු කරනවා සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග සම්බන්ධයෙන්. පසුගිය කාලය පුරාවට මම මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී අදාළ කමිටුවලට මගේ අදහස් ඉදිරිපත් කළා.

සමථකරණය අද පළාත් පාලන ආයතන මට්ටමින් අත්‍යවශ්‍ය දෙයක් හැටියට මම දකිනවා. අද වන විට සමස්ත පළාත් පාලන ආයතන තුළ විශාල ගැටලු රාශියක් ඇති වෙලා තිබෙනවා. සුළු කාරණා පළාත් පාලන ආයතන තුළදීම සමථයකට ඇවිල්ලා විසඳා ගන්න පුළුවන් ක්‍රමයක් හඳුන්වා දෙන්න පුළුවන් නම්, අනවශ්‍ය ලෙස නඩු විශාල සංඛ්‍යාවක් මහෙස්ත්‍රාත් අධිකරණවලට යොමු වීම වළක්වා ගන්න අපට පුළුවන්. ඒ වාගේම මහෙස්ත්‍රාත් අධිකරණවල කටයුතු කාර්යක්ෂම කර ගන්නත් පුළුවන්. එහෙම නැත්නම් කාලය, ශ්‍රමය, මුදල් විශාල වශයෙන් වැය වෙනවා. ඒ වාගේම ජනතාවට විශාල පීඩනයකුත් ඇති වෙනවා. සුළු ඉඩම් ආරාවුල්, සුළු ව්‍යාපාර, ගොඩනැඟිලි, ව්‍යාපාර බලපත්‍ර, ඉඩකඩම් මායිම්, අනවසර ඉදිකිරීම්, මංමාවත් ආදි විවිධ කාරණා සම්බන්ධයෙන් ගැටලු රාශියක් මේ වන විට පළාත් පාලන ආයතනවල ගොඩගැහිලා තිබෙනවා. අද මම ගරු අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවටත්, ආංශික අධීක්ෂණ කාරක සභාවටත් මගේ යෝජනාවක් ඉදිරිපත් කළා, පළාත් පාලන ආයතන සඳහාත් අතරමැදි සමථකරණයක් හඳුන්වා දීම සම්බන්ධයෙන්. මොකද, ඒ සමථකරණය තුළින් පරිපාලනමය වශයෙන් සහ නීතිමය වශයෙන් අපට බලපාන, අපට මුහුණ පාන්න සිදු වන ගැටලු විශාල ප්‍රමාණයක් විසඳා ගන්න පුළුවන්. ඒ වාගේම ඒ තුළින් අපට ඉතා කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්නත් පුළුවන්. මොකද, අද වනකොට ජාත්‍යන්තර දර්ශකවල, විශේෂයෙන්ම ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අප ඉන්නේ 99 වන ස්ථානයේ. මා ඉහතින් යෝජනා කළා වාගේ සමථකරණයක් හඳුන්වා දුන්නොත්, අපට පියවර කිහිපයක් ඉදිරියට යන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. හිටපු අධිකරණ අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමාටත් මම මේ යෝජනාව ඉදිරිපත් කළා. වර්තමාන ඇමතිතුමාටත් මම මේ සම්බන්ධයෙන් වන මගේ යෝජනාව අද දිනයේදී ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මමත් හිටපු පළාත් පාලන ආයතන ප්‍රධානියෙක්. අපිත් විශාල වශයෙන් මේ පීඩනය අත්වින්දා. පළාත් පාලන ආයතන සඳහාත් සමථකරණය හඳුන්වා දීම පිළිබඳ යෝජනාවට පක්ෂ, විපක්ෂ හැම දෙනා ඉදිරියේදී ඒකමතිකව එකඟ වෙයි කියලා මම විශ්වාස කරනවා.

අද අපේ රටට එන ආයෝජකයන් රස්තියාදු වන, ආයෝජකයන්ට හිතකර නොවන පරිසරයක් අපේ රටේ නිර්මාණය වෙලා තිබෙනවා. මෑතකදී ඒ කාරණාවට අදාළව ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් වන කමිටුවට ලැබුණු පැමිණිලි දෙකක් මම මේ වෙලාවේ මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා. පළමුවැනි කාරණාව මේකයි. හොංකොං රාජ්‍යයේ බේලි ඉන්වෙස්ට්මන්ට් කියන සමාගම ලංකාවට ආවා. ඒ සමාගම ඩොලර් මිලියන 300ක ආයෝජනයක් ලංකාවට ගෙන ආවා. මේ වන විට ඒ ආයෝජනවලින් විශාල ප්‍රමාණයක් යොදවා ව්‍යාපාර ආරම්භ කර තිබෙනවා. පසුගිය සතියේදී ඒ අය වැල්ලවත්ත මයුර කෝවිල අසල, නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් මිල දී ගත්තා, රුපියල් බිලියන 1.2කට. ඒ ඉඩම 2018දී වෝකර්ස් සමාගමට දීලා වෝකර්ස් සමාගම එය සම්පත් බැංකුවට mortgage කරලා රුපියල් මිලියන 900ක් අරගෙන තිබුණා. අන්න ඒ කාරණාව සමථයකට - settlement එකකට - පත් කරලා ඒ සමාගම ඒ සියලු මුදල් සම්පත් බැංකුවට ගෙවලා නාගරික සංවර්ධන අධිකාරියේ සහයෝගය ද ඇතුව ඒ ඉඩම -අවුරුදු 99කට- මිල දී ගත්තා. ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කරන දවසේම, ව්‍යාපාර ආරම්භ කරන්න ඉඩමට ගියාට පස්සේ මයුර කෝවිලේ භාරකාරයෝ ගිහිල්ලා "අපිත් මේ ඉඩම භුක්ති වින්දා" කියලා ඒ ආයතනයට විශාල බලපෑමක් කළා. අවසානයේදී පොලිස් නිලධාරින්ගේත් නොසැලකිලිමත්කම, නීතිය නොදැන සිටීම තුළ ඒ කාරණාව අධිකරණයට ඉදිරිපත් කළා. මේ රටට ඩොලර් මිලියන 300ක් අරගෙන ආපු ඒ ව්‍යාපාරිකයා අද වන විට උසාවි ගානේ බඩ ගානවා; නීතිඥ ගාස්තු විධියට නීතිඥයන්ට අනවශ්‍ය ලෙස විශාල මුදලක් ගෙවනවා. මෙහිදී නාගරික සංවර්ධන අධිකාරිය සම්පත් බැංකුවට තිබෙන වගකීම ඉෂ්ට කරලාත් නැහැ. කොහේ හරි ඉන්න මිනිහෙකුට ඇවිල්ලා "මමත් මේක භුක්ති වින්දා" කියන්න පුළුවන් නම්, අද මේ රටේ ආයෝජන කරන්න පුළුවන් තත්ත්වයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම 2018දී මේ රටට ලැබුණා -නානුඔය සිට නුවරඑළිය දක්වා- කේබල් කාර් ව්‍යාපෘතියක්. ජනාධිපතිවරුන් දෙදෙනෙකු යටතේ, අගමැතිවරුන් දෙදෙනෙකු යටතේ අවස්ථා දෙකකදී ඒ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. 2018 වසරේදී කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. නැවත වතාවක් 2021දීත් මේ කාරණයටම අදාළව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා.

නමුත් තවමත් කිකිළියාමාන කඳු මුදුනෙන් ඒ සමාගමට අවශ්‍ය පර්චස් 150ක් ගන්න බැරි වෙලා තිබෙනවා. කිකිළියාමාන කන්ද සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය මම මීට කලිනුත් මේ ගරු සභාවේ අවධානයට යොමු කළා. තර්කානුකූල නොවන, විද්‍යානුකූල නොවන කාරණා ඉදිරිපත් කරමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එක්තරා නිලධාරියෙකුගේ අභිමතය මත මේ ආයතනයට ඒ අවශ්‍ය කොටස දෙන්නේ නැහැ. ඔවුන් කියනවා, එය අධිසංවේදී කලාපයක් කියලා. හැබැයි අධිසංවේදීකම බලාගන්න පුළුවන්, කිකිළියාමාන කන්දට ගියාම. එහි Telecom towers හදලා, වැසිකිළි හදලා විශාල පරිසර දූෂණයක් සිදු වෙලා තිබෙනවා. හැබැයි ඒ සමාගම ඉදිරිපත් කර තිබෙන යෝජනාවලිය පාර්ලිමේන්තුවට ගෙන්වාගෙන මම එය හොඳින් පරීක්ෂා කර බැලුවා. ඉතා හොඳ විනිවිදභාවයකින් යුතුව, ඉතා හොඳ සැලසුමක් ඇතුව, පරිසර පද්ධතිය ඉතා හොඳින් ආරක්ෂා වන විධියට ඒ යෝජනාවලිය ඉදිරිපත් කර තිබෙනවා.

ඊළඟට පසුගිය කාලයේ අපි දැක්කා, පඩු කරඳ ගහක් බදාගෙන අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නැවැත් වූ ආකාරය. මේ රටේ සංවර්ධන වැඩ කටයුතුවලට එහෙම බාධා කරන්න එක නිලධාරියෙකුට, දෙදෙනෙකුට පුළුවන් නම් ඒක අපේ රටේ අවාසනාව. මම මෙහිදී විශේෂයෙන් කියන්න ඕනෑ, ආයතනවලින් සියයට 90ක අනුමැතිය ලැබිලා තිබෙනවා නම්, ඒ ව්‍යාපෘතිය කරගෙන යන්න පුළුවන් සම්පූර්ණ අනුමැතිය අනිවාර්යයෙන් ලැබුණා සේ සලකන්න ඕනෑ බව. මොකද, අපි එහෙම කියන්නේ? අද වනකොට IMF එකෙන් ඩොලර් මිලියන 400ක්, 500ක් ගන්න කථා කරමින් ඉන්නවා. හැබැයි, අර කියපු බේලි ඉන්වෙස්මන්ට් සමාගම ඩොලර් මිලියන 300ක් ගෙනැල්ලා තිබෙනවා. කේබල් කාර් ව්‍යාපෘතිය ඩොලර් මිලියන 55ක් ගෙනැල්ලා තිබෙනවා. එතැනම ඩොලර් මිලියන 355ක්

[ගරු නීතිඥ මධුර විතානගේ මහතා]

ගෙනැල්ලා තිබෙනවා. මේ, ආයෝජකයෝ දෙදෙනෙක් විතරයි. ආයෝජකයන් මේ රටට ආයෝජන ගේන්න කැමැතියි. මේ රටේ ආයෝජනය කරන්න ලෝකයේම මිනිස්සු සූදානම්. නමුත් අද දේශපාලන අධිකාරියේ ඉතා අකාර්යක්ෂම, දුර්වල, දූෂිත යම් යම් පුද්ගලයන් සහ අකාර්යක්ෂම, දූෂිත නිලධාරි පෙළැන්තියක -මම මෙහිදී කියන්නේ නැහැ, සියලු නිලධාරින් දූෂිතයි කියලා- යම් යම් නිලධාරින්ගේ අභිමතයන් නිසා අද අපේ රට ඉතා අවාසනාවන්ත තැනකට ඇවිත් තිබෙනවා. IMF එකෙන් ඩොලර් බිලියන 20ක්, 30ක් හම්බ වුණත්, මේ රට ගොඩ දාන්න බැහැ, මෙන්න මේ කාලකණ්ණි, අමන මානසිකත්වයෙන් මිනිසුන් අයින් කරන්න පුළුවන් වනතාක්. එහෙම නැතුව අපට මේක කරන්න බැහැ.

ඒ වාගේම අපි දැක්කා, පසුගිය කාලයේ තවත් ලොකු නාඩගම් කිහිපයක් නටපු හැටි. ගානියා කියලා නෝනා කෙනෙක් ලොකු නාඩගමක් නැටුවා. නටලා ඇය පැන්නා embassy එකක් ඇතුළට. ඊළඟට, නිශාන්ත සිල්වා කියලා එක්කෙනෙක් තවත් සෙල්ලමක් නැටුවා. CID එකෙන් ඔක්කෝම තොරතුරුත් අරගෙන තිබියදී ඔහු රට පැන්නා. ඊළඟට අලුත්ම නාඩගම තමයි මුලතිව් මහෙස්ත්‍රාත්වරයාගේ සිද්ධිය. හැබැයි තමන්ට එහෙම පීඩනයක් තිබෙනවා නම්, බලපෑමක් තිබෙනවා නම්, තර්ජනයක් තිබෙනවා නම් ඔහු මහෙස්ත්‍රාත්වරයෙකු නිසා අනිවාර්යයෙන් ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරන්න ඔහුට හැකියාව තිබුණා. ඔහු පැමිණිලි කරනවා වෙනුවට මොකක්ද කළේ? ඒක තමයි අලුත්ම සෙල්ලම. ඒක තමයි, තමන් පිළිබඳ යම්කිසි අසත්‍ය කාරණාවක් හදලා පිටරටක ජීවත් වෙන්න පුළුවන් පරිසරය හදාගන්න එක; එහෙම නැත්නම් පිටරටක පුරවැසිභාවය ලබා ගන්න පාර කපාගන්න එක. මා හිතන්නේ මේ ගැන පුළුල් පරීක්ෂණයක් කරන්න ඕනෑ කියලායි. මොකද, ඒ මහෙස්ත්‍රාත්වරයා අනිවාර්යයෙන් ඉතා සැලසුම්සහගතවයි මේක කළේ. මහෙස්ත්‍රාත්වරුන්ට මීට වඩා බලපෑම් කළා, පසුගිය 2022 වර්ෂයේදී. මොකද, ගෙවල් ගිනි තියපු, රාජ්‍ය දේපළ විනාශ කරපු සැකකරුවන් උසාවියට අල්ලාගෙන ගියාට පස්සේ මුළු උසාවියම නැඟිටිනවා. අන්තිමේදී තමන්ගේ වාහනයේ "මහෙස්ත්‍රාත්" කියන බෝඩ් කෑල්ල ගලවලා තමයි මහෙස්ත්‍රාත්වරුන්ට යන්න එන්න සිදු වුණේ. ඒ අයට ඒ වාගේ විශාල මානසික පීඩනයක් දුන්නා, නීතිඥ සංගමයේ සමහර පුද්ගලයෝ. සමස්ත නීතිඥ සංගමය ගැන නොවෙයි මම මේ කියන්නේ. සමහර උසාවිවල එහෙම වුණා. රඹුක්කන, ගංගොඩවිල, අත්තනගල්ල ආදි ස්ථානවල එවැනි සිද්ධීන් මම ඇස් දෙකට දැක්කා. සැකකරුවන්ට, ඒ අපරාධකරුවන්ට මල්මාලා දැම්මා. අන්න ඒවා තමයි මහෙස්ත්‍රාත්වරුන්ට කරපු ඍජු නොවන, වක්‍රාකාර වූ පැමිණිලි. මේ කාරණා විතරක් නොවෙයි, තවත් කාරණා කීපයක් මම මේ වෙලාවේ ඉතා වගකීමෙන් මේ ගරු සභාවට කියන්න කැමැතියි. මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
මට තවත් විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක වැදගත්ම කාරණාවක්.

පසුගිය කාලයේ අපි දැක්කා - පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනා සම්බන්ධයෙන්ම මේ කාරණය හොයන්න ඕනෑ - මන්ත්‍රීවරු තමන්ගේ කාර්ය මණ්ඩලය කියලා බටහිර රටවලට, යුරෝපයේ රටවලට පුද්ගලයන් එක්කරගෙන යන ආකාරය. එහෙම එක්කරගෙන ගිහින් ඔවුන් ඒ රටවල බස්වා එනවා. උතුරු-නැඟෙනහිර සමහර මන්ත්‍රීවරුන් පසුගිය අවුරුදු 10ටම තමන්ගේ කාර්ය මණ්ඩල කියලා පුද්ගලයන් එහෙම එක්කරගෙන ගිහින් ඒ රටවල බස්වා ඇවිත් තිබෙනවා; එවැනි ජාවාරමක් තිබෙනවා. ඒ ජාවාරම කරමින් ඔවුන් ඒ රටවලට ගිහිල්ලා ඊට පස්සේ කියන්නේ මොකක්ද? මේ රටේ ජීවත් වෙන්න විධියක් නැහැ, මේ රටේ විශාල ප්‍රශ්න තිබෙනවා කියලා බොරු හදලා කියමින් ලක්ෂ ගණන්වලටයි ඒ වැඩ පිළිවෙළ කරගෙන යන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරු 225දෙනාම check කරන්න. පසුගිය අවුරුදු 10ක, 15ක කාලය තුළ තමන්ගේ කාර්ය මණ්ඩලය කියලා පුද්ගලයින්ව බටහිර රටවලට, යුරෝපයේ රටවලට ඒ වාගේම කැනඩාවට එක්කගෙන ගිහිල්ලා බස්සලා ආපු අය ඉන්නවා. ඒ වාගේ තුච්ඡ විධියේ වැඩ කරනවා. මේක ඉතා සැලසුම් සහගතව කරන වැඩක්.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඒ අයගේ නම් ලැයිස්තුව කියන්න.

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
ඒක තමයි මම කිව්වේ, 225දෙනා ගැනම බලන්න කියලා. එතකොට එහෙම එක්කගෙන ගිය අයගේ නම් ලැයිස්තුව automatically ලැබෙයි. මේකෙදි උතුරු-නැඟෙනහිර මන්ත්‍රීවරුන්ට විතරක් ඇඟිල්ල දිගු කරලා වැඩක් නැහැ. මම වගකීමෙන් කියනවා, ඒ විධියට පුද්ගලයින්ව එක්කගෙන ගිහිල්ලා ඒ රටවල නවත්වලා එන ජාවාරමක් තිබෙනවා කියලා. ඒ ජාවාරම්කරුවන්ට ගොඩක් රිදෙනවා, මුලතිව් මහෙස්ත්‍රාත්වරයා කරපු වැඩෙන්. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.01]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්නේ නැතිව මේ රට ඉදිරියට යයි කියලා කාටවත් බලාපොරොත්තුවක් තියා ගන්න බැහැ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ දී අධිකරණය ප්‍රධාන ක්ෂේත්‍රයක් හැටියට අපි කවුරුත් පිළිගන්න ඕනෑ. අද ඇතිවෙලා තිබෙන තත්ත්වය ගැන අපි කවුරුත් දන්නවා. අද අධිකරණය කෙරෙහි තිබෙන විශ්වාසය මුළුමනින්ම නැතිවෙලා ගිහින් තිබෙනවා. අධිකරණ ක්ෂේත්‍රය කෙරෙහි තිබෙන ඒ විශ්වාසය නැතිවෙන්න ප්‍රධානතම හේතුව වෙලා තිබෙන්නේ වෙන කිසිම කාරණාවක් නොවෙයි. අද විධායකයත්, ව්‍යවස්ථාදායකයත් පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවාවෙලා අධිකරණයට යම් යම් බලපෑම් සිදු කිරීම තමයි ඒකට හේතුව. අපි කවුරුත් දන්නවා, මේ ආණ්ඩුව විවිධ අණ පනත් ගෙනැල්ලා, ආණ්ඩුවට විරුද්ධ වන ජනමතය මර්දනය කරන්න උත්සාහ කරනවා කියලා. අපි අද දිනයේත් දැක්කා පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනැල්ලා තිබෙනවා, online වැඩ කටයුතු පිළිබඳව, social media - සමාජ මාධ්‍ය -

පිළිබඳව යම් නියාමනයක් සිදු කරන්න. ජනමතය මර්දනය කරන්න කටයුතු කරනවා වාගේම, මේ ආණ්ඩුවට ඕනෑ දේවල් ටික කර ගන්න යම් යම් ආකාරයේ බලපෑම් විධායකයට සිදු වෙනවා. අපි ඒක පසුගිය කාල සීමාවේම දැක්කා. මේ ආසන්නතම සිදුවීම තමයි මුලතිව් සිද්ධිය. ඉතා බැරෑරුම් තත්ත්වයක් මේ රටේ උදාවෙලා තිබෙනවා. තමන්ට තර්ජනයක් එල්ල වෙනවා, රාජකාරි කරන්න බැහැ, ඒ නිසා ඉල්ලා අස්වෙනවා කියලා මේ රටේ විනිශ්චයකාරවරයෙක් ලිඛිතව ලබා දෙනවා නම්, ඒක ලොකු ගැටලුවක්. ඉල්ලා අස්වෙනවා විතරක් නොවෙයි, ඊට පස්සේ එතුමා රට අත හැරලාත් යනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කියනවා නම් ඒක නාඩගමක් කියලා, එහෙම නම් ඒ පිළිබඳව ස්වාධීන පරීක්ෂණයක් කරන්න. ස්වාධීන පරීක්ෂණයක් කරලා ඒ පිළිබඳව යම් කටයුත්තක් ආණ්ඩුව විසින් හැකි ඉක්මනින් සිදු කරන්න ඕනෑ. හැබැයි, ඒක එක කාරණාවක් විතරයි. අපි මීට කලිනුත් දැකලා තිබෙනවා, තමන්ට ඕනෑ දේ කරගන්න ජනාධිපතිවරයා -විධායකය- විසිනුත් බලපෑම් එල්ල කරන ආකාරය. විධායකය පසුගිය කාලයේදී කිව්වා, අධිකරණය කියන දේවල් නොවෙයි පාර්ලිමේන්තුව කියන දේවල් විතරයි පිළිගන්නේ කියලා. එතකොට කථානායකවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩවීම පිළිබඳව තීන්දුවක් ලබා දීලා කියනවා, අවසාන තීන්දුව වන්නේ පාර්ලිමේන්තුවේ තීන්දු පමණයි කියලා. මේ කාරණා නිසා අද අධිකරණය පිළිබඳව අපට ලොකු ගැටලුවක් මතුවෙලා තිබෙනවා.

විනිශ්චයකාරවරුන්ට ස්වාධීනව කටයුතු කරන්න වාතාවරණයක් ඇති කළ යුතුයි. ඒක දේශපාලන අධිකාරිය, විධායකය -රටේ ජනාධිපතිවරයා- ඇතුළු මේ සියලු දෙනාගේම වගකීමක්. ඒක මේ ජාත්‍යන්තරය සතුටු කරන්න යනවාය කියන එක නොවෙයි. අද ජාත්‍යන්තරයෙනුත් යම් බලපෑමක් ඇතිවෙලා තිබෙන තත්ත්වයක් නේ තිබෙන්නේ. ජාත්‍යන්තරය ගැන අපි පස්සේ කථා කරමු. හැබැයි, මේ රටේ මිලියන 22ක් වන ජනතාව ප්‍රජාතන්ත්‍රවාදය තුළ නේ ජීවත්වෙන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය තුළ ජීවත් වෙන්න නම් අධිකරණයේ ස්වාධීනත්වය අත්‍යවශ්‍යයි.

මේ වෙනකොට ජාත්‍යන්තර වශයෙන් විශේෂයෙන්ම සාකච්ඡා වෙන කාරණාවක් තමයි අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව තිබෙන ගැටලුව; අපේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය නොමැති වීම පිළිබඳ ගැටලුව. අද ජාත්‍යන්තර සංවිධාන මේවා සම්බන්ධයෙන් ප්‍රකාශ නිකුත් කර තිබෙනවා. එතකොට ජාත්‍යන්තර වශයෙන් එවැනි ප්‍රකාශ නිකුත් කර තිබෙන මේ වෙලාවේ විනිශ්චයකාරවරයෙක් තමන්ට තිබෙන බලපෑම් නිසා ඉල්ලා අස්වෙලා රට අත්හැර දමා යන තත්ත්වයකට පත් වුණාම, ජාත්‍යන්තර වශයෙන් අපි තවත් අර්බුදයකට පත් වෙනවා.

අපි කවුරුත් දන්නවා, ජනාධිපතිවරයා ඇතුළු මේ ආණ්ඩුවේ අය නොයෙක් රටවලට ගිහිල්ලා "අපිට ආධාර කරන්න, උදවු කරන්න" කියලා ඉල්ලීම් කරන බව. එතකොට මේ ජනාධිපතිතුමාගේ මුහුණ බලා හෝ එහෙම නැත්නම් එතුමාත් එක්ක ගිය කණ්ඩායමේ සිටින අයගේ මුහුණු බලා නොවෙයි නේ, අපේ රටට උදවු කරන්නේ. අපේ රටට උදවු කරන්නේ අපි මේ රට ඇතුළත ගෙන යන ප්‍රතිපත්ති අනුවයි. ඒ පිළිබඳව අධ්‍යයනයක යෙදී තමයි මේ රටට උදවු කරන්න තීන්දු-තීරණ ගන්නේ; ආධාර, ණය කියන මේ සියල්ලම ලබා දෙන්නේ ඒ අනුවයි. එතකොට මේ වෙලාවේ ඒ ආධාර, ණය අපට ලබා ගන්න නම් ජාත්‍යන්තර වශයෙන් පිළිගන්න අධිකරණ ක්‍රමවේදයක් අපිට තිබෙන්න ඕනෑ. ඒ වාගේම අපි අධිකරණ කටයුතුවලට සෘජුව හෝ වක්‍රව කිසිම බලපෑමක් සිදු කරන්නේ නැතුව කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා මම මේ වෙලාවේ දී විශේෂයෙන්ම අධිකරණය පිළිබඳව ඒ කාරණා සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරද්දී සඳහන් කළ යුතු අනෙක් කාරණාව තමයි මේ රටේ ඡන්ද පවත්වන්න ඕනෑය කියන එක. අද මේ රටේ ඡන්ද පවත්වන එක කල් දමා තිබෙනවා. මේ ආණ්ඩු පක්ෂයේ සමහර මැති-ඇමතිවරු කියනවා, "මේ රටට බලපාන ප්‍රධානම ඡන්ද වන පාර්ලිමේන්තු මැතිවරණය, ජනාධිපතිවරණය අපි කල් දමන්නේ නැහැ" කියලා. ඒක පුදුම කථාවක් නේ. පාර්ලිමේන්තු මැතිවරණය, ජනාධිපතිවරණය කල් දමන්නේ නැති වුණාට, පළාත් පාලන ඡන්දය කල් දමනවා. එතකොට පළාත් පාලන ඡන්දය කල් දමන එක කාට තිබෙන අයිතියක්ද? රටේ ව්‍යවස්ථාවට අනුව තමයි ඡන්ද පවත්වන්න ඕනෑ. පළාත් පාලන ඡන්දය කියන්නේ පුංචි ඡන්දයක් කියලා කිව්වාට, ඒක ඉතාම වැදගත් ඡන්දයක්. අපි ඒවාට "පුංචි ඡන්ද" කියන්නේ පළාත් පාලන ආයතන නිසායි. එහෙම නැතුව ඒ මැතිවරණය වටිනාකමින් පුංචි වෙලා නැහැ. ඒක නිසා පළාත් පාලන ඡන්දය පැවැත්විය යුතුයි.

පළාත් පාලන ඡන්දය නොපැවැත්වීම සම්බන්ධයෙන් අපි අධිකරණයට ගියා. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මහ ලේකම්තුමා සහ මම පැමිණිලිකරුවන් හැටියට මේ අවුරුද්දේ මුල පෙබරවාරි-මාර්තු වාගේ මාසවල අධිකරණයට ගියා. ඊට පසුව රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා ගොනු කළ නඩුවට අනුව අතුරු නියෝගයක් නිකුත් කළා, ඒ මැතිවරණය පවත්වන්න කියලා. එහෙම මැතිවරණය පවත්වන්න කියලා කිව්වාට, මේ ආණ්ඩුව මැතිවරණය පැවැත්වූවේ නැහැ. හැබැයි, ඊට පසුව අපි දැකපු දේ සම්බන්ධව කියන්නත් කනගාටුයි. අධිකරණ ක්ෂේත්‍රයේ විනිශ්චයකාරතුමන්ලාටත් මේ පිළිබඳව කනගාටුවක් තිබෙන බව අපි දන්නවා. මොකද, මේ මැතිවරණය පවත්වන්න කියා ගොනු කළ නඩුව මාස තුන, මාස හය වශයෙන් කල් දමනවා. ප්‍රජාතන්ත්‍ර විරෝධී ආකාරයට මැතිවරණය කල් දමනවා කියලා මැතිවරණ කොමිසම නඩු දමා තිබෙනවා, ප්‍රධාන විපක්ෂය ඇතුළු විශාල කණ්ඩායමක් නඩු දමා තිබෙනවා. හැබැයි ඉතාම කනගාටුයි කියන්න, අධිකරණය පැත්තෙන් ඒකට අවශ්‍ය දේ ඉටු වන බවක් අපට දකින්න නැහැ. අධිකරණය එම නඩු සම්බන්ධයෙන් තීන්දුව ලබා දීම මාස තුනකට කල් දමනවා; ඊට පසුව නැවත වතාවක් තවත් මාස තුනකට කල් දමනවා. මේ රටේ ඉතාම වැදගත්, ප්‍රජාතන්ත්‍රවාදයට බලපාන කාරණා සම්බන්ධව අධිකරණය මීට වඩා සංවේදී වෙන්න ඕනෑ. අධිකරණය මේ වෙලාවේ දී ආණ්ඩුවට ඕනෑ දේ කරනවාද කියන ඉතාම ගැටලුකාරී තත්ත්වයකට අපි මුහුණ පා තිබෙන බව ඉතා පැහැදිලිවම කියන්න ඕනෑ. මේ ආණ්ඩුවට ඕනෑ දෙයද දැන් අධිකරණය කරන්නේ? එතකොට, එතැනදීත් අධිකරණයට යම් බලපෑමක් සිදු වෙලා තිබෙනවාද කියලා අපිට හිතෙනවා. ඉතින්, යම් බලපෑමක් නිසා අධිකරණය මේ මැතිවරණය පිළිබඳව අවසාන තීන්දුවක් ගන්නේ නැතුව මාස තුනකට, මාස හයකට ඒ තීන්දුව දෙන එක කල් දමනවා නම්; ඒ නඩු අහන එක කල් දමනවා නම්, ඒ පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මේ රටේ පුරවැසියන් හැටියට, මේ රටේ වගකියන මහජන නියෝජිතයන් හැටියට අපි ඉතාම ඕනෑකමින් අධිකරණයෙන් ඉල්ලීමක් කරනවා. අපි විපක්ෂයක් හැටියටත්, ඒ වාගේම මුළු රටත් එකතු වෙලා මැතිවරණයක් ඉල්ලා නඩුවක් දැම්මාම, ඕනෑම ආකාරයකින් ඒ නඩුව සම්බන්ධව තීන්දුව දෙන්න පුළුවන්.

නමුත්, ඒ නඩුවේ තීන්දුව දෙනකොට තව අවුරුද්දක්, දෙකක් ගිහිල්ලා. අධිකරණයකින් එහෙම ප්‍රමාද වෙලා තීන්දුවක් දීලා වැඩක් නැහැ. අපි දන්නවා, ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස අග්‍රාමාත්‍යවරයෙකු පත් කරලා දින 52 ආණ්ඩුව හදපු වෙලාවේ අධිකරණය ඉතාම ඕනෑකමින්, හැකි ඉක්මනින් නඩුව අහලා ඒ පිළිබඳව තීන්දුවක් දුන් බව. ඒ වාගේ තවත් වැදගත් කාරණාවක් තමයි, පළාත් පාලන මැතිවරණය. පළාත් පාලන මැතිවරණය පිළිබඳ තීන්දුව හැකි ඉක්මනින් ලබා දිය යුතුයි. මේ ආණ්ඩුවට

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

අවශ්‍ය ආකාරයෙන් එය කල් දැමීම පිළිබඳව අපේ අප්‍රසාදය පළ කරන්න ඕනෑ. එම නිසා කරුණාකරලා අධිකරණයේ ස්වාධීනත්වය රැකෙන ආකාරයට කටයුතු කිරීම සම්බන්ධයෙන් විධායකයටත්, ඒ වාගේම මේ ආණ්ඩුවේ ඉන්න සියලු දෙනාටත්, මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාටත් විශාල වගකීමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයෙන් අපට චෝදනා කරලා තිබෙනවා දැක්කා, ජනාධිපතිවරයා සමඟ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 78වන සැසිවාරයට ගිය එකට ලොකු වියදමක් දරන්න වුණේ නැහැ කියලා. නමුත්, විපක්ෂ නායකතුමා ඒ පිළිබඳව අප්‍රසාදය පළ කළා. මම මේ වේලාවේදී මේ කාරණය විශේෂයෙන් කියන්න ඕනෑ. අපට කිසිම ගැටලුවක් නැහැ, ඒ සඳහා කී දෙනෙක් ගියාද කියන එක ගැන. මේ වෙලාව අපේ රට ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා තිබෙන වෙලාවක්. රට බංකොලොත් වෙලා තිබෙන වෙලාවේ අපේ ආර්ථිකය ඉහළ නංවන්න අපි පුළුවන් තරම් උදව් කරන්න ඕනෑ. මේ රටේ ලොකුම ගැටලුව වුණේ ඩොලර් නැහැ කියන එක නේ. එහෙම වෙලාවක තිබෙන ඩොලර් ටික වියදම් කරනවාද, එහෙම නැත්නම් පිරිමහ ගන්නවාද කියන එකයි අපි හිතන්න ඕනෑ. අපි කියන්නේ නැහැ, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට රටේ ජනාධිපතිවරයා සහභාගි නොවිය යුතුයි කියලා. රටේ නායකයා හැටියට එතුමා ඒවාට සහභාගි වෙන්න ඕනෑ. නමුත්, එතුමා අනික් අයට ආදර්ශයක් දෙන්න ඕනෑ. මම කියන්නේ නැහැ, මේ වෙලාවේ මන්ත්‍රීවරු ඒකට ගියේ නැත්නම් ඩොලර් බිලියන ගණනක් ඉතුරු කරගන්න පුළුවන් කියලා. ඒකට ලොකු මුදලක් වැය නොවන්න ඇති. නමුත්, එතුමා ආදර්ශයක් දෙන්න ඕනෑ නේ. රටේ සිටින අහිංසක ජනතාවට ජීවත් වෙන්න ඉතා අමාරු තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා, බදු වැඩි කරලා තිබෙන නිසා. ජනතාවට බදු වැඩි කරලා තිබෙන අවස්ථාවක සති කිහිපයකට සැරයක් රට යෑම, රට යනකොට මන්ත්‍රීවරුන් රැගෙන යෑම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. එහෙම කරනකොට එතුමා මොන ආදර්ශයක්ද දෙන්නේ? අපි ඒක අපි තේරුම් ගන්න ඕනෑ. අපේ රට බංකොලොත් වෙච්ච රටක්. මේ තත්ත්වයෙන් ගොඩ එන්න නම් බංකොලොත් වෙච්ච රටේ පාලකයන් ඉස්සෙල්ලාම ආදර්ශවත් විය යුතුයි. මේ සම්බන්ධයෙන් ජනතාවට වගකීමක් තිබෙනවා වාගේම මේ රටේ මුදල් භාවිත කරන කොට ඊටත් වඩා වගකීමක් තිබෙනවා, මේ පාර්ලිමේන්තුවටත්, මේ රටේ විධායකයටත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.බී. හේරත් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.14]

**ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.பீ. ஹேரத் - கால்நடை வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock Development)
අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ දිස්ත්‍රික්කයේ තරුණ මන්ත්‍රීවරයෙක් මූලාසනයේ ඉන්න වෙලාවක පාර්ලිමේන්තුවේ මෙවන් කථාවක් කරන්න ලැබීම සතුටට කාරණාවක්. අපේ අධිකරණ ඇමතිතුමා විශේෂයෙන් මේ පාර්ලිමේන්තු කාල පරාසය තුළ එතුමාගේ කාර්යභාරය ඉතා මැනවින් වටහාගෙන මෙතෙක් ඇති වෙච්ච හිඩැස් පුරවන්න දරන උත්සාහය පිළිබඳව එතුමාට අපේ කෘතවේදීත්වය පළ කරන්න ඕනෑ.

මට ඉස්සෙල්ලා කථා කරපු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා මැතිවරණ කල් දැමීම පිළිබඳව කථා කරන කොට අපට බරපතළ ප්‍රශ්නයක් ඇති වෙනවා, එතුමන්ලාගේ හෘදය සාක්ෂිය පිළිබඳව. පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේ මේ රටේ පළාත් සභා ක්‍රමය විකෘති කරන්න, ඒ වාගේම පළාත් පාලන මැතිවරණ ක්‍රමය විකෘති කරන්න දායක වෙච්ච කෙනෙකු රටේ වර්තමාන ආර්ථික තත්ත්වය සැලකිල්ලට අරගෙන මේ විධියට විග්‍රහ කිරීම පිළිබඳව අපි පුදුම වෙන්නේ නැහැ. මොකද, විපක්ෂයේ කාර්යභාරය, අපේක්ෂාව වෙන්නේ කොයි විධියකින් හෝ අඩු පාඩු කියලා ජයග්‍රහණය ලැබීමයි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මහතා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒ විග්‍රහය මගෙන් අහනවාට වඩා හොඳයි, ඔබතුමාගේ ආණ්ඩුවේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාගෙන් අහන එක. මොකද, ඔබතුමාගේ නායකයාගෙන් ඇහුවා නම් මට වඩා හොඳින් එතුමා ඒක තේරුම් කරලා දෙයි.

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பீ. ஹேரத்)
(The Hon. D.B. Herath)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන අපි කවුරුත් මේ මාතෘකා පිළිබඳව විවෘතව කථා කරන්න ඕනෑ. මෙහිදී වැදගත් වෙන්නේ මැතිවරණ කල් දමන්න ඔබතුමන්ලා හවුල් වුණාද, එහෙම නැත්නම් අපි හවුල් වුණාද කියන කාරණාව නොවෙයි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට වටිනාකමක් දෙන්න ඕනෑය කියන යථාර්ථය අපි කවුරුත් පිළිගන්න ඕනෑ. මක්නිසාද, අපි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ තමයි මෙතැනට ඇවිල්ලා ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දෙවැනිවර කියවීම සඳහා ඉතාම වැදගත් පනත් කෙටුම්පත් දෙකකුත් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඉන් එකක් වන්නේ, නඩු පිටපත් ලබා ගැනීම සම්බන්ධව සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතට ගෙනැල්ලා තිබෙන සංශෝධනයයි. මේ රටේ සාමාන්‍ය ජනතාව, විශේෂයෙන්ම ගම්බද ජනතාව අද නඩු කටයුතුවලට දායක වුණාම කාරණා කිහිපයක් නිසා දැඩි පීඩාවකට පත්වනවා. එකක්, නඩු කල් යෑම. සුළු නඩු කටයුත්තක් වෙනුවෙන් අවස්ථා ගණනාවකදී අධිකරණය හමුවට එන්න, නීතිඥ සහාය පතන්න සහ නඩු තීන්දුවෙන් පස්සේ තීන්දුවේ පිටපත් ගන්න ගියාම ඔවුන් විශාල ගැටලුවලට මුහුණ දෙනවා. ඔවුන්ගේ බර සැහැල්ලු කරන්න, සහනයක් දෙන්න තමයි ගරු ඇමතිතුමා මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කළේ.

ඊළඟට අද තවත් සංශෝධනයක් ගෙන එනවා, මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත ලෙස. පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වුණු අපේක්ෂකයන්ට පමණක් නොවෙයි, ප්‍රාදේශීය සභා මැතිවරණ, පළාත් සභා මැතිවරණ ආදී මැතිවරණ ගණනාවකට ඉදිරිපත් වෙලා කටයුතු කරපු අපේක්ෂකයන්ට මේ රටේ මහජන මතය වෙනස් කරන්න කොතරම් උත්සාහයක් දරන්න වෙනවාද කියලා අපි දන්නවා. හුදෙක් පක්ෂයක්, එහෙම නැත්නම් පුද්ගලයෙක්, ප්‍රතිපත්ති හෝ යම් යම් කාරණා පදනම් කරගෙන මහජන මතය උරගා බලන්න කටයුතු කරනවා වෙනුවට මිල මුදල් භාවිත කරලා, භෞතික සම්පත් පාවිච්චි කරලා ජන මනස විකෘති කරලා ජන මතය හසුරුවන්න උත්සාහ දරන අවස්ථා තිබෙනවා. ඒකට ඔවුන් පාවිච්චි කරන ප්‍රධාන සාධකය තමයි, මුදල්. මේ පිළිබඳව ගරු අධිකරණ ඇමතිතුමා විසින් මැතිවරණයකදී අපේක්ෂකයෙකුට වියදම් කරන්න පුළුවන් මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් වූ පනතකුත් ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කාරණය පිළිබඳව නිරීක්ෂණය කරලා කවරෙකුට හෝ අධිකරණයට යන්න ඕනෑ නම්, ඒ දින විසි එකක කාලය දින හතළිස් දෙක දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ, ඇයි? මැතිවරණයකින් පස්සේ ඒ සඳහා වැය වූ මුදල පිළිබඳව පැහැදිලිවම නිවැරදි විනිශ්චයකට භාජනය කරන්න අවශ්‍ය නිසා. නීත්‍යනුකූලව කටයුතු කළ යුතු මෙවැනි කාරණාවකදී අපේක්ෂකයෙකුගේ ක්‍රියාකාරකම් පිළිබඳව තීන්දු ගන්න දින වකවානු අවශ්‍යයි. එම නිසා දින විසි එකක් වූ සීමිත දින ප්‍රමාණය දින හතළිස් දෙක දක්වා වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා.

ඊළඟට ඉදිරිපත් කර තිබෙනවා, සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ නියෝග. ගම්බදව ජීවත් වන අය හැටියට අපි දන්නවා, අධිකරණයට ගියාම සුළු සුළු වැරදි සමථ මණ්ඩලයට යොමු කරන බව. අපි සමථ මණ්ඩලය තුළින් ඒ සඳහා විනිශ්චයක් බලාපොරොත්තු වෙනවා. හැබැයි, මෙතෙක් කල් සමථ මණ්ඩලවල කටයුතු කරන නිලධාරින්ගේ, තීන්දු ගන්න නිලධාරින්ගේ සුදුසුකම් පිළිබඳව කිසිම තැනක පැහැදිලිව සඳහන් වෙලා තිබුණේ නැහැ. ඒ කාරණාවත් එක්ක ඔවුන් ලබා දෙන විනිශ්චය පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපි සමථ මණ්ඩල ක්‍රියාකාරිත්වයේ යෙදෙන්නන්ගේ සමාජ මට්ටම, අධ්‍යාපන මට්ටම හා ප්‍රශ්නයක් තේරුම් ගන්න තිබෙන හැකියාව පිළිබඳව තීන්දු කරන්න අවශ්‍ය පදනම සැකසිය යුතුයි. ගරු අධිකරණ ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කරලා, අද ඊට අවශ්‍ය සංශෝධන ගෙනැවිත් තිබෙනවා. විශේෂයෙන්ම රටේ පැවැත්ම වෙනුවෙන් මේ කාරණා සැලකිල්ලට අරගෙන ගරු අධිකරණ ඇමතිතුමා රටේ ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය හැටියට මෙම පාර්ලිමේන්තුවට වැදගත් තීන්දු-තීරණ ඉදිරිපත් කරද්දී මේ රටේ ව්‍යවස්ථාදායකයේ වටිනාකම, ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳවත් පැහැදිලි කරන්න යෙදුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටක් හැටියට ගත්තාම අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ වගකිව යුතු පුද්ගලයෝ - මහජන නියෝජිතයෝ වෙන්න පුළුවන්, ආයතන ප්‍රධානීන් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් දෙපාර්තමේන්තුවල සහ ආයතනවල ක්‍රියාකාරීන් වෙන්න පුළුවන්- ස්වකීය වගකීම හරි විධියට ඉටු කරනවාද කියන කාරණය අද ප්‍රශ්නයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිනපතා පළවන පුවත් පතක අද සඳහන් වෙලා තිබුණා, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාළ කාරණයක්. ඒ තමයි, "ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නීත්‍යනුකූල සහතිකයක් නැති ආයතනයකින් ප්‍රතිදේහවලට සම්බන්ධ බෙහෙත් ගෙනැල්ලා රුපියල් මිලියන 130ක පාඩුවක් කරලා" කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ-පෙරේදා කථා කළා, ශ්‍රීලන්කන් ගුවන් සේවයට අයත් ගුවන් යානා පිටත් වීමේ පමාව පිළිබඳව.

ඊළඟට, ලංකාවේ පුරාවිද්‍යාත්මක වටිනාකම් තිබෙන ස්ථාන 252ක් නීතිගත කරලා නැහැ. ඊළඟට, පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයේ ටෙන්ඩර් මගඩියක් වෙලා ඒකෙන් රුපියල් කෝටි 3ක පාඩුවක් වෙලා තිබෙනවා. දැන් කවුද මේවා කරන්නේ? මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු ද, ඇමතිවරු ද, ජනාධිපතිවරයා ද? නැහැ, මේ රටේ යම් යම් වගකීම් දරන ඒ ආයතනවල ප්‍රධානීන් මේවාට වග කියන්න ඕනෑ. රටේ පවතින දූෂණ තත්ත්වය පිළිබඳව දිනපතා පුවත් පත් මඟින් විග්‍රහ කරනකොට ඒවායේ වගකීම දරන උදවිය මේ පිළිබඳ තීන්දු-තීරණ ගන්නවාද? නැවත මෙවන් දෙයක් මේ රට තුළ සිද්ධ වන එක වළක්වන්න කටයුතු කරනවාද? මේ ආදී වශයෙන් බරපතළ ප්‍රශ්න මේ සමාජය තුළ තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාල වකවානුව තුළ මේ රටේ ක්‍රියාත්මක වෙච්ච අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ගැටලු සහගත තත්ත්ව තිබුණු බව.

ඒ වාගේම පුවත් පතක සඳහන් වෙලා තිබුණා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඉදිරිපත් කළ නඩු ගණනාවක් ඉල්ලා අස්කරගෙන තිබුණා කියලා. එතකොට මෙකේ වගකීම ඔවුන් හරි විධියට ඉටු කළාද? මේ 225දෙනාම හොරු කියලා හැම දාම අපේ චෝදනා පත්‍රවලට එකතු කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන් කවදා හරි කොහේ හෝ තැනක කථා කරලා තිබෙනවාද, මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කරලා පත් කරපු ආයතන, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන ස්වකීය වගකීම ඉටු කරන්නේ නැහැයි කියලා? නැහැ. හැබැයි, එතුමන්ලා වගකීමකින් තොරව කටයුතු කරන කාරණාව ආණ්ඩුවේ ගිණුමට බැර කරන්න විපක්ෂයේ මන්ත්‍රීවරු උත්සාහ කරනවා. මේක තමයි වර්තමාන තත්ත්වය.

වර්තමාන ජනාධිපතිතුමාත් එක්ක යන අපේ දේශපාලන ගමන ගැන මම කියන්න කැමැතියි. ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගේ කථාවට සවන් දුන් නිසායි මම මේක කියන්නේ. අපි අලුත් දේශපාලන සංස්කෘතියක් පටන් ගත්තා. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ගැන විවේචනය කරනවා. මේ රටේ අරගළයක් ඇති වෙලා, රට විනාශ වෙන්න ගිය වෙලාවේ, ජනතාව අගාධයට වැටෙන්න ගිය වෙලාවේ රට ගොඩගන්න අපි 134දෙනෙක් එක්ක එකතු වෙලා එතුමාව ජනාධිපති වශයෙන් පත් කරන්න කටයුතු කළා.

මේ පුංචි රටේ මිලියන 220ක් වූ ජනතාව නියෝජනය කරන නායකයා විධියට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ජාත්‍යන්තර ප්‍රජාවත් එක්ක ගනු දෙනු කරන හැටි, ස්වාධීන අදහස් ප්‍රකාශ කරන හැටි, ජාත්‍යන්තර ගැටලුත් එක්ක අපේ රටේ ප්‍රශ්න ඉදිරිපත් කරන ස්වභාවය පිළිබඳව අපි ඇත්තටම සෑහීමකට පත් වෙනවා. එවන් තත්ත්වයක් තුළ රටේ විධායකය ගන්නා වූ තීන්දු-තීරණත් එක්ක, එතුමා දරන මතයත් එක්ක ඊට සාපේක්ෂව මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කැබිනට් ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී මණ්ඩලය වන අපට වගකීමක් තිබෙනවා එකට එක්කහු වෙලා මේ රටේ දැවෙන ප්‍රශ්නවලට විසඳුම් සොයන්න. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය හැටියට අපේ අගමැතිතුමාගේ නායකත්වයෙන් හැම වෙලාවකම අපි වගකීම -රාජකාරිය- නිසි අයුරින් හරියට ඉටු කළොත් මම විශ්වාස කරනවා, අපට නිවැරදි තැනකට යන්න පුළුවන් කියලා. විශේෂයෙන්ම රටක් ඉදිරියට අරගෙන යන්න නම් රටට විනයක් තිබෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම නීතිගරුක ක්‍රියාකාරකම් එක්ක එකතු වෙන්න ඕනෑ. අන්‍යයන්ට ගෞරව කරන්න ඕනෑ. එවන් පසුබිමක් තුළ අපි කටයුතු නොකිරීම නිසා තමයි, අවුරුදු 75ක දේශපාලන ඉතිහාසය පුරාවටම අපි ඉතිහාසයට අවලාද නඟන පිරිසක් බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ. අපි එක තැන නැවතිලා ඉන්නේ. මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය තුළ ආපහු හැරිලා බලන්න පුළුවන් නම්,

[ගරු ඩී.බී. හේරත් මහතා]

අපට තෘප්තිමත් වෙන්න පුළුවන් ඉතිහාසයක් නැහැ කියන එක පෙනෙනවා. ඒ නිසා අපේ වැරැදි නිවැරදි කරන්න සුදුසුම කාල පරාසය ඇවිල්ලා තිබෙනවාය කියන කාරණාව මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්වකීය වගකීම මේ පාර්ලිමේන්තුව වෙනුවෙන්, රටේ අනාගතය වෙනුවෙන් ඉටු කිරීම සම්බන්ධයෙන් ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාටත්, රාජ්‍ය අමාත්‍ය ගරු අනුරාධ ජයරත්න මැතිතුමාටත් ස්තුතිවන්ත වෙමින්, අවස්ථාව ලබා දුන් ඔබතුමාටත් ගෞරවය පුද කරමින් මගේ කථාව මෙතැනින් අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. තව්ෆික් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.24]

**ගරු එම්.එස්. තව්ෆික් මහතා**
(மாண்புமிகு எம்.எஸ். தெளபீக்)
(The Hon. M.S. Thowfeek)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்தில் கலந்துகொண்டு என்னுடைய கருத்துக் களையும் கூறுவதற்கு எனக்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இன்று திருகோணமலை மாவட்டத்தைப் பொறுத்த வரையில், அங்குள்ள பல்வேறு பிரதேசங்களில் பாரிய பிரச்சினையாகக் காணிப் பிரச்சினை தொடர்ந்துகொண்டு இருக்கின்றது. புல்மோட்டைப் பிரதேசத்தில் வாழுகின்ற மக்களுக்குச் சொந்தமான காணியை, தொல்பொருள் திணைக் களத்துக்கும் 'පූජා භූමි' - 'புண்ணிய பூமி' - என்ற திட்டத்துக்குமென சென்ற வாரம் வர்த்தமானி அறிவித்தல்மூலம் பிரகடனப்படுத்தி இருக்கிறார்கள். இவ்வாறு அங்குள்ள கிட்டத்தட்ட 67 ஏக்கர் காணியை வர்த்தமானி அறிவித்தல்மூலம் பிரகடனப்படுத்தி, அபகரிப்பதற்கான திட்டம் மேற்கொள்ளப்பட்டிருக்கின்றது. அந்தக் காணிக்கான அனுமதிப் பத்திரம் அம்மக்களிடம் இருக்கின்றது. அந்த மக்கள் நீண்ட காலமாக விவசாயம் செய்துவந்த அந்தக் காணி தற்பொழுது தொல்பொருள் திணைக்களத்துக்கும் 'පූජා භූමි' என்ற திட்டத்துக்கும் வழங்கப்பட்டிருப்பது உண்மையிலே அந்த மக்களுக்கு இழைக்கப்படுகின்ற அநியாயமாகும்.

கௌரவ காணி அமைச்சர், கௌரவ பிரதம மந்திரி, மாண்புமிகு சனாதிபதி என இருக்கின்ற எல்லா உயர்மட்டம் வரைக்கும் நாங்கள் இந்த விடயத்தைக் கொண்டு சென்றிருக்கின்றோம். கடைசியாக நானும் எங்களுடைய தேசியத் தலைவரான கௌரவ றவுப் ஹகீம் அவர்களும் குச்சவெளிப் பிரதேச சபையின் முன்னாள் தவிசாளரான முபாரக் அவர்களும் மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்து, இந்தப் பிரச்சினையைத் தீர்த்துத் தருமாறு வேண்டினோம். எனினும், இந்தப் பிரச்சினை இதுவரைக்கும் தீர்க்கப்படவில்லை. இந்தப் பிரச்சினையை இந்த நாட்டின் சனாதிபதி அவர்களிடம் கொண்டுசென்றும் தீர்க்க முடிய வில்லை என்றால், இதை நாங்கள் யாரிடம் கொண்டுசெல்ல வேண்டும் என்பதை இந்த உயரிய சபை எங்களுக்குக் கூற வேண்டும். யுத்தத்தினாலும், சுனாமி அனர்த்தத்தினாலும் பாதிக்கப்பட்டு, இன்று பல்வேறு பிரச்சினைகளை எதிர்நோக்கிக் கொண்டிருக்கின்ற, வறுமைக் கோட்டுக்குக்கீழ் வாழுகின்ற அப்பாவிப் பொதுமக்களுடைய காணிகளே இவ்வாறு அபகரிக்கப்பட்டு இருக்கின்றது. இந்தப் பிரச்சினை காரணமாக சென்ற கிழமை ஓரிரு பெண்மணிகள்கூட தாக்கப்பட்டு இருக்கிறார்கள். இவ்வாறு அநியாயங்கள் நடக்கும்போது, இந்த நாட்டில் சட்டத்தைச் சரியாக அமுல்படுத்துவதற்கு ஏன் அரசாங்கம் முன்வருவதில்லை என்பது கேள்விக்குறியாகவே இருந்துகொண்டு இருக்கின்றது. ஏன் இந்த அரசாங்கம் எல்லா சமூகத்தினருக்கும் சட்டத்தை ஒரேவிதமாக அமுல்படுத்துவதில்லை?

அங்கு மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டம் நடந்துகொண்டிருக்கும்பொழுது, அதைக் குழப்புகிறார்கள். ஆளுநர், பாராளுமன்ற உறுப்பினர்கள் உட்பட எத்தனையோ உயரதிகாரிகள் கலந்துகொள்கின்ற அந்தக் கூட்டத்தைக் குழப்பி, இடைநிறுத்துகிறார்கள். யார் அவர்களுக்கு அந்த அதிகாரங்களை வழங்கியது? ஏன் இந்த நாட்டில் சட்டத்தைச் சரியாக அமுல்படுத்துகிறார்கள் இல்லை? என்பதை நான் இந்த உயரிய சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோன்று, கிண்ணியா பிரதேச செயலகப் பிரிவுக்கு உட்பட்ட கல்லறுப்பு, தளவாய் போன்ற பிரதேசங்களிலுள்ள காணிகள் யுத்த காலத்திற்கு முன்னர் - கிட்டத்தட்ட 35 - 40 வருடங்களுக்கு முன்னர் - விவசாயம் செய்யப்பட்டு வந்த காணிகள்! அவை இதுவரை விடுவிக்கப்படவில்லை. யுத்தம் முடிவடைந்ததன் பின்னர், அந்தக் காணிகளை உரிய விவசாயி களுக்கு வழங்க வேண்டுமென்று நாங்கள் கோரிக்கைகளை விடுத்து, உரிய அதிகாரிகளையும் கௌரவ அமைச்சர்களையும் சந்தித்து வருகின்றோம். ஆனாலும், இதுவரை அந்தக் காணிகள் விடுவிக்கப்படவில்லை. அதேபோன்று, முத்துநகர், கப்பல்துறை போன்ற பிரதேசங்களிலுள்ள காணிகள் 1972ஆம் ஆண்டிலிருந்து விவசாயம் செய்துவந்த காணிகள்! அவற்றை 1983 - 1984 காலப்பகுதியில் அமைச்சராக இருந்த லலித் அத்துலத்முதலி அவர்கள் துறைமுக அதிகாரசபைக்கு வழங்கும் வகையில், விசேட வர்த்தமானி அறிவித்தல் ஒன்றை வெளியிட் டிருந்தார். அதனால் தற்பொழுது அவை துறைமுக அதிகாரசபைக்குச் சொந்தமான காணிகளாக மாற்றப் பட்டிருக்கின்றன. இருந்தாலும், அந்த மக்கள் அந்தக் காணிகளை மீண்டும் விவசாயம் செய்வதற்காகக் கோருகின் றனர். தகருவெட்டுவான் என்ற குளத்தைப் புனரமைப் பதற்கென நிதியொதுக்கீடு செய்யப்பட்டு, அங்கு புனரமைப்புப் பணிகள் இடம்பெற்றுக்கொண்டிருந்த நிலையில், அதை துறைமுக அதிகாரசபை இடைநிறுத்தி இருக்கின்றது. இப்படி அங்கு பல பிரச்சினைகள் நடந்துகொண்டிருக்கின்றன. இருந் தாலும், நாங்கள் இன்னமும் அவற்றுக்குத் தீர்வுகளைப் பெற்றுக்கொள்ள இயலாத நிலையிலே இருந்துகொண்டிருக் கின்றோம். எனவே, இவற்றை உடனடியாக இந்த உயரிய சபை உரிய அமைச்சர்களின் கவனத்திற்குக் கொண்டுவந்து, தீர்த்து வைக்க வேண்டுமென்று நான் கோரிக்கை விடுக்கின்றேன்.

மூதூர் பிரதேசத்தில் இருக்கின்ற நாவலடிக் கிராமம் சுனாமியால் பாதிக்கப்பட்ட ஒரு கிராமமாகும். அதில் வசித்த 25க்கும் மேற்பட்ட குடும்பங்களைச் சேர்ந்தவர்கள் சுனாமி அனர்த்தம் ஏற்பட்ட காலத்திலிருந்து அங்கிருந்து வெளியேறி, தற்பொழுது வெவ்வேறு இடங்களில் குடியிருக்கிறார்கள். அவர்களுக்கு இன்னும் மாற்றுக் காணிகள் வழங்கப் படவில்லை. எனவே, அதுதொடர்பாகவும் உரிய நடவடிக்கை எடுக்கப்பட வேண்டுமென்று நான் இந்தச் சபையிடம் கேட்டுக்கொண்டு, எனக்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு மீண்டும் கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.31]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අදාළ වන පනත් කෙටුම්පත් දෙකක් සහ එම අමාත්‍යාංශයට අදාළ තවත් පනත් දෙකකට නියෝග හා නියමයක් ගෙන එනවා. එම සංශෝධන ගෙන ඒම පිළිබඳව ගරු අමාත්‍යතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මම හිතන විධියට ඒවා ඉතාම කාලෝචිත සංශෝධන. මුදල් ගෙවීමකින් තොරව නඩු තීන්දුවල සහතික පිටපත් ලබා දීම මෙහි එක් සංශෝධනයක් තුළින් ක්‍රියාත්මක වෙනවා. අපි දන්නවා නඩු තීන්දු ගන්න මිනිස්සු ගොඩක් වෙලාවට ගිහිල්ලා රස්තියාදු වෙන බව. ගරු ඇමතිතුමනි, ඔබතුමා අද ගෙන ආවේ ඉතාම හොඳ තීරණයක්. ඒ වාගේම, සියලු ග්‍රාම නිලධාරින්, පරිවාස නිලධාරින්, ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක නිලධාරින් ඇතුළු නිලධාරින් ගණනාවකට සාමදාන විනිශ්චයකාර පදවි ලැබෙනවා. ඒ නිසා ඉතාම හොඳ නියෝග හා පනත් සංශෝධන කිහිපයක් තමයි අද අධිකරණ අමාත්‍යාංශය ගෙන එන්නේ. විශේෂයෙන්ම හිටපු අධිකරණ අමාත්‍යතුමාටත්, වත්මන් අධිකරණ ඇමතිතුමාටත් ස්තුති කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. මම හිතන විධියට මේ රජය යටතේ, යල් පැන ගිය වැඩිම අණ පනත් ප්‍රමාණයක් සංශෝධනය කරලා, අදට ගැළපෙන ලෙස ඉදිරිපත් කිරීමට මේ පාර්ලිමේන්තුවේදී කටයුතු කළා. ඒ පිළිබඳව වත්මන් අධිකරණ අමාත්‍යතුමාත්, හිටපු අධිකරණ අමාත්‍යතුමාටත් අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

හැබැයි, ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මොන තරම් පනත් කෙටුම්පත් ගෙන ආවත්, ඔබතුමා මොන තරම් සංශෝධන ඉදිරිපත් කළත්, එතැනින් එහාට ඒවා ක්‍රියාත්මක වීම පිළිබඳව අපට ගැටලුවක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, මම මුලින්ම මේ පාර්ලිමේන්තුවෙන් පටන් ගන්නම්. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ගෙනාවා නේ. 2023 අගෝස්තු මාසයේ 08වැනි දා එහි සහතිකය සටහන් කළා. ඔබතුමා ඒක සැප්තැම්බර් මාසයේ 15වැනි දා ඉඳලා බලාත්මක කරන්න කියලා ගැසට් නිවේදනයක් නිකුත් කළා. අද 2023 ඔක්තෝබර් මාසයේ 03වැනි දා. අද වෙනතුරු මේ පාර්ලිමේන්තුවට ඒක බලාත්මක කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ ඇයි? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳ කාරණයක් නිසා. මම හිතන විධියට මේ පාර්ලිමේන්තුවේ පිහිටු වූ අකාර්යක්ෂම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තමයි, දැන් මේ පාර්ලිමේන්තුවේ තිබෙන්නේ. ඒක කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. ගරු අගමැතිතුමාටත්, ගරු විපක්ෂ නායකතුමාටත් දෙදෙනාටම මම ඒක කියන්න ඕනෑ. අපේ ආණ්ඩුවේ අගමැතිතුමාට වාගේම විපක්ෂ නායකතුමාටත් -දෙදෙනාටම- කියන්න ඕනෑ, සත පහකට වැඩක් නැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තමයි මේ පාර්ලිමේන්තුවේ තිබෙන්නේ කියලා.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, මේ රටට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ඕනෑ කියලා තමුන්නාන්සේලා පාරට බැස්සා. ජනාධිපතිවරයා අධිකරණ විනිසුරුවරු පත් කරනවා, ජනාධිපතිවරයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවට නිලධාරින් පත් කරනවා, තමන්ට ඕනෑ විධියට නඩු පවරනවා, තමන්ට ඕනෑ නඩුව අයින් කරනවා, ඒ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් පත් කරලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා ඒකට ස්වාධීන පුද්ගලයෝ පත් කරන්න ඕනෑයි කිව්වා. දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත් කරලා දවස් කීයක් වෙනවාද? කෝ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවට නිලධාරින් පත් කළාද? අඩු ගානේ මේ දූෂණ විරෝධී පනත බලාත්මක කළාද? ඒ නිසා මේක තමයි මේ පාර්ලිමේන්තුවට පත් වෙච්ච අකාර්යක්ෂම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන එක කනගාටුවෙන් වුණත් මේ පාර්ලිමේන්තුවේ කියන්න ඕනෑ. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මොන උත්සාහය දැරුවත් වැඩක් නැහැ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳව අපි ලෝකයේ ගිහිල්ලා කථා කරනවා. ජනාධිපතිතුමා ගිහිල්ලා කථා කරනවා, අපේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව. අපේ විනිවිදභාවය පිළිබඳව කථා කරනවා. දූෂණය අවම කරන එක ගැන කථා කරනවා. මේ දූෂණ විරෝධී පනත අපේ රටේ මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ ඉදිරිපත් කරපු අග්‍රගණ්‍ය පනතක්. හැබැයි, ඒ පනත බලාත්මක කර ගන්න බැහැ.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවේදී කට කැඩෙනකම් කෑගහනවා හොරකම් ගැන. නමුත් මේ ගැන කථා කරන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ කටේ පිට්ටුද? තමුන්නාන්සේලා අහන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන. අහන්න ඔබේ විපක්ෂ නායකතුමාගෙන්, ඇයි, මේ පනත බලාත්මක කරන්න කටයුතු කරන්නේ නැත්තේ කියලා. අගමැතිතුමාට පමණක් නොවෙයි, කථානායකතුමාටත් මේ චෝදනාව මම එල්ල කරනවා. කථානායකතුමා, අගමැතිතුමා හා විපක්ෂ නායකතුමා ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්න සියලු සාමාජිකයින්ගෙන් -දහදෙනාගෙන්- මේ ගැන අහන්න ඕනෑ. වටලන්න ඕනෑ අපේ ගෙවල් නොවෙයි. වටලන්න ඕනෑ, මෙගොල්ලන්ගේ ගෙවල්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවට නිලධාරින් පත් කරලා, ඒ තීරණ ගන්නේ නැත්නම්, අපි ජනාධිපතිතුමාට හා පාර්ලිමේන්තුවට යෝජනා කරනවා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසුරුවලා, වෙනත් පිරිසක් පත් කරලා හරි ඒ කටයුතු හරියට ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු අමාත්‍යතුමනි, මම මේ පාර්ලිමේන්තුවේදී දිගින් දිගටම දරපු මතයක් තිබෙනවා, රාජ්‍ය ආදායම පිළිබඳව. පසුගිය දා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ අවධානය යොමු වුණු කාරණා තුනක් තිබෙනවා. පළමුවෙනි එක උද්ධමනය තනි ඉලක්කමකට ගේන්න කියන එක. දෙවෙනි එක විදේශ සංචිත වැඩි කරන්න කියන එක. තුන්වෙනි එක රාජ්‍ය ආදායම වැඩි කරන්න කියන එක.

අපි සියයට 95ට තිබුණු ආහාර උද්ධමනය සියයට ඍණ 5ට ගෙනාවා. ඒ වාගේම අපි විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 4කට ගෙනාවා. ඒ පිළිබඳව අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පැසසුමට ලක් වුණා. හැබැයි රාජ්‍ය ආදායම පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් දැඩි චෝදනාවක් එල්ල වුණා. අපට දෙවෙනි වාරිකය ගන්න බැරි ප්‍රශ්නයට මූලික හේතුව තමයි අපේ රාජ්‍ය ආදායම පිළිබඳ කාරණය. මම හැම දාම කියනවා වාගේ අපේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව රාජ්‍ය ආදායම සියයට 7.2යි. ලෝකයේ පුංචි රටවලත් එය සියයට 20යි. රාජ්‍ය ආදායමෙන් සියයට 90ක් අපට ලැබෙන්නේ බදුවලින්. හැබැයි ඒ බදු අය කරන ආයතන තුනේ අකාර්යක්ෂමතාව, මේ ආයතන තුනේ ඉන්න නිලධාරින්ගේ දූෂණ, වංචා නිසා වසරකට රුපියල් බිලියන 500ක් අපට අහිමි වෙනවා ගරු ඇමතිතුමනි.

රේගුවේ අකාර්යක්ෂමතාව හා දූෂණය නිසා දිනකට අහිමි වෙන මුදල රුපියල් බිලියන 1ක්. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාව හා දූෂණය නිසා දිනකට අපට අහිමි වෙන මුදල රුපියල් මිලියන 500ක්. සුරාබදු දෙපාර්තමේන්තුවේ තිබෙන දූෂණ හා අක්‍රමිකතා නිසා දිනකට අපට අහිමි වෙන මුදල රුපියල් මිලියන 10ක්. වසරකට රුපියල් බිලියන 500ක් රාජ්‍ය ආදායමට ඒක රාශි කර ගන්න පුළුවන් වැඩ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

පිළිවෙළ මේ ආයතන තුන ක්‍රියාත්මක කරන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, මේවාට වග කියන්න ඕනෑ කියලා දේශපාලනඥයාටයි බණින්නේ, මේ මන්ත්‍රීවරු 225දෙනාටයි බණින්නේ. අපිද රාජ්‍ය ආදායම එක්කහු කරන්නේ? ආණ්ඩුවක් හැටියට ජනාධිපතිතුමාට කරන්න පුළුවන් එකම දේ තමයි උද්ධමනය පාලනය කිරීම. ඒක රජය කරලා තිබෙනවා. ආණ්ඩුවක් හැටියට සංචිත වැඩි කරලා තිබෙනවා. හැබැයි, ආණ්ඩුවට පුළුවන්ද රාජ්‍ය ආදායම වැඩි කරන්න? ආණ්ඩුවට පුළුවන්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉඳගන්න? ආණ්ඩුවට පුළුවන්ද සුරාබදු දෙපාර්තමේන්තුවේ ඉඳගන්න?

ගරු අමාත්‍යතුමනි, නිෂ්පාදන සමාගම්වලින් මාසයකට මත්පැන් බෝතල් මිලියන 45ත්, 50ත් අතර ප්‍රමාණයක් එළියට යනවා. ඒ, විස්කි, අරක්කු, බියර් සහ රා කියන බෝතල්. අවුරුද්දකට බෝතල් මිලියන 500ක් එළියට යනවා. මේකෙන් සියයට 40ක් under-invoice කර යන්නේ; රජයට සත පහකවත් බද්දක් ගෙවන්නේ නැහැ. මේක වළක්වන්න 2022දී අලුත් රජය යෝජනාවක් ගේනවා. ඒ යටතේ ස්ටිකර් එකක් ගේනවා. සියලු මත්පැන් බෝතල්වල මේ ස්ටිකර් එක අලවන්න ඕනෑ කියනවා. ඒ අනුව 2022 පළමු කාර්තුවේ ආදායම සියයට 100කින් ඉහළ යනවා. සුරාබදු දෙපාර්තමේන්තුව බිලියන ගණනක් ලාභ ලබනවා. හැබැයි හරියටම මාස තුනයි ගත වෙන්නේ, හොර ස්ටිකර් එකක් එනවා. නැවත ආදායම සියයට 40කින් බහිනවා. අපේ අදාළ කාරක සභාවට මම සුරාබදු දෙපාර්තමේන්තුව කැඳවලා මේ පිළිබඳව ඇහුවා. අපි ඇහුවා ඇයි තමුන්නාන්සේලා මේවා වටලන්නේ නැත්තේ කියලා. "අපි වැටලුවේ නැහැ තවම" කිව්වා. අපේ කමිටුව සුරාබදු දෙපාර්තමේන්තුවට නියෝගය දුන්නාට පසුව අද වෙනකොට බෝතල් 40,000ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේ සුමාන දෙකට සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම රුපියල් බිලියන 1කින් වැඩි වෙලා තිබෙනවා. ඉතින්, මේක කමිටුව කරන්න ඕනෑ දෙයක්ද? මේ හොර ස්ටිකර් ගහන එක අල්ලන්න කියන්න ඕනෑ අපිද? අපි සුරාබදු දෙපාර්තමේන්තුව කමිටුවට කැඳෙව්වේ නැත්නම්, අපි එදා නියෝගය දුන්නේ නැත්නම් අදත් හොර ස්ටිකර් එක ක්‍රියාත්මක වෙනවා. සුරාබදු දොපර්තමේන්තුවේ නිලධාරින්ට ප්‍රශ්නයක් නැහැ. ඒකේ ඉන්න ඉහළම නිලධාරියාගේ ගෙදර තිබෙන්නේ ඇමෙරිකාවේ ලොස්ඇන්ජලීස්වල. එතුමා හැම මාසයකට සැරයක්ම රට යන්නේ Business Class එකේ. ඒකේ ඉන්න දෙවෙනි මහලොකු නිලධාරියා කුඩු කිලෝ 5ක් එක්ක අහුවෙලා හිරේ ගිය මනුස්සයෙක්. ඒ තමයි මේ ආයතනවල ප්‍රධාන නිලධාරින්. ඒ ගොල්ලන්ට තමයි මේවා පාලනය කරන්න දෙන්නේ.

ඊළඟට අපි බලමු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගැන. මම දන්න ව්‍යාපාරිකයකුට මිලියන 100ක tax එකක් ගෙවන්න කියලා තිබුණා. ඔහු ගිහිල්ලා නියෝජ්‍ය කොමසාරිස්තුමෙක්ව හම්බ වුණා, රුපියල් මිලියන 10ක් දුන්නා; ෆයිල් එක වැහුවා. අදාළ කමිටුවට කැඳෙව්වාම කොමසාරිස් ජනරාල්තුමාට මම මේ ගැන කිව්වා. කිව්වාම කොමසාරිස් ජනරාල්තුමා කියනවා, "එයා නම් එහෙම තමයි" කියලා. කොහේද අපි මේ යන්නේ? ආණ්ඩුවට සල්ලි නැහැ කියනවා. බිලියන 904ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එක්කහු කර ගන්න තිබෙනවා.

Collectable taxes රුපියල් බිලියන 204ක් තිබෙනවා. නමුත් එකතු කරන්නේ නැහැ. ලෝකයේ ලංකාව හැර වෙනත් කිසිම රටක් නැහැ, අභියාචනා 4ක් ඉදිරිපත් කරලා බදු නොගෙවා ඉන්න පුළුවන්. අවුරුදු 15ක් බදු නොගෙවා ඉන්න පුළුවන් ලෝකයේ එකම රට මේකයි. සුරාබදු කොමසාරිස් ළඟ අභියාචනය අවුරුදු තුනක් තිබෙනවා. Tax Appeals Commission එකට අවුරුදු තුනක් යනවා. Court of Appeal එකට තව කාලයක් යනවා. ඒ වාගේම Supreme Court එකට තව කාලයක් යනවා. ගරු ඇමතිතුමනි, බදු ගෙවන්නේ නැතුව අභියාචනා 4ක් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්නේ ලෝකයේ මොන රටද? කමිටුවක් හැටියට එදා අපි මේ සම්බන්ධයෙන් හොඳ යෝජනා ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම කථා කරන්න ගියේ ඒ ගැන නොවෙයි, ගරු අමාත්‍යතුමනි. මේ පාර්ලිමේන්තුවේ අපි 225දෙනාම එකතු වෙලා ගේන්න ඕනෑ හොඳ නීතියක් ඔබතුමා පනතක් මඟින් ගෙනැල්ලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමාට ස්තුති කරන්නයි මම මේ කථා කරන්නේ. ගරු අමාත්‍යතුමනි, වැරදි කරන නිලධාරින්ට දඬුවම් දෙන ක්‍රමයක් මීට පෙර තිබුණේ නැහැ.

මත්පැන් බෝතලයේ ව්‍යාජ ස්ටිකර් වංචාව අල්ලන්නේ නැත්නම්; රජයට සියයට 40ක පාඩුවක් සිදු වුණා නම්, සුරාබදු කොමසාරිස් ජනරාල්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ; ඔහු අධිකරණයට ගේන්න ඕනෑ. දේශපාලනඥයා විතරක් නොවෙයි, රාජ්‍ය නිලධාරින් වැරදි කරනවා නම් ඔවුන්ට විරුද්ධවත් නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමනි, වාහන ගෙන්වන එක නවත්වලා මේ වනකොට අවුරුදු එකහමාරකට වැඩි කාලයක් වෙනවා. මගේ යාළුවෙක් පෙරේදා mobile phone එකෙන් මට පෙන්වනවා, 2019 වර්ෂයේ V8 එකක්. ගන්න මිනිස්සු ඉන්නවාද කියලා අහනවා. DMT එකේ register කරලා තිබෙනවා, ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමනි. ලංකාවට වාහනය ගෙන්වා නැහැ. හැබැයි, රේගුවේ හොර පාරෙන් වාහන එනවා. BMWs තිබෙනවා, V8s තිබෙනවා, 2019, 2020 වර්ෂවල ඕනෑම වාහනයක් වෙළෙඳ පොළේ තිබෙනවා. නමුත්, ආණ්ඩුව දැන් වාහන ගෙන්වන එක තහනම් කරලා තිබෙනවා. ඒ වාහන වෙන තැනකින් ලංකාව ඇතුළට එනවාද? එක රේගුවයි තිබෙන්නේ. රේගුවට එන containersවලින් සියයට 95ක් check කරන්නේ නැහැ. BOI එකට එන එකක්වත් අල්ලන්නේ නැහැ. ඒවා ඇතුළේ වාහන එනවා, සිගරැට් එනවා, කුඩු එනවා; බලන්නේ නැහැ. හැබැයි, දේශපාලනඥයාට බණිනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට හොඳ වගන්තියක් ඇතුළත් කර තිබෙනවා. ඒ තමයි, 111වන වගන්තිය. එහි මෙසේ සඳහන් වෙනවා:

> "රජයට වැරදි සහගත හෝ නීති විරෝධී අලාභයක් කිරීමේ හෝ තමන් වෙත හෝ වෙනත් යම් තැනැත්තකු වෙත යම් වැරදි සහගත හෝ නීති විරෝධී ප්‍රතිලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් ප්‍රදානය කරනු ලැබීමේ අදහස හෝ දැනුම ඇතිව හෝ යම් තැනැත්තකුට හෝ රජයට යම් වැරදි සහගත හෝ නීති විරෝධී අලාභයක් සිදු කිරීමේ අදහසින් හෝ එසේ වන බවට දැනුමැති ව,... "

මෙන්න මේ කාරණා ටික තමයි හොඳම:

> "යම් වැරදි සහගත හෝ නීති විරෝධී ප්‍රතිලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් යම් තැනැත්තකු වෙත ප්‍රදානය වනු ලැබීමේ අදහසින් හෝ එසේ වන බව දනිමින්,-
>
> (අ) රජයේ සේවකයකු ලෙස ස්වකීය තනතුර ප්‍රකාරව හෝ ඒ සේවකයාට පවරන ලද යම් බලතල ඇතිව හෝ නොමැතිව ඒ නිලය භාවිත කරමින් යම් ක්‍රියාවක් සිදු කරන හෝ සිදු කිරීම වළක්වන;
>
> (ආ) රජයේ සේවකයකු ලෙස ස්වකීය තනතුර ප්‍රකාරව යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වළකින ලෙසට වෙනත් රජයේ සේවකයකු පොළඹවන;"

මේ යටතේ ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුට විරුද්ධව කටයුතු කරන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඔබතුමා හොඳ පනතක් ගෙනැල්ලා තිබෙන්නේ. හැබැයි ගරු ඇමතිතුමනි, මේ පනත ගෙනාවාට වැඩක් නැහැ, මෙහි ඇති නීති ක්‍රියාත්මක කරන්නේ නැත්නම්. මේ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අය විය යුතු ආදායමෙන් සියයට 40ක් අය කර ගන්න අධ්‍යක්ෂ ජනරාල් වැඩ කරලා නැත්නම් මේ පනත යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල් නීතිය ඉදිරියට ගේන්න ඕනෑ. එසේ කරන්නේ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වෙන්න පුළුවන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වෙන්නත් පුළුවන්. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 100ක් tax ගෙවන්න ඕනෑ කෙනාගෙන් රුපියල් මිලියන 10ක් අරගෙන ෆයිල් එක වහනවා නම්, ඒ නිලධාරියාට විරුද්ධව මේ පනත තුළින් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, එහෙම නැතුව මේ රට හදන්න බැහැ. හොරකමක් වුණාම TV එකෙන් පේන්න මේ පාර්ලිමේන්තුවේදී නිකම් බොරුවට "හොරා, හොරා, හොරා" කියනවා. හැබැයි, මේ නීති ක්‍රියාත්මක කරන්න කථා කරන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ රට හදන්න කථා කරනවා. නමුත් ඔවුන් බදු ගැන කථා කරන්නේ නැත්තේ ඇයි? අපි රටක් හැටියට ජනතාවට සහනාධාර ටික දෙන්නේ, රාජ්‍ය සේවකයන්ගේ පඩි ගෙවන්නේ, රටේ සංවර්ධනය ඇතුළු සියල්ල කරන්නේ මේ බදු ආදායමෙන්. මම දිගින් දිගටම කිව්වා, මේ රටේ සමහර ප්‍රබල ව්‍යාපාරිකයෝ ශත පහක්වත් බදු ගෙවන්නේ නැහැ කියලා. මම ඇති තරම් ඒ අයගේ නම් කියලා තිබෙනවා. දැන් කිව්වා ඇති. මම එක දෙයක් විතරක් කියන්නම්. එක් අයෙකුගේ මහජන බැංකුවේ ගිණුමට රුපියල් බිලියන 100ක් එනවා. මම දේශීය ආදායම් කොමසාරිස්වරයාට ඒ පුද්ගලයාගේ bank statement එක පෙන්නුවා. එක් අවුරුද්දක රුපියල් බිලියන 100ක් ඔහුගේ බැංකු ගිණුමට ඇවිල්ලා තිබෙනවා. නමුත් ශත පහක්වත් බදු ගෙවලා නැහැ. මම ඇහුවා, "මොකක්ද තමුන්නාන්සේ කියන්නේ?" කියලා. එතකොට කිව්වා, "අපි හොයලා බලන්නම්" කියලා. වෙන මොකුත් ඕනෑ නැහැ ගරු ඇමතිතුමා, අපේ රටේ රාජ්‍ය ආදායමෙන් සියයට 86ක් ගෙවන්නේ companies 494ක් විසින්. ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමනි, ලංකාවේ සමාගම් 494ක් තමයි අපේ රටේ රාජ්‍ය ආදායමෙන් සියයට 86ක්ම ගෙවන්නේ. අපි කොහේද ඉන්නේ? දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින් 2,500ක් තියාගෙන ෆයිල් 494යි නම් කරන්නේ, මොකටද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවක්?

රාජ්‍ය ආදායම ඒක රාශි කර ගැනීම සඳහා ලෝකයේ හැම රටකම කරන්නේ tax එක අය කරගැනීමයි. ගරු අධිකරණ ඇමතිතුමනි, ඒ නීතිය ගේන්න. අපේ රටේ තිබෙන්නේ ස්වයං බදු ගෙවීමේ ක්‍රමයක්. ඒක හරියට, අනුරාධපුරේ යන ගමන් ශ්‍රී මහ බෝධියට කැමති නම් පඬුරක් දාලා යන්න පුළුවන්, නැත්නම් නොදා යන්න පුළුවන් වාගේ දෙයක්. මේ ස්වයං බදු ගෙවීමේ ක්‍රමය තිබෙන්නේ ලංකාවේ විතරයි. ලෝකයේ වෙන රටවල tax එක කැපුණාට පසුව තමයි පඩිය, ආදායම අතට එන්නේ. අපි රාජ්‍ය සේවකයින්ට, පොඩි පොඩි අයට tax ගහලා වැඩක් නැහැ. මම හැම දාම කියන්නේ ඒකයි. තෝරු, මෝරු, මහ ලොකු මිනිස්සු සිටිද්දී පොඩි මිනිහාගේ පඩියට සත පහ, සත දහය බදු ගහලා වැඩක් නැහැ. ගරු ඇමතිතුමනි, ඒ ලොකු මිනිසුන්ගෙන් බදු අය නොකර පොඩි මිනිහාට බදු ගහලා වැඩක් නැහැ. ගරු අධිකරණ අමාත්‍යතුමනි, අප ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ පනවන නීති බලාත්මක කරන්න කියලායි; ක්‍රියාත්මක කරන්න කියලායි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පනත් භාවිත කරමින් පසුගිය කාලයේ අපට නඩු දැම්මා. මම දැනුත් නඩුවකට යනවා. කැරම් බෝඩ් ගෙනාවා කියලා මට නඩු දැම්මා විශේෂ අධිකරණයේ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා කැඳවලාම කිව්වා, කැරම් බෝඩ් ගෙනාවා කියලා මහින්දානන්දට නඩු දමන්න කියලා. මම ගෙනාපු කැරම් බෝඩ් එකක් නැහැ. කැරම් බෝඩ් ගෙනාවේ සතොස; ගෙවීම් කළේ සතොස; බෙදුවේ සතොස. නරක වෙලාවට, එදා මම ක්‍රීඩා ඇමති. කැරම් බෝඩ් ක්‍රීඩා භාණ්ඩයක් හින්දා ක්‍රීඩා ඇමතිට නඩු දැම්මා ලු. කාටද මේවා කියන්නේ? දැන් විශේෂ අධිකරණයේ ඒ ගැන නඩු අහනවා. දැනට අවුරුදු 5ක් වෙනවා. පනත් පාවිච්චි කරපු විධිය තමයි මේ. අල්ලස් පනත පාවිච්චි කරන්න ඕනෑ එහෙම ඒවාට නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ ගරු සභාවේ ගරු කථානායකතුමා නැති වුණත්, ඔබතුමා මූලාසනයේ ඉන්නවා. නමුත් මම මේ කාරණය කියන්නේ ගරු කථානායකතුමාට. ගරු කථානායකතුමනි, අපි ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරත්වය නැති කරන්න එපා, පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට තිබෙන ගෞරවය නැති කරන්න එපා කියලා. අපි ගරු අගමැතිතුමාට බෙහෙවින් ගරු කරනවා. ඒ නිසා ගරු අගමැතිතුමාගෙනුත් අපි ඉල්ලා සිටිනවා, එම ගෞරවය නැති වන තැනට මෙය ගෙන යන්න එපා කියලා.

විපක්ෂ නායකතුමා ගැන නම් කථා කරලා වැඩක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ විපක්ෂ නායකතුමා ඊයේ පෙරේදා කියලා තිබුණා, ජනාධිපතිතුමා එක්ක -රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා එක්ක- මම ඇමෙරිකාවට ගියා කියලා. මේ අවස්ථාවේ සභාවේ ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා ඉන්න එකත් හොඳයි. මා මිත්‍ර තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා කියලා තිබුණා, මහින්දානන්ද අලුත්ගමගේ කෘෂිකර්මය කෑවා කියලා. හරියට නිකම් මම බත් කන්නේ නැතිව, පාන් කන්නේ නැතිව කෘෂිකර්මය කෑවා වාගෙයි කියලා තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක්සත් ජාතීන්ගේ සම්මේලනයට ගිය තුන්වැනි වතාව මේ. මම චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියත් එක්ක තමයි ඉස්සෙල්ලාම එහි ගියේ. ඊළඟට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එක්ක ගියා. ඊළඟට, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා එක්කත් ගියා. ඒ සම්මේලනයට සහභාගි වෙන්න කියලා පාර්ලිමේන්තුවේ පක්ෂ ගණනාවකට ආරාධනා කළා. තමුන්නාන්සේලාගේ පක්ෂයේ -සජිත් ප්‍රේමදාස මහත්මයාගේ පක්ෂයේ- තුන්දෙනෙකුට ආරාධනා කරලා තිබුණා. වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමාට ආරාධනා කරලා තිබුණා. ඒ වාගේම මොනරාගල මන්ත්‍රීතුමාටත් ආරාධනා කරලා තිබුණා. මට එතුමාගේ නම මතක නැහැ. අපේ අර අහිංසක, වයසක මන්ත්‍රීතුමා කවුද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ධර්මසේන මන්ත්‍රීතුමා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ආ, ධර්මසේන මන්ත්‍රීතුමා. එතුමාට visa එකත් ලැබිලා තිබුණේ. ඊළඟ එක්කෙනා, කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඒ තුන් දෙනාම යන්න කැමැත්ත පළ කරලායි තිබුණේ. ඒ තුන්දෙනා ගෙන්නලා විපක්ෂ නායක කාර්යාලයේ දණගහලා වැන්දා, යන්න එපා කියලා. ඒ තුන්දෙනාම ඇවිත් කිව්වා, "අනේ අඬනවා. එන්න විධියක් නැහැ" කියලා. තමුන්නාන්සේලාගේ පක්ෂයේ තුන්දෙනෙකුට එන්න කියලා තිබුණා. අපේ පක්ෂයෙනුත් දෙන්නෙකුට එන්න කියලා තිබුණා. සුළු ජාතික පක්ෂ නියෝජනය කරමින් එක්කෙනෙකුට එන්න කියලා තිබුණා.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

එක්සත් ජාතීන්ගේ සම්මේලනයට ගිහිල්ලා අප ලබපු අත්දැකීම් ටිකක් තිබුණා. ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමාත් මේ ගැන දන්නවා. දේශපාලනඥයින් විධියට අපි ඒවාට ගිහින් ලබන අත්දැකීමක් තිබෙනවා. ලෝක බැංකු නියෝජිතයින් එක්ක අපට කවදද වාඩි වෙන්න පුළුවන් වුණේ? සමන්තා පවර් එක්ක අපට වාඩි වෙන්න පුළුවන්ද? හැබැයි, අපි ඒ සාකච්ඡාවලට වාඩි වුණා. අපි ඒ සාකච්ඡාවලින් අත්දැකීම් ලැබුවා. දේශපාලනිකව අපි යම් දැනුමක් ලැබුවා.

තමුන්නාන්සේලාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කට ඇරියොත් කියන්නේ අසත්‍ය. හැම දාම උදේට හූනියමක් වාගේ ඇවිල්ලා කියවනවා, කියවනවා! මේ පාර්ලිමේන්තුවට ගහලා තිබෙන හෙණේ ඒකයි. මස්තබාල්දුවක් වාගේ උදේට කියවනවා. කකුල් දෙක හොඳන්නේ නැහැ. ඇවිල්ලා කියවනවා, කියවනවා, කියවනවා! අපට *per diem* ගෙව්වා, අපට batta ගෙව්වා කියලා එතුමා කියා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට සත පහක්වත් දුන්නේ නැහැ. අපට දුන්නේ ටිකට් එක විතරයි. අපට ආණ්ඩුව දුන්නේ ටිකට් එක විතරයි. එයින් එහාට කිසිම දෙයක් අපට ලැබුණේ නැහැ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු හිටපු ඇමතිතුමනි, මම තමුන්නාන්සේ ඇමෙරිකා ගිය එකට ද්වේශ සහගතව ප්‍රකාශයක් කළා නොවෙයි. තමුන්නාන්සේ කිව්වා, තමුන්නාන්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක ගියා, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය එක්ක ගියා, මේ ගියේ තුන්වැනි වතාවටයි කියලා. හරිම සන්තෝෂයි. හැබැයි, මම තමුන්නාන්සේගෙන් අහන්නේ මේකයි. තමුන්නාන්සේලා එහෙම එක්කරගෙන යන්නේ මොකක් හෝ අරමුණකට නේ. ජනාධිපතිතුමා තමුන්නාන්සේලාව එක්කරගෙන ගිහින් තිබෙනවා.

කෘෂිකර්මය කාපු කථාවක් මම කිව්වා ලු. ඇත්තටම තමුන්නාන්සේ කෘෂිකර්මය කෑවේ නැත්නම් තමුන්නාන්සේගේ හිටපු ජනාධිපතිවරයා තමයි කෘෂිකර්මය කෑවේ. අපි දන්නා හැටියට තමුන්නාන්සේලා කළුතර ගිහින් වෙල්යායක ඒක කෑවා. අපි තමුන්නාන්සේගෙන් අහනවා, තමුන්නාන්සේලා ඇමෙරිකා ගිහිල්ලා මොනවාද ගෙනාවේ කියලා. මේ රටට දිනාගෙන ආපු ජයග්‍රහණ මොනවාද කියන එකයි අපි අහන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි රටට ලබා ගෙන ආපු ජයග්‍රහණ ගැන කිව්වොත් මන්ත්‍රීතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලෝක බැංකු නියෝජිතයන් එක්ක කළ සාකච්ඡාවේදී එතුමාට ලෝක බැංකුව දක්වපු ප්‍රතිචාරය ඔබතුමා දැක්කා ද? ඒ වාගේම සමන්තා පවර් පොහොර සඳහා සම්පූර්ණ මුදල් ගෙවන්න එකඟ වුණා. ඒ විධියට අපි ලබා ගත් ජයග්‍රහණ ප්‍රමාණයක් තිබෙනවා. ඒක අපි ගිය නිසාම ලැබුණා කියලා නොවෙයි මම කියන්නේ. ඔබතුමාත් පසුපෙළ මන්ත්‍රීවරයකු හැටියට ගිහිල්ලා ඒ අත්දැකීම ලබන්න ඕනෑ. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ තවත් මන්ත්‍රීවරු ඒවාට යන්න ඕනෑ. ඔබතුමා මේ කාරණය දිහා පෞද්ගලිකව බලන්න එපා. මාත් එක්ක ඔබතුමන්ලාගේ විපක්ෂ නායකතුමාට පෞද්ගලික ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි මම විපක්ෂ නායකතුමාට කියනවා, අපේ ටිකට් එක ඉල්ලනවාට වැඩිය මෙන්න මේ ගැන බලන්න කියලා. මා ළඟ තිබෙනවා, එතුමාගේ අම්මා - හේමා ප්‍රේමදාස මහත්මිය - ජනාධිපති ලේකම් කාර්යාලයට යවපු ලිපියක්. මම ඒ ලිපිය මේ අවස්ථාවේ දී **සභාගත*** කරනවා.

කේ.ඒ. දිල්රුක්ෂි මහත්මිය, ගණකාධිකාරී, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ 01 වෙත හේමා ප්‍රේමදාස හිටපු ජනාධිපති ආර්යාව විසින් එම ලිපිය යවා තිබෙනවා. 2023.09.20 දිනැති ඒ ලිපියෙන් එතුමිය ඉල්ලනවා, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම ඉක්මනින් අවසන් කරනවා. මම හිතුවා ඔබතුමාත් සජිත් ප්‍රේමදාස මහත්තයාගේ පැත්තේද කියලා.

හේමා ප්‍රේමදාස මැතිනිය ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ඉල්ලපු භාණ්ඩ ලේඛනයේ තිබෙනවා, මෝර්ටීන් 2යි, ඇට්ලස් නිල් පාට පෑන් 2යි, ගම් බෝතල් 01යි ආදී වශයෙන්. තවත් භාණ්ඩ කිහිපයක් තිබෙනවා. විපක්ෂ නායකතුමාට කියන්න, ඉස්සෙල්ලාම අම්මාට මඳුරු කොයිල් එක යවන්න කියලා. ඇමෙරිකාවේ ගිහිල්ලා කථා කරනවාට වඩා, ඉස්සෙල්ලා තමන් වදාපු අම්මාට මඳුරු කොයිල් එක යවන්න කියන්න. මඳුරු කොයිල් එක ආණ්ඩුවෙන් ගන්න විපක්ෂ නායකතුමා! ගම් බෝතලයක්, පෑන් දෙකක්, භාෆ්ෂීට්, ෆයිල් කවර ඉල්ලා ඒ ලිපිය අත්සන් කරන්නේ මම නොවෙයි, හේමා ප්‍රේමදාස මැතිනිය.

මම ඩුබායි ගියා. Sheikhsලා ඇවිල්ලා හිටියා. Delegation එකේ 430දෙනෙක් හිටියා. අපේ හිටියේ 18දෙනායි. හැම රටකම විශාල පාර්ලිමේන්තු නියෝජනයක් තිබුණා. අපි ඒකේ කරපු contribution එකක් නැති වෙන්න පුළුවන්. හැබැයි, දේශපාලනඥයන් හැටියට අපි ලබපු අත්දැකීමක් තිබෙනවා. අපට ඒකෙන් ඉගෙන ගන්න දෙයක් තිබෙනවා. අපි ඒ අත්දැකීම ලබන්න ඕනෑ. ඒ exposure එක අපට ඕනෑ. ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා ඇතුළු අපි Sectoral Oversight Committeesවල Chairmenලා හැටියට දැන් ඇමෙරිකාවට යන්නේ ඇයි? අපට ඒ

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දැනුම ලබා ගන්න. ඒ දැනුම, ආහාසය අපට ඕනෑ මන්ත්‍රීතුමා. ඒ නිසා ඔබතුමන්ලාගේ විපක්ෂ නායකතුමාට මේක කියන්න. අම්මාට ගම් බෝතලය දෙන්න බැරි, අම්මාට මදුරු කොයිල් එක දෙන්න බැරි, අම්මාට හාෆ්ෂීට් එක දෙන්න බැරි පුතා ඇමෙරිකාව ගැන කථා කරනවා. ඉස්සෙල්ලාම අම්මාගේ මදුරු කොයිල් එක දීලා, ඊටපස්සේ එතුමාට කථා කරන්න කියන්න. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.53]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ, මගේ මිත්‍රයාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. එතුමා ළඟ දැන් ඉඳගෙන හිටියා අධිකරණ රාජ්‍ය ඇමතිතුමා. මම කථා කරන්න පටන් ගත්තාට පස්සේ එතුමා නැඟිට්ටා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ අධිකරණ ඇමතිතුමා මේ ගෙනෙන සංශෝධන ඔක්කෝම අපි අනුමත කරනවා. මීට පෙර දූෂණ විරෝධී පනත ගෙන ආ වෙලාවේත් මම එතුමාට කිව්වා, "ඔබතුමා මේක ගේන්නේ නම් හොඳ චේතනාවෙන්. හැබැයි, මේ ජනාධිපතිතුමා යටතේ නම් මේවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ" කියලා. මම කථාව අවසාන කළේ එහෙමයි. ගරු අධිකරණ ඇමතිතුමනි, අද ඔබතුමා කළ සම්පූර්ණ කථාව මම ගෙදර ඉඳන් අහගෙන හිටියා. ඔබතුමා ඉතාම විශිෂ්ට ගණයේ කථාවක් කළා. එහිදී ඔබතුමා මතක් කළා, ඔබතුමා COPE එකේ Chairman හැටියට කටයුතු කළ කාලයේ ඔබතුමා සහ අපි එකතු වෙලා Sri Lanka Insurance Corporation එක පිළිබඳව ගත්ත තීන්දුව. ඔබතුමා පත් කරපු ඒ Subcommittee එකේ මම තමයි Chairman හැටියට කටයුතු කළේ. අවසානයේ ඔබතුමාට එන්න වුණා විපක්ෂය පැත්තට. Group Meeting එකේදී ඔබතුමාට මඩ ගහනකොට මම විතරයි ආණ්ඩුව පැත්තේ ඉඳගෙන ඔබතුමා වෙනුවෙන් පෙනී සිටියේ.

ගරු ඇමතිතුමනි, මේ සියලු අණ පනත් ඔබතුමා ඉතාම යහපත් චේතනාවෙන් ගෙනාපු අණ පනත්. වර්තමාන ජනාධිපතිතුමාට තිබෙන ජන වරමේ අඩුව නිසා හෝ මොකක් හරි හේතුවක් නිසා මේවා ක්‍රියාත්මක කරන්න බැරි වෙනවා. සමහර කට්ටිය වර්තමාන ජනාධිපතිතුමාගේ කකුලෙන් අදිනවා. එහෙම නැත්නම් එතුමාගේ පක්ෂයේ පැරදුණු උදවිය කකුලෙන් අදිනවා. ඒ නිසා මේවා ක්‍රියාත්මක කරන්න බැරි වෙනවා. රටේ ජනතාව අද උදේ අහගෙන ඉන්න ඇති මේ රටේ අධිකරණ ඇමතිතුමාගේ කථාව. ඔබතුමා කිව්වා, කථානායකතුමාගේ ගේ වටලන්න වෙයි කියලා. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිතුමා හැටියට එතුමා හරියට ක්‍රියාත්මක වෙලා නැහැ ලු. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ නම් කට ඇරුණා, අගමැතිතුමාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්නවාය කියලා කියන්න. නමුත් ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන් කියන්න හැදුවේ, විපක්ෂ නායකතුමා නිසා තමයි මේ වැඩේ කරගන්න බැරි කියන එකයි. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ නම් කට ඇරුණා, අගමැතිතුමාත් ඉන්නවා කියන්න. ඒක ලොකු දෙයක්. අනුරාධ ජයරත්න රාජ්‍ය ඇමතිතුමාත් ළඟ තියාගෙනම ඒක කිව්ව එක ලොකු දෙයක්. ඒ නිසා මේ වෙලාවේ කථානායකතුමා ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන්ට අපි මෙය කියනවා. එහි සිටින සාමාජිකයන් 10දෙනා කවුද? එහි අගමැතිතුමා ඉන්නවා, විපක්ෂ නායකතුමා ඉන්නවා, ජනාධිපතිතුමාගේ නියෝජිතයෙක් ඉන්නවා. එතුමා මගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමති කෙනෙක්. එතුමා මොන ආණ්ඩුව ආවත් හැමදාම ඇමති කෙනෙක් හැටියට කටයුතු කරනවා. හැබැයි කවුරු හිටියත් විපක්ෂ නායකතුමා ඒ වැඩේට විරුද්ධ නම්, බහුතරයට පුළුවන් තීන්දුවක් ගන්න.

මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාත් සුළු කාලයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිටියා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ බහුතරයට පුළුවන්, විපක්ෂ නායකතුමාට බම්බු ගහගන්න කියලා තීන්දුවක් ගන්න. විපක්ෂ නායකතුමා කියන දේම කරන්න ඕනෑ ද? ඒ නිසා මේක විපක්ෂ නායකතුමාගේ ගිණුමට බැර කරලා, අනේ! ක්‍රියාත්මක කරන්න බැරි වුණා කියන කාරණාව මට නම් පිළිගන්න බැහැ.

ගරු අධිකරණ ඇමතිතුමනි, මම දකින විධියට ඔබතුමා තමයි වර්තමාන කැබිනට් මණ්ඩලයේ සිටින, ව්‍යවස්ථාදායකයේ ඇමතිවරයෙකු කරන්න ඕනෑ කාර්යභාරය තේරුම් ගත් පුද්ගලයා. ඔබතුමාට තිබෙන්නේ නීති හදන වැඩේ නේ. ඔබතුමා ඒක හොඳට කරගෙන යනවා. හැබැයි, ඔබතුමා වටේ ඉන්න බොහෝ ඇමතිවරුන්ට ඒක තේරෙන්නේ නැහැ. කෘෂිකර්ම ඇමතිතුමා වෙළෙඳ ඇමතිතුමාට බණිනවා, වෙළෙඳ ඇමතිතුමා කෘෂිකර්ම ඇමතිතුමාට බණිනවා. මහින්දානන්ද මහත්තයා කැරම් බෝඩ් නඩුවට උසාවි යනවා, ඒ කාලයේ හිටපු සභාපති කෙනෙක් අද ඇමති මණ්ඩලයේ ඉඳගෙන ඉන්නවා. ඉතින් මම කියන්නේ මේවා විහිළු. ඒ නිසා අපි මේ වෙලාවේ මේ රට පිළිබඳව එළියේ තියෙන මතය ගැන බලමු. මේ රට පිළිබඳව ජාත්‍යන්තරයේ තිබෙන මතය තමයි අධිකරණයට විධායකය ඇඟිලි ගහනවා කියන එක. අධිකරණය තීන්දුවක් දුන්නා, ව්‍යවස්ථාදායකය මුදල් අනුමත කළා, පළාත් පාලන ඡන්දය පවත්වන්න. එම ඡන්දය පැවැත්වීමට බාධා කරන්න එපාය කියලා තීන්දුව දුන් ශ්‍රේෂ්ඨාධිකරණ ගරු විනිසුරුතුමන්ලා වරප්‍රසාද කමිටුවට කැඳවන්න ඕනෑ කියලා වර්ෂයේ හොඳම පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනාවා. වර්ෂයේ හොඳම පාර්ලිමේන්තු මන්ත්‍රී. You know, Hon. Minister, that there are two types of lawyers, lawyers who appear in courts and speak and "voice-cut lawyers". You know the difference and we saw the difference here today.

ඊළඟට, අර්ථසාධක අරමුදලේ කාරණාවලටත් අදාළ වන පනත් කෙටුම්පතක් ගෙනෙන වෙලාවේ ඒ පනත් කෙටුම්පත ගේන්න සුමානයකට ඉස්සෙල්ලා ජනාධිපතිතුමා කථාවක් පවත්වලා කියනවා, මුදල් බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට, අධිකරණය බලාගෙනයි කියලා. කථානායකතුමාත් ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ ගිරවෙක් වාගේ ඒකම කියනවා.

දැන් මුලතිව් මහේස්ත්‍රාත්තුමා රට ගිහිල්ලා, එතුමාට තර්ජන තිබෙනවා කියලා. මේ කථාවේ අග මුල මමත් දන්නේ නැහැ. ආණ්ඩුවෙන් ප්‍රකාශයක් කෙරුණා, ඒ ගැන අපක්ෂපාතී පරීක්ෂණයක් කරනවාය කියලා. ගරු අධිකරණ ඇමතිතුමනි, හැබැයි අද බළලා මල්ලෙන් එළියට පැන්නා. ආණ්ඩු පක්ෂයේ හිටපු කැබිනට් ඇමති කෙනෙක් - දැන් මන්ත්‍රී කෙනෙක් - කියනවා "නැහැ, නැහැ, මේ මහේස්ත්‍රාත් පිස්සුවක් නේ මේ කරන්නේ" කියලා. මහේස්ත්‍රාත්තුමාට දැන් චෝදනා කරනවා. ඉතින් මහේස්ත්‍රාත්තුමාට චෝදනා කළා කියන වරද නිකම්ම අහු වෙනවා නේ. අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වලා ඒකෙන්

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

කරුණු සොයා ගන්න පෙරම ආණ්ඩු පක්ෂයේ හිටපු කැබිනට් ඇමතිවරයෙක්, දැන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවේ නැඟිටලා කියනවා, මේ මහෙස්ත්‍රාත්තුමා වැරදි තීන්දු දීලා තිබෙන්නේ කියලා; අරක කළා නම් හරි, මේක කළා නම් හරි කියලා පාර්ලිමේන්තුව ඇතුළේ චෝදනා කරනවා. එතකොට ඒ මහෙස්ත්‍රාත්තුමා රට ගියේ වැරදි තීන්දු දීලා වුණත්, නැති වුණත් එතුමා රට ගිය එක ගැන එතුමාට කියන්න පුළුවන්, "පෙනෙන්නේ නැද්ද, ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් තර්ජනය කරනවා, ඕක තමයි මට තිබෙන ප්‍රශ්නය" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ අධිකරණයේ ස්වාධීනත්වයට විධායකය ඇඟිලි ගහනවා. ව්‍යවස්ථාදායකයේ ස්වාධීනත්වයට විධායකය ඇඟිලි ගහනවා. රටක් හැටියට ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පක්ෂය එකට එක්ව, "ඒක එහෙම නැහැ" කියලා කියන්න පුළුවන්. නමුත් කියන්න බැරි, ආණ්ඩු පක්ෂයේ සමහර මැති ඇමතිවරු මෙතැන ඇවිල්ලා කථා කරන්නේ රෙද්දක් ඇඳගෙන ඔළුවෙන් හිටගෙන. මුලතිව් මහෙස්ත්‍රාත්තුමා වැරැද්දක් කරලා ගියා නම්, ඒක පරීක්ෂණයෙන් හසු වෙයි. ඊට ඉස්සෙල්ලා ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු, මන්ත්‍රීවරු මුලතිව් මහෙස්ත්‍රාත්තුමා මෙහෙමයි, මෙහෙමයි කියලා පාර්ලිමේන්තුවේ කියනවා නම්, ඉතින් ඒ කියන්නේ එතුමාට තර්ජනය කරලා තිබෙනවා කියන එක නේ. තර්ජනය කරලා තිබෙනවා. ඒක ඔප්පු වෙනවා. මොකද, අද පාර්ලිමේන්තුවේ එතුමාට තර්ජනය කිරීමක් තමයි කෙරුවේ, වෙන විධියකට. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඒ නිසා අන්න ඒ වාගේ මන්ත්‍රීවරු, ඇමතිවරු එක්කගෙන යන්න ඇමෙරිකාවට. එතකොට දැන ගනියි, හැසිරෙන්න ඕනෑ විධිය. ඒ වාගේ කට්ටිය ගියා නම් ඒ අත්දැකීම ප්‍රයෝජනවත්. ආංශික අධීක්ෂණ කාරක සභාවල සභාපතිතුමන්ලා රට යන්නේ ආණ්ඩුවේ සල්ලිවලින් නොවෙයි. නමුත් මම කියන්න ඕනෑ, අන්න ඒ වගේ කට්ටිය ගියා නම් ප්‍රයෝජනවත්. අඩු ගාණේ රටට ප්‍රශ්නයක් ආපු වෙලාවක පාර්ලිමේන්තුවේ කථා කරන්න ඕනෑ මොනවාද කියලා ඔවුන්ට කියලා දෙන්න.

මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මේකයි. ගරු අධිකරණ ඇමතිතුමනි, අපේ රටේ තිබෙන ඈවර කිරීම - liquidation - පිළිබඳ නීතිය ඉතාම පැරණි එකක්. සමහර මිනිස්සු ජීවිත කාලයේදීම ඉතුරු කරපු සල්ලි ටික The Finance Company එකේ තැන්පත් කළා. නමුත්, ඒ තැන්පත්කරුවන්ට මහ බැංකුවේ ඉන්න නිලධාරින්ගේ අත්තනෝමතික ක්‍රියා නිසා ඒ සල්ලි ටික ගන්න බැරි වුණා. ඒ සම්බන්ධයෙන් නඩුවක් පැවරුවා. ඒ නඩුවේදී කිව්වා, සමාගම ඈවර කරලා සල්ලි ටික දෙන්න කියලා. ඔබතුමාත් දන්නවා, ඒ සමාගම ඈවර කරන්න ගියාම අවුරුදු 10ක් විතර ගතවන බව, ගරු ඇමතිතුමනි. ඒ සල්ලි ටික ගන්න අවස්ථාව ලැබෙනකොට ඒ මිනිස්සු මැරිලා. එමනිසා මෙවැනි අණ පනත් ගෙනාවා වාගේම, ඈවර කිරීම - liquidation - පිළිබඳවත් අලුත් නීති ගෙනැල්ලා, ඒ මඟින් අසාධාරණයට ලක් වෙච්ච පිරිසට සාධාරණය ඉෂ්ට කරන්න කියාත් මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, මම මීට කලින් දිනක කිව්වා වාගේම, ඔබතුමා අවංකවම දූෂණයට, වංචාවට විරුද්ධව ගෙනෙන්නා වූ මේ අණ පනත් ක්‍රියාත්මක කරන්න නම් මේ ජනාධිපතිතුමා යටතේ ඔබතුමාට හැකි වෙන එකක් නැහැ කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා ඉදිරිපත් කළ කරුණු දෙකක් ගැන මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මීට පෙරත් මම කිව්වා, ලංකාවේ තිබුණු බංකොලොත් වූ මූල්‍ය සමාගම් රාශියක් කඩාගෙන වැටුණු බව. මහ බැංකුව ඒවා නිසි පරිදි අධීක්ෂණය නොකරපු නිසා තමයි ඒ සමාගම් කඩාගෙන වැටුණේ කියන එක ගැන කිසිම තර්කයක් නැහැ. ඒ නිසා ලක්ෂ ගණනක නොවෙයි, මම හිතන්නේ මිලියන ගණනක ජනතාව අද වෙනකොට අසරණභාවයට පත්වෙලා ඉන්නවා, ඒ සමාගම්වල තැන්පත් කළ මුදල් ලබා ගන්න විධියක් නැතිව. ඒ මුදල් එකතු කරපු අය එක්කෝ ලංකාවේ නැහැ නැත්නම් ඒ එකතු කර ගත්ත මුදල් වෙන රටවලට ගෙනිහිල්ලා. ඒ නිසා මම මෑතකදීත් ඒ සඳහා යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ අනුව අපි සාමාන්‍යයෙන් මූල්‍ය සමාගම් ඈවර කරන්න යන්නේ නැතිව මහ බැංකුවටම මූල්‍ය බලයක් දෙන්න ඕනෑ, ඒ වාගේ ආයතනවල දේපළ අත්පත් කරගෙන, ඒවා වෙන්දේසියේ දාලා හෝ එම තැන්පත්කරුවන්ට මුදල් ලබා දෙන්න. මොකද, ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඈවර කිරීමේ ක්‍රියාවලියකට යන්න කිව්වොත් ඒ සඳහා ගතවන කාල සීමාවත් එක්ක ප්‍රායෝගිකව depositorsලාට සාධාරණයක් වෙන්නේ නැහැ.

දෙවැනි කාරණය මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මුලතිව් මහෙස්ත්‍රාත්තුමාගේ කාරණය ගැන මම උදේත් පැහැදිලිව කිව්වා. ඒ පිළිබඳව දන්නා කරුණු අපි ප්‍රකාශ කළා. නමුත්, අපට ඒ ගැන කිසිම ආකාරයකින් පූර්ව නිගමනයක් - predetermination - නැහැ. එතුමා හරිද දන්නේත් නැහැ, වැරැදිද දන්නේත් නැහැ. ඒ සම්බන්ධයෙන් අපට කිසිම නිගමනයක් නැහැ. එතුමා ආණ්ඩුවේ පාලනයට යටත් වෙන කෙනෙකුත් නොවෙයි; ජනාධිපතිතුමා විසින් කරන ලද පත්වීමකුත් නොවෙයි. ඒ කියන්නේ එතුමා මුල් අවස්ථා අධිකරණයක විනිසුරුවරයෙක්. එතුමාගේ පත්වීම ලබා දීම, විනය පාලනය කිරීම, ඉවත් කිරීම කියන සියලු බලතල තිබෙන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවට. ඒ නිසා ආණ්ඩුවක් විධියට අපට කරන්න පුළුවන් එකම දේ තමයි, ඒ පිළිබඳව සාධාරණ විමර්ශනයක් කරලා, සත්‍ය තොරතුරු අනාවරණය කරන්න කියලා අධිකරණ සේවා කොමිසමෙන් ඉල්ලීමක් කරන එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.03]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிட்டிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෑත කාලයේ ප්‍රගතියක් පෙන්වපු ක්ෂේත්‍රයක් වන, නීති ක්ෂේත්‍රය ගැනයි මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ජනාධිපති නීතිඥයෙකු හැටියට, රටේ තිබෙන ගැටලු නිරාකරණය කර ගන්න මේ කාලයේ පනත් ගොඩක් සංශෝධනය කරන බව අපි දකිනවා. රටේ විය යුතු දේවල්, කළ යුතු දේවල් වාගේම, එතුමාට අදාළ ක්ෂේත්‍රය තුළ කළ යුතු දේවල් සියල්ල මේ වෙනකොට එතුමා ටිකෙන් ටික

කරගෙන යනවා. ඒ වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාවත් අපට ලැබිලා තිබෙනවා. ඒ නිසා පක්ෂ-විපක්ෂ අපි හැමෝටම පුළුවන් එතුමාට යෝජනා ඉදිරිපත් කරන්න. මේවා විශේෂ පනත් කෙටුම්පත්. එහෙම විශේෂ පනත් කෙටුම්පත් කීපයක් තමයි අදත් සම්මත කරන්න හදන්නේ. මේ සමහර දේවල් ගැන අද පාර්ලිමේන්තුවේදී පක්ෂ-විපක්ෂ මන්ත්‍රීවරු කථා කරනවා. ඒ වාගේම යෝජනා ඉදිරිපත් කරනවාත් මම දැක්කා.

විශේෂයෙන්ම නොයෙක් දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් අපේ රටට ලොකු චෝදනාවක් එල්ල වෙනවා. ඒ ගැන විදේශ රටවලදී, UN එකේදී ආදී හැම තැනකදීම වාගේ කථා කරනවා. ඒ දූෂණ චෝදනා නවත්වා ගන්න තමයි මෙවැනි අණ පනත් ගේන්න අපි ක්‍රියා කරන්නේ. ගරු ඇමතිතුමනි, දූෂණයට විරෝධය දක්වන කෙනෙකු හැටියට ඔබතුමා දූෂණ නවත්වන්න නොයෙකුත් ආකාරයෙන් උත්සාහ කරනවා.

සමථ මණ්ඩලය ගැනත් මම විශේෂයෙන් කථා කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක ඉතා වැදගත් කාරණයක්. මම හිතන්නේ අපේ නීති ක්ෂේත්‍රය දැන් ගැටලු ගොඩක් නිරාකරණය කරන තැනක් බවට පත්වෙලා තිබෙනවා. සමථ මණ්ඩලය කියන්නේ ශ්‍රී ලංකාවේ තිබෙන කුඩා අංශයක් වුණත්, සමථ මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන් එකතුවෙලා, ඔවුන්ට හැකි උපරිම ආකාරයෙන් ලොකු වැඩ කොටසක් කරන බව අපි දකිනවා.

මේක තමයි අවශ්‍යතාව. ඒ සි සමථ මණ්ඩලවල කටයුතු කරගෙන යන්න අවශ්‍ය සහයෝගය දීලා, high-tech භාවිත කරලා ඒවා ක්‍රියාත්මක කරන ක්‍රමයක් ආවොත් හොඳයි කියන එකයි මගේ යෝජනාව. ඒවාට නව තාක්ෂණය යොදා ගන්න පුළුවන් නම් අපි හැමෝටම ඉතා වැදගත් වෙයි. ඔබතුමාගේ මේ අවශ්‍යතාව කාලෝචිතයි, ප්‍රායෝගිකයි.

නඩු කටයුතු ගැන කථා කරනකොට අපි දන්නවා, නඩු කටයුතු පමා වෙන බව. මොකද, අධිකරණ තුළ නඩු විශාල සංඛ්‍යාවක් ගොඩ ගැහිලා තිබෙනවා. සමථ මණ්ඩල පත් කිරීම තුළින් නඩු විශාල සංඛ්‍යාවක් දැන් clear වෙනවා; ඒ නඩු කඩිනමින් අහලා අවසන් වෙනවා. දැන් සමථ මණ්ඩලය හොඳින් ක්‍රියාත්මක වෙන බව අපි දකිනවා. ඒ ගැන නීති ක්ෂේත්‍රය තුළත් කථා කරනවා, රටේ ජනතාවත් කථා කරනවා. හැබැයි, අපි යම් කිසි විධියකට මේ කටයුතු නියාමනයක් කළ යුතුයි. මහේස්ත්‍රාත් අධිකරණවල ගොඩ ගැහිලා තිබෙන නඩු මේ වන විට යම් කිසි මට්ටමකට අඩු කරගෙන යන ක්‍රමයක් ඔබතුමා ක්‍රියාත්මක කරන ආකාරය අපි දැන් දකිනවා. ඒ වාගේම ගෙවුණු දශක කිහිපය තුළ සමථ මණ්ඩල කටයුතු සාර්ථකව ක්‍රියාත්මක වූ බවත් අපි දැක්කා. ඒ වාගේම සුළු ඉඩම් ආරාවුල්, සුළු මුදල් ආරාවුල් නිරාකරණය දැන් යම් කිසි මට්ටමකට සමථ මණ්ඩලවලින් ක්‍රියාත්මක වෙනවා. ජනතාව ඒ ගැන ඉතා සතුටින් ඉන්නවා. ඒක තමයි අපේත් අවශ්‍යතාව. කාලය, මුදල්, අධිකරණයේ තදබදය, වැයවීම්, නාස්තිවීම් වළක්වන්න දැන් සමථ මණ්ඩලය හොඳින් ක්‍රියාත්මක වෙනවා. නඩු එක්රොක් වීම, සිවිල් ප්‍රජාවගේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ විශේෂයෙන්ම අධිකරණය කෙරෙහි අප්‍රසාදයට පත් වීම හේතුවෙන් තමයි මේ සමථ මණ්ඩල හඳුන්වා දීලා තිබෙන්නේ. ඒක වැදගත් දෙයක්. විශේෂයෙන්ම සමථ මණ්ඩලයලදී නීතිඥවරයෙකු පෙනී සිටින්න ඕනෑ නැහැ. එතකොට වියදමත් අඩු වෙනවා. ජනතාවට තිබෙන ගැටලු කථා කරන්න, ජනතාවට තිබෙන ප්‍රශ්නය කියන්න තිබෙන වැදගත් සභාවක් තමයි, සමථ මණ්ඩලය. ඒ සමථ මණ්ඩලයේ ඉන්න සාමාජිකයන් ඉතා හොඳින් ක්‍රියාත්මක වෙනවා අපි දැකලා තිබෙනවා. ඔවුන් පුළුවන් උපරිමයෙන් අවශ්‍ය විසඳුම් දෙන්නත් කටයුතු කරනවා.

ගරු අධිකරණ අමාත්‍යතුමනි, මම යෝජනාවක් වශයෙන් කරන්නේ ඉදිරියට සමථ මණ්ඩලයට රැස් වෙන්න ස්ථිර ස්ථානයක් -පාසලක් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වාගේ ස්ථානයක්- නම් කරන්න පුළුවන් නම් හොඳයි කියන එකයි. එය ඉතා ම වැදගත්. එතකොට එම ආයතනයටත් ගාම්භීරත්වයක් ලැබෙනවා, ඉතා හොඳ ස්ථානයකට, එහෙම නැත්නම් රාජ්‍ය ආයතනයකට ඇතුළු වෙලා ජනතාවගේ ප්‍රශ්න නිරාකරණය කර ගන්න අවස්ථාවකුත් ලැබෙනවා. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වාගේ ස්ථානයක් යොදාගන්න පුළුවන් නම් ගොඩක් හොඳයි. මොකද, ඒ ආයතන ඉදිරියට වහලා තිබෙන්නේ. ඒ auditorium එක වාගේ ස්ථානයක් ගන්න පුළුවන් නම් ඉතා වැදගත්. විශේෂයෙන්ම සමථ මණ්ඩලයේ නිලධාරින්ගේ ඇඳුම ගැනත් විශේෂත්වයක් දක්වන්න ඕනෑ. සමහර අය ටයි පටිය දාලා, කොලර් එක තිබෙන ෂර්ට් එක ඇඳලා එනවා. ඒ ඇඳුමත් හොඳයි. ඒ ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම සමථ මණ්ඩලයේ සියලු නිලධාරින් වාර්තා සියල්ල ලියන්නේ අතින්. ගරු අමාත්‍යතුමනි, මේක ටිකක් බැරෑරුම් කාරණයක්. පොලිසියෙන් කවුරුන් හෝ කෙනෙක් සමථ මණ්ඩලයට යොමු කරවනවා නම්, පිටපත් හතරකින් එම වාර්තාව ලියන්න ඕනෑ. උසාවියකින් යොමු කරනවා නම්, පිටපත් පහකින් එම වාර්තාව ලියන්න ඕනෑ. ඒ කටයුත්ත පැවරිලා තිබෙන්නේත් සභාපතිවරයාට. එහෙම නැත්නම්, සාමාජිකයන් සියලුදෙනා එකතු වෙලා ලියලා තමයි ඒ පිටපත් ලබා දෙන්නේ. මේක ඉතා අමාරු කාර්යයක්. සමථ මණ්ඩලය තවදුරටත් ව්‍යාප්ත වෙලා ක්‍රියාත්මක වෙනකොට මේක ටිකක් අමාරු කාර්යයක් වෙනවා. අපි මේ කටයුත්ත අලුත් තාක්ෂණය භාවිත කරලා කරමු. ඇත්තටම මේ සඳහා පරිගණකය භාවිත කරන්න පුළුවන්. අපට මේ වෙලාවේ මුදල් අර්බුදයක් තිබෙන බව අපි දන්නවා. හැබැයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් එක්ක සම්බන්ධ වුණා නම් මේ කාර්යය පහසුවෙන් කර ගන්න පුළුවන්. මොකද, ඕනෑ තරම් නිලධාරින් එම කාර්යාලවල ඉන්නවා. ඕනෑ නම් මේ කාර්යය සඳහා ඉරිදා දවසට නිලධාරියෙක් වෙන් කර ගන්නත් පුළුවන්. ඒ භූමිය සකසා ගන්න අවශ්‍ය කණ්ඩායමකුත් ඕනෑ නම් ගන්න පුළුවන්. මේ වෙලාවේ ඔවුන්ගේ උදව් අවශ්‍ය නම් ලබා ගන්නත් පුළුවන්. එතකොට අවශ්‍ය පිටපත්වල printouts ගන්න පුළුවන්.

ඒ වාගේම ඒ කටයුතු අධිකරණ ක්‍රියාවලියට හා පොලිසියේ ක්‍රියාවලියට link කරලා තිබෙනවා නම් පොලිස් වාර්තා ලබා දීමේදීත් ඉතා පහසු වෙනවා. එහෙම නැත්නම් සමථ මණ්ඩලයේ වාර්තාව හොයා බලා තමයි පොලිස් වාර්තාව ලබා දෙන්න වෙන්නේ. දැනට තිබෙන්නේ ඒ කටයුතු ගොඩක් කල් යන ක්‍රමයක්. මේ සඳහාත් සුදුසු ක්‍රමයක් ඔබතුමාට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් මම හිතන්නේ ඉතා වැදගත් වෙනවා කියලායි. ඒ වාගේම ඒ අයට external hard disk එකක් දීලා තියන්න පුළුවන් නම්, ඒ document එක ඒ විධියටම ආරක්ෂා කර ගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මේ කටයුතු සඳහා සුළු සේවකයනුත් යොදවා, සමථ මණ්ඩලවල කටයුතු කරන සාමාජික මහත්ම මහත්මීන්ගේ අභිමානය රැකෙන ආකාරයෙනුත් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් ගොඩක් වටිනවා.

විශේෂයෙන්ම ඒවාට අධීක්ෂණ නිලධාරින් පත් කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා. අධීක්ෂණයකුත් කළ යුතුයි. ගරු අමාත්‍යතුමනි, follow-up එකක් කරන්න පුළුවන් නම් ඉතාම වැදගත් වෙයි කියලා මම හිතනවා. ඔවුන් මොනවාද කරන්නේ කියලා follow-up එකකුත් කරන්න ඕනෑ. ඒ වාගේම, රහස්‍යභාවය රකින එක ගැනත් අවශ්‍ය කරුණු මේකට ඇතුළත් කරන්න පුළුවන් නම් ගොඩක් හොඳයි.

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

ඒ වාගේම, මෙතැනදී ඒ සාමාජිකයන්ගේ ශාරීරික යෝග්‍යතාව බලනවා කියලා මම දන්නවා. නමුත්, ඒක බැලීමේදී age limit එකකුත් තිබෙන බව අපි සැලකිල්ලට ගන්න ඕනෑ. නමුත්, සමහර අවස්ථාවලදී ශාරීරික යෝග්‍යතාවත් බලන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු කාලයක් දෙන්න.

විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව දැන් කථා කළා. මේක ලොකු ප්‍රශ්නයක්. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා පක්ෂ, විපක්ෂ වශයෙන් බෙදිලා කථා කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් පත් කර ගැනීමේදී විශේෂයෙන්ම විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයක් තිබෙන බව තමයි අපි දකින්නේ. මේක ක්‍රියාත්මක කරවන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ගරු කථානායකතුමාටත් ලොකු වගකීමක් තිබෙනවා. මේක ක්‍රියාත්මක කළ යුතුයි. එහෙම නැත්නම් වැඩක් නැහැ. රට ඉස්සරහට යන්න නම් අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරියට ක්‍රියාත්මක වුණා නම් අපේ මේ ගැටලුවලට යම්කිසි ප්‍රමාණයකින් උත්තර ලැබෙනවා. අපට අවශ්‍ය උත්තර එතැන තිබෙනවා. ඒක ක්‍රියාත්මක නොකරන නිසා තමයි අපි මේ තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ. ගරු අමාත්‍යතුමනි, යෝගට් හැදි, ප්ලාස්ටික් බට භාවිතය නවත්වන්න අවුරුදු දෙකක ඉඳන් මම fight කළා. මම ඒ සඳහා අවුරුදු දෙකක් fight කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම අවුරුදු දෙකක් තිස්සේ fight කරලා පසුගිය පළමුවැනි දා ඉඳන් තමයි යෝගට් හැදියි, ප්ලාස්ටික් බටයි භාවිතය නවත්වා ගන්න පුළුවන් වුණේ. අවුරුද්දකට ප්ලාස්ටික් ටොන් තුනහමාරක් recycle කරන්නේ නැතිව අපේ මහ පොළොවට එකතු වෙනවා. ඒක නවත්වා ගන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට ඉඳලාත් මට අවුරුදු දෙකක් ගියා. අපේ රටට ගෙන්වන අර්තාපල්වලට tax එකක් දා ගන්න මට තවම බැරි වුණා. ඒ ගැන මට හරි දුකයි. අපේ ප්‍රදේශවල සිටින අර්තාපල් ගොවීන් ප්‍රශ්න ගොඩක ඉන්නේ. ගරු අමාත්‍යතුමා ඒකට අවශ්‍ය කටයුතු කළා. ඒ හැම දෙයක්ම කරලා Treasury එකටත් ගියා. නමුත්, එතැනින් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා අපට අර්තාපල්වලට tax එක දා ගන්න බැරි වුණා. එහෙම වීම ගැන මට හරිම දුකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැමදෙයක්ම ඉතා කඩිනමින් ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

අධිකරණ අමාත්‍යතුමනි, ඔබතුමාගේ කාර්යභාරය නිසියාකාරයෙන් ඉෂ්ට කරලා, අධිකරණ පද්ධතිය නඩත්තු කරන්න උත්සාහ ගැනීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා. ඒ තුළින් ජනතාවට සේවයක් කරන්න ඔබතුමාගෙන් ලැබෙන ඒ ශක්තිමත් දායකත්වයට ගෞරවනීය ස්තුතිය පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.13]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

මගේ කථාව පටන් ගන්න කලින් එක කාරණයක් කියන්නට ඕනෑ. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා අපි ගැනත් සඳහන් කරමින් අද කථා කළා. එතුමා බොහොම උනන්දුවෙන් කථා කරමින් කිව්වා, මේ රාජ්‍ය නිලධාරීන් අපේ රටට ලැබෙන බදු විශාල වශයෙන් මහ හරිනවා, පැහැර හරිනවා, හංගනවා කියලා. එතුමා ඒ ගැන කථා කරපු එක හොඳයි. ඒක හොඳ යෝජනාවක්. හැබැයි, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමන්ලා එදා ඇමතිවරු වෙලා ඉන්නකොට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට ඇවිල්ලා, එතුමා ඒ තැනට ගේන්න කටයුතු කරපු ගජමිතුරු ව්‍යාපාරික ජාලයට මහා දානයක් දුන්නා. සීනිවලට විශාල බදු සහනයක් දුන්නා. එදා සීනි කිලෝග්‍රෑම් එකකට අය කළ රුපියල් 50ක බද්ද ශත 25 දක්වා අඩු කෙරුවා. පොල්තෙල්වලටත් ඒ විධියේ විශාල බදු සහනයක් දුන්නා. ඒක රුපියල් බිලියන 800ක බදු සහනයක්. ඒ රුපියල් බිලියන 800ක බදු සහනය වෙනුවෙන් අත උස්සපු මන්ත්‍රීවරයා,-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න, මම ඔබතුමාගේ කථාවට බාධා කරනවා නොවෙයි. මම අධිකරණ ඇමතිතුමාට කියන්නේ ඒ වැරදි කරපු සියලුදෙනාට දඬුවම් දෙන්න කියලායි. මම කවුරුවත් බේරන්නේ නැහැ. සීනිවලින් වංචාවක් කළා නම් එයාටත් දඬුවම් දෙන්න ඕනෑ. සුරාබදුවලින් වංචාවක් කළා නම් එයාටත් දඬුවම් දෙන්න ඕනෑ. ඒ ඔක්කෝටම දඬුවම් දෙන්න ඕනෑ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අනිවාර්යයෙන්ම.

ඔබතුමාට දැන් මොළේ පහළ වෙලා තිබෙන එක ගැන අපි සතුටු වෙනවා. හැබැයි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා මේ රටට රුපියල් බිලියන 800ක බදු අහිමිවීමක් වෙන්න ඉඩ හරිද්දී, අපේ භාණ්ඩාගාරයට ලැබෙන්න තිබුණු ඒ බදු මුදල් ලැබෙන එක වළක්වද්දී ඒකට පක්ෂව ඔය දෑත, ඔය සුරතම තමයි ඔබතුමා එදා ඉස්සුවේ. ඔබතුමා කථා කරන්න දක්ෂයි. හැරෙන හැරෙන විධියට ඔබතුමාට කථා කරන්න පුළුවන්. ඔබතුමා කෘෂිකර්ම ඇමතිවරයා හැටිවට සිටි කාලයේ අපි පාර්ලිමේන්තුවේ ප්‍රශ්න ඇහුවා, මේ රටේ කෘෂි කර්මාන්තය බිමට වට්ටන්න ද, සමතලා කරන්න ද හදන්නේ කියලා. මේ වාගේ පොහොර ප්‍රතිපත්තියක් ගේන්නේ ඇයි කියලා අපි එදා ඇහුවා. හැබැයි, ඔබතුමා කිව්වේ මොනවාද? මහින්දානන්ද ඇමතිවරයා කළුතර ගිහිල්ලා, මහින්දානන්ද කියන ගොවියා එක්ක කථා කෙරුවා. ඒ කියන්නේ, ඇමතිවරයාම ප්‍රශ්න අහනවා; උත්තරය දෙන්නේත් ඇමතිවරයාමයි. එහෙම කරලා ගෝඨාභය රාජපක්ෂගේ කාබනික පොහොර ප්‍රතිපත්තිය වැඩිදියුණු කරන්න ඔබතුමා කටයුතු කළා. එහෙම කරලා මේ රටේ කෘෂි කර්මාන්තය බින්දුවටම වට්ටපු ඇමතිවරයෙක් අද මේ ගැන කථා කරන එක ගැන අපි සතුටු වෙනවා. ඒ එක්කම සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ මව ගැනත් ඔබතුමා කථා කළා. හැබැයි, ඔබතුමා ෆෝන් එකෙන් මෙන්න මෙහෙම පෙන්නලා, මෙහෙම පෙන්නලා ලිපියක් සභාගත කරනවා, සභාගත කරනවා කියලා කිව්වාට, ඒ ලිපිය සභාගත කළා ද කියන්න අපි දන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, වගකීමෙන් කියන්නේ. හේමා ප්‍රේමදාස මහත්මියගේ අත්සන සහිත එම ලිපිය මම සභාගත කළා. ඊයේ හවස බඩු ටිකත් ගෙදරට යැව්වා. මතක් කරලා මදුරු කොයිල් එකත් යැව්වා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
හොඳයි.

අධිකරණ ක්ෂේත්‍රයට අදාළ පනත් කිහිපයක් ගැන කථා කරන මේ වෙලාවේ මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ සම්බන්ධව ඊයේ පෙරේදාත් අපට තවත් අපකීර්තියක් අත්වුණ බව. මුලතිව් දිසා විනිසුරුවරයා ඉල්ලා අස් වුණා විතරක් නොවෙයි, මේ වෙනකොට රටිනුත් පිට වෙලා ගිහිල්ලා තිබෙනවා. අධිකරණමය පරීක්ෂණයක් සිදු වෙන අවස්ථාවක සරත් වීරසේකර මන්ත්‍රීවරයා -දේශපාලනඥයා- ඒ ස්ථානයට ගිහිල්ලා විරෝධතා දක්වනවා නම්, අදහස් දක්වනවා නම්, අපේ රටේ අධිකරණ පද්ධතිය සුරක්ෂිතයි, අපි අපේ අධිකරණ පද්ධතිය ආරක්ෂා කරනවාය කියලා සහතික වෙන්නේ කොහොමද? මේවා නිසා ජාත්‍යන්තරය තුළ අපි අපකීර්තියට පත් වෙනවා. මහෙස්ත්‍රාත් අධිකරණයේ විනිසුරුවරයෙක් යම් ස්ථානීය පරීක්ෂණයක් කරන්න යනකොට මේ රටේ දේශපාලනඥයෙක් එතැනට ගිහිල්ලා බලපෑම් කරනවා නම්, ඒ අධිකරණ ක්‍රියාවලියට බාධා කරනවා නම්, අධිකරණයට අපහාස කිරීම යටතේ හරි නම් සරත් වීරසේකර මහත්මයා අත්අඩංගුවට ගන්න ඕනෑ. නමුත් සිද්ධ වුණේ ඒක නොවෙයි. ඒ විනිසුරුවරයා ඉල්ලා අස් වුණා. ඔහු මේ වෙනකොට රටිනුත් ගිහිල්ලා ඉවරයි.

ඊයේ පෙරේදා අපි දැක්කා, ජනාධිපතිතුමා ජර්මනියේ බර්ලින්වල පැවැති ගෝලීය සංවාද සමුළුවට ගිහිල්ලා ජර්මනියේ රූපවාහිනී නාළිකාවක සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වූ බව. ඒ සම්මුඛ සාකච්ඡාව බලනකොට මට පුදුම හිතුණා, මේ අර අපිත් එක්ක ඒ කාලයේ හිටපු රනිල් වික්‍රමසිංහද කියලා. එතුමා සම්පූර්ණයෙන් වෙනස් වෙලා. පාස්කු ප්‍රහාරය ගැන ජාත්‍යන්තර පරීක්ෂණයක් ගැන අහනකොට එතුමා කියනවා, අපට විදේශීය කණ්ඩායම් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒක අපි අපේ රටේම කරනවා කියලා. රනිල් වික්‍රමසිංහ මහත්මයා තමයි එහෙම කියන්නේ. හරියට නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ වාගෙයි. මේ රටේ මේ පරීක්ෂණ කරන්නේ, හොරුන්ගේ හොරකම් පරීක්ෂා කරන්නේ හොරුම නිසා ජාත්‍යන්තර පරීක්ෂණයක් ගැන අහනකොට ජර්මනියේ ඒ රූපවාහිනී නාළිකාවට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා කියනවා, අපි විදේශීය සහාය ලබා ගන්නේ නැහැ කියලා. තවදුරටත් මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් එතුමා කියනවා, මානව හිමිකම් කවුන්සලයේ Report එක, ඒ චෝදනා කිසිවක් පිළිගන්නේ නැහැ කියලා. අපට පුදුමයි. පෝද්දල ජයන්තට ගහනකොට, එතුමාගේ හෙොඳ මිත්‍රයෙක් වූ ලසන්ත වික්‍රමතුංග ඝාතනය කරනකොට හඬ නඟපු රනිල් වික්‍රමසිංහ මහත්මයාට හත්දෙයියනේ මේ මොකක්ද වෙලා තිබෙන්නේ? මේ මොකක්ද වෙලා තිබෙන්නේ, අපේ හිටපු රනිල් වික්‍රමසිංහ මහත්මයාට? රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඒ අදහස් ආවේ කොහොමද කියලා අපට පුදුමයි. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරපු, යහපාලනය ගැන කථා කරපු, මානව හිමිකම් ගැන කථා කරපු රනිල් වික්‍රමසිංහ මහත්මයාට, අන්තර්ජාතික ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමයේ සභාපති වෙලා හිටපු රනිල් වික්‍රමසිංහ මහත්මයාට දැන් මේ ජනාධිපති ධුරය භාර ගත්තාට පස්සේ මොකක්ද වෙලා තිබෙන්නේ?

මට මතක් වෙනවා, අර ගිරා පැටවු දෙන්නාගේ කථාව. ගිරා පැටවු දෙන්නෙක් හිටියා. එක ගිරා පැටවෙක් භාවනා කරන බමුණන් පිරිසක් ළඟට ගියා. අනෙක් ගිරා පැටවා හොරු රැළක් ළඟට ගියා. අන්තිමට බමුණන් ළඟට, තවුස්දම් වඩන තවුසන් ළඟට ගිය ගිරා පෝතකයා බොහොම ශාන්තදාන්ත, බොහොම නිවිච්ච ගිරවෙක් වුණා. හොරු රැළ ළඟට ගිය ගිරා පැටියා කුණුහරුප කියන, තක්කඩි බස් කියන, නන්නත්තාර, පට්ටපල් ජරා ගිරවෙක් බවට පත් වුණා. එතකොට අපිත් එක්ක හිටපු ඒ ගිරවාට, රනිල් වික්‍රමසිංහ කියන ජනාධිපතිතුමාට මහින්දානන්ද මහත්මයලා ඇතුළු රාජපක්ෂලා කියන

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගියාට පස්සේ දැන් මොකක්ද මේ වෙලා තිබෙන්නේ? එතුමාටත් අර ගිරවාට වෙච්ච දේම සිද්ධ වෙලාය කියලා මම මේ අවස්ථාවේදී කියනවා.

විශේෂයෙන්ම අද රාජපක්ෂ මහත්වරුන්ටත් වඩා රාජපක්ෂ මතවාදය ආරක්ෂා කරන රාජපක්ෂ කෙනෙකු බවට රනිල් වික්‍රමසිංහ මහත්මයා පත් වෙලා ඉන්නවා. රනිල් වික්‍රමසිංහ මහත්මයාට කියන්නේ දැන් රනිල් රාජපක්ෂ කියලා. සාධාරණයි. රටේ ජනතාව එහෙම කියන එක සාධාරණයි. කෝට් එකට උඩින් සාටකයක් දාගෙන එන කෙනෙක් අපි තවම මේ පාර්ලිමේන්තුවේ දැක්කේ නැහැ. ඒ නිසා අපි යෝජනා කරනවා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට, පොඩි වෙනසක් වෙන්නත් එක්ක ඔය කෝට් එකට උඩින් අර ගිරුවාපත්තුවේ කුරහන් සාටකයත් දාගෙන මේ පාර්ලිමේන්තුවට එන්න, මේ වැඩ කටයුතුවලට සම්බන්ධ වෙන්න කියලා. ඒක බොහොම හොඳයි. මේක කබරගොයා තලගොයා වෙන න්‍යාය. ඒ කඳවුරේ අය රනිල් වික්‍රමසිංහ මහත්මයාට ජනාධිපතිකම දුන්නා. එතකොට රාජපක්ෂවරු රැකීම-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි දෙකක් වැඩිපුර දෙනවා කිව්වා.

කන්න ඕනෑ වුණාම කබරගොයාත් තලගොයා වෙනවා වාගේ, රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් කබරගොයා තලගොයා කරගෙන මේ ජනාධිපති ධුරය භුක්ති විඳින බව අපට පෙනෙනවා.

ඒ එක්කම මේ කාරණයත් මම කියන්න ඕනෑ. පොලීසිය භාර ඇමති ටිරාන් අලස් මහත්මයා අද පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා, සමාජ මාධ්‍ය නියාමනය සම්බන්ධයෙන්. මේක ගෙනෙන්න ඕනෑ පොලීසිය භාර ඇමතිවරයා නොවෙයි. සමාජ මාධ්‍ය නියාමනය කිරීමේ වගකීම හා සම්බන්ධ පනත් කෙටුම්පත ගෙනෙන්න ඕනෑ එක්කෝ ජනමාධ්‍ය ඇමතිවරයා, එහෙම නැත්නම් අධිකරණ ඇමතිවරයා. සමාජ මාධ්‍ය නියාමනය පිළිබඳව පොලීසියට තිබෙන අයිතිය මොකක්ද? පොලීසිය හා සම්බන්ධ විෂය පථයට කොහොමද මේක එකතු වෙන්නේ? පොලීසිය භාර ඇමතිවරයා මේ පනත් කෙටුම්පත ගෙනෙන එකෙන්ම අපට පෙනෙනවා මේ කරන්න හදන මර්දනය. පොලිස් රාජ්‍යයක් බවට මේ රට පත් කරන්න

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

හදන බව, නීති-රීති, අණපනත් මඟින්, පොලීසිය මඟින් කරන මර්දනය තුළින් මේවා යටපත් කරන්න හදන බව අපට පෙනෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියනවා. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් දැන් මෙතැන හිටියා නම් හොඳයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇතුළු 18දෙනෙකුගෙන් සමන්විත delegation එකක් එක්සත් ජාතීන්ගේ සංවිධානයත් එක්ක සාකච්ඡාවකට ගියා කිව්වා. අපි ඇහුවා, එහිදී මොකක්ද කළේ කියලා. අලි සබ්රි මහත්මයා කියන්නේ හිටපු අධිකරණ ඇමති, හිටපු මුදල් ඇමති. එතුමා අධිකරණ ඇමති හැටියට සිටියදී අන්තිමට ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ගෙදර යවලා තමයි නැවතුණේ. එතුමා මුදල් ඇමතිවරයා හැටියට ඉද්දී මේ රට බංකොලොත් කියන ඒ භයානක ප්‍රකාශය කළා. මේ රට බංකොලොත් කියලා ප්‍රකාශ කරපු ලංකාවේ එකම මුදල් ඇමතිවරයා එතුමායි. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇතුළු ඒ delegation එකත් එක්ක ඒ සාකච්ඡාවට ගිහිල්ලා ඉන්දියාවයි, කැනඩාවයි අතර තිබෙන ප්‍රශ්නයකට එතුමා මැදිහත් වුණා. ඒවා පණ්ඩිතකම්. මංගල සමරවීර මහත්මයලා, ලක්ෂ්මන් කදිර්ගාමර්ලා, ජී.එල්. පීරිස් මහත්මයලා බොහොම ලස්සනට විදේශ ඇමතිකම හැසිරෙව්වා. ඉන්දියාවයි, කැනඩාවයි අතර තිබෙන රාජ්‍ය තාන්ත්‍රික ප්‍රශ්නයකට කට දාන්න එතුමාට මොකක්ද තිබෙන අමාරුව? කථාවක් තිබෙනවා නේ, මුහුදේ තෝරු, මෝරු රණ්ඩු වෙනකොට හාල්මැස්සෝ මැදට පැන්නාම වෙන දේ. කාරල්ලෝ හැදිලා තිබෙන්නේ එහෙමලු. තෝරු, මොරු රණ්ඩු වෙනකොට ඒ මැද්දට හාල්මැස්සෝ පැනලා ඒවා ෂේප් කරන්න ගියාම තැළිලා වප්ප වෙලාලු, කාරල්ලා හැදුණේ. "පාන්" කියා ගන්න බැරිව ඉන්න මේ වාගේ රටක අලි සබ්රි මහත්මයා ඉන්දියාව සහ කැනඩාව වාගේ රටවල් දෙකක් අතර තිබෙන ජාත්‍යන්තර ප්‍රශ්නයකට දාන ටෝක් මොනවාද? රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගෙන් අපි අහනවා, ඔබතුමා එක්කගෙන යන දූත කණ්ඩායමට මෙහෙම අය අරගෙන ගිහිල්ලා ඒ වාගේ ප්‍රකාශ කරලා, තෝරු, මෝරු මැද්දට පැනලා ඒ වාගේ පණ්ඩිත කථා කියලා අපේ රටට ලබාගන්න ජයග්‍රහණය මොකක්ද කියලා. ඒකෙන් වෙන්නේ කොහේ හරි තිබෙන රටක් අපිත් එක්ක තරහ වෙන එකයි. ඒ නිසා කරුණාකර රාජ්‍ය තාන්ත්‍රික කාරණාවලදී, මීට වැඩිය ශීලාචාර වෙන්න, තවදුරටත් සෙල්ලම් දාන්න පුළුවන් රටක් නොවෙයි අපට ඉතුරු වෙලා තිබෙන්නේ කියලා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
Sir, I propose that the Hon. Thushara Indunil Amarasena do now take the Chair.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு துஷார இந்துனில் அமரசேன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. U.K. SUMITH UDUKUMBURA left the Chair, and THE HON. THUSHARA INDUNIL AMARASENA took the Chair.*

[பி.ப. 3.25]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ அமைச்சர் விஜயதாஸ ராஜபக்ஷ அவர்களால் கொண்டுவரப்பட்டிருக்கின்ற சட்டமூலங்களையும் பிரேரணைகளையும் நாங்கள் ஆதரிக்கின்றோம். நாட்டுக்கு தேவையான அத்தியாவசியமான சட்டமூலங்களையும் பிரேரணைகளையும் உரிய நேரத்தில் அவர் கொண்டுவந்திருக்கிறார். அதற்காக அவருக்கு நன்றி கூறுகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய அமைச்சுக்குக்கீழ் வருகின்ற மஹர சிறைச்சாலையோடு சேர்ந்ததாக 1903ஆம் ஆண்டு பிரித்தானியரது ஆட்சிக் காலத்தில் ஒரு பள்ளிவாசல் கட்டப்பட்டது. அது மலே சமூகத்தைச் சார்ந்தவர்களுக்காகக் கட்டப்பட்ட ஒரு பள்ளிவாசலாகும். அந்தப் பகுதியில் இருக்கின்ற கிட்டத்தட்ட 350 குடும்பங்களைச் சேர்ந்தவர்கள் அந்தப் பள்ளிவாசலில் தொழுது வந்தார்கள். இந்த நாட்டில் நிகழ்ந்த 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் பின்னர், அந்தப் பள்ளிவாசலை prison நிர்வாகத்தினர் மூடிவிட்டார்கள். அந்தப் பள்ளிவாசல் சம்பந்தமாக அகில இலங்கை ஜம்இய்யத் துல் உலமா விடுத்த வேண்டுகோள்களையும், அந்தப் பள்ளிவாசலின் பதிவுச் சான்றிதழையும் நான் ***ஹன்சாட்டில்*** பதிவுசெய்வதற்காகச் *சமர்ப்பிக்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இவற்றின் ஒரு copyஐ நான் உங்களுக்கும் தருகின்றேன். தயவுசெய்து, மக்களுக்குத் தொழுவதற்கு அந்தப் பள்ளியை மீண்டும் திறந்து கொடுக்கு மாறு நான் உங்களிடத்தில் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

அண்மையில் இந்த நாட்டில் இனவாதமும் பேரினவாதமும் தலைதூக்கின. Dr. Shafi போன்றவர்கள்மீது பொய்யான வழக்குகள் போடப்பட்டு, அவர்கள் சிறையில் அடைக்கப்பட்ட சம்பவங்கள் உங்களுக்குத் தெரியும்! அவர்கள்மீது குற்றச் சாட்டுக்களைச் சுமத்தியவர்கள் இன்று ஊமைகள்போல்

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

இருப்பதை நாங்கள் பார்க்கின்றோம். Prof. Rezvi Sheriff என்பவர் இந்த நாட்டிலுள்ள பிரபலமான ஒரு வைத்தியர்! அவர் kidney மாற்றுச் சிகிச்சை செய்வதில் வல்லுநர்! அவர்தான் இந்த நாட்டில் முதலாவதாக kidney மாற்றுச் சிகிச்சையைச் செய்தவர். அவர்மீதுகூட, இனவாத சக்திகள் குற்றச்சாட்டுக்களைச் சுமத்தி, சிறைக்கு அனுப்புவதற்கான சதிகளைச் செய்தார்கள். எனினும், அவர் அந்தச் சதிகளிலிருந்து பாதுகாக்கப்பட்டார்.

அண்மையில் நாங்கள் இந்த நாட்டில் ஒரு சம்பவத்தைப் பார்த்தோம். அதாவது, 53 வயதுடைய இரண்டு பிள்ளைகளின் தாயான பாஹிமா என்ற வைத்தியர் சுகயீனமுற்றிருந்த நிலையி லும், இரண்டு மாதக் குழந்தையின் உயிரைக் காப்பாற்று வதற்காக வைத்தியசாலைக்குச் சென்றிருந்தார். அப்போது, அவருக்கு இரத்த அழுத்தம் அதிகரித்ததால் மரணமடைந்தார். இவ்வாறு இந்த நாட்டு மக்களுக்கு நல்ல பணிகளைச் செய்கின்ற பல வைத்தியர்கள் எமது சமூகத்தில் இருந்தாலும், அவர்கள் பற்றி இந்தச் சபையில் யாரும் சொல்வதும் இல்லை; அவர்களைப் பாராட்டுவதும் இல்லை. நான் இச்சந்தர்ப்பத்தில் டாக்டர் பாஹிமா சஹாப்தீன் அவர்களுடைய சேவையைப் பாராட்டுகின்ற அதேநேரம், Dr. Shafi, Prof. Rezvi Sheriff போன்றவர்களையும் இன்னும் பல கல்விமான்களையும் இந்தச் சபையில் பல பாராளுமன்ற உறுப்பினர்கள் கேவலப்படுத்திய தையும் ஞாபகப்படுத்துகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய அமைச்சு க்குக்கீழ் வருகின்ற சட்டமா அதிபர் திணைக்களம் - Attorney-General's Department - கோட்டாபய ராஜபக்ஷ ஆட்சிக்கு வந்த பிறகு, ஏற்கெனவே தாக்கல் செய்யப்பட்டிருந்த சில வழக்கு களை வாபஸ்பெற்றதன்மூலம் இந்த நாட்டில் பல சதிகள் நடைபெற்றதை நீங்கள் அறிவீர்கள்! இந்தத் திணைக்களம் இவ்வாறான நிலையிலிருந்து விடுபட்டு, நேர்மையான, நீதியான திணைக்களமாக மாறுகின்றபொழுதுதான், இந்த நாட்டில் வாழுகின்ற சமூகங்கள் குறிப்பாக சிறுபான்மைச் சமூகங்கள் இத்திணைக்களத்தின்மீதும் இந்த நாட்டின் சட்டம் ஒழுங்கின்மீதும் பொலிஸார்மீதும் நீதிமன்றங்களின்மீதும் நம்பிக்கை கொண்டு வாழ்வார்கள். இந்த அரசியலமைப்புக்குப் பிறகு, அந்த மக்களுக்கு இருக்கின்ற ஒரேயொரு பாதுகாப்பு இவ்வாறான விடயங்கள்தான்.

ஹிஜாஸ் ஹிஸ்புல்லாஹ் என்பவர் ஒரு பிரபலமான சட்டத்தரணி! மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்களைப் பிரதமர் பதவியிலிருந்து நீக்கியதற்கு எதிராக நீதிமன்றத்தில் சிறப்பாக வாதிட்டவர். அவரை CIDஇனர் அநியாயமாகக் கைதுசெய்தனர். அவர்களுடன் சட்டமா அதிபர் திணைக்களத் தினரும் இணைந்து சிறந்ததொரு dramaவைச் செய்தார்கள். இன்றும் அவருக்கெதிரான வழக்கு விசாரணை நடந்து கொண்டிருக்கிறது. நிச்சயமாக, அவர் அவ்வழக்கிலிருந்து விடுதலை செய்யப்படுவார். அவருக்கு எதிராகப் பொய் சாட்சிகள் உருவாக்கப்பட்டதை நான் கண்களால் கண்டேன். என்னைச் சிறையில் வைத்திருந்த அதே காலப் பகுதியில் கரைத்தீவு பாடசாலையில் கல்வி கற்றுக்கொடுத்த இரண்டு மௌலவி ஆசிரியர்களைக் கைதுசெய்து அங்கு கொண்டு வந்தார்கள். "கரைத்தீவு பாடசாலைக்கு ஹிஜாஸ் ஹிஸ்புல்லாஹ்வும் சஹ்ரானும் வந்தார்கள் என்று நீங்கள் சொன்னால், நாங்கள் உங்களை விட்டுவிடுவோம். இல்லை யென்றால், உங்களை இங்கே வைத்துக் கொலைசெய்து விடுவோம்" என்று CIDஇனர் அவர்களை அச்சுறுத்தினார்கள். அந்த இருவரையும் ஒரு வருட காலம் சிறையிலே அடைத்து வைத்தார்கள். பல மாதங்கள் CIDஇலும் இன்னும் பல மாதங்கள் சிறையிலும் அவர்களை வைத்திருந்தார்கள். அவர்களுக்கு எதிராகத் தொடுக்கப்பட்டுள்ள வழக்கு இன்னும் தீர்க்கப்படவில்லை. பொய் சாட்சி சொல்லும்படி CIDஇனர் வற்புறுத்துவதும், agenda ஒன்றின்படி இயங்குவதும் நியாயமா? என நான் கேட்கின்றேன்.

கோட்டாபய ராஜபக்ஷ அவர்கள் ஆட்சிக்கு வந்தபிறகு, Criminal Investigation Department அரசியல் மயப்படுத்தப் பட்ட ஒரு திணைக்களமாக மாறியது. அதை நான் எனது அனுபவத்தினூடாகக் கண்டேன். அன்று நான் பாராளுமன்ற அமர்வில் கலந்து கொண்டு விட்டு, வீட்டில் உறங்கிக் கொண்டிருந்த போது, நள்ளிரவில் எனது வீட்டுக்கு வந்த CIDஇனர் என்னை ஒரு பயங்கரவாதியைக் கைதுசெய்வது போல கைதுசெய்துகொண்டு போனார்கள். அவ்வாறு கொண்டுசென்ற அவர்கள், பல நாட்களாகியும் என்னிடத்தில் எதையும் விசாரிக்கவில்லை. CID அதிகாரி ஒருவர் என்னிடம் வந்து, "என்னை மன்னித்துக்கொள்ளுங்கள்! உங்களுக்கு எதிராக எந்தவொரு குற்றச்சாட்டும் இல்லை. ஆனால், உங்களைக் கைதுசெய்யுமாறு மேலிடத்திலிருந்து உத்தரவு வந்திருக்கின்றது" என்று கூறினார். இவ்வாறு கைதுசெய்த என்னை 6 - 7 மாதங்கள் சிறையில் அடைத்து வைத்திருந்தார் கள். என்னைக் கைதுசெய்த அதே இரவில் என்னுடைய சகோதரரான றியாஜ் பதியுதீனையும் கைதுசெய்து சிறையில் அடைத்தார்கள். அதற்கு முன்னர், 6-7 மாதங்கள் சிறையி லிருந்த அவரை "உங்கள்மீது எந்தவொரு குற்றமும் இல்லை" என்று கூறியே விடுதலை செய்திருந்தார்கள். விவசாயத்தை நாசமாக்கிய முன்னாள் அமைச்சர், இந்த நாட்டை நாசமாக்கிய அமைச்சர் என அமைச்சர்கள் உட்பட ஸ்ரீ லங்கா பொதுஜன பெரமுனவின் 100 பாராளுமன்ற உறுப்பினர்கள் கையொப்ப மிட்டு, றியாஜ் பதியுதீனை மீண்டும் கைதுசெய்யும்படி முன்னாள் ஜனாதிபதிக்கு மனுவொன்றைக் கொடுத்தார்கள். அதனடிப்படையில், அவரை மீண்டும் கைதுசெய்து, ஒரு வருடத்திற்கும் மேல் சிறையில் அடைத்துவைத்தார்கள்.

நான் அமைச்சராக இருந்தபோது, என்னுடைய அமைச்சில் வேலைசெய்த ஓர் அதிகாரி அங்கு வந்த ஒரு வியாபாரியோடு தொலைபேசியில் இரண்டு நிமிடங்கள் பேசியதற்காகவே என்னையும் என் தம்பி றியாஜ் பதியுதீனையும் கைதுசெய்தார் கள். என்னைக் குற்றமற்றவர் என விடுவித்து விடுதலை செய்து ஒரு வருடமாகிறது. ஆனால், என்னுடைய தம்பி றியாஜ் பதியுதீனின் file இன்றும் Attorney-General's Departmentஇல் தூங்கிக்கொண்டு இருக்கிறது. அவருடைய வழக்கு கிடப்பிலே போடப்பட்டு, இன்னும் அவர் அக்குற்றச்சாட்டி லிருந்து விடுவிக்கப்படாமல் இருக்கிறார். ஒரே குற்றச்சாட்டுக் காக என்னையும் என்னுடைய சகோதரரான றியாஜ் பதியுதீனையும் கைதுசெய்த நீங்கள், என்னை ஒரு வருடத் திற்கு முன்னர் அக்குற்றச்சாட்டிலிருந்து விடுதலை செய்தீர்கள். ஆனால், றியாஜ் பதியுதீனின் fileஐ அப்படியே வைத்திருக் கிறீர்கள். இதில் என்ன நியாயம் இருக்கிறது? என நான் சட்டமா அதிபர் திணைக்களத்தினரிடம் கேட்கின்றேன்.

மாணவனான அஹ்னாப் ஜஸீம் ஒரு கவிதை எழுதினார் என்பதற்காக அவரை ஒன்றரை வருடங்கள் சிறையிலே அடைத்து, அவருக்குச் செய்யக்கூடிய அத்தனை அநியாயங் களையும் செய்தார்கள். அதேபோல், ரம்சி ராசிக் என்பவர் Facebookஇல் 'ஜிஹாத்' என்ற சொல்லைத் சேர்த்து கவிதை ஒன்றைப் பதிவிட்டார் என்பதற்காக அவரை ஒன்றரை வருடங்கள் சிறையில் அடைத்து வைத்திருந்தார்கள். தற்போது அவரை குற்றமற்றவர் என விடுவித்து விடுதலை செய்திருக் கிறார்கள். ஏன் இவ்வாறான பொய்யான வழக்குகளைத் தாக்கல் செய்து, இவர்களை மாதக் கணக்கில், வருடக் கணக்கில் சிறையில் அடைத்தீர்கள்? என்று நாங்கள் Attorney-General's Departmentஇனரிடமும் CIDஇனரிடமும் கேட்கின் றோம். முனாஜித் மௌலவி என்பவர் voice-cut ஒன்றைக் கொடுத்தார் என்பதற்காக அவரைப் பல மாதங்கள் சிறையில் அடைத்து வைத்திருந்தார்கள். இன்று அவர் விடுதலை செய்யப் பட்டிருக்கிறார். இவ்வாறான எத்தனையோ விடயங்களைச் சொல்லிக்கொண்டே போகலாம். இவ்வாறு பலருடைய filesஐ Attorney-General's Department முடக்கி வைத்துக்கொண்டு, அவர்களைக் குற்றச் சாட்டுக்களிலிருந்து முழுமையாக விடுதலை செய்யாமல், bailஇல் விடுதலை செய்திருக்கிறது. அவர்களால் வெளிநாடு செல்லமுடியாது, தொழிலுக்குச் செல்ல முடியாது. இவ்வாறு அவர்கள் பெரும் கஷ்டத்திற்கு உள்ளாகி இருக்கிறார்கள். அவர்கள் குற்றமற்றவர்கள் என்றால், அவர்களை விடுதலை செய்யுங்கள்! அரச சார்பானவர்களுக்கு மாத்திரம் அவசர அவசரமாக உதவி செய்கின்ற நிலையிலிருந்து சட்டமா அதிபர் திணைக்களம் மாறவேண்டும்.

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

நான் புத்தளத்திலுள்ள இடம்பெயர்ந்த மக்களை சனாதிபதித் தேர்தலில் வாக்களிப்பதற்காக பஸ்ஸில் அழைத்துச் சென்றேன் என்பதற்காக என்னை சிறையில் அடைத்து வைத்தார்கள். கடந்த காலங்களில் நாங்கள் ஒவ்வொரு தேர்தலின்போதும் இவ்வாறு புத்தளத்திலுள்ள மக்களை அழைத்துச் சொல்வோம். எனினும், நாங்கள் ராஜபக்ஷ அரசாங்கத்தில் இருந்தபொழுது, எங்களைக் கைது செய்யவில்லை. கடந்த சனாதிபதித் தேர்தலில் சஜித் பிரேமதாஸ அவர்களுக்கு உதவி செய்தேன் என்ற காரணத்திற்காக என்னை இரண்டு மாதங்கள் சிறையில் அடைத்து வைத்திருந்தார்கள். அதன் பின்னர் நானும் Engineer Yaseen உட்பட accountant ஒருவரும் அந்த வழக்கிலிருந்து விடுதலையானோம். எங்களுக்கு எதிராக எந்தக் குற்றச்சாட்டும் இல்லையென்று கூறியே, எங்களை விடுதலை செய்தார்கள். ஆனால், எங்களைக் கைதுசெய்யுமாறு CIDஇனருக்கு சட்டமா அதிபர் திணைக்களம்தான் ஆணை பிறப்பித்திருந்தது. என்னை விடுதலை செய்த பின்னர், எனக்கு உதவி செய்தார்கள் என்ற காரணத்துக்காக Engineer Hakeem, Engineer Mueen, Fahumudeen Sir உட்பட 10 பேரைக் கைதுசெய்தார்கள். இன்னும் அவர்களுடைய files Attorney-General's Departmentஇலிருந்து நீதிமன்றத்திற்கு வரவில்லை. என்மீது குற்றமில்லை என்று சொல்லி, என்னை விடுதலை செய்துவிட்டு, எனக்கு உதவி செய்தவர்களுக்கு எதிராக வழக்குகளைத் தொடுத்து, அவற்றை இன்னமும் விசாரணை செய்யாமல் தவணைபோட்டுக்கொண்டு இருக்கிறார்கள். இவை நியாயமா? என நாங்கள் கேட்கின்றோம். எனவே, இவ்விடயத்தில் சட்டமா அதிபர் திணைக்களம் நியாயமாகச் செயற்பட வேண்டுமென்று நான் இந்த உயரிய சபையிலே வேண்டுகோள் விடுக்கின்றேன்.

கௌரவ அமைச்சர் விஜயதாஸ ராஜபக்ஷ அவர்களே, 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலுக்குப் பின்னர், இந்த நாட்டிலிருந்த எத்தனையோ முஸ்லிம் மத்ரஸாக்களை மூடிவிட்டார்கள். சஹ்ரான் என்பவன் செய்த குற்றத்திற்காக முஸ்லிம் சமூகமே பாதிக்கப்பட்டுக்கொண்டிருக்கிறது. நான் ஏற்கெனவே சொன்னதுபோல, இந்தக் குண்டு வெடிப்புக்குப் பின்னர், மஹர சிறைச்சாலை வளாகத்திலுள்ள பள்ளிவாசலை இழுத்து மூடிவிட்டார்கள். அல்-ஆலிம் பரீட்சையில் சித்தி எய்தினால் தான் மௌலவிமார்கள் பாடசாலைகளில் இஸ்லாம் பாட ஆசிரியர்களாக நியமனம் பெறமுடியும். ஆனால், இக்குண்டுத் தாக்குதலுக்குப் பின்னர் அந்தப் பரீட்சையும் முற்றாக நிறுத்தப்பட்டிருக்கிறது.

அதேபோல், வெளிநாட்டிலிருந்து இந்த நாட்டிற்கு அரபுப் புத்தகங்களை மாத்திரம் கொண்டுவர முடியாது. ஆனால், தமிழ்ப் புத்தகங்களையோ, ஆங்கிலப் புத்தகங்களையோ, சிங்களப் புத்தகங்களையோ, ஹிந்திப் புத்தகங்களையோ, உருதுப் புத்தகங்களையோ கொண்டுவர முடியும். அவ்வாறான ஒரு தடையை Ministry of Defenceஇன் தற்போதைய செயலாளர் விதித்திருக்கிறார். இது எந்த வகையில் நியாயம்? எனக் கேட்கின்றேன். கட்டார், குவைத் போன்ற அரபு நாடுகளிலிருந்து மற்றும் துபாய் போன்ற அரபு இராஜ்யங்களிலிருந்து இந்த நாட்டிற்கு touristஆக வருகின்ற அரபி ஒருவர், வாசிப்பதற்காக அரபுப் புத்தகமொன்றைக் கொண்டுவந்தால்கூட, அதையும் பறித்தெடுக்கிறார்கள். இந்த நாட்டில் வாழுகின்ற முஸ்லிம்களுக்கான புத்தகங்கள் வெளிநாட்டில் இருந்துதான் வருகின்றன. அதைத் தடுப்பதற் கான ஒரு சதியே இதுவாகும். எனவே, இவற்றில் மாற்றங்களைக் கொண்டுவர வேண்டும். அதன் மூலம்தான் இந்த நாட்டில் சனநாயகம் வலுப்படுத்தப்படும் என்பதை நான் இந்த இடத்திலே சொல்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

அடுத்து, முல்லைத்தீவு மாவட்ட நீதிபதி அவர்களின் வெளியேற்றத்தை ஆளுங்கட்சியினர் ஒரு பார்வையிலும் எதிர்க்கட்சியினர் இன்னொரு பார்வையிலும் பார்க்கக்கூடாது. இந்த நாட்டைக் கையேந்துகின்ற நிலைக்கு கோட்டாபய ராஜபக்ஷ அரசாங்கம் இட்டுச் சென்றுவிட்டது. இன்று இந்த நாடு பிச்சை எடுக்கின்ற நிலைக்கு வந்திருக்கின்றது. இன்று இந்த நாடு IMFஐ நாடி நிற்கின்றது; உலக வங்கியை நாடி நிற்கின்றது; ஏனைய சர்வதேச நாடுகளிடம் பெற்ற கடனை மீளச் செலுத்த முடியாமல் தவித்துக்கொண்டிருக்கின்றது. இந்தச் சூழ்நிலையில், இந்த நாட்டில் சனநாயகத்தை வலுப்படுத்த வேண்டும். பாராளுமன்ற உறுப்பினர்களுக்குள்ள வரப்பிரசாதங்களைப் பயன்படுத்தி, இங்குள்ளவர்கள் நீதிபதி களைக் கேவலமாகப் பேசுவதும் அவர்களை அச்சுறுத்துவதும் இந்த நாட்டுக்கு நல்லதல்ல; சனநாயகத்துக்கு நல்லதல்ல. குறித்த நீதிபதிக்கு மொழி தெரியாமல் இருக்கலாம்! அதனால்தான் அவருக்கு இந்த மாதிரியான ஒரு சிந்தனை வந்திருக்கும் என்று இங்கு பேசிய ஒரு பாராளுமன்ற உறுப்பினர் சொல்லியிருந்தார். அவர் மாத்தளை, உக்குவெல அஜ்மீர் தேசிய பாடசாலையில் முஸ்லிம், தமிழ் மாணவர் களோடு சேர்ந்து கல்வி கற்றவர். அந்த வகையில், அவருக்குச் சிங்கள மொழியும் ஆங்கில மொழியும் தமிழ் மொழியும் நன்கு தெரிந்திருக்கும். நீதிபதிகளுடைய வெளியேற்றம், இராஜினாமா என்பன நாட்டுக்கு நல்லதல்ல. எனவே, எதிர்காலத்தில் இந்த விடயத்தில் கௌரவ அமைச்சர் அவர்களும் Judicial Service Commissionஉம் கவனஞ் செலுத்த வேண்டும் என்று நான் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

அண்மையில் புல்மோட்டையில் ஒரு பாரிய பிரச்சினை நடந்திருக்கின்றது. அதாவது, புல்மோட்டை - 1 கிராம சேவகர் பிரிவுக்கு மதகுரு ஒருவர் தன்னுடைய சகோதரரையும் அழைத்துக் கொண்டுபோய் அங்குள்ள 6 குடும்பங்களுக்குச் சொந்தமான காணியைப் பலவந்தமாக அபகரிப்பதற்காக dozer இயந்திரங்களைக் கொண்டுசென்று பாரிய அடாவடித் தனத்தைச் செய்திருக்கிறார். அந்தக் காணிச் சொந்தக்காரப் பெண் ஒருவர் அதனைத் தட்டிக்கேட்டபொழுது, அவரைத் தாக்கி இருக்கிறார்கள். ஸுலைஹா என்ற அந்தப் பெண்மணி தற்பொழுது வைத்தியசாலையில் இருக்கிறார். எனவே, இவ்வாறான நிலை மாற வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, இந்த மாதிரியான விஷயங்கள் இந்த நாட்டில் தொடரும்பொழுது, இனவாத சக்திகள் மேலும் ஊடுருவுவதற் கான வாய்ப்புகள் ஏற்படும்.

நான் இங்கு இன்னுமொரு விஷயத்தையும் சொல்ல வேண்டும். கல்முனை மாநகர சபையினால் அங்குள்ள மக்களுக்கு எந்தவித அபிவிருத்தியும் இடம்பெறுவதை நாங்கள் காணவில்லை. ஆனால், மக்களுடைய பல கோடிக் கணக்கான ரூபாய் வரிப் பணம் சூறையாடப்பட்டிருப்பதாக நாங்கள் அண்மையில் கேள்விப்பட்டோம். கல்முனை மாநகர சபை எல்லைக்குள் 100 மீற்றர் தூரப் பாதையில் 53 LED விளக்குள் போடப்பட்டதாகக் கூறி, பல கோடி ரூபாய் சூறையாடப் பட்டிருக்கிறது. அவ்வாறு சூறையாடப்பட்டுள்ள வரிப் பணம் மீண்டும் அந்த மாநகர சபைக்கு வழங்கப்பட வேண்டும். இவ்வாறான பல ஊழல்கள் அங்கு நடந்திருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விஷயத்தைக் கவனத்தி லெடுத்து, உங்களுடைய அதிகாரத்தைப் பயன்படுத்தி, அந்த மக்களுடைய வரிப் பணம் மீண்டும் அவர்களுக்குப் போய்ச் சேரவும், குற்றவாளிகள் தண்டிக்கப்படுவதற்கும், எதிர்காலத் தில் இந்தக் குற்றவாளிகள் அரசியல் செல்வாக்கினூடாக வெளியே வந்து, அந்தப் பணத்தைக் கட்டாமல் தப்பித்துக் கொள்ளாமல் இருப்பதற்குமான நடவடிக்கைகளை மேற் கொள்ள வேண்டுமெனக் கேட்டு, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.39]

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் குடியியல் நடவடிக்கைமுறைச் சட்டக் கோவை (திருத்தச்) சட்டமூலம் மற்றும் தேர்தல்கள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம் ஆகியவை இரண்டாம் மதிப்பீட்டுக் காகவும், அதேபோல மத்தியஸ்த (விசேட வகுதிகளைச் சார்ந்த பிணக்குகள்) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், நீதித்துறைச் சட்டத்தின் கீழான கட்டளை ஆகியவை அங்கீகாரத்திற் காகவும் கௌரவ அமைச்சர் விஜயதாஸ ராஜபக்ஷ அவர் களால் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றன. இந்தச் சட்டங்களிலே பல்வேறு நன்மைகள் இருந்தாலும் அவை உரியமுறையில் மக்களைச் சென்றடைய வேண்டும் என்பதை நாங்கள் வலியு றுத்துகின்றோம். ஏனென்றால், இலங்கையிலே அண்மைக் காலங்களிலே பல்வேறு சட்டங்கள் கொண்டுவரப்பட்டிருந் தாலும் அவற்றில் மக்களுக்கு நன்மையளிக்கும் வகையிலான சட்டங்கள் மிகமிகக் குறைவாக இருப்பதையே நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது.

இந்த நாட்டிலே சட்டவாக்கம், பாராளுமன்ற அதிகாரங்கள், நீதித்துறையின் அதிகாரங்கள் மற்றும் ஊடகத்துறையின் அதிகாரங்கள் ஆகிய நான்கு விடயங்களும் சமாந்தரமாக இயங்காவிட்டால் நாடு சிறப்பாகச் செயற்படுவதை நாங்கள் காணமுடியாது. குறிப்பாக, சனாதிபதி அதிகாரத்தைத் தனக்குத் தேவையான விதத்தில் பயன்படுத்துகின்ற நிலை - தான் விரும்பிய ஒரு விடயத்தை நீதித்துறையினூடாகச் செய்ய முடியாதவிடத்து, அதனைப் பாராளுமன்றத்திற்குக் கொண்டு வந்து, பாராளுமன்றத்தின் அனுமதியைப் பெற்றுக்கொண்டு அதனைச் செயற்படுத்துகின்ற நிலை காணப்படுகின்றது. அதாவது, நீதித்துறையினூடாகச் செய்து கொள்வதில் சங்கடங் கள் காணப்படுகின்ற விடயங்களை, அதற்கு இந்தப் பாராளு மன்றத்துக்குத்தான் அதிகாரம் இருக்கிறது என்று சொல்லி, நிச்சயமாக அதைச் செய்துகொள்ளுகின்றார்.

அதுபோல, இன்று பாராளுமன்றத்தின் அதிகாரங்கள் தொடர்பிலும் பல்வேறு தலையீடுகள் இருப்பதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. அவ்வாறே நீதித் துறையில் உள்ளவர்களுக்கு அழுத்தங்கள் கொடுக்கப்பட்டு இன்று அந்தத்துறை செயலிழக்கக்கூடிய ஒரு சூழ்நிலை ஏற்படுவதற்கான சந்தர்ப்பம் உருவாக்கப்பட்டிருக்கின்றது. அதுமாத்திரமன்றி, ஊடகங்களையும் - social media - அடக்கு முறைக்குள் கொண்டுவருவதற்கான சட்டமூலங்கள் இங்கு கொண்டுவரப்படுகின்றன. ஆகவே, இந்த நான்கு துறைகளுக் கும் எதிராக இவ்வாறான சட்டமூலங்கள் கொண்டுவரப்பட்டு, அவற்றை அடக்கிவைத்து, எதேச்சாதிகாரமாகச் செயற்படுவ தற்கு நாட்டினுடைய ஜனாதிபதி அவர்கள் முயற்சிப்பாரே யானால், நாட்டு மக்களின் எதிர்காலம் என்னவாகுமென்பதை நாங்கள் புரிந்துகொள்ளவேண்டும்.

இந்த நாடு வங்குரோத்து நிலையை அடைந்தபொழுது IMF உதவி செய்வதற்கு முன்வந்தது. அதன் முதற்கட்டமாக 2.9 பில்லியன் நிதியுதவி கொடுக்கப்பட்டபோது பல்வேறு conditions போடப்பட்டததாக நாங்கள் அறிகின்றோம். ஆனால், அந்த conditionsஇனை இந்த அரசாங்கம் நிறைவேற்றாததன் காரணமாக இன்று எங்களுக்குக் கிடைக்கவேண்டிய இரண்டாம் கட்டப் பணம் கிடைக்காமற்போவதற்கு இடமிருக் கின்றது. ஆகவே, இந்த நாட்டிலே முதலாவதாக ஒழிக்கப்பட வேண்டியது ஊழல் செயற்பாடுகளாகும். அதனை ஒழித்தால் மட்டும்தான் எங்களுடைய மக்கள் சுபிட்சத்தை அடைய முடியும். இன்று இலங்கையில் ஒவ்வொரு தனிப்பட்ட நபரும் 4,700,000 ரூபாய் கடனில் இருப்பதாகப் பேராதனைப் பல்கழைக்கழக ஆய்வு சொல்கிறது. பிறக்கப்போகும் குழந்தை களுக்குக்கூட இந்தக் கடன் சுமை இருக்குமென்று அந்த ஆய்வு சொல்கிறது. ஆகவே, இவ்வாறான கடன் சுமையிலிருந்து விடுபடவேண்டுமானால், முதலிலே நாட்டில் ஊழலுக்கு எதிராகக் கடுமையான சட்டமூலங்கள் கொண்டுவரப்பட்டு, அதனை ஒழிப்பதற்கான நடவடிக்கை எடுக்கப்படவேண்டும். கௌரவ விஜயதாஸ ராஜபக்ஷ அவர்கள் இதற்கான நடவடிக் கையைச் செய்துவருகிறார் என்று நான் நினைக்கிறேன். ஆனாலும், இதை நடைமுறையிலே சரிவரச் செய்வதற்கான நடவடிக்கைகளை எடுக்கவேண்டுமென்பதை நான் இந்த நேரத்திலே சொல்லிக்கொள்ள விரும்புகிறேன்.

அதேபோல, இந்த நாட்டினுடைய நிருவாகத் துறையை எடுத்துக்கொண்டால், நிருவாகத் துறையினர் முறையாக நிருவாகம் செய்யாததன் காரணமாக இந்த நாட்டுக்குக் கிடைக்க வேண்டிய வரிகள் - tax - கிடைக்காமல் போய் விடுகின்றது. கௌரவ மஹிந்தானந்த அலுத்கமகே அவர்கள் இதுபற்றி மிகத் தெளிவாகச் சொல்லியிருந்தார். Income Tax, සුරාබදු, இன்னும் பலவிதமான tax இந்த நாட்டுக்குக் கிடைக்காமற்போவதற்கு இங்கு இடம்பெறும் ஊழலே காரணமென்று நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. இதனால் அரச வருமானத்தை அதிகரித்துக்கொள்வதற்காகப் பெற்றோல், டீசல், gas போன்றவற்றின் விலையை அதிகரித்துச் சாதாரண மக்கள்மீது வரிச் சுமையைத் திணிக் கின்றீர்களே தவிர, பாரியளவிலான கம்பனிகளிடமிருந்து tax பெறுவதற்கான வாய்ப்புகளை ஏற்படுத்தவில்லை. இதன் காரணமாக வசதியானவர்களுக்குச் சாதகமானதாகவும் சாதாரண மக்கள் துன்பகரமான சூழ்நிலையை அனுபவிக்கும் விதமாகவும் இந்தக் காலகட்டம் இருப்பதாக IMF அறிக்கை சொல்கின்றது. எனவே, இந்த வரி வசூலிப்பு முறையாக மேற்கொள்ளப்படவில்லை என்பது எங்களுடைய கருத்தாகும். ஆகவே, ஏழைகள்மீது அதிக வரிச் சுமையை ஏற்படுத்தாமல், அந்த மக்கள் வரிச் சுமையில்லாத ஒரு வாழ்க்கையை வாழக் கூடிய வகையில் முறையான வரி வசூலிப்பு நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். நான் இங்கு குறிப்பிட்டதுபோல, ஒவ்வொரு துறைக்கும் - separation of powers - ஒவ்வொரு power இருக்கின்றது. ஆகவே, ஜனாதிபதி அவர்கள் பாராளுமன்றத்தின் அதிகாரங்களிலோ நீதித்துறையின் அதிகாரங்களிலோ தனது தலையீட்டைக் குறைத்துக்கொள்ள வேண்டும் என்பதை நாங்கள் தெரிவித்துக் கொள்கின்றோம்.

முல்லைத்தீவு நீதிமன்ற நீதிபதியாக இருந்த சரவணராஜா அவர்கள் இந்த நாட்டு நீதித்துறை சார்ந்து பேசப்படுகின்ற ஒரு நபராக இன்று இருக்கின்றார். அவர் கடந்த காலங்களிலே அங்கு பல தீர்ப்புகளை வழங்கியிருக்கின்றார். அதற்கெதிராக அவருக்கு அச்சுறுத்தல் ஏற்படுத்தப்பட்டு, மன உளைச்சலுக் குள்ளாகி இன்று அவர் வெளிநாட்டுக்குப் போயிருக்கிறார். இவ்வாறு ஒரு நீதிபதி நாட்டைவிட்டு வெளியேறியது இலங்கையில் இதுதான் முதற்தடவை என்று நான் நினைக்கிறேன். ஒரு நீதிபதிக்கே இவ்வாறான நிலையென் றால், உங்களுக்கும் எங்களுக்கும் சாதாரண மக்களுக்கும் என்ன நடக்குமென்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும். இன்று மக்களுக்கு இருக்கின்ற ஒரேயொரு நம்பிக்கை இந்த நீதித்துறையாகும். ஆகவே, நீதித்துறை சார்ந்த இவ்வாறான சட்டங்கள் கொண்டுவரப்படும் பொழுது நீதித்துறையின் சுயாதீனத்தைக் கவனமாகப் பேணிக்கொள்ள வேண்டியது அரசாங்கத்தின் பொறுப்பாக இருக்கவேண்டுமென்பதை நாங்கள் இங்கு தெரிவித்துக் கொள்கின்றோம்.

அதேபோல், இப்பொழுது எங்கள் பகுதியிலுள்ள Kegalle Plantations தொழிலாளர்கள் தோட்ட நிர்வாகம் தங்களுக்கு bonus கொடுப்பனவு வழங்கவில்லை என்பதற்காகக் கடந்த 3 - 4 நாட்களாக strike செய்கிறார்கள். ஆனாலும், தோட்ட நிர்வாகம்

[ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා]

இன்று அவர்களைத் தடுத்து, தேயிலைப் பெட்டிகளை ஏற்றுகின்ற விடயத்தில் பொலிஸார் மூலமாக நிர்ப்பந்தம் செய்துகொண்டு இருக்கின்றது. அங்கு பொலிஸ் அதிகாரங்களைத் துஷ்பிரயோகம் செய்து, மக்களை அடக்குகின்ற நடவடிக்கையில் முதலாளித்துவம் ஈடுபடுவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களுடன் இதுதொடர்பில் நாங்கள் தனியாகப் பேசவேண்டும். அப்போது நான் அதுபற்றிய சகல விபரங்களையும் உங்களுக்கு எடுத்துச் சொல்லுவேன். ஆகவே, மக்களை நசுக்கி, மக்களினுடைய தேவைகளைப் பூர்த்தி செய்யாத அந்தத் தோட்ட நிர்வாகங்களினுடைய அடக்கு முறையை இல்லாமல் செய்வதற்கான வழிவகைகளை நீதியமைச்சர் நீதித்துறையில் மேற்கொள்ளவேண்டும் என்பதை நான் இந்த இடத்தில் கேட்டுக்கொண்டு, நீதித்துறை சுயாதீனமாக இயங்குவதற்கு அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டும் என்பதைக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි IMF එකේ කොන්දේසි ඉටු කරලා නැති නිසා ඊළඟ වාරිකය ලබා දීමේ ප්‍රමාදයක් තිබෙනවාය කියලා කිහිප වතාවක්ම කියවුණා. ඒ පිළිබඳ සත්‍ය තත්ත්වය මම මේ පාර්ලිමේන්තුවට හෙළිදරව් කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම කොන්දේසි ඉටු නොකිරීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. ඒ ගොල්ලන් බලාපොරොත්තු වෙනවා, ලබන අවුරුද්දේ පළමු කාර්තුව අවසන් වෙනකොට එක්තරා ඉලක්කයක බදු ආදායම් ලබා ගන්න. ඒ කියන ඉලක්කයට බදු ආදායම ලබා ගැනීම සාර්ථකව කරන්න නම්, තිබෙන බදු ප්‍රතිශතය වැඩි කරන්න අපට සිද්ධ වෙනවා. අපි රජයක් විධියට ඒ ගොල්ලන්ට දැනුම් දුන්නා, මේ අවස්ථාවේ මීට වඩා බදු බරක් ජනතාව පිට පටවන්න බැහැ කියන කාරණය. නමුත්, ඒ ගොල්ලන් ඉල්ලා සිටිනවා ඒ ඉලක්කයට යන්න නම් බදු වැඩි කරන්න ඕනෑ කියලා. අපි කිව්වේ අපට තවත් බදු බර පටවන්න බැරි නිසා, කරුණාකර ඒක ගැන නැවත සලකා බලන්න කියලා. එම සාකච්ඡා වටය තමයි ඊළඟට පවතින්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි විස්සක කාලයක් තිබෙනවා.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මේ අවස්ථාවේ දී ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு துஷார இந்துனில் அமரசேன அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. THUSHARA INDUNIL AMARASENA left the Chair, and THE HON. SAMANPRIYA HERATH took the Chair.*

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

ගරු අමාත්‍යතුමනි, IMF එකෙන් කියලා තිබෙනවා, මේ රටේ mismanagement තිබෙනවා කියලා. හරියට බදු එකතු කරන්නේ නැහැ, සල්ලි තිබෙන මිනිස්සුන්ගෙන් බදු එකතු කරන්නේ නැතිව පොඩි මිනිස්සුන්ට බදු බර පටවනවා කියලා. ඒක තමයි මම කිව්වේ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක ඇත්ත. එම වාර්තාවේ එහෙම සඳහන් වෙනවා. හැබැයි, දැන් ඔය කියන බොහෝ චෝදනා තිබෙන්නේ මෑත කාලයේ ඒවා නොවෙයි. ඈත අතීතයේ ඒවා තමයි එම වාර්තාවේ සඳහන් කරලා තිබෙන්නේ. ඔබතුමාට මතක ඇති IMF එකෙන් විතරක් නොවෙයි, ඒක අපිත් කිව්වා. අපි COPE වාර්තා ඉදිරිපත් කරලා මේ රටේ දූෂණ, වංචා පිළිබඳව කොච්චරවත් කථා කළා. ඒවා නිවැරදි නොවුණු නිසා තමයි මේ රට මේ තත්ත්වයට පත් වෙන්න මූලික වශයෙන් බලපෑවේ කියන කාරණය අපි කවුරුත් දන්නා කාරණයක්. මෑත කාලීනව ගත්තාම, බදු එකතු කරලා නැහැ කියලා ඔබතුමා කියපු කතන්දරයත් හරි. ඒකත් කියලා තිබෙනවා. මොකද, මීට කලින් ගරු මහින්දානන්ද මන්ත්‍රීතුමාගේ කථාවෙනුත් ඒක කියවුණා. ඇත්ත වශයෙන්ම අපට ලැබිය යුතු බදු, ඒ කියන්නේ ගණනය කරපු බදු විතරක් රුපියල් බිලියන 904ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අය කරගෙන නැහැ. ඒ වාගේම මම කලින් කිව්වා වාගේ අපට රේගුවෙන් ලැබෙන්න ඕනෑ මුදලත්, සුරාබදු එකෙන් ලැබෙන්න ඕනෑ මුදලත් ගත්තාම, ඒ වාගේ දහ ගුණයක් විතර තිබෙනවා කියලා මම හිතනවා. ඒවා ගණනය වෙලාත් නැහැ. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. ඒවා නිවැරදි කිරීම සඳහා තමයි අවශ්‍ය නීති යාන්ත්‍රණය අපි හදලා දුන්නේ. ඔබතුමන්ලා, අපි ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් විධියට අපේ duty එක, යුතුකම ඉටුකළා. දැන් ඒ වගකීම පවරා තිබෙනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවට. දැන් ඒ ගොල්ලන් තමයි ඒ වගකීම ඉෂ්ට කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජානක වක්කුඹුර රාජ්‍ය අමාත්‍යතුමා කථා කරන්න.

[අ.භා. 3.50]

**ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පනත් කෙටුම්පත් දෙකක් සහ පනත් දෙකක් යටතේ ගෙනෙන නියෝග සහ නියමයක් පිළිබඳව විවාදයට අරගෙන තිබෙනවා. එකක් තමයි මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත. අපේ ගරු ඇමතිතුමා මීට ඉස්සරවෙලා පළාත් පාලන ආයතන ඡන්ද අපේක්ෂකයන්ගේ වියදම් සීමා කරන්න, ඒවා හෙළි කරන්න පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සම්මත කළා. ඒ වාගේම ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කිරීමට දීලා තිබෙන දින 21ක කාලය, දින 42 දක්වා දීර්ඝ කරන්න තමයි මේ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතින් සංශෝධනයක් ගෙනැල්ලා තිබෙන්නේ.

ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ, මැතිවරණයක් අවසන් වුණාට පස්සේ කෙනෙකුට ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරන්න දින 42ක කාලයක් ලබා දීමයි. පළාත් පාලන මැතිවරණයකට ඉදිරිපත් වෙච්ච අපේක්ෂකයෝ, ඒ වාගේම දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් වියදම් හරියට ගණනය කරන්නේ නැහැ. මම ඒ ගැන මැතිවරණ කොමිසමටත් කිව්වා. අපි මේ පනත් කෙටුම්පත් මොනවා සම්මත කළත්, යම්කිසි ප්‍රදේශයකින් ඡන්දය ඉල්ලන පුද්ගලයෙකුට මෙන්න මෙච්චර මුදලක් තමයි වියදම් කරන්න පුළුවන් කියන එක අපි හරියට ගණනය නොකළොත්, කිසිම කෙනෙකුට හොයාගන්න බැරිවෙනවා ඔහු වියදම් කරපු මුදල.

දැන් පළාත් පාලන මැතිවරණයේදී අපේක්ෂකයෙකුට එක කොට්ඨාසයයි තිබෙන්නේ. ඒ කොට්ඨාසය තුළ සිටින ඡන්දදායකයන් ගණන කොපමණද කියා බලලා, ලැබුණු ඡන්ද ගණනින් ගුණ කරලා වියදම බලන්න ඕනෑ. ඒ ප්‍රදේශයේ ජනතාව හරියටම දන්නේ නැහැ, ඒ පුද්ගලයාට කොපමණ මුදලක් වියදම් කරන්න පුළුවන්ද කියලා. දේශපාලන පක්ෂයක් රටේ හැම තැනකටම නාම යෝජනා දීලා නැත්නම්, ඒ දේශපාලන පක්ෂයට ඒ අපේක්ෂකයා ඡන්දය ඉල්ලන පළාතෙන් එහෙම නැත්නම් ප්‍රදේශයෙන් තමයි බලන්න වෙන්නේ කොපමණ මුදලක් වියදම් කරන්න පුළුවන්ද කියන කාරණය. ඒ පිළිබඳ දැනුවත් කිරීමක් මහජනතාවට නැති වුණොත් අපේක්ෂකයන්ට විරුද්ධව කටයුතු කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. මම ඒ වෙලාවේ මැතිවරණ කොමිසමටත් කිව්වා, හැමෝටම වියදම් කරන්න පුළුවන් වෙන්නේ, මෙන්න මේ සීමාව තුළ කියන එක පෙන්වන්න කියලා. දිස්ත්‍රික් මැතිවරණයක් පවත්වනකොට ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද සංඛ්‍යාව බලලා කියන්න පුළුවන්, එක අපේක්ෂකයෙකුගේ වියදම මෙච්චර විය යුතුයි කියලා.

අපි බලන්නේ වංචාව, දූෂණය නතර කරන්නයි. මැතිවරණයක් පවත්වන කාලයට සල්ලි තිබෙන අපේක්ෂකයා රූපවාහිනිය මඟින් හෝ පත්තර මඟින් හෝ වෙනත් ක්‍රමවලින් ප්‍රචාරණයට විශාල මුදලක් වියදම් කරලා කොහොම හරි ජයග්‍රහණය කරනවා. ජනතා කැමැත්ත තිබුණත්, මේ රටේ සිටින අහිංසක පුද්ගලයෙකුට ජනතා නියෝජිතයෙකු විධියට එන්න බැරි හේතුව, අර වාගේ ප්‍රචාරණයක් නොමැති වීමයි. ඕනෑම කෙනෙකු කැමැතියි, තමන් ඡන්දය දෙන අපේක්ෂකයා ජයග්‍රහණය කරනවා දකින්න. ඒක තමයි හැමෝගෙම බලාපොරොත්තුව. යම් පුද්ගලයෙකු දිනන බව පෙනෙනවා නම් ඔහුට ඡන්දය දෙනවා. ඒ වාගේම සල්ලි වැඩියෙන් වියදම් කරලා මාධ්‍ය හරහා ඔක්කෝම දේවල් කර ගන්නා අපේක්ෂකයන් පස්සෙන් තමයි ජනතාව වැඩිපුර යන්නේ. ඒක නතර කරන්න තමයි, අපේ ඇමතිතුමා පළාත් පාලන මැතිවරණය වෙලාවේ මේ යෝජනාව ගෙනැල්ලා සම්මත කළේ. ඉදිරියේදී අපි පාර්ලිමේන්තු මැතිවරණයකදී, පළාත් සභා මැතිවරණයකදී සහ ජනාධිපතිවරණයකදී බලාපොරොත්තු වෙනවා, හැමෝටම එක හා සමාන වියදමක් දැරීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් කරන්න. මැතිවරණයෙන් පස්සේ යම්කිසි කෙනෙකුට විරුද්ධව ඡන්ද පෙත්සමක් දමන්න ඕනෑ නම්, ඒ කාලය දීර්ඝ කරන්නත් මේ සංශෝධනයෙන් ඉඩක් ලැබෙනවා.

යම් දේශපාලන පක්ෂයක ඉන්න පුද්ගලයෙක් ඉවත් කරන්න කෙනෙක් ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කළොත්, ඒ දේශපාලන පක්ෂයේම ලැයිස්තුවේ පහළ ඉන්න පුද්ගලයෙක් තමයි උඩට එන්නේ. ඒ පක්ෂයේම කෙනෙක් තමයි අභවලා වැඩියෙන් සල්ලි වියදම් කළා කියලා ඡන්ද පෙත්සමක් දමන්න ඕනෑ. මොකද, වෙනත් දේශපාලන පක්ෂයක කෙනෙක් නඩුවක් දමලා තවත් පක්ෂයක කෙනෙකු ඉවත් කරන්නේ නැහැ. මොකද, ඔහුට ඒකෙන් වාසියක් වෙන්නේ නැති නිසා. ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණයකදීත් අපි තරහ වුණත්, වෙන පැත්තකට ගිහින් හිටියත් ලැයිස්තුවේ ඊළඟට ඉන්න කෙනාට තමයි ඒ අවස්ථාව ලැබෙන්නේ. මේ ක්‍රමය එක්ක තිබෙන වංචාව, දූෂණය නතර කරනවා වාගේම, අපි බලන්න ඕනෑ තව දෙයක් තිබෙනවා.

යම්කිසි පක්ෂයකින් ඡන්දය ඉල්ලන අපේක්ෂකයෙකුට මහජනතාව ඡන්දය දෙනවා, ගිහිල්ලා අපට වැඩ කරන්න කියලා. හැබැයි, ටිකක් කල් යනකොට ඒ පුද්ගලයා එහාට මෙහාට වෙන්න පුළුවන්. ඒකටත් යම්කිසි දෙයක් කරන්න ඕනෑ. ඒකටත් අපි සාධාරණ වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් හොඳයි. මොකද, මැතිවරණ කාලයකදී මැතිවරණ කොමිෂන් සභාවටවත් බැහැ, හැම අපේක්ෂකයෙකුම වියදම් කරන ප්‍රමාණය බලන්න. මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතේ තිබෙනවා, දින 42ක කාලයක් තුළ ඡන්ද පෙත්සම ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. හැබැයි, මට හ◌ිතෙන විධියට යම් කෙනෙක් ඉදිරිපත් කරන පෙත්සම නිවැරදිද නැද්ද කියලා බලන්න ක්‍රමයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වංචාව, දූෂණය නැති කරලා තමන්ට ආදරේ කරන මිනිස්සුන්ගේගන් ඡන්දය ලබා ගෙන ප්‍රාදේශීය සභාවේ ඉඳන් ජනාධිපති ධූරය දක්වා යන්න ඕනෑම කෙනෙකුට තිබෙන අවස්ථාව උදා කර ගන්න ඒ විධියට කටයුතු කිරීම හොඳයි.

ඒ වාගේම සමථ මණ්ඩලවලිනුත් දැන් ගොඩක් කටයුතු කෙරෙනවා. අපේ ගම්වල ඉන්න අයට උසාවි ගිහිල්ලා විශාල මුදලක් වැය කරන්න බැරි නිසා සමථ මණ්ඩලයට ගිහිල්ලා ගැටලුවක් -ප්‍රශ්නයක්- විසඳා ගන්න ඔවුන් බලනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙනුත් මම ඉල්ලීමක් කරන්න කැමැතියි. ගොඩක් වෙලාවට සමථ මණ්ඩලයෙන් කැඳවීමක් කළත්, පෙළක් අය එන්නේ නැහැ. ඒ අය මඟ හරිනවා. ඒ නිසා සමථ මණ්ඩලයේ නිලධාරින්ට ඒ අය ගෙන්වා ගැනීමට බලයක් ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. උසාවියට ආවේ නැත්නම් වරෙන්තු කරනවානේ. මෙහිදී වරෙන්තු නොකර වෙනත් ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් නම් හොඳයි. මොකද, සමථ මණ්ඩලයෙන් ගොඩක් ප්‍රශ්න විසඳා ගන්න පුළුවන් නිසා. ගමක තිබෙන ඉඩම් ආරවුලක්, වැටක ප්‍රශ්නයක්, පාරක ප්‍රශ්නයක්, මුදල් ගනුදෙනුවල ප්‍රශ්නයක් විසඳා ගන්න පොලිසියට ගියාමත්, එය සමථ මණ්ඩලයට යොමු කරනවා. ඊට පස්සේ ටික දවසක් බලලා විසඳා ගන්න බැරි වුණොත් නැවත අධිකරණයට යොමු කරනවා. අධිකරණයට යන්නේ නැතිව සමථ මණ්ඩලයෙන් විසඳා ගන්න පුළුවන් ගොඩක් ප්‍රශ්න තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ ගෙන එන නියෝගවලින් යෝජනා කර තිබෙනවා, සමථ මණ්ඩලවලට සාමාජිකයන් පත් කරන ක්‍රමය පිළිබඳව. එම මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීමේදී යම්කිසි ක්‍රමයක් තිබෙන්න ඕනෑ. එතකොට තමයි ඔවුන්ට පිළිගැනීමක් තිබෙන්නේ. අපි අධිකරණයට ගියාම නඩුකාරතුමා කෙරෙහි පිළිගැනීමක් තිබෙනවා. ඒ වාගේම සමථ මණ්ඩලයේ ඉන්න සාමාජිකයන් ඒ සුදුසුකම් ටික සම්පූර්ණ කර තිබුණාම, ඔවුන්ටත් යම් පිළිගැනීමක් ලැබෙනවා. එතකොට ඔවුන් දෙන යම් කිසි තීන්දුවක් අහන්න අදාළ පාර්ශ්ව එකඟ වෙනවා. මේක හොඳ කටයුත්තක්. ඒ නිසා එම මණ්ඩලවලට සාමාජිකයන් තෝරා ගැනීමේ ක්‍රමයක් සකස් කිරීම හොඳ දෙයක්. ඒ වාගේම අපට පුළුවන් නම්, මේ හරහා මීට වඩා බලයක් සමථ මණ්ඩලවලට ලබා දිය යුතුයි. එතකොට එතැනින් දෙන තීන්දු ක්‍රියාත්මක කරන්න ඒ අයට පුළුවන්. එහෙම වුණොත්, ආපසු ඒ කාරණය අරගෙන උසාවි යනවාට වඩා එතැනින්ම යම් කිසි විසඳුමක් ලබා ගන්න පුළුවන් වෙනවා. ඒ ආකාරයට ප්‍රශ්න ගොඩක් විසඳලාත් තිබෙනවා. මම දන්නවා, ඉඩම් ආරාවුල් ගොඩක් ඒ ආකාරයට විසඳන බව.

ගරු ඇමතිතුමනි, සමහර මිනිස්සු උසාවි යන්නේ අභිමානයට. යම් කෙනෙක් ඉඩමක දහයෙන් පංගුවක අයිතිය වෙනුවෙන්

[ගරු ජානක වක්කුඹුර මහතා ]

උසාවි ගිහිල්ලා අවුරුදු 25ක් විතර නඩු කියලා අර දහයෙන් පංගුව ගත්තත්, ඒ වාගේ ඉඩම් 100ක් විතර වටිනා මුදලක් ඒ වෙනකොට ඒ නඩුව වෙනුවෙන් වියදම් කරලා තිබෙනවා. ඉතින් මේ මිනිස්සු නඩු කියන්නේ අභිමානයට. පාරේ අඩියක ප්‍රමාණයක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒකටත් සමහරු උසාවි යනවා. එහෙම කරන්නේ ඒ අඩියක ප්‍රමාණය තමන්ට නැති වෙන නිසා නොවෙයි, තමන්ට ඒකෙන් අඩු පාඩුවක් වුණා කියලා හිතලා. වරක් රත්නපුරයේ උසාවියට හොඳ මහේස්ත්‍රාත්තුමෙක් ඇවිල්ලා හිටියා. එතුමා එවැනි ප්‍රශ්න තිබෙන අය ගෙන්වා සාකච්ඡා කරලා තීන්දුවක් දුන්නා, මේ ඉඩමේ තිබෙන පංගු පහෙන් හතරක අයිතිය තිබෙනවා නම්, තවත් දීර්ඝ කාලයක් ඉතුරු ටිකට නඩු කියන්න වියදම් කරනවාට වඩා හොඳයි, ඔයගොල්ලන් සමසේ ඒක බෙදා ගන්න කියලා. එතකොට ඔවුන් ඒ තීන්දුව පිළිගෙන ඒ ආකාරයට කටයුතු කළා. අපේ වැඩි හරියක් දෙනා උසාවි ගිහිල්ලා ඉඩම් වෙනුවෙන් නඩු කියලා දිනුවාට වැඩක් නැහැ, ඒ අය පරාදයි. දිනපු කෙනාත් පරාදයි; පැරදුණු කෙනා කොහොමත් පරාදයි. ඒ නිසා සමථ මණ්ඩල හරහා හොඳ පැහැදිලි කිරීමක් කරලා ඒ ආරවුල් විසඳන්න පුළුවන්. එහෙම නිරවුල් කර ගන්න බැරි ප්‍රශ්නයක් නම්, ඒ ඉඩම සමසේ බෙදා දෙන ක්‍රමයක් හෝ හදන්න පුළුවන් නම්, මම හිතන විධියට ඒක හොඳ දෙයක්. එහෙම වුණොත් මේ රටේ උසාවිවලට ඇවිල්ලා රස්තියාදු වෙන මිනිස්සුන්ගෙන්, විශාල මුදලක් වැය කරන මිනිස්සුන්ගෙන් වැඩි කොටසකගේ ගැටලු අපට ගම තුළදී මේ සමථ මණ්ඩල හරහා විසඳා දෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, එම නිසා ඔබතුමා මේ ගන්නා වූ උත්සාහය හොඳයි.

ඒ වාගේම මේ මණ්ඩලවලට හොඳ පිරිසක් පත් කරන්න ඕනෑ. මොකද, ඒ පිරිස දැක්කාම ගමේ අය දන්නවා, ඒ කටයුත්ත හරියට කරයි කියලා. එහෙම නැතුව ගමේම කණ්ඩායමක් මේ මණ්ඩලයට පත් වුණොත් හිතනවා, මේ කෙනා අර කෙනාගේ පැත්තට තමයි මේ ප්‍රශ්නයේදී කථා කරන්නේ කියලා. සමථ මණ්ඩල පත් කළාට පස්සේ අපි නඩු රාශියක් විසඳා තිබෙනවා. මම හිතනවා, ඔබතුමා මේ හරහා තවත් මැදිහත්වීමක් කරලා මා සඳහන් කළ කාරණාත් ඉෂ්ට කළොත් උසාවිවලට ඇවිල්ලා රස්තියාදු වෙන පිරිසෙන් වැඩි කොටසකගේ ගැටලු අපට සමථ මණ්ඩල හරහා විසඳා දෙන්න පුළුවන්කම ලැබෙයි කියා.

අපේ රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා බදු ගැන කිව්වා. අපි දන්නවා, පසුගිය දවස්වල සුරාබදු දෙපාර්තමේන්තුව අරක්කු බෝතල්වල අලවන්න ස්ටිකර් එකක් නිකුත් කළ බව. නමුත්, මේ වෙනකොට අරක්කු බෝතල්වල වැඩි හරියක් අලවා තිබෙන්නේ හොර ස්ටිකර්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. මම දන්නා විධියට අපේ රටේ මත්පැන් නිෂ්පාදනය කරන ආයතනවලට ගෙනෙන එතනෝල් ලීටරයකින් අරක්කු ලීටර් තුනහමාරක් හදන්න පුළුවන්. ඒ අනුව ගණනය කරලා තමයි ඉස්සෙල්ලා බදු ගැහුවේ. හැබැයි, ලංකාවට වෙනත් ආකාරයෙන් - හොර පාරෙන් හෝ- එතනෝල් ගෙනැල්ලා මත්පැන් නිෂ්පාදනය කරනවා. ඒවා කොහෙන් ගෙනාවත් ඒ කර්මාන්තශාලාවෙන් නිෂ්පාදනය එළියට යනකොට, ඒවාට බද්දක් ගහන්න තමයි මේ ස්ටිකර් ක්‍රමය ගෙනාවේ. නමුත්, ඒ ක්‍රමය ගෙනාවාට පසු තිබුණු තත්ත්වයට වඩා හොඳ තත්ත්වයක් නිෂ්පාදකයන්ට ඇති වුණා. ඔවුන් හොර ස්ටිකර් එකක් ගැහුවා, ඔක්කෝම බෝතල්වලට. අද වෙනකොට නිෂ්පාදනවලින් සියයට 95කට විතර හොර ස්ටිකර් ගසා තිබෙන බව පෙනී යනවා. ඒ නිසා දැන් කලින් එළියට ආපු නිෂ්පාදන ටිකවත් නිවැරැදි ආකාරයෙන් එළියට එන්නේ නැහැ. අපේ රටේ මහා පරිමාණයෙන් එම නිෂ්පාදන කටයුතු කරන අය බදු ගෙවන්නේ නැතුව සිටිනවා නම් ඒ අයට ලොකු දඬුවමක් දෙන්න ඕනෑ. ඔවුන්ට ලොකු දඬුවමක් දුන්නේ නැත්නම් මේ වැඩේ කරන්න හම්බ වෙන්නේ නැහැ. අපි සාමාන්‍ය මනුස්සයෙකුට දෙන දඬුවමට වඩා සිය ගුණයකින් වැඩි දඬුවමක් මහා පරිමාණයෙන් ඒ කටයුතු කරන කිහිප දෙනාට ලබා දුන්නොත් හරි විධියට ඔවුන් බදු ගෙවයි.

දැන් අපි සියයට 100ක් බදු එකතු කර ගැනීම සඳහා සියයට 120ක් බදු ගහලා උත්සාහ කළත්, ඒක කර ගන්න බැහැ. ඒ කියන්නේ මේ බදු ගෙවීමෙන් ඔවුන් කොහොම හරි රිංගා යනවා. ඒක නිසා තමයි IMF එක කියා තිබෙන්නේ බදු ගැහුවත් ඒ බදු මුදල භාණ්ඩාගාරයට එකතු වෙන්නේ නැහැ කියලා.

අපි මන්ත්‍රීවරුන් 225දෙනා අර පැත්තට, මේ පැත්තට බණිනවාට වඩා ඒ බදු ටික එකතු කරන්න පුළුවන් ක්‍රමයක් හදන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. අද අපේ රටේ සිදුවන දූෂණය ගැන ගොඩක් තැන්වල කථා කරනවා. ඒකට මන්ත්‍රීවරුන් 225දෙනාට බණිනවා. ප්‍රාදේශීය සභා තිබුණා නම් ප්‍රාදේශීය සභාවේ ඉන්න ඔක්කෝටම බණිනවා. පළාත් සභාව තිබුණා නම් ඒ අයට බණිනවා. මම කියන්නේ නැහැ, ඒ ඔක්කෝම සුදනෝ කියලා. හැබැයි, ගමේ සාමාන්‍ය මනුස්සයෙකුගෙන් ඇහුවාම කියයි, කවුද දූෂණ වැඩ කරන්නේ කියලා; වැඩක් කරගන්න ගියාම කාටද සල්ලි දෙන්න ඕනෑ කියලා. මිනිහෙක් මැරුණාට පස්සේ ඒ මිනිය ගන්නත් බැහැ, සල්ලි දෙන්නේ නැතුව. ඒක තමයි ඇත්ත. ඒක නිසා දූෂණය, වංචාව නවත්වනවා නම් මේ සියල්ල නවත්වන්න ඕනෑ. අපි ඔක්කෝම එකතු වෙලා රටක් ගැන හිතලා වැඩ කරනවා නම් වංචාව, දූෂණය, හොරකම නවත්වන්න පුළුවන්. හැබැයි, ඔක්කෝම එක දෙයක් කරන්න ඕනෑ. මම මේ රටේ මහජනතාවටත් ඒක කියනවා.

දූෂණය වැඩියෙන්ම ඇති වෙලා තිබෙන්නේ මොකක් නිසාද? තමන්ගේ වැඩේ ඉක්මනට කර ගන්න කාට හරි කීයක් හරි ගිහිල්ලා දෙනවා, මේ වැඩේ ඉක්මනට කරලා දෙන්න කියලා. ඉතින් ඒ අය තව මනුස්සයෙක් ආවාම ඒ මනුස්සයාගෙනුත් ඒ දේම බලාපොරොත්තු වෙනවා. අල්ලස් දීලා හුරුකරලා නිසා දැන් හැම මනුස්සයාගෙන්ම බලාපොරොත්තු වෙනවා, අරයාත් දුන්නා නම් මෙයාත් දෙන්න ඕනෑ කියලා. අපි හැමෝම එකතු වෙලා ඒක නතර කළොත් මේ රටේ අහිංසක මිනිසුන් මේ තිබෙන අමාරුකමින් ගොඩ දාන්න පුළුවන්. එක පැලැන්තියක් ඉන්නවා, මොකක් කළත් ඒ අය ඒක කරනවා. මම කියන්නේ මේවා නවත්වන්න අපි හැමෝම එකතු වෙන්න ඕනෑ බවයි. අපි කථා කරනවා විතරක් නොවෙයි, ක්‍රියාවෙන් ඒක ඔප්පු කරලා පෙන්වන්න ඕනෑ. රටේ ජනතාවටත් කියන්න ඕනෑ, කාටවත් සල්ලි දෙන්න ඕනෑ නැහැ කියලා.

රාජ්‍ය සේවකයන්ට ආණ්ඩුවෙන් පඩි ගෙවන්නේ මහජනතාවගේ බදු මුදලින්. ඒ ගොල්ලන් ඉන්නේ ඒ වැඩේ කරන්න. මේ පාර්ලිමේන්තුවේ වුණත්, ප්‍රාදේශීය සභාවේ වුණත් ඉන්න අයට මහජනතාවගේ බදු මුදලින් තමයි පඩි ගෙවන්නේ. ඡන්දයෙන් ආවා නම්, කාගෙන්වත් පගා ගන්නේ නැතුව මිනිසුන්ට වැඩ කරන්න ඕනෑ.

මත්ද්‍රව්‍ය නිවාරණය කරන්න කියලා හැම දාම ගිහිල්ලා දේශන දෙනවා. දේශන දුන්නත් මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වෙලා තිබෙන්නේ. ඒකේ අඩුවක් වෙලා නැහැ. දේශන දෙන්නත් තව මුදලක් වියදම් කරගෙන යනවා. දේශන දුන්නත් ඇබ්බැහි වීම වැඩි වෙලා මිසක් අඩු වීමක් වෙලා නැහැ. අපි බලන්න ඕනෑ, ඒක නතර කරන්න පුළුවන් ක්‍රමයක් හදන්නේ කොහොමද කියලා. අද හැම දාම වාගේ අපේ රටේ මිනිස්සු මහ පාරේ මරනවා. මාස තුනක් විතර ගියාම ඒ මිනීමරුවා ආපහු එළියට එනවා. ඇවිල්ලා ඒ වැඩේම ආපසු කරනවා. කුඩු විකුණන මනුස්සයා කුඩු විකුණනවා. හිරේට ගිහිල්ලා ටික දවසක් ඉඳලා ආපහු ඇවිල්ලා ඒකම කරනවා. අපි

ඔක්කෝම කියනවා, මරණ දඬුවම හොඳ නැහැ කියලා. හැබැයි, මරන මනුස්සයාට අනෙක් මිනිහෙක් මරන එක හොඳයි. මේ අවුරුද්දට මිනිස්සු 50ක් විතර මහ පාරේ මරලා තිබෙනවා. ඒ අය අහිංසක මිනිස්සු. එතකොට ඒවා ජීවිත නොවෙයිද? ඒවාත් ජීවිත තමයි. ඊයේ-පෙරේදා මරලා දාපු කාන්තාවගේ ඔළුව තවම හොයා ගන්න නැහැ. හැබැයි, ඒ මරපු මිනිහාට මරණ දඬුවම දෙන්න හොඳ නැහැ කියනවා. අපි හැම වෙලාවේම බලන්නේ එක පැත්තක්. රටක නීතියක් හරියට ක්‍රියාත්මක වෙනවා නම්, ඒවාට තිබෙන දඬුවමත් දෙන්න ඕනෑ. ඒ දඬුවම් නොදී ඉන්න එක තමයි මේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. අද ගොඩක් අය කථා කරන්න බයයි. මොකද ඕනෑම වෙලාවක ඕනෑම මනුස්සයෙක් මහ පාරේ මරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාතාලයේ ඉන්න අයට මේ මන්ත්‍රීවරුන් 225දෙනාගෙන් ඕනෑම කෙනෙක් හෙට වුණත් මරන්න පුළුවන්. ඒ ගොල්ලන් එච්චර බය නැහැ. එන තැන හොයාගෙන ගිහිල්ලා මරනවා. ඒ කාලයේ එල්ටීටීඊ එකෙන් මිනිස්සු මැරුවා හා සමානවම අද පාතාලය රජ කරලා මිනිස්සු මරනවා. ඒ නිසා මිනිස්සු බයයි. සල්ලි තියෙන ලොකු මිනිහා පාරේ යන්න බයයි. ඒ ඇයි? වාහනයක් traffic lightsවලට නවත්වාගෙන ඉන්න බයයි. කෝච්චි පාරක් ළඟ signal light එකට නවත්වාගෙන ඉන්න බයයි. ඔවුන් හැම වෙලාවේම බයේ ඉන්නේ බයිසිකලයකින් කවුරු හරි ඇවිල්ලා වෙඩි තියයි කියලා. මේවා මර්දනය කරන්න අද ගොඩක් අය කථා කරන්නේ නැහැ. කථා කරන්නේ නැත්තේ කථා කරලා මහ පාරේ යන්න බැහැ කියලා. මට මතකයි, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමා එදා ද.මු. දසනායක මැතිතුමා නැති වෙච්ච වෙලාවේ කිව්වා, කථා කරලා මැරුණාට කමක් නැහැ කියලා. හැබැයි, එතුමාටත් අන්තිමට බෝම්බයක් වැදිලා මැරෙන්න වුණා. මම අපේ අධිකරණ ඇමතිතුමාටත් කියන්නේ මෙයයි. ගරු ඇමතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ නීති සම්පාදනය කරලා හරි මේවා නවත්වන්න. නීතිය අතට අරගෙන මේ විධියට මහ පාරේ මිනිස්සු මරන එක නවත්වන්න ඕනෑ.

ඒ වාගේම අහිංසක දරුවෝ මරනවා; ළමයි දූෂණය කරනවා. මේවා නවත්වන්න අපි මොනවා හරි කරන්න ඕනෑ. අපි හැම වෙලාවේම දූෂණය, වංචාව හා හොරකම ගැන කිය කියා ඉන්නවා. එහෙම කියන්නේ නැතුව යම්කිසි වැඩ පිළිවෙළක් ගෙනැල්ලා අපි මේවා නවත්වන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපි 225දෙනාට තමයි ඒ වගකීම තිබෙන්නේ. හැමෝම කියන්නේ, අතන මැරුවා, මෙතැන මැරුවා, එයාට අරයාගේ රැකවරණය තිබෙනවා කියලා. ඒ රැකවරණය ගන්න පුළුවන් වෙන්නේත් නීතිය අස්සෙන්ම තමයි. ඒක නිසා හැමෝටම සාධාරණය ඉටු කරන්න ඕනෑ. සාධාරණය ඉටු කරලා මිනිසුන්ට මහ පාරේ බය නැතුව යන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න ඕනෑ. සල්ලි තිබෙන මිනිසුන්ට වාගේම, අහිංසක මිනිසුන්ටත් අද බය නැතුව පාරේ යන්න බැහැ. කෙනෙකුට වෙඩි තබනකොට වෙනත් කෙනෙකුට වදින්න පුළුවන්. ඒක නිසා මේවා නවත්වන්න යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න ඕනෑ. මම අධිකරණ ඇමතිතුමාටත් කියන්නේ, පනත්වල අඩු පාඩුවක් තිබෙනවා නම්, පනත් සංශෝධනය කරලා හෝ තිබෙන පනතක් ක්‍රියාත්මක වන්නේ නැත්නම් ක්‍රියාත්මක මට්ටමට ගෙනැල්ලා හෝ මේ මහ පාරේ සිදු කරන මරණ ගැන විශේෂ උසාවියකින් හෝ නඩු අහලා දඬුවම් දෙන ක්‍රමයක් හදලා ඒවා නතර කරන්න කියලායි. එහෙම නැත්නම් වෙන්නේ, මේ රටේ ජනතාවට එදා එල්ටීටීඊ කාලයේ වාගේම බියෙන් ඉන්නයි. වැරැද්දක් දැක්කාම ගොඩක් අය කථා කරන්නේ නැහැ. මොකද, ඒ වෙනුවෙන් කථා කරපු කෙනාට ඊළඟට මළ ගෙදරකටවත් යන්න බැහැ. ඔය මිනී මැරුම් ගැන කථා කරන්න මිනිස්සු බයයි. එහෙම බයෙන් ජීවත් වෙලා වැඩක් නැහැ. හැමෝටම යම්කිසි සාධාරණයක් වෙන්න ඕනෑ. ඒ නිසා මේ වංචාව, දූෂණය, මිනී මැරුම් හා හොරකම නවත්වන්න යමක් කරන්න පුළුවන් නම් එය කරන පැත්තේ, නවත්වන පැත්තේ අපි ඉන්නවා.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත, මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සහ සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ ගෙනෙන නියෝග, අධිකරණ සංවිධාන පනත යටතේ ගෙනෙන නියමය තුළින් හදන්නේ මේ රට නිසි මාර්ගයට ගන්න කටයුතු කරන්නයි. මේ කටයුතු ඉදිරියටත් කරගෙන යන්න හැකියාව ලැබෙන්න කියලා ඔබතුමාට සුබ පතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.08]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා අධිකරණ විෂයය භාර ගත්තාට පස්සේ මේ රටේ ගොඩක් නීති රීති හැදුවා. දූෂණ වැළැක්වීම සඳහා එතුමා දූෂණ විරෝධී පනත් කෙටුම්පත පවා ගෙනැල්ලා මේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තා. නමුත්, මොන පනත් සම්මත කළත් රටේ නීතිය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් තේරුමක් නැහැ. නීතිය ක්‍රියාත්මක වෙන්නේ දුප්පත්, අසරණ මිනිසුන්ට විතරක් නම්, සල්ලි තිබෙන සහ දේශපාලන බලය තිබෙන මිනිසුන්ට නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, නීති කොච්චර ගෙනාවත්, නීති කොච්චර හැදුවත් තේරුමක් නැහැ. අපේ රට දිහා බලාගෙන ඉන්න ජාත්‍යන්තර ප්‍රජාව, IMF එක - IMF එක සැප්තැම්බර් මාසයේ එවපු වාර්තාවෙන් පවා- ඒ වාගේම යුරෝපා සංගමය, මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කරන සංගම්, දේශීය ජනතාව, මේ රටේ අරගළ කරපු ජනතාව ඉල්ලුවේ, මේ රටේ වංචාව හා දූෂණය නවත්වන ලෙසත්, ඒ හරහා උපයාගත් මුදල් රජයට බැර කරන ලෙසත්. හැබැයි, මේ නීති රීති හැදුවාට රටේ වංචාව, දූෂණය සහ බොරුව නවත්වන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒක තවත් වැඩිදියුණු වෙලා ක්‍රියාත්මක වන විධියයි අපට පෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ රාජ්‍ය අංශයේ සිදු වන වංචාව, දූෂණය හා හොරකම නැති කරන්න රජය වෙනුවෙන් නඩු දමන්න පෙනී සිටින්නේ නීතිපති දෙපාර්තමේන්තුව. එම දෙපාර්තමේන්තුව සහ අධිකරණ පද්ධතිය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් අපි මේ රටේ මොන නීති සම්මත කළත්, මොන නීති ගෙනාවත් තේරුමක් නැති බව අපි දකිනවා. මොන නීති ගෙනාවත් අධිකරණ පද්ධතිය, අධිකරණ ක්‍රියාදාමය හරියට සිදු වෙන්නේ නැත්නම් තේරුමක් නැහැ. දැන් බලන්න. රජයේ ආයතනවල සිදු වන දූෂණ, වංචා පිළිබඳව කටයුතු කරන්න තිබෙන ආයතනය තමයි නීතිපති දෙපාර්තමේන්තුව. හැබැයි අපි දකින්නේ නැහැ, නීතිපති දෙපාර්තමේන්තුව ඒ අදාළ ආයතනත් එක්ක ඒකාබද්ධව වැඩ කරන බව. නීතිපති දෙපාර්තමේන්තුව කියන්නේ, නීති උපදෙස් සපයන කණ්ඩායම ඉන්න ආයතනය.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

පෞද්ගලිකව කෙනෙකුට උසාවියේ තමන් වෙනුවෙන් පෙනී සිටින්න සල්ලි දීලා නීතිඥයෝ සපයා ගන්න පුළුවන්කම තිබෙනවා වාගේ, රජයේ ආයතනවලට පුළුවන් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගන්න. ඒ සඳහා වැටුප් ගෙවනවා. නමුත්, රාජ්‍ය නිලධාරියෙක් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලුවොත්, ඒ නීතිමය කාරණය සඳහා කටයුතු කරන ලෙස ඉල්ලුවොත්, ඒ රාජ්‍ය නිලධාරීන් ශත පහකට, තඹ දොයිතුවකට ගණන් ගන්නේ නැතුව තමයි නීතිපති දෙපාර්තමේන්තුව වැඩ කරන්නේ. හරියට අධිකරණයක් විධියට තමයි ඔවුන් හැසිරෙන්නේ. ඒ නිසා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා, කරුණාකරලා නීතිපති දෙපාර්තමේන්තුවත්, රාජ්‍ය ආයතනත් අතර සම්බන්ධතාව ගොඩනඟන්න කියලා. එහෙම නැත්නම් අපට පෙනෙන විධියට කරන්න තිබෙන හොඳම දේ තමයි, නීතිපති දෙපාර්තමේන්තුවත් privatize කරන එක. මේ රටේ රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කරනවා නම්, ඉස්සෙල්ලාම නීතිපති දෙපාර්තමේන්තුව පෞද්ගලීකරණය කරන්න ඕනෑ. එහෙම නැතිව ඒකේ කාර්යක්ෂමතාව හදන්න බැහැ කියන එක අපට තේරෙනවා. මොකද, ඒ කණ්ඩායම් ඒකාබද්ධ වෙන්නේ නැහැ නේ.

මේකට හොඳ උදාහරණයක් තමයි එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ප්‍රශ්නය. ඒ ගැන නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරු දෙතුන් වතාවයි කථා කරලා තිබෙන්නේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියත් - MEPA - එක්ක. නමුත් ඩොලර් බිලියන 6ක වන්දියක් ගන්න හදනවා. ඩොලර් බිලියන 6ක වන්දියක් ගන්නේ කොහොමද, ඒක ගණනය කරන මිනිස්සු එක්කවත්, ඒකට වග කියන මිනිස්සු එක්කවත් සාකච්ඡා නොකර? හරි නම් ඩොලර් බිලියන 6ක වන්දිය ගන්න නම් ඒ ගැන සාකච්ඡා කරන්න නීතිපති දෙපාර්තමේන්තුවේ කෙනකු, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ - MEPA - කෙනෙකු සතියකට සැරයක් හමුවෙන්න ඕනෑ. නමුත්, ඒ ආයතන ඒවා සැලකිල්ලට ගන්නේ නැත්නම්, ඒ ආයතන ගණන් ගන්නේ නැත්නම් කොහොමද වැඩ කරන්නේ? නිව් ඩයමන්ඩ් නෞකාවේ වන්දිය පවා අපට හරියට ලබාගන්න බැරි වුණේ, නීතිපති දෙපාර්තමේන්තුවත්, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියත් අතර සම්බන්ධයක් නැති නිසායි. මගේ කථාව අහගෙන ඉන්නවා නම්, මේ රටේ ඉන්න රාජ්‍ය නිලධාරීන් මේකට සාක්ෂි දරයි. සියලු රාජ්‍ය නිලධාරීන් එක්ක මනා සම්බන්ධතාවක් නැතිව, හිතුවක්කාර විධියට වැඩ කරගෙන යනවා නම් කොහොමද වැඩ කරන්නේ?

අපි දැක්කා ඊයේ-පෙරේදා ප්‍රකාශයට පත් කළා, වන්දි වශයෙන් ඩොලර් බිලියන 6.5ක් ලබා ගන්න තිබෙද්දී, ඩොලර් 878,650.53ක අතුරු වන්දියක් ලැබුණා කියලා. ඒ වන්දියක් නොවෙයි. බොරුව ජනගත කරන්න උත්සාහ කරනවා. ඒක වන්දියක් නොවෙයි. ඒක ලැබුණේ අද ඊයේ නොවෙයි. ඒක මේ ළඟදී නඩු කියලා ගත්ත මුදලක් නොවෙයි. ඒ නෞකාවෙන් විනාශය සිද්ධ වුණාට පස්සේ මැයි, ජුනි සඳහා පළමු අදියර වශයෙනුත්, ජූලි, අගෝස්තු සඳහා දෙවන අදියර වශයෙනුත්, සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සඳහා තුන්වන අදියර වශයෙනුත් 2022 නවවැනි මාසයේ 07වැනි දා ඩොලර් 67,54,557ක් අපට ලැබුණා. ඒක P&I Club එකෙන්, නැව් සමාගම් එක්ක තිබෙන සංවිධානයෙන් නැවකින් පරිසර දූෂණයක් වුණාම ඒක යථා තත්ත්වයට පත් කරන්න දෙන මුදල. ඒක වන්දියක් නොවෙයි. ඒ ස්ථානය පිරිසිදු කරන ආයතනයට යම් මුදලක් දෙනවා.

ඒ වාගේම 2022 මාර්තු මාසයේ අප්‍රේල්, මැයි, ජුනි, ජූලි, අගෝස්තු යන මාසවලට ඩොලර් 878,650.53ක් ලැබෙන්න අනුමත කරලා තිබ්බා, P&I Club එක. ඒ අනුමත කරලා තිබුණු එක ගත්තා. ඇයි, අනුමත කරපු එක කලින් දුන්නේ නැත්තේ? ඒකට හේතුව තමයි, නැවේ සුන්බුන් ගෙනයෑමට අපි අවසර දුන්නේ නැති එක. ඒ අවසරය නොදුන් නිසා අපද්‍රව්‍ය ඉවත් කරනවාට දෙන සල්ලි ටික නැවැත්තුවා. දැන් අපි ඒ අපද්‍රව්‍ය ඉවත් කරන්න විරෝධතාවක් නැහැ කිව්වා. එතකොට ඩොලර් 878,650ක මුදලක් අපට ලැබුණා. නමුත්, රටේ ජනතාව නොමඟ යවන්න මාධ්‍ය මඟින් ප්‍රකාශ කළා, අතුරු වන්දියක් වශයෙන් ඩොලර් 878,650ක් ලැබුණා කියලා. මේවා බොරු. මිනිස්සු අන්දනවා. මේ විධියට මිනිස්සු ඇන්දිල්ල නවත්තලා මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනය වන නීතිපති දෙපාර්තමේන්තුව එක්ක එකතු වෙලා වැඩ කටයුතු කරනවා නම් මෙහෙම ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ.

ඒ වාගේම අපි ඩොලර් 1,082,253.15ක මුදලක් -2022.11.30 දක්වා- ඉල්ලා තිබෙනවා නැව් සමාගමෙන්. වන්දි විධියට නොවෙයි, පිරිසිදු කිරීම් වශයෙන් අපි වියදම් කරපු සල්ලි ඉල්ලා තිබෙනවා. ඒක ගෙවලා නැහැ. ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම මේ නඩුව කියන්න නීතිපති දෙපාර්තමේන්තුව ඔස්ට්‍රේලියානු සමාගමට දුන්නා, ඩොලර් මිලියන 4.5ක්. ඒ නඩුව කියන්න සිංගප්පූරුවෙන් ණයට සල්ලි ගත්තා. අපේ රටේ නීතිඥයෝ නැද්ද? ඔවුන්ට දැනුම නැද්ද? උසාවි නැද්ද? මේවා තමයි අපි ජනතාවත් එක්ක, අදාළ රාජ්‍ය ආයතනත් එක්ක කථා කරලා ගන්න ඕනෑ සාමූහික තීන්දු. ඊයේ-පෙරේදා කැබිනට් පත්‍රිකාවක් දාලා තිබෙනවා ඒ නඩු කටයුතු සඳහා ඩොලර් මිලියන 9.5ක් අවශ්‍යයි කියලා. ඒ කියන්නේ රුපියල් බිලියන 3.18ක් නීතිපති දෙපාර්තමේන්තුව ඉල්ලනවා එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ සිද්ධිය වෙනුවෙන් නඩු කියන්න. නමුත් එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ සිදුවීමට අදාළව ලැබෙන වන්දිය කොපමණද?

දැන් සිංගප්පූරුවේත්, එංගලන්තයේත් මේ සම්බන්ධයෙන් නඩු දෙකක් තිබෙනවා. බැරි වෙලා හරි එංගලන්තයේ නඩුව දිනුවොත් ලැබෙන මුළු වන්දි මුදල ලැබෙන්නේ අපට විතරක් නොවෙයි, බඩු මුට්ටු -cargo- ඔක්කොටමයි, ඒවායේ අයිතිකරුවන්ටයි. එතකොට ඩොලර් මිලියන 9.5කට නඩු කියන එකේ තේරුමක් තිබෙනවාද? ඒක අනෙක් අයත් එක්ක සාකච්ඡා කරන්න ඕනෑ නැද්ද? ඒක හිතුවක්කාරකමට කරන්න ඕනෑද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ සඳහා වග කියන මූලික ආයතනය තමයි, MEPA එක. මේ මූලික ආයතනය අඩුම ගානේ පවරපු නඩුවේ පිටපතක් දැකලා නැහැ. මොකක්ද, පවරපු නඩුව කියලා MEPA එක දන්නේ නැහැ. කිසි විනිවිදභාවයක් නැතිව නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙනවා නම් මොකක්ද ඇතිවන තත්ත්වය? නඩුවක් පවරපු ලියවිල්ල අදාළ ආයතනය දන්නෙත් නැත්නම් මොකක්ද වෙන්නේ? ඇයි, මේක හංගාගෙන කරන්නේ? මේක විනිවිදභාවයෙන් කරන්න බැරිද? හංගාගෙන වැඩ කටයුතු කිරීම නිසා මොකක්ද වෙන්නේ? ඉස්සෙල්ලා මේවා විනිවිද දකින්න ඕනෑ. මේවා වසන් කරමින් කටයුතු කිරීම නිසා ප්‍රශ්න ඇති වෙනවා. මේ නීතිය පිළිබඳ කටයුතු කරන ආයතන දූෂණයට ලක් වීම වැළැක්විය යුතුයි.

ඒ විතරක් නොවෙයි. ඇයි මල්වානේ නිවස සම්බන්ධ නඩුව අයින් වුණේ? ආණ්ඩුව වෙනස් වෙනකොට මල්වානේ නිවස සම්බන්ධ නඩුව අයින් වුණා. ඒ විධියට නඩු 37ක් අයින් වුණා. යහ පාලන ආණ්ඩුව කාලයේ සිටි නීතිපතිවරයා ඒ නඩු පවරනවා. ඊළඟට ආපු නීතිපතිවරයා කියනවා ඒ නඩුවල technical faults තිබෙනවා කියලා. එතකොට නඩු අහක යනවා. එහෙම නම් ඒක ඒ නීතිපතිවරු දෙන්නා බලාගන්න ඕනෑ. හිටපු නීතිපතිවරයා වැරදියට නඩු පැවරුවේ මොකද කියලා ඒ ආපු නීතිපතිවරයා බලා

ගන්න ඕනෑ. එහෙම නම් යහ පාලන කාලයේ හිටපු නීතිපතිවරයාට විරුද්ධව නඩු දාන්න ඕනෑ, වැරදියට නඩු පැවරුවා කියලා. මේවා හදන්නේ නැතිව, මේවායේ විනිවිදභාවය හදන්නේ නැතිව මේ රටේ පවතින නීතියවත් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නැහැයි කියන එක මම විශේෂයෙන්ම පැහැදිලි කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සාරතී දුෂ්මන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.18]

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අධිකරණ අමාත්‍යාංශයට අයත් පනත් කෙටුම්පත් දෙකක්, නියෝග සහ නියමයක් පිළිබඳව තමයි විවාදයට ගැනෙන්නේ.

නඩු ප්‍රමාදය පිළිබඳව අපි කාලාන්තරයක් තිස්සේ දීර්ඝ වශයෙන් කථා බහ කරනවා. නඩු ප්‍රමාදය අවම කර ගැනීම සඳහා, සිවිල් අධිකරණවල නඩු ප්‍රමාදය අවම කර ගැනීම සඳහා මුදලේ සීමාව ඉහළ දමලා දිසා අධිකරණයට යන නඩු ප්‍රමාණයක් අලුතින් පිහිටවපු සුළු හිමිකම් අධිකරණයට භාර දීලා තිබෙනවා. මේ ඉදිරිපත් කරන සංශෝධන ගැන අපට කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ සඳහා අපේ උපරිම සහයෝගය ලබා දෙනවා. අදටත් අවුරුදු 40, 50 වාගේ බොහෝ දීර්ඝ කාලයක් පැවතිගෙන යන නඩු රාශියක් තිබෙනවා. ඒ අනුව මේක අද ඊයේ ඇති වුණු ප්‍රශ්නයක් නොවෙයි.

ඒ වාගේම නඩු වාර්තා ලබා ගැනීමට ඇති කරලා තිබෙන පහසුකම පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ඉදිරිපත් වෙලා තිබෙන වෙලාවක, මම හිතන විධියට මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කිරීමට දින 21ක කාල සීමාව මදි වේවි. ඒ නිසා මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත හරහා එය දින 42ක් ලෙස සංශෝධනය කර තිබෙනවා. මේ ගෙනැවිත් තිබෙන සංශෝධනවල කිසි ප්‍රශ්නයක් අපි දකින්නේ නැහැ. ඒවාට අපි සහයෝගය දෙනවා කියන කාරණය මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමා සභාවේ සිටින මේ වෙලාවේ කිවයුතු තවත් කාරණයක් තිබෙනවා. 2005දී එතුමා COPE එකේ සභාපතිවරයා හැටියට මේ රටේ වංචාව, දූෂණය පිළිබඳව කථා කරලා විසඳුමක් නොලැබුණු නිසා, එතුමා හිටපු පැත්ත අත හැරලා අනෙක් පැත්තට ගියා. එදා එතුමා එරෙහි වූ, එතුමා පෙන්වා දුන් රට තුළ පැවතියා වූ ඒ ක්‍රියාදාම අදටත් ඒ ආකාරයටම සිද්ධ වී ගෙන යනවා. ඉතින්, ආණ්ඩු වෙනස් වුණා කියලා රටේ ලොකු වෙනසක් මම දකින්නේ නැහැ. ඒ නිසා අපි දෙපැත්තට බෙදිලා ආණ්ඩු පක්ෂයට සහ විපක්ෂයට ඇඟිල්ල දිගු කර ගැනීම නොවෙයි කළ යුත්තේ. ඇත්තටම අපේ රටේ තරුණයා system change එකකින් බලාපොරොත්තු වුණේ සැබෑ වෙනසක්. ඒ හරයාත්මක වෙනස ලබා ගැනීමට අපි සියලුදෙනා එකතු වුණේ නැත්නම්, විශේෂයෙන්ම ඒ හරයාත්මක වෙනස මොකක්ද කියලා නිසි විග්‍රහයක් කර ගත්තේ නැත්නම් ඉදිරි කාලය තුළ ආණ්ඩු පක්ෂයේ ඉන්න දේශපාලන පක්ෂවලට වාගේම විපක්ෂයේ ඉන්න දේශපාලන පක්ෂවලටත් පාරට බහින්න බැරි තත්ත්වයක් උද්ගත වෙන එක වළක්වන්න බැහැ. ඒ නිසා සැබෑ ප්‍රශ්නය මොකක්ද, යථාර්ථය මොකක්ද කියන කාරණය ගැන අපි කථා බහ කළ යුතුයි.

මම විශ්වාස කරනවා, බොහෝවිට යථාර්ථය රඳා පවතින්නේ අද රටේ පවත්නා ආර්ථික තත්ත්වයත් එක්කයි කියලා. පසුගිය කාලයේ කළමනාකාරිත්වය ගත්තා වූ වැරදි තීන්දු තීරණත් එක්ක ඇති වෙලා තිබෙන ආර්ථික තත්ත්වය උඩ අද අපේ රටේ මිනිස්සු අනන්ත අප්‍රමාණ දුක් විඳින තැනට පත් වෙලා තිබෙනවා. මේ තැනින් අපේ ජනතාව ගොඩ ගන්නේ කොහොමද කියන කාරණයේදී විශේෂයෙන්ම රටේ නීති පද්ධතිය, නීති රාමුව ශක්තිමත්ව ඉදිරියට ගෙන යෑම සඳහා නිසි සැකැස්මක, යාන්ත්‍රණයක අවශ්‍යතාව අපි බොහොම පැහැදිලි විධියට දකිනවා. එහෙම නැතිව අහවලා අතේ තමයි සියලු වගකීම් තිබෙන්නේ කියලා අනෙක් අය ඇඟ බේරා ගන්න උත්සාහ දරනවා නම් අපි බලාපොරොත්තු වෙන තැනට රට ගෙනියන්න කාටවත් පුළුවන්කමක් ලැබෙන්නේ නැති වෙයි.

මට මතකයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවේ බොහෝ ගුණාංග ඒකට එකතු කරලා. හැබැයි, පාර්ලිමේන්තුව තුළ ඒකට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක වුණේ නැහැ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන්න. විශේෂයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කටයුතු පාලනය කිරීම සඳහා රෙගුලාසි නිර්මාණය වුණේ නැහැ. ඒ තුළ ඇති වුණු විවිධ ප්‍රශ්න දේශපාලන ප්‍රශ්න දක්වා දුර දිග ගිහිල්ලා ඒ මොහොතේ තිබුණු ආණ්ඩුව කැඩිලා බිඳිලා ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පසුව ගෙන ආ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරලා වැඩක් නැහැ. විශේෂයෙන් විශාල ඡන්ද ප්‍රමාණයක් අරගෙන ආපු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කෙරෙහි තිබුණු බලාපොරොත්තු බොහොම කෙටි කාලයකින් දිය වෙලා ගියේ, එතුමා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමය පිළිබඳ විශ්වාසය පැත්තක තියලා ඊට එරෙහිව වැඩ කටයුතු කරපු හින්දා. එහි ආදීනවත් අද දක්වා අපේ සමාජයේ නෂ්ටාවශේෂ හැටියට තිබෙනවා. ඒ නිසා වර්තමාන ආණ්ඩුවට බොහොම ඉක්මනට කරන්න තිබෙන්නේ මේ ආර්ථිකය ශක්තිමත් කරන්නා වූ වැඩ පිළිවෙළක් ඉදිරියට කරගෙන යෑමයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගත්තාම, අප දකින විධියට එය අදත් දෙපැත්තට ඇද ඇද ඉන්නවා. එහෙම නැතිව රටේ තරුණයන් බලාපොරොත්තු වුණු system change එක සිදු කරන, තරුණයන්ගේ බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ කරන පාටක් අදත් අපට පෙනෙන්නට නැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපි කිසිම වෙලාවක කුහක දේශපාලනයේ නිරත වුණේ නැහැ. අපේ පක්ෂය IMF එකට යන්න ඕනෑය කියපු පක්ෂයක්. IMF එකේ සල්ලි නොලැබෙන තැනට පත් වුණාම ඒකෙන් සතුටු වන පක්ෂයක් නොවෙයි අපේ පක්ෂය. එම නිසා අපි කියනවා පුළුවන් තරම් සාකච්ඡා කරලා, අපේ රටේ ජනතාවට බර නොදැනෙන විධියට කටයුතු කරන්න කියලා. විශේෂයෙන්ම IMF සාකච්ඡාවලදීත් කියැවුණේ වංචා, දූෂණ පිළිබඳව රටේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා කියලායි. ඒවා වැළැක්වීම සම්බන්ධයෙන් පවතින යන්ත්‍රණ අක්‍රිය වෙලා තිබෙනවා නම්, ඒවා සක්‍රිය කිරීමට අවශ්‍ය වැඩ කටයුතු කිරීම තමයි අද ආණ්ඩු පක්ෂයේ වගකීම බවට පත් විය යුත්තේ. බොහොම පැහැදිලිව පෙනෙනවා, විශේෂයෙන්ම Inland Revenue Department එකෙන්, Excise Department එකෙන්, Sri Lanka Customs එකෙන් රටට ලැබිය යුතු ආදායමෙන් සියයට 40ක්, 50ක් ලැබෙන්නේ නැති බව. අපේ රටේ අපනයන ක්ෂේත්‍රය දිහා බලන්න. අපේ රටට තේ අපනයනයෙන් පමණක් ලැබෙන්න තිබෙන ආදායමෙන් සියයට 50ක්ම ලැබෙන්නේ නැහැ. ඒ මුදල් ඒ ඒ රටවල නවත්වාගෙන ඉන්නවා. ඒ මුදල් අපේ රටට එන්නේ

[ගරු සාරතී දුෂ්මන්ත මහතා]

නැහැ. අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න බොහොම පැහැදිලි මාර්ග තිබෙනවා. ඒ සඳහා නිසි ක්‍රමෝපායයන් අනුගමනය කළ යුතුයි. අදාළ ආයතන අවශ්‍ය තීන්දු තීරණ ගත්තේ නැත්නම්, එම ආයතන අවශ්‍ය තීන්දු තීරණ ගත්තේ නැති එකේ වගකීම පාර්ලිමේන්තුවේ 225දෙනා මත පටවන්න උත්සාහයක් දරනවා නම්, අපි එතැනින් එහාට ගිහිල්ලා ජනතාවට පැවසිය යුතුයි, මෙය සැබෑවටම නැවතිලා තිබෙන්නේ කුමන හේතුවක් නිසාද කියලා.

ඒ වාගේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අකර්මණ්‍යභාවය මඟ හරවන්න ගරු කථානායකතුමා මැදිහත් වෙලා ඉදිරි කාලය තුළ අවශ්‍ය කටයුතු ටික ඉෂ්ට සිද්ධ කළේ නැත්නම්, ජනතාවගේ, තරුණ පිරිසගේ අසහනය ඉදිරියේදී තවදුරටත් වැඩි වන එක වළක්වාගන්න බැහැ. මොකද, දැන් ලයිට් බිල නැවතත් වැඩි කරන්න යනවා සියයට 22කින්. කොහොමද ඒක ගෙවන්නේ? ලබන මාසය වනකොට බොහෝ නිවාසවල විදුලිය කප්පාදු කරන මට්ටමකට එයි. මාස දෙකක ලයිට් බිල එකතු වුණොත් විදුලිය කප්පාදු කරන මට්ටමට එයි. එම නිසා අවශ්‍ය යන්ත්‍රණය කරුණාකර සකසන්න. අපට අණ පනත් ගේන්න පුළුවන්. දැනටත් අණ පනත් රාශියක් ගෙනැල්ලා තිබෙනවා. පසුගිය වසරක වාගේ කාලය තුළ හොඳ අණ පනත් ගෙනැල්ලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම අණ පනත් සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට තිබෙන බාධක ටික නැති කරලා, අපි ඉදිරියටම ගමන් කරමු කියා ඉල්ලා සිටිමින්, නියමිත කාලය අවසන් නිසා මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තවරාජා කලෙයි අරසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.25]

**ගරු තවරාජා කලෙයි අරසන් මහතා**
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் குடியியல் நடவடிக்கைமுறைச் சட்டக் கோவை (திருத்தம்) சட்டமூலம், மத்தியஸ்த (விசேட வகுதி களைச் சார்ந்த பிணக்குகள்) சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் என்பன பற்றிய விவாதம் இடம்பெற்றுக்கொண்டிருக்கிறது.

எமது நாட்டைப் பொறுத்தமட்டில், ஒவ்வொரு பிரதேசத் திலும் மத்தியஸ்த சபைகள் அமைக்கப்பட்டு, அவற்றின்மூலம் மக்களின் பிரச்சினைகளைக் கையாளுகின்ற விடயம் உண்மை யிலேயே வரவேற்கத்தக்கதொரு விடயமாகும். வீணான செலவுகளைக் குறைத்து, அந்தந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களின் பிரச்சினைகளை இலகுவாக இனங்கண்டு, அவற்றுக் குச் சரியான தீர்வுகளையும் மக்களுக்கு நியாயத்தையும் பெற்றுக்கொடுக்கின்ற விடயம் இவற்றின்மூலம் நடைபெற்றுக் கொண்டு இருக்கின்றது. எனவே, மத்தியஸ்த சபைகளை வலுப்படுத்தி, எதிர்காலத்தில் இந்த நாட்டில் நியாயமான தீர்வுகளை மக்களுக்குப் பெற்றுக்கொடுக்கக்கூடிய சபைகளாக நாங்கள் அவற்றை மாற்ற வேண்டும். அதற்காக இதனுடன் சம்பந்தப்பட்ட ஒழுங்குவிதியைக் கொண்டுவந்த குறித்த அமைச்சுக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இன்று இந்த நாட்டிலாக இருக்கலாம் அல்லது சர்வதேசத் திலாக இருக்கலாம் சமூக வலைத்தளங்களும் தனியார் ஊடகங்களும் சுதந்திரமாக இயங்குவதனால், நாட்டில் நடக்கின்ற, உலகத்தில் நடக்கின்ற அனைத்து விடயங் களையும் எங்களால் இலகுவாக அறிந்துகொள்ளக்கூடியதொரு சூழல் இருக்கிறது. இந்த நிலையில் இன்று இச்சபையில் முதலாம் மதிப்பிற்காகச் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற நிகழ் நிலைக் காப்புச் சட்டமூலமானது, சமூக வலைத்தளங்கள்மீதும் ஊடகங்கள்மீதும் கட்டுப்பாடுகளை விதிக்கக்கூடிய வகையில் அமைந்துவிடக் கூடாது. இன்று எமது நாடு மிக மோசமாக இலஞ்ச, ஊழல் நடைபெறுகின்ற நாடாகவும் பொருளா தாரத்தில் மிகவும் பின்தங்கிய நாடாகவும் இருந்துகொண்டு இருக்கிறது. இந்த நாடு மீட்சிபெற வேண்டுமாக இருந்தால், முதலில் இலஞ்சம், ஊழல் ஒழிக்கப்பட வேண்டும். அச்செயற்பாட்டை நாங்கள் அனைவரும் இணைந்து செயற் படுத்த வேண்டும். இந்த நாட்டில் மிக மோசமான ஊழல்கள் நடைபெற்றிருப்பது உங்களுக்குத் தெரியும்!

குறிப்பாக, கடந்த ஆண்டு சீனி இறக்குமதியில் பாரிய ஊழல் இடம்பெற்றது. அதேபோன்று, எரிந்து நாசமாகிய "X-Press Pearl" கப்பல் விடயத்தில்கூட பாரிய ஊழல் இடம்பெற்றிருக்கிறது. இவ்வாறான ஊழல்களை வெளியே கொண்டுவருவதில் தனியார் தொலைக்காட்சி நிறுவனங்கள் மற்றும் சமூக வலைத்தளங்களின் பங்கு மிகவும் இன்றியமை யாதது. அந்த வகையில், சக்தி TV, சிரச TV போன்ற தனியார் தொலைக்காட்சிகள் உடனுக்குடன் இவ் வாறான செய்திகளை வெளிக்கொண்டுவந்து, மக்களை மாத்திரமல்ல, அரசியல் வாதிகளையும் விழிப்படையச் செய்ததை நாங்கள் மறந்துவிட முடியாது. சமூக வலைத் தளங்களைக் கட்டுப்படுத்துகின்ற அல்லது அடக்குகின்ற நிலைக்கு இந்த நாடு செல்லக்கூடாது என்பதில் நாங்கள் மிகவும் உறுதியாக இருக்கின்றோம். இவ்வாறான செயற் பாடுகள் நிச்சயமாக எதிர்காலத்தில் இந்த நாட்டில் நியாயபூர்வமான செயற்பாட்டை முன்னெடுப்பதற்கு உறுதுணையாக அமையாது என்பது எனது கருத்தாகும்.

குருந்தூர் மலை விடயம் சம்பந்தமான தீர்ப்பும் மனிதப் புதைகுழி விடயத்தில் அரசுக்குச் சார்பாகத் தீர்ப்பு வராது என்றதோர் அச்சமும் சரத் வீரசேகர போன்றவர்கள் குருந்தூர் மலையிலிருந்து வெளியேற்றப்பட்டமையும் தியாக தீபம் திலீபன் அவர்களின் நினைவேந்தலை அனுஷ்டிப்பதற்கு அனுமதி வழங்கியமையுமே நீதிபதி ரீ. சரவணராஜா அவர்கள் நாட்டை விட்டு வெளியேறுவதற்கான சூழலை ஏற்படுத்தியது எனப் பலரும் கருத்துக்களை முன்வைக்கின்றார்கள். உண்மை யிலேயே இந்த நாட்டில் நீண்ட காலமாகத் தமிழர்கள்மீது ஓர் அடக்குமுறை திணிக்கப்பட்டு வருவதை நீங்கள் அனைவரும் அறிய வேண்டும். அந்த அடிப்படையில், இன்றும்கூட, அரசியல்வாதிகளாகிய நாங்கள் எங்கு சென்றாலும், புலனாய் வுத்துறையினர் எங்களைப் பின்தொடர்ந்து கண்காணித்துக் கொண்டுதான் இருக்கிறார்கள். இராணுவப் புலனாய்வுத் துறையினரின், தேசியப் புலனாய்வுத்துறையினரின், அரச புலனாய்வுத்துறையினரின் தொடர்ச்சியான கண்காணிப்பு காரணமாகவும், சரத் வீரசேகர போன்றவர்களின் அழுத்தங்கள் காரணமாகவும், உயிர் அச்சுறுத்தல் காரணமாகவுமே நீதிபதி சரவணராஜா அவர்கள் நாட்டை விட்டு வெளியேறி இருக்கிறார். அவருடைய கடவுச்சீட்டுக்கூட குறிப்பிட்ட சில தினங்களுக்கு முன்னரே

எடுக்கப்பட்டிருக்கிறது. இவ்வாறு அவர் நாட்டை விட்டு வெளியேறி இருப்பதென்பது, இந்த நாட்டுக்கும் நீதித்துறைக்கும் சவால்மிக்க ஒரு விடயமாகவே இருந்துகொண்டிருக்கின்றது. ஆகவே, இந்த நாட்டில் நீதித்துறை சுயாதீனமாக இயங்க வேண்டும் என்பதை நான் இவ்விடத்தில் கூறிவைக்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சிவநேசதுரை சந்திரகாந்தன் அவர்களின் நெருங்கிய சகாவாக இருந்த அசாத் மௌலானா கருத்தொன்றை முன்வைத்திருக்கிறார். அதாவது, மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினராக இருந்து மரணித்த மாமனிதர் யோசப் பரராஜசிங்கம் அவர்களின் கொலை தொடர்பான வழக்கின் தீர்ப்பு 100 சதவீதம் சந்திரகாந்தனுக்கு எதிராக வரவிருந்த சூழலில், நீதிபதியை மாற்றியதாகக் கூறி யிருக்கிறார். அதுமாத்திரமல்ல, கிழக்கு மாகாண ஆளுநராக இருந்த ஹிஸ்புல்லாகூட, தான் மட்டக்களப்பு மாவட்டத் திலுள்ள ஓர் ஆலயத்தை இடித்து, அந்த இடத்தில் சந்தை அமைத்ததாகப் பகிரங்கமாகத் தேர்தல் பிரசாரத்தின்போது கூறியிருந்தார். அந்தச் சந்தர்ப்பத்தில் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாரிய எதிர்ப்புக்கு மத்தியில் தான் நீதிபதியை மாற்றியதாக அவரே கூறியிருக்கின்றார். இவ்வாறான கருத்துக்கள் இந்த நாட்டின் நீதித்துறையை எவ்வாறு பாதித்திருக்கின்றது என்பதை நீங்கள் அறிந்துகொள்ள வேண்டும்.

இந்த நாட்டில் நீதித்துறை சுயாதீனமாக இயங்கவில்லை. அரசியல்வாதிகளின் அழுத்தங்களுக்கு மத்தியில், அவர்கள் நினைக்கின்ற விடயங்களைச் சாதிப்பதில்தான் நீதித்துறை இருந்துகொண்டிருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, இந்த நிலைமையை நீங்கள் இனியும் அனுமதிக்கக் கூடாது. இந்த நாட்டில் நீதியான, நியாயபூர்வமான, சமத்துவமான நீதித்துறை இருக்க வேண்டும்; அது நாட்டு மக்களைப் பாதுகாப்பதாக அமைய வேண்டும் என்று நான் உங்களிடம் இந்த உயரிய சபையிலே கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උදයන කිරිඳිගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.34]

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිවිල් නඩු විධාන සංග්‍රහයට සංශෝධන ගෙන එමින්, අධිකරණ සංවිධාන පනත යටතේ නියමය සහ සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ නියෝග පිළිබඳවත් විවාද කරන මේ අවස්ථාවේ, හැම දාම අපි බලාපොරොත්තු වන්නා වූ ප්‍රතිඵලය නීති සංශෝධන තුළින් මේ සමාජයට ලැබෙනවාද කියන එක පිළිබඳව තමයි අපි සාකච්ඡා කරන්නට ඕනෑ.

විශේෂයෙන් අපි යම් යම් සංශෝධන ගේනවා. ඒවා සමාජයට, ඒ වාගේම නඩු කටයුතු ඉක්මන් කරන්නට නීතියේ ප්‍රවර්ධනයට හේතු වෙනවා. ඒ හා සමානවම දේශපාලන අවශ්‍යතා මත සමහර සංශෝධන ගෙනෙනවා අපි දකිනවා. එහෙම කියන්න සිද්ධ වෙන්නේ මේ නිසායි. 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ගෙනාවා. ඒ පනත ගෙනැල්ලා අවුරුදු 8කින් -2023 වෙනකොට- එය අහෝසි කළා. හැබැයි, ඒ පනත යටතේ වරදකරුවන් වෙච්ච, ඒ යටතේ ඇප නැතිව රිමාන්ඩ් බන්ධනාගාරගත වෙලා සිටින පුද්ගලයන්ට මොකද වෙන්නේ? මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයකු වන, හිටපු මාධ්‍යවේදියකු වන ජේ. ශ්‍රී රංගා මහතා තවමත් රිමාන්ඩ් බන්ධනාගාරගතව ඉන්නවා. හැබැයි, මේ පනත දැන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ වෙච්ච අසාධාරණයට ඔවුන්ට වන්දි ගෙවන්නේ කොහොමද? මේවා දේශපාලන පළිගැනීම් සඳහා ගෙනෙන පනත් ද? මෙන්න, මේ කාරණා ගැන සමාජයේ සාකච්ඡාවක් ඇති විය යුතුයි කියා මා විශ්වාස කරනවා. මොකද, අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත්වලට අත ඔසවා එකඟ වුණාට, අවසානයේ ඒකෙන් යම් පිරිසක් අසාධාරණයට ලක් වෙනවා නම්, ඒ ගැනත් අපට විශේෂයෙන් සලකා බලන්න වෙනවා. මට ලැබී තිබෙන තොරතුරු මත මේ පනත අහෝසි කිරීමත් සමඟම ඒ බහුතරයක් වූදිතයන්ට ඇප ලැබී ඇති නමුත්, ජේ. ශ්‍රී රංගා මහතා තවමත් රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටිනවා. අපි අධිකරණයේ පවතින කටයුත්තකට මැදිහත් වෙන්න උත්සාහ කරනවා නොවෙයි. නමුත්, මේ සමාජයේ ප්‍රගමනය සඳහා සාධාරණය, යුක්තිය කියන මේ සියල්ලම අවශ්‍ය වෙනවා.

වර්තමානයේ සිදු කරන මේ සංශෝධන එක්ක සුළු හිමිකම් අධිකරණයට අදාළව පැවති ඒ රුපියල් ලක්ෂ 15ක මුදල් සීමාව රුපියල් ලක්ෂ 20ක් දක්වා වැඩි කිරීමත් සමඟ අධිකරණ ක්ෂේත්‍රයේ තිබුණු නඩු තදබදයට විසඳුමක් ලබා දීම සඳහා අධිකරණ අමාත්‍යාංශය යම් උත්සාහයක් ගෙන තිබෙනවා කියලා අපි දකිනවා.

ඊළඟට, මැතිවරණ පෙත්සම් ඉදිරිපත් කිරීමේදී ලබා දිය යුතු කාලය වැඩි කරමින් සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. පොඩි පොඩි සංශෝධන ගෙනාවා කියලා මේ රටේ මැතිවරණ ගැන ජනතාව තුළ තිබෙන අවිශ්වාසය දුරලීමේ හැකියාවක් අපට නැහැ. 1977 වෙනකල් මේ රටේ ක්‍රියාත්මක වුණේ කේවල කොට්ඨාස ඡන්ද ක්‍රමය. ඊට පසු සමානුපාතික නියෝජන ක්‍රමය ආවත් එක්කම තමයි මේ දේශපාලනය විනාශ වෙන්න ගත්තේ, වංචාව දූෂණය රජ කරන්න ගත්තේ, මිල මුදල් එක්ක දේශපාලනය ගැටෙන්න ගත්තේ, අවි ආයුධ එක්ක දේශපාලනය ගැටෙන්න ගත්තේ. අද උදේ එක්තරා මාධ්‍ය නාළිකාවක පාතාලය ගැන සාකච්ඡාවක් ගියා. මම නුවර ඉඳලා මෙහේට එනකල් ඒක අහගෙන ආවේ. ඒ තුළ කියවුණු දේවල්වල සත්‍ය, අසත්‍ය කෙසේ වෙතත්, දේශපාලනය එක්ක ගැවුණු සැකමුසු තැන් ගොඩක් තිබෙනවා. මෙන්න, මේවා සම්බන්ධයෙන් අපි විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, මේ ඡන්ද ක්‍රමයත් එක්කම තමයි අපි 225දෙනාම එපා කියලා කියන්නේ. අඩු ගණනේ ඒ පැරණි ඡන්ද ක්‍රමයත් එක්ක අපට තිබුණා, අතුරු මැතිවරණ ක්‍රමයක්. ඒ අනුව ජනතාව තමන්ගේ මතයට විරුද්ධ නම්, සෘජුව එළියට බැහැලා නැවත ජනතා ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ඒමේ හැකියාවක් තිබුණා. හැබැයි, පාර්ලිමේන්තුවේ කථා කරලා කේවල ක්‍රමය සහ සමානුපාතික නියෝජන ක්‍රමය ඒකාබද්ධ කිරීමක් සහිත අලුත් මැතිවරණ පනත් ගෙනාවාට ඒවා හමස් පෙට්ටියට ගිහින් තිබෙනවා, ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඉතින්, මෙන්න මේවා සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කළේ නැත්නම් ඉදිරියේ දී නිහඬ, ඒ වාගේම අවංක දේශපාලනයක් කරන පිරිසට දේශපාලන ක්ෂේත්‍රය තුළ ඉදිරියට ඒමේ හැකියාවක් නැති වෙනවා. මොකද, දූෂණ කරන, හොරකම් කරපු පිරිසකට පමණයි ඡන්දයෙන් පාර්ලිමේන්තුවට හා අදාළ ආයතනවලට පත් වීමේ හැකියාව ලැබෙන්නේ.

මේ හා සමානව ම පෙරේදා සමාජයේ ලොකු කතාබහකට ලක් වුණා SriLankan Airlines එක. වගකිව යුතු ඇමතිවරයෙක් කිව්වා කියලා ප්‍රකාශයක් තිබෙනවා, SriLankan Airlines ප්‍රමාද වෙනවා නම් වෙනත් යානා භාවිත කරන්න කියලා. මේක නොවෙයි අපි

රජයකින් බලාපොරොත්තු වෙන්නේ. SriLankan Airlines කියන නාමය මේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ හැම තැනම ඉතාම ජනප්‍රිය වෙච්ච නාමයක්. හැබැයි, මේ සන්නාමයට අද මොකක්ද වෙලා තිබෙන්නේ? අපේ දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයාත් සමඟ කත්මන්ඩු බලා යන ඒ ගුවන් යානයේ යන්න මේ රටට ආපු ආයෝජකයන් කිහිපදෙනෙක් සිටියා. ඔවුන්ට ඇති වෙච්ච අපහසුව මා පෞද්ගලිකව දන්නා නිසායි මේ ගැන කියන්නේ. එහෙම වුණාම මේ රටේ ආයෝජනය කරන්න මිනිසුන් පැමිණේවිද, ආයෝජකයන් පැමිණේවිද? සංචාරකයන් පැමිණේවිද? මේක වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක් නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම රජය අතපසු කරලා තිබෙනවාය කියන එකත් මට කියන්න වෙනවා. ඒ වාගේම මේ තුළින් ඇතිවන අපකීර්තිය ගැනත් අපි හිතන්න ඕනෑ. සංචාරක කර්මාන්තය යන්තම් ගොඩනැඟීගෙන එනකොට මොකක්ද වුණේ? ඇත්තටම මේ සිද්ධිය ගැන මට කියන්නත් කනගාටුයි. ඒ ආපු එක් ඉන්දීය සංචාරකයෙක් කිව්වා, මාසයකට පමණක් ක්‍රියාත්මක වන SriLankan Airlines Kathmandu direct flight එකේ යන්න මට අවස්ථාව ලැබුණා, මම පුදුම වාසනාවන්තයි කියලා. හැබැයි, අන්තිමට ඔහුට මොකද වුණේ? Kathmandu flight එකට ගිහිල්ලා, පැය දෙකහමාරක් flight එකේ ඉඳලා උදේ ආහාරයත් අරගෙන ආපසු එන්න සිද්ධ වුණා.

මේවා ජාතියම ලජ්ජා වෙන්න ඕනෑ දේවල්; කනගාටු වෙන්න ඕනෑ දේවල්. මේ වෙච්ච සිද්ධියට රට වෙනුවෙන් අපි ඔවුන්ට කනගාටුව ප්‍රකාශ කරනවා. මොකද, SriLankan Airlines කියන නාමය ඉන්දියානු සංචාරකයන්ගේ පළමුවැනි කැමැත්ත තිබෙන ගුවන් සේවා නාමයක්. ඔවුන්ගේ ගුවන් සේවා සන්නාමයට වඩා ඔවුන් ආදරය කරන්නේ SriLankan කියන සන්නාමයට. ඔවුන් මේ ගුවන් සේවය නැති වෙනවාට කැමැති නැහැ. මේ තිබෙන තත්ත්වය තුළ අප විසින්ම මේ ආයතනය ඇතුළේ කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක කරනවාද කියන එකත් බලන්න වෙනවා. මම කිව්වා වාගේ මේ රටේ සියලු දේවල් දූෂණය, වංචාව සහ මිල මුදල් එක්ක ගැටගැහිලා තිබෙනකොට මේ ක්‍රියාත්මක වෙන්නේත් ඒකේ එක්තරා කොටසක්ද කියලා කුකුසක් ඇති වෙනවා. එහෙම කුකුසක් ඇතිවීම සාධාරණයි, අද ඇති වෙලා තිබෙන තත්ත්වය තුළ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අධ්‍යාපනය ගැන ගරු අධ්‍යාපන අමාත්‍යතුමා සමඟ මම අද උදේ සාකච්ඡා කළා. මම නැවතත් ඉල්ලා සිටිනවා, මේ දරුවන්ට සාධාරණයක් ඉෂ්ට වෙන විධියට හැකි ඉක්මනින් උසස් පෙළ විභාගය සඳහා දිනයක් නියම කරලා මේ මානසික පීඩාවෙන්, ඔවුන්ට ඇති වෙලා තිබෙන ගැටලුසහගත තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා වහාම මැදිහත් වෙන්න කියලා. මෙතැනදී අමාත්‍යවරයාගේ සංවේදීකම නිලධාරින්ට නැද්ද කියන ප්‍රශ්නය තමයි අපට මතු වෙන්නේ. මොකද, හැම වෙලාවේම බැණුම් අහන්නේ දේශපාලනඥයා වුණාට දේශපාලනඥයාගේ නියෝග මත කටයුතු කරන නිලධාරින් අවශ්‍ය කටයුතු අවශ්‍ය වෙලාවට මෙහෙයවන්නේ නැත්නම්, ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, ඔවුන්ගේ හදවත් සංවේදී වෙන්නේ නැත්නම් ඔක්කොම කුණු බේරුවල බොක්කට වාගේ මේ රටේ බැණුම් අහන්න කොටසක් ඉන්න නිසා නිලධාරින් ඔවුන්ගේ ගැලවීම උදෙසා කටයුතු කරනවාද කියලා සිතා බැලිය යුතුය කියමින් මම නවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මට කෙටි අවස්ථාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, ජේ. ශ්‍රී රංගා හිටපු මන්ත්‍රීතුමා පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයේ ඔහුට විරුද්ධව පවතින නඩුවක සාක්ෂිකරුවෙකුට ඔහු බලපෑම් කළා කියන චෝදනාව මත තමයි ඔහු රැඳවුම් භාරයේ තබාගෙන ඉන්නේ. ඒක කිසිසේත් දේශපාලනයට අදාළ කාරණයක් නොවෙයි. ඒකට අපට කරන්න දෙයක් නැහැ. ඒක අධිකරණයේ අභිමතය මත කෙරෙන කාර්යයක්.

අනෙක් කාරණය මෙයයි. අපි අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ගෙනාවා, ඒක ක්‍රියාත්මක කළා, පසුව ඒකේ අඩු පාඩු දැක්කා. අඩු පාඩු දැකපු නිසා ඒවාත් නිවැරදි කළා. සමහර උදවිය ඒ පනත යටතේ අත්අඩංගුවට ගත්තාම බරපතළ ප්‍රශ්නයක් ඇති වෙනවා. මොකද, අභියාචනාධිකරණයට ගිහින් තමයි ඇප ගන්න සිද්ධ වෙන්නේ. ඉතින්, අපි ඒ පැත්තත් බලලා ඒක ලිහිල් කරලා තමයි ඒ බලය මහෙස්ත්‍රාත් අධිකරණයට ලබා දීලා තිබෙන්නේ.

අනෙක් කාරණය තමයි, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සම්බන්ධව නොයෙකුත් අවස්ථාවලදී උත්සාහ නොකළා නොවෙයි. මම කලිනුත් මේ ගැන සඳහන් කළා. මේ ගරු මන්ත්‍රීතුමා ඒ අවස්ථාවේ මෙම ගරු සභාවේ නොසිටියා වෙන්න පුළුවන්. 2015දී යහ පාලන ආණ්ඩුව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනකොට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් මේ සභාවේ තිබුණා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය ඉල්ලන ගමන් අපි මන්ත්‍රීතුමන්ලාට කිව්වා, ඉදිරි මැතිවරණයට පෙර විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා ඒකත් සම්මත කරලා දෙනවා කියලා. මට මතක විධියට ඒ යටතේ තිබුණේ කොට්ඨාස 160යි. 225 දක්වා අවශ්‍ය ඉතිරි මන්ත්‍රී සංඛ්‍යාව 65ක් වෙන්න ඕනෑ. ඒක එක්කෝ පළාත් මට්ටමින්, එහෙම නැත්නම් දිස්ත්‍රික් ලැයිස්තු මට්ටමින්, එහෙම නැත්නම් ජාතික මට්ටමින් තෝරා පත් කර ගන්න ඕනෑ. අපි ඒක කරන්න ලෑස්ති වෙනකොට -එවක අපි ආණ්ඩුවේ ඇමතිවරු වුණාට, අපි දන්නේත් නැතිව- පාර්ලිමේන්තුව විසුරුවපු නිසා අපට ඉන් එහාට යන්න බැරි වුණා. එම නිසා මම නැවත වතාවක් මෙය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා. ඊයේ අමාත්‍ය මණ්ඩලය මේක සාකච්ඡාවට ගත්තා. ගරු ජනාධිපතිතුමා ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් Cabinet Subcommittee එකක් පත් කළා, මේ පාර්ලිමේන්තුවේ පක්ෂ නායකතුමන්ලාත් එක්ක සාකච්ඡා කරලා මේ පිළිබඳව එකඟතාවකට එන්න කියලා. එහෙම වුණොත් අපි උපරිම වශයෙන් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා, ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයට පෙර මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට අදාළ නීති රීති සම්මත කර ගන්න. ඔබතුමන්ලාගේ සහයෝගය දෙනවා නම් අපට මේක කර ගන්න එක එච්චර අපහසු වෙන එකක් නැහැ.

**ගරු උදයන කිරිදිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)

ඒ සංවේදීභාවය සම්බන්ධයෙන් ගරු විජයදාස රාජපක්ෂ අපේ අධිකරණ ඇමතිතුමාට ස්තුතිය ප්‍රකාශ කරනවා. මොකද, මෙතැන තිබෙන්නේ රටේ ඉන්න සමස්තයේ අවශ්‍යතාවක්. කැබිනට් මණ්ඩලයට මේ සංශෝධනය ඉදිරිපත් කරලා ඒ ගැන සාකච්ඡාවට බඳුන් කිරීම ගැන විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට මේ වෙලාවේ මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ඒ පිළිබඳව ඔබතුමාට මගේ ගෞරවය ප්‍රකාශ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න සමහර අය මැතිවරණ ක්‍රමය වෙනස් කරනවාට බයයි. මොකද, දිස්ත්‍රික්කය පුරා ගිහිල්ලා කොහොම හරි යම් කිසි ඡන්ද ප්‍රමාණයක් එකතු කර ගන්න පුළුවන් වාසිදායී කණ්ඩායම් අප අතර ඉන්න නිසා. නමුත්, එහෙම නැති අයත් ඉන්නවා. සමහර වෙලාවට මේ තිබෙන ක්‍රමය මටත් වාසියි. මොකද, කොළඹ දිස්ත්‍රික්කයේ ආසන 15න්ම මට ඡන්ද ලැබෙන නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වාසි වුණත් රටට හිතකර නැත්නම් අපි රටට අවශ්‍ය විධියට ඒ නීතිය වෙනස් කරන්න ඕනෑ. මේ නිවැරැදි ක්‍රමය හඳුන්වා දුන්නාට පස්සේ ජනතාව අපි පරාජය කරලා ගෙදර යැව්වාට අපට කිසිම දුකක් නැහැ. අපේ duty එකයි කෙරෙන්න ඕනෑ. මේ ඉන්න වෙලාවේ අපේ වගකීම ඉෂ්ට කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අනුරාධ ජයරත්න රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.45]

**ගරු අනුරාධ ජයරත්න මහතා (අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுராத ஜயரத்ன - நீதி மற்றும் சிறைச்சாலை அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Justice and Prison Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පත් කිහිපයක් වාගේම නියෝග සහ නියමයක් විවාදයට ගන්නා මේ මොහොතේ ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම සිවිල් නඩු විධාන සංග්‍රහයට කෙරෙන මේ ප්‍රායෝගික සංශෝධනය යටතේ, නඩු වාර්තා ලබා ගැනීමට යැමේදී අය කිරීමකින් තොරව සහතික කරපු පිටපත් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම ඒ නඩු කටයුතුවලට සහභාගි වන අයට අත්‍යවශ්‍ය වූ කාරණාවක් කියලායි මම විශ්වාස කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SAMANPRIYA HERATH left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.*

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அனுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දිනවල සම්මත කළ පනත් අතරින් සුවිශේෂීම පනතක් බවට පත් වුණා, මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත. බොහෝ දෙනෙකුගේ කථා බහට ලක් වෙච්ච දූෂණයකින් තොර වූ මැතිවරණයක් සඳහා වන මූලික අවශ්‍යතා මේ පනත තුළ ගැබ් වෙලා තිබෙනවා. පාර්ලිමේන්තු මැතිවරණය වේවා, පළාත් සභා මැතිවරණය වේවා, පළාත් පාලන මැතිවරණය වේවා, ජනාධිපතිවරණය වේවා මේ සියලු මැතිවරණවලදී අපේක්ෂකයන් කරන වියදම් පිළිබඳවත්, ඒ වාගේම යම් යම් කණ්ඩායම් බලයට පත් වීම පිළිබඳවත්, ඔවුන් ඒ වෙනුවෙන් කරගෙන ගිය කාර්ය පටිපාටිය පිළිබඳවත් විවිධ අවස්ථාවලදී විවේචනය වුණා. හැබැයි, ඒ විවේචනය වූ බොහෝ කාරණා යම් විධියකින් නීත්‍යනුකූල රාමුවක් ඇතුළට ගෙන එන්න පුළුවන්කම ලැබෙනවා, මේ වියදම් කළමනාකරණය නිසියාකාරව ඉටු කිරීමට පුළුවන්කම ලැබුණොත්. විශේෂයෙන්ම අපේ ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා පසුගිය කාලය තුළ විවිධාකාර පනත් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඒවාට අවශ්‍ය සංශෝධනත් ගෙනාවා. එය සමස්ත රටම ලබපු ජයග්‍රහණයක් කියලායි මම විශ්වාස කරන්නේ.

අද ඉදිරිපත් කළ පනත් කෙටුම්පත් වාගේම තමයි, දූෂණ විරෝධී පනතත්. දූෂණ විරෝධී පනත සැහෙන කාලයක් මේ පාර්ලිමේන්තුව තුළ පවා විවිධ වූ ප්‍රශ්නවලට, විවිධ වූ කල් ගැනීම්වලට ලක් වුණා. හැබැයි, මොන ක්‍රමයෙන් හරි ඒ වාද විවාද සියල්ල අවසන් කරලා අපට එය සම්මත කරගන්න පුළුවන්කම ලැබුණා. දූෂණ විරෝධී පනත විතරක් නොවෙයි, අපි මොන පනතක් මේ පාර්ලිමේන්තුවේදී සම්මත කළත්, එය මේ රටේ භාවිත වන නීතියක් හැටියට පත් කරන්න කටයුතු කළත් ඒවා කොතෙකුත් දුරට හරියාකාරව ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳව අද බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරින් වේවා, එහෙම නැත්නම් ගරු ඇමතිතුමා වේවා බොහෝ මහන්සි වෙලා අද වෙනකොට මේ පනත් ටික ඉදිරිපත් කර තිබෙනවා. නමුත්, කිසිදු බෙදීමකින් තොරව අපි 225දෙනා අත උස්සලා සම්මත කරන ඒ පනත් ටික කොතෙක්දුරට හරියාකාරව ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳව අද බරපතළ ප්‍රශ්නයක් පැන නැඟ තිබෙනවා.

ඒ වාගේම පක්ෂ, විපක්ෂ අප සියලුදෙනාගෙන්ම මතුවෙච්ච කාරණාවක් තමයි, දූෂණ විරෝධී පනතට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට තවමත් සාමාජිකයන් නම් කරලා නැහැ කියන කාරණය. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් එම කොමිෂන් සභාවට අවශ්‍ය සාමාජිකයන් නම් නොකිරීමෙන් අප සියලුදෙනාට චෝදනා එල්ල වෙනවා. අපි අද ආණ්ඩු පක්ෂය නියෝජනය කළා කියලා කිසි ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ජනාධිපතිවරයාගේ නියෝජිතයෙක් ඉන්නවා, අග්‍රාමාත්‍යවරයා ඉන්නවා, ඒ වාගේම විපක්ෂ නායකතුමා ඉන්නවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මේ කියන සියලු දෙනාගෙන්ම සමන්විතයි.

අද අපි කථා කරනකොට කියනවා, Ease of Doing Business Index එකේ අපි ඉන්නේ සියයට පහළින් කියලා. ඒ නිසා කිසිම ආයෝජකයෙකු මේ රටට -සියයට පහළ ගියපු රටකට- ගේන්න පුළුවන්ද කියලා අපි තර්ක විතර්ක කරනවා. මේවා හදන්න තිබෙන එකම ක්‍රමය, මේ රටේ දූෂණය අවම කිරීම කියලා කියනවා. දූෂණය අවම කරන්න නම් අවසානයේ හැම පුරවැසියෙකුම ඒකට පෙළ ගැහෙන ක්‍රමය හදන්න ඕනෑ කියනවා. හැබැයි, ඒ සඳහා හදපු ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ නිසියාකාරව වෙන්නේ නැත්නම් ඒක බරපතළ මෙන්ම අවාසනාවන්ත තත්ත්වයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා නියෝජ්‍ය කථානායකතුමා හැටියටත්, අද මූලාසනයේ සිටින ප්‍රධානියා හැටියටත් අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ, මේ කාරණා ටික ක්‍රමවත්ව ඉටු කරන්න කියලායි. මේ රටේ system change කරන්න, මේ රටේ වෙනසක් ඇති කරන්න, මේ රට නිවැරැදි තැනට ගෙනියන්න කියලා මහජනතාව ඉල්ලුවා. මේ රටේ

[ගරු අනුරාධ ජයරත්න මහතා]

මහජනතාවට අවශ්‍ය වුණේ සමස්ත ආණ්ඩු ක්‍රමය තුළම නිවැරැදි වැඩ පිළිවෙළක් ඇති කරවන්නයි. ඒක නිල් පාටද, කොළ පාටද, රතු පාටද, කොයි පාටද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඒ නිල් පාට, රතු පාට, කොළ පාට සියලුදෙනා එකතු වෙලා -සමස්ත බහුතරයෙන්- සම්මත කරපු පනතක් ක්‍රියාත්මක කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නිසා කල් යනවා නම්, ඒක රටේ බරපතළ අවාසනාවක් කියන එකත් මම විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ.

ඒ නිසා මේ කාරණාව නිවැරදි කිරීම සඳහා අපි කඩිනමින් කටයුතු කරන්න ඕනෑ. මොකද, කොමිෂන් සභා ටික පිළිබඳව අද ජාත්‍යන්තරයට ගිහිල්ලා සියලුදෙනා කථා කරනවා. මේ කොමිෂන් සභාවලට කිසිදු බලපෑමකින් තොරව ස්වාධීනව ක්‍රියාත්මකවීමට ඇති හැකියාව පිළිබඳව අපි කථා කරනවා. එහෙම කථා කරලා මේ රටට කීර්තිනාමයක් ගේන්න සියලුදෙනා උත්සාහ කරනවා. හැබැයි, අපි එහෙම කථා කරලා පාර්ලිමේන්තුව ඇතුළට එනකොට පාර්ලිමේන්තුවෙන් විය යුතු කාර්යභාරය වෙලා නැත්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක බරපතළ අවාසනාවන්ත තත්ත්වයක්. ඒ නිසා මේ දූෂණ විරෝධී පනතේ හැටියට මේ ප්‍රධාන පිරිස පත් කිරීම පිළිබඳ ප්‍රශ්නය තිබෙන්නේ විපක්ෂ නායකතුමාට වෙන්න පුළුවන්. හැබැයි, විපක්ෂ නායකතුමා විරුද්ධ වෙනවා නම්, ප්‍රශ්නයක් නැහැ. ඒකට ගරු ජනාධිපතිතුමා ඉන්නවා. එතුමා ඉන්න කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මේකට ලැබුණා. ඒ වාගේම අගමැතිතුමාත් ඉන්නවා. ඒ නිසා අපි සියලුදෙනා එකට එකතු වෙලා මේ සඳහා කටයුතු කරන්න අවශ්‍යයි. මොකද, විපක්ෂ නායකතුමාට ඒ පිරිස නම් කිරීම සඳහා අවශ්‍ය තීන්දුව ගන්න බැරි නම්, ඒ හයිය නැත්නම්, ඒ වාගේම ඒ තීන්දු තීරණ ගන්න විපක්ෂ නායකතුමාගේ සහයෝගය දෙන්න බැරි නම්, මේ වෙනුවෙන් අපි හරි ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියන එක විශේෂයෙන් සිහිපත් කරනවා.

මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳ ප්‍රශ්නය ගත්තත් මේ වාගේම තමයි. ඒ නිසා අපි තේරුම්ගත යුතු කාරණාව මේකයි. මේ රටට අත්‍යවශ්‍ය වෙච්ච අණපනත් ටික හදලා ක්‍රියාත්මක කරන්න උත්සාහ කළත්, ඒ සියල්ල කෙරෙන යන්ත්‍රණයෙන් ඒක වෙන්නේ නැත්නම් අපි මොන තරම් අණපනත් හැදුවත් වැඩක් වෙන්නේ නැහැ. අපි මේ සම්මත කරන අණපනත් කොතෙක් දුරට රාජ්‍ය යන්ත්‍රණය හරහා ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, මේවා එළියේ ඉන්න මහජනතාව වෙන විධියකටයි දකින්නේ. මහජනතාව මේ 225දෙනා දෙවතාවක්, තුන් වතාවක්, හතර වතාවක් නොවෙයි දහස් වතාවක් වෙනස් කළත් මේ සමහර කාරණා කරන්න වෙන්නේ නැහැ, මෙතැන තිබෙන අර්බුදය, ප්‍රශ්නය අපි නිවැරදිව හඳුනා ගත්තේ නැත්නම්. ඒකට හොඳම උදාහරණයක් මම කියන්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. RAMIS කියන software එක ගෙනාවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට. RAMIS software එක ගෙනැල්ලා තිබෙන්නේ 2015දී. RAMIS software

එක ගෙනෙන්න තාක්ෂණය හඳුන්වා දෙන්න පනත්වලට අවශ්‍ය සංශෝධන අපි කරන්නේ 2015දී. අද අපි ඉන්නේ 2023 වර්ෂයේ. එදා අපි කාරක සභාවට ගෙනැල්ලා සාකච්ඡා කරලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බිලියන 1.4ක් වෙන් කරලා තිබෙනවා, මේ RAMIS කියන software එක හදන්න. හැබැයි, හදපු software එක දුවනවාද කියලා ඇහුවාම, 2024 ජනවාරිවල තමයි ලැබෙන්නේ කියලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින් අපට කියනවා. IRD එකේ නිලධාරින් අපට කියන්නේ එහෙමයි. 2024 ජනවාරි ඉඳලා ඔබතුමන්ලා මේ software එක පවත්වාගෙන යනවාද කියලා ඇහුවාම, එතුමන්ලා කියන්නේ, මේකට හොඳ පුහුණු පිරිසක් බඳවා ගෙන, තව කාලයක් අරගෙන ඔවුන් ඒ සඳහා පුහුණු කිරීම විතරයි අපට දැන් කරන්න ඉතුරු වෙලා තිබෙන්නේ කියලායි. ඒ කියන්නේ අවුරුදු 8කට පසුවත් අපට මේ පද්ධතිය පවත්වාගෙන යන්න බැහැ. එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොතැනද ප්‍රශ්නය තිබෙන්නේ? මේ උත්තරීතර සභාව 2015 වෙනකොට ඒකට අවශ්‍ය නීති ටික හදනවා, අණපනත් ටික හදනවා. ඒවා මේ රටේ නීති හැටියට ක්‍රියාත්මක කරනවා. ඒ කටයුතු කරන්න රාජ්‍ය යන්ත්‍රණයට භාර දෙනවා. හැබැයි, මේ කියන පිරිස අවුරුදු 8ක් යනතුරුත් තවම ඉන්නේ එකම තැන නම්, මේ ප්‍රශ්නය කොතැනද තිබෙන්නේ කියලා අපි හරියාකාරව තේරුම් ගන්න ඕනෑ. මොකද, මේ අවුරුදු 8 ඇතුළත කොළ පාට ආණ්ඩු තිබුණා, නිල් පාට ආණ්ඩු තිබුණා, රතු පාට සමඟ ආණ්ඩු තිබුණා. නැවත සියලු දෙනා එකතු වෙච්ච තව ආණ්ඩුවක් හැදුවා. ඉතින් මේ ආණ්ඩු ඔක්කෝම හැදිලා තිබුණේ මේ අවුරුදු ගණන ඇතුළත. එතකොට අපි සියලුදෙනා අසමත් වෙනවා නම්, අපි 225දෙනාට තේරුම් ගන්න තිබෙන්නේ තව 225 දෙනෙක් සිය වතාවක් මෙතැන හිටියත් වැඩක් වෙන්නේ නැහැ කියන එකයි. මොකද, මේ ප්‍රශ්නය විසඳිය යුතු තැන අපි අල්ලා ගන්නේ නැතුව, මේ ගැන කොච්චර කථා කළත් වැඩක් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේ පිළිබඳව හරියාකාරව අවධානය යොමු කරලා ඒ අවශ්‍ය සංශෝධන ටික, වෙනස්කම් ටික අපි නියමානුකූලව කළ යුතුයි කියා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අදහස් දැක්වීමේදී දිගින් දිගටම අපේ ගරු මන්ත්‍රීවරු හත් අට දෙනෙකුට වැඩිය මුලතිව් මහෙස්ත්‍රාත්තුමා පිළිබඳව අදහස් පළ කළා. මේ සරවණරාජා මහෙස්ත්‍රාත්තුමා පිළිබඳ කාරණා මතු වූ වෙලාවේ අපේ ගරු අමාත්‍යතුමා ඒ පිළිබඳ විශේෂයෙන්ම පැහැදිලි කිරීමක් කළා. ඒ වාගේම අධිකරණ සේවා කොමිසමෙන් පෞද්ගලිකවත් මේ ගැන විමසීමක් කළා. මොකද, අද දිගින් දිගටම මේ කාරණාව තමයි ගරු මන්ත්‍රීතුමන්ලා මතු කළේ. අපි දකිනවා, අද මේ ප්‍රශ්නය වෙන විධියකට අරගෙන යන බව. නමුත් අවසානයේ තේරුම් ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා.

ඒ ගෞරවනීය අධිකරණය පිළිබඳ අපි සියලුදෙනාට විශ්වාසයක් තිබෙනවා. මේ කියන කවුරු වුණත් අධිකරණය පිළිබඳ විශ්වාසයක් තියලා අධිකරණයට අවශ්‍ය මොහොතක ඉදිරිපත් වෙනවා. අධිකරණය තමයි අවසානයේ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරලා දෙන ස්ථානය බවට මිනිස්සු පිළිගන්නේ. නමුත් ගෞරවනීය විධියට සේවය කරන ඒ මහෙස්ත්‍රාත්තුමන්ලා සියලු දෙනාට හානි වෙන විධියට අද සමහර කණ්ඩායම් අදහස් ප්‍රකාශ කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක සාධාරණ නැහැ. මොකද, ඒ පිළිබඳ විවිධ කාරණා සඳහන් කළ නිසා. මේ මහෙස්ත්‍රාත්තුමා දන්වන්නේ නැතුව රට ගියා කියලා කියනවා. මේ මහෙස්ත්‍රාත්තුමා පිළිබඳ විවිධ විවේචන කළා. තව පිරිසක් මේ මහෙස්ත්‍රාත්තුමා ගැන කරුණු කියලා, බය වෙලා, මෙවැනි තත්ත්වයක් මේ රටේ ඇති වෙලා කියලා වෙනත් විධියට විග්‍රහ කළා. හැබැයි, අපි තේරුම් ගන්න ඕනෑ, අධිකරණ සේවා කොමිසම මේ වෙනකොට ස්වාධීන පරීක්ෂණයක් මේ පිළිබඳව ආරම්භ කරලා තිබෙන බව.

ඒ වාගේම ඔවුන් පොලිස්පතිතුමාට මේ කාරණය යොමු කරලා, මේ පිළිබඳව කරන පරීක්ෂණයේ ප්‍රගතිය මොකක්ද කියලා විමසීමක් කරලා තිබෙනවා. එමෙන්ම මේ පිළිබඳව ජනාධිපතිතුමා මාර්ගයෙනුත් පරීක්ෂණ වෙනවා. මේ සියලු කණ්ඩායම්වලට විනිවිදභාවයෙන් යුතු, අපක්ෂපාතී, නිවැරැදි පරීක්ෂණයක් කරන්න ඉඩ දීලා, මේක බොරුවට අපේ දේශපාලන අවශ්‍යතාවක් බවට පත් කර ගන්නේ නැතිව පැත්තකට වෙන එක තමයි සුදුසු කියන

එකත් විශේෂයෙන් අපි මේ වෙලාවේදී සිහිපත් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මෙම ප්‍රශ්නයේ අභ්‍යන්තරය ගැන දන්නේ නැතිව ඒ විනිසුරුතුමා හෝ ඒ විනිසුරුතුමා ගැන හිතලා අනික් සමස්ත අධිකරණ පද්ධතියම අපි හැල්ලු කරනවා. එහෙම නැත්නම් අධිකරණය පිළිබඳව මේ රටේ මහ ජනතාව තුළ තිබෙන විශ්වාසය අපි නැති කරන්න උත්සාහ කරනවා. ඒක සාධාරණ නැහැ. නමුත් අධිකරණ සේවා කොමිසම හරහා මේ වෙනුවෙන් අවශ්‍ය කටයුතු කෙරිලා තිබෙනවා. ඒ වාගේම අපක්ෂපාතී පරීක්ෂණ කරනවා නම් ඒකට අවශ්‍ය පරිසරය අපි ගොඩ නඟලා තිබෙනවා. ඒ වෙනුවෙන් ඉඩ දෙන එක තමයි වඩා සුදුසු කියන එක මම විශේෂයෙන් මේ වෙලාවේදී සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා රක්ෂණ වන්දි පිළිබඳව දිගින් දිගටම කථා කළා. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ගනුදෙනුව පිළිබඳව දක්වන උනන්දුව වාගේම ඊට අත දැමීමේ වැඩිම අවශ්‍යතාව තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වෙන කවුරුවත් නොව අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමායි. මේ රටේ මහ ජනතාව සහ රට වෙනුවෙන් යම් මුදලක් ලබා ගන්න තිබෙනවා නම් ඒ වෙනුවෙන් විශාල පිරිසක් අද වෙනකොට එකතුවෙලා ඉන්නවා. මුලින්ම අලි සබ්රි ඇමතිතුමා ඒ වෙනුවෙන් කටයුතු කළා. වර්තමාන අධිකරණ අමාත්‍යතුමා හැටියට විජයදාස රාජපක්ෂ මැතිතුමා මේ සඳහා අවශ්‍ය සියලු කාරණා ඉටු කළා. මේ කටයුතුවලට කැබිනට් අනුමැතිය ගන්නකොට, අවශ්‍ය මුදල් වෙන් කරනකොට නීතිපතිතුමාට අවශ්‍ය සහයෝගය දීලා, එතුමා ඒ සියලු කාරණා ටික ඉටු කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! සභාවේ කටයුතු අවසාන වන තෙක් වැඩිපුර කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அனுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට අවාසිසහගත විධියටම අත දමන මන්ත්‍රීවරයා වෙන කවුරුවත් නොවෙයි, අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමායි. එක වතාවක් මේ සම්බන්ධයෙන් උපදේශක කාරක සභාවක් තිබුණා. ඒ උපදේශක කාරක සභාවේදී දෙපාර්ශ්වයම එක තැනකට ගෙනැල්ලා, නීතිපති දෙපාර්තමේන්තුව එක පැත්තක ඉන්දවලා, ඒකට විපක්ෂ නායකතුමාත් ගෙන්වා ගෙන -අපි මේ කිසි දෙයක් දන්නේ නැහැ- අධිකරණ ඇමතිතුමාටත් එන්න පුළුවන්ද කියලා ඇහුවා. අධිකරණයේ විභාග වෙන කටයුත්තකට මේ විධියට මැදිහත් වෙන්න කිසිම මන්ත්‍රීවරයෙකුට සදාචාරාත්මක අයිතියක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාර්ශ්ව දෙකක් එක තැනක ඉන්දවලා උසාවියේ විභාග වන නඩුවක් ගැන මේ විධියට ප්‍රශ්න කරන්න මන්ත්‍රීවරයෙකුට මේ පාර්ලිමේන්තුවේ ලබා දීලා තිබෙන වරප්‍රසාදය මොකක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඒ වාගේම උදේ හවස මේ ගරු සභාවට ඇවිල්ලා ප්‍රශ්න කරලා අහනවා, දැන් මොකක්ද මේ නඩුවටවෙලා තිබෙන්නේ, මොකක්ද අර පාර්ශ්වය කියන්නේ, කියන්න තිබෙන කාරණා මොනවාද, ලිපි ලේඛන මොනවාද කියලා. එක්ස්ප්‍රස් පර්ල් නඩුව කියන්නේ ඒ නැව පිළිබඳ ප්‍රශ්නයක්, වෙන කාරණයක් පිළිබඳ ප්‍රශ්නයක් නොව මේ රට පිළිබඳ ප්‍රශ්නයක්. ඒ මේ රටට ලබා ගන්න තිබෙන වන්දිය පිළිබඳ ප්‍රශ්නයක්; මේ රටේ අහිංසක ධීවරයන්ට වෙච්ච හානිය පිළිබඳ ප්‍රශ්නයක්; මේ රටේ ස්වභාව සෞන්දර්යය, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය කියන මේ සියලු කාරණා එක්ක ගැට ගැහිච්ච ප්‍රශ්නයක්. ඒ සියලු මිනිස්සුන්ට සාධාරණය ඉටු කිරීමේ වගකීම වෙනුවෙන් මේ උත්තරීතර පාර්ලිමේන්තුව බැඳිලා තිබෙනවා. ඒ වාගේම අපි ඒ කටයුත්ත ගරු අධිකරණයට, නීතිපතිතුමා ඇතුළු පිරිසට බාර දීලා තිබෙනවා. මේ රජයට, අපට නීතිපති උපදෙස් ලබා ගන්න පුළුවන් තැන තමයි නීතිපති දෙපාර්තමේන්තුව. ඔවුන් ඊටත් එහාට ගිහිල්ලා, ඕස්ට්‍රේලියානු සමාගමකින් නීති උපදෙස් අරගෙන අද වෙනකොට සාර්ථකව ඒ කටයුතු කරගෙන යනවා. ඒ අනුව අටලක්ෂ හැත්තෑඅටදාහකට ආසන්න ඩොලර් ප්‍රමාණයක් වියදම් හැටියට ලබා ගෙන තිබෙනවා. හැබැයි, අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාට අනුව ඒක වන්දියක්. අතුරු වන්දි වශයෙන් තවත් රුපියල් මිලියන 16ක් ලැබී තිබෙනවා. එතුමා එක එක විධියට විග්‍රහ කරලා, වෙන පැතිවලට මේ කරුණ හරවන්න උත්සාහ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බොහොම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කොන්ත්‍රාත් ලබාගෙන මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මන්ත්‍රී අසුන නියෝජනය කරන එක අපි වහාම නතර කරන්න ඕනෑ. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ඇත්තටම මන්ත්‍රීවරුන්ගේ මූලික බලාපොරොත්තුවක් වෙන්නේ ඒ නිසායි. ඒ වාගේම දූෂණ විරෝධී පනත මූලික පරමාර්ථයක් වෙන්නේ ඒ නිසායි. අපේ ඔළු ගෙඩිවල තිබෙන්නේ වෙන අදහසක්; කථා කරන්නේ ඩයස්පෝරාවට; කථා කරන්නේ වෙන රටකට; කථා කරන්නේ වෙන පෙළැන්තියකට. හැබැයි, නියෝජනය කරන්නේ ශ්‍රී ලංකාවේ මහ ජනතාව කියන එක තමයි පෙන්වන්න උත්සාහ කරන්නේ. ඒ නිසා තමයි රට දිගින් දිගටම විනාශවෙලා තිබෙන්නේ. මේක වෙනස් කෙරෙන්න ඕනෑ. ඒ නිසා අපි බොහොම ගෞරවයෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. අද මේ රටේ මහ ජනතාවට අධිකරණය පිළිබඳව ගෞරවයක් තිබෙනවා. මේ රටේ විනිසුරුතුමන්ලා පිළිබඳව මේ රටේ මහ ජනතාවට ගෞරවයක් තිබෙනවා. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ඉඳලා ඒක කෙලසන්න කවුරුවත් උත්සාහ කරන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම අපි කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් අද සමථකරණය පිළිබඳව අපේ ගරු මන්ත්‍රීතුමන්ලා යම් වැදගත් අදහස්, යෝජනා කීපයක් ඉදිරිපත් කළා. අපේ සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාත්, අපේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කීපදෙනෙකුත් බොහොම සාධනීය කාරණා වාගේම යෝජනා කීපයකුත් ඉදිරිපත් කළා.

සාධනීය අදහස් හා යෝජනා ඉදිරිපත් කරලා මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයට අවශ්‍ය කරන වෙනස්කම් ටික මේ රටේ ජනතාවට යහපතක් වන විධියට සිදු කරන්න අපට සහයෝගය හා ශක්තිය ලබා දීම පිළිබඳව මන්ත්‍රීවරුන් සියලුදෙනාටත්, අපේ අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් මේ සංශෝධන සිදු කිරීම ඇතුළු සියලු කාරණා සඳහා ඒ අවශ්‍ය කටයුතු කරන අපේ ගරු ඇමතිතුමා, අමාත්‍යාංශ ලේකම්තුමිය ප්‍රධාන සියලු නිලධාරින්ටත්, අද දින මේ කටයුතුවලට සම්බන්ධ වන අනෙකුත් සියලු නිලධාරින්ටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***

***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*

*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*

*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (101 වන අධිකාරයේ 205 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 2.- (101ஆம் அத்தியாயத்தின் 205ஆம் பிரிவினைத் திருத்துதல்)

CLAUSE 2.- (*Amendment of section 205 of Chapter 101*)

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'තීන්දුවේ හෝ අවසන් තීන්දු ප්‍රකාශයේ හෝ නඩු තීන්දුව සහ අවසන් තීන්දු ප්‍රකාශය යන දෙකෙහිම සහතික' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Bill reported with Amendments.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

### தேர்தல்கள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்

ELECTIONS (SPECIAL PROVISIONS) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 10 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 10ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 10 ordered to stand part of the Bill.*

***පළමුවන, දෙවන, තුන්වන, හතරවන උපලේඛන පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*முதலாம், இரண்டாம், மூன்றாம், நான்காம் அட்டவணைகள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப் பட்டது.*
*First, Second, Third and Fourth Schedules ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சட்டமாகு வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Enacting Clause ordered to stand part of the Bill.*

***දීර්ඝ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*விரிவுப் பெயர் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Long Title ordered to stand part of the Bill.*

***නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*தலைப்பு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Title ordered to stand part of the Bill.*

***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Bill reported without Amendment.*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත: නියෝග
## மத்தியஸ்த (விசேட வகுதிகளைச் சார்ந்த பிணக்குகள்) சட்டம்: ஒழுங்குவிதிகள்
## MEDIATION (SPECIAL CATEGORIES OF DISPUTES) ACT: REGULATIONS

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනතේ 4 (2) වගන්තිය සමඟ කියවිය යුතු 27 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජනවාරි 14 දිනැති අංක 2314/80 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අධිකරණ සංවිධාන පනත: නියමය
## நீதித்துறைச் சட்டம்: கட்டளை
## JUDICATURE ACT: ORDER

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 29අ(2) වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අප්‍රේල් 21 දිනැති අංක 2328/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.08.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය.

## ළමයින් සඳහා සුරක්ෂිත අනාගතයක් සහතික කිරීම
### சிறுவர்களுக்கான பாதுகாப்பான எதிர்காலமொன்றை உறுதிசெய்தல்
### ENSURING A SECURE FUTURE FOR CHILDREN

[අ.භා. 5.05]

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසයේ පළමුවැනි දා අපේ රටේ ළමා දිනයත්, වැඩිහිටි දිනයත් සමරනවා. මම අද දවස මේ යෝජනාව ගෙන එන්න යොදා ගත්තේ ඒ ළමා දිනය සැමරීමෙන් පසු අපේ පාර්ලිමේන්තුව රැස්වෙන පළමු දවස අද නිසායි. අපි මොන තරම් ඉහළින් ළමා දිනය සැමරුවත්, අපේ දරුවන්ගේ ළමා කාලයට, ළමා ජීවිතයට සිද්ධ වෙලා තිබෙන අවාසනාවන්ත තත්ත්වය දැක්කාම, ඒ සම්බන්ධයෙන් අපේ වැඩි අවධානයක් යොමු කළ යුතුයි කියලා හිතපු නිසා, අද දින සභාව කල් තබන අවස්ථාවේ මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "මෙවර ලෝක ළමා දින සැමරුම තේමාව වූයේ 'සියල්ලන්ටම වඩා දරුවන් වටී' යන්නයි. දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, හිංසනය සහ අපචාරයන්ගෙන් මිදී ජීවත්වීමට මෙන්ම දරුවන්ට නිදහසේ සිය ළමා කාලය ගත කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම ජනතා නියෝජිතයන් පමණක් නොව සියලු වැඩිහිටි ප්‍රජාවේ ද වගකීමකි.
>
> විශේෂයෙන්ම ළමා ශ්‍රමය, ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ දරුවන්ට එරෙහි විවිධ වැරදි තුරන් කිරීමට විවිධ රජයන් කලක පටන් විවිධ පියවර ගෙන තිබේ. නමුත්, මේ වන විටත් එම අවදානම් තත්ත්වය පහව යාමක් හෝ අඩුවීමක් ප්‍රායෝගිකව දක්නට නොමැත.
>
> මේ හේතුවෙන් සියලුම වග කිවයුතු අංශ පමණක් නොව, සියලු පුරවැසියන්ගේ දායකත්වය ඇතිව දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීම සඳහා පියවර ගත යුතු යැයි මෙම ගරු සභාවට මම යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දින කිහිපය පුරා අපේ රටේ නාළිකාවල ප්‍රචාරය වූ ප්‍රවෘත්ති අරගෙන බැලුවත්, සමාජ මාධ්‍ය අරගෙන බැලුවත් රටේ කථා බහ වුණු බොහෝ මාතෘකා අතර ප්‍රධාන මාතෘකාවක් බවට පත් වෙලා තිබුණේ අපේ රටේ ළමයින්ට සිදු වෙන හිංසනයි. ඒ අතරේ ලිංගික වශයෙන් අපේ දරුවන්ට සිදු වෙන අපචාර ගැන සඳහන් වෙනවා. ඔවුන්ගේ ජීවිතවලට තිබුණු භයානක තත්ත්ව ගැන සඳහන් වෙනවා. මේ පිළිබඳව මම අමුතුවෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතු නැහැ කියලා විශ්වාස කරනවා. මොකද, ඒ තරමටම මේ රටේ ජනතාව ඒ පිළිබඳව දැනුවත් වුණා. එවැනි සිදුවීම් වෙනුවෙන් දුක් වුණා; කනගාටු වුණා. හදවතින් කනගාටු වුණත් අපි තවමත් කොතැනද ඉන්නේ?

අද අපේ දරුවෙකුට පාරේ බැහැලා යන්න පුළුවන් වටපිටාවක් තිබෙනවාද? පාරේ බැහැලා යන්න තියා, අපේ දරුවාට තමන්ගේ ගෙදරවත් ආරක්ෂාවක් තිබෙනවාද? අපේ දෙමව්පියන්ට තමන්ගේ දරුවන් සම්බන්ධ වගකීමක් තිබෙනවාද? සමාජය තුළ එවන් වගකීමක් තිබෙනවාද? අපි ළමා හිමිකම් පිළිබඳ ප්‍රඥප්තිවලට අත්සන් කරලා, ඒවා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වටපිටාව සකස් කරලා තිබෙන රටක් වුණත්, අද අපේ දරුවෝ මොන තරම් අනාරක්ෂිතද? අද ඒ අයගේ ළමා කාලය කෝ? පෙරේදා ළමා දිනයේදී අපේ දරුවෝ නොයෙක් තැන්වලට ගිහිල්ලා සතුටු වෙච්ච ආකාරය අපි දැක්කා. අපේ දරුවෝ නොයෙක් තැන්වල පවත්වපු උත්සවවලට ගිහිල්ලා මොන තරම් ආශාවකින් එදා දවස ගත කළාද කියලා අපි දැක්කා. එහෙම වෙන්නේ ඇයි? අපි අවුරුද්දකට එක දවසක් අපේ දරුවන්ට නිදහස දීලා, අපේ දරුවන්ගේ ඉතිරි දින 364ටම අපි මොකක්ද කරලා තිබෙන්නේ? ඉතින් අපේ දරුවෝ කොතැනටද යන්නේ?

මේ යෝජනාවට අදහස් දක්වන්න අද දවසේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඉදිරිපත් වෙලා ඉන්න නිසා, ඒ අයගේත් අදහස් මේ යෝජනාවට එකතු කර ගන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා.

මහජන නියෝජිතයන් විධියට විතරක් නොවෙයි, වැඩිහිටියන් විධියට, රටේ සමස්ත ප්‍රජාව විධියට අපට -මේ රටේ ඉහළ ඉඳලා බිම් මට්ටම දක්වා වන අප සියලුදෙනාට- වගකීමක් තිබෙනවා, අපේ අනාගත පරපුර රැක ගැනීමට -ආරක්ෂා කර ගැනීමට- වාගේම ඉන් ඔබ්බට ගිහින් මේ රට භාර ගන්න සිටින අනාගත පරපුර නිරෝගිමත් කායික, මානසික මට්ටමකින් යුත් පුරවැසියන් බවට පත් කිරීමට.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දත්ත අනුව අපේ දරුවන් දහදාහකට වඩා වැඩි පිරිසක් මේ වන විටත් අනාරක්ෂිත තත්ත්වයක ඉන්නේ. නමුත් ලේඛනගත නොවුණු -එළියට නො එන- එවැනි තවත් කොච්චර නම් දරුවන් ඉන්නවාද?

අප හිතන්නේ, මහ පාරේ බැහැලා යනකොට අපේ දරුවා අනාරක්ෂිතයි, දන්නේ අඳුනන්නේ නැති අයගෙන් අපේ දරුවා ආරක්ෂා කර ගන්න ඕනෑ කියලායි. නමුත් පසු ගිය දවස්වල අපි අහපු දැකපු දේවල් එක්ක බැලුවාම, අපේ දරුවන් මහ පාරේ නොවෙයි අනාරක්ෂිත වෙලා තිබෙන්නේ. තමන්ගේම ගේ ඇතුළේ තමයි අපේ දරුවන් අනාරක්ෂිත වෙලා තිබෙන්නේ. මේ වාගේ අවාසනාවන්ත කාලයක විශේෂයෙන්ම අම්මා කෙනෙකු විධියට, කාන්තාවක විධියට මම කියනවා, මහජන නියෝජිතයන් විධියට අප මේ වෙනුවෙන් ඉතා කඩිනමින් -වහ වහා- යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව තිබෙන බව. ඒ වෙනුවෙන් මේ යෝජනාව ඉදිරිපත් කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු සමන්ප්‍රිය හේරත් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.10]

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව කථා කරන්න මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි. ප්‍රථමයෙන්ම, එතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා. අපි හැම අවුරුද්දකම ලෝක ළමා දිනය සමරනවා; අවුරුද්දකට සැරයක් ළමයින් ගැන කථා කරනවා. ඊට

පසුව අපි ඒ දිනය අමතක කරනවා. අප දරුවන් වෙනුවෙන් වෙන් කළ යුත්තේ එක දිනයක් නොවෙයි. ගෙදරක සුරක්ෂිත බව ශක්තිමත්ව සකසන්න නම් දරුවන්ගේ ආරක්ෂාව සහ අනාගත සුරක්ෂිතභාවය තහවුරු කරන්න ඕනෑ. විශේෂයෙන් දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, දරුවන්ට සිදු කරන ලිංගික හිංසනය වළක්වන්න කටයුතු කරනවා වාගේම, ඉන් එහාට ගිහින් කළ යුතු දේවල් ද තිබෙනවා.

"දෙරණ" නාළිකාව පෙරේදා වාර්තා කළ සිද්ධියකට අවධානය යොමු කරන්න මා කැමැතියි. පසුගිය අවුරුද්දේ රිය අනතුරුවලින් විතරක් දරුවන් 400ක් පමණ මිය ගිහින් තිබෙනවා. ඒ වාගේම, පරිගණක අපරාධ සඳහා යොමු වෙලා සිටින ප්‍රමාණය සියයට 14ක්. මට මතක හැටියට "දෙරණ" නාළිකාව තමයි මෙය වාර්තා කළේ. දරුවන් විවිධාකාරයෙන් හිංසනයට ලක් වෙනවා කියන කාරණය අපි අවධානයට ලක් කළ යුතුව තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. අද වන විට ඇතැම් දරුවන් මහ මඟ යාචකයන් බවට පත් කර තිබෙනවා. එවැනි ව්‍යාපාර සඳහා -විශේෂයෙන් මත්ද්‍රව්‍ය ව්‍යාපාරය සඳහා- දරුවන් යොදා ගන්නා අවස්ථා ද අපි ඇස් දෙකට දැක තිබෙනවා. එහෙම නම් දරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් අවශ්‍යයි. විෂය භාර ගරු රාජ්‍ය අමාත්‍යතුමිය දැන් මේ ගරු සභාවේ ඉන්නවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, මෙහිදී ඔබතුමියගෙන් විශේෂ ඉල්ලීමක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අද ඉන්නේ විනයක් නැති ජාතියක්. පියා අතින් තමන්ගේ දරුවා කෙලෙසෙනවා නම්, අප අද කොතැනටද ගිහින් ඉන්නේ කියන කාරණය අපි දෙවතාවක් හිතන්න ඕනෑ. මගේ දිස්ත්‍රික්කයේ විශේෂයෙන්ම ගල්ගමුව, ගිරිබාව කියන ප්‍රදේශවල අඩු වයස් විවාහ සිදු වෙනවා. ඒවා හොර රහසේ සිදු වෙන්නේ. ඒ දේවල් නතර කරන්න අපට හැකියාව ලැබී තිබෙනවාද? අපි අවුරුද්දට එක දිනයක් වෙන් කරගෙන දරුවන් ගැන කථා කරනවා. නමුත්, එතැනින් එහාට කළ යුතු වැඩ බොහොමයක් තිබෙනවා. දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය නීති, අණ පනත් තිබෙනවා. හැබැයි, ඒවා ක්‍රියාත්මක කිරීමේදී යම් යම් අඩු පාඩු සිදු වෙලා තිබෙනවාය කියන කාරණය අපි සිහිපත් කරන්න ඕනෑ.

මේ සඳහා පෙර පාසලේ ඉඳන් සම්පූර්ණ අධ්‍යාපන ක්‍රමය යම්කිසි වෙනසකට ලක් කළ යුතු කාලය අද ඇවිත් තිබෙනවා. පරිසරය පවා දරුවන්ගේ මනස විකෘති කිරීමට බලපානවාය කියන කාරණය අපි සිහිපත් කරන්න ඕනෑ. පෙර පාසල් යන කාලයේ ඉඳලාම පරිසරයට ආදරය කරන, මේ සමාජයට ආදරය කරන දරුවකු බිහි කරන්නට අප සියලුදෙනා යම් වගකීමකින්, වගවීමකින් වැඩ කරන්න ඕනෑය කියන කාරණයත් මේ අවස්ථාවේදී සිහිපත් කරන්නට ඕනෑ.

සේයා දැරියගේ ඝාතනය අපට මතකයි. මත්ද්‍රව්‍ය පාවිච්චි කරන පුද්ගලයෙකු විසින් ඉතා අමානුෂික අන්දමින් කරන ලද මහා සැහැසි ක්‍රියාවක්, එය. ඒ ක්‍රියාවේ අඳුරු සෙවණැලි මැකී යන්නටත් කලින් -ඊට සමගාමීව- ඒ වාගේ සිදුවීම් ගණනාවක් මේ රට තුළ සිදු වුණා.

මල්වැනි කුඩා දරුවන්ගේ අනාගතය අද විවිධාකාරයෙන් විවිධ ක්ෂේත්‍ර හරහා විශාල වශයෙන් විනාශ වෙමින් පවතිනවාය කියන කාරණය මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕනෑ. එය වැළැක්වීමේ වගකීම සහිත විවිධ ආයතන තිබෙනවා. එසේ විවිධ ආයතන තිබුණත්, මේ අපරාධවල අඩුවීමක් සිද්ධ වන්නේ නැහැ. ඒ නිසා යම්කිසි වැඩ පිළිවෙළක් අවශ්‍යයි. යම්කිසි විනයක් තිබෙන ජාතියක් අපි බිහි කරන්න ඕනෑ. එවැනි විනයක් සහිත බොහෝ රටවල් උදාහරණ වශයෙන් පෙන්වන්න අපට පුළුවන්. අප දරුවන්ගේ අනාගතය සුරක්ෂා කළේ නැත්නම් මේ රටේ ආර්ථිකය කඩා වැටීම ගැන කථා කරලා වැඩකුත් නැහැ; අද මේ රට වැටිලා තිබෙන තැන ගැන කථා කරලා වැඩකුත් නැහැ. අනෙක් සියලු දේවල් යථාර්ථයක් බවට පත් වුණත්, දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා නම් මේ අධ්‍යාපන ක්‍රමය යම් වෙනසකට ලක් විය යුතුමයි කියන කාරණය මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ මට මේ පිළිබඳව බොහෝ දේවල් කථා කරන්න තිබුණත් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නැහැ. අද සමාජය කාර්මීකරණය වෙලා තාක්ෂණයත් එක්ක ඉස්සරහට යමින් තිබෙනවා; ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වෙලා තිබෙනවා. ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වෙලා තිබුණත්, අද බොහෝ වැරදි ක්‍රියා සඳහා දරුවන් යොදා ගැනීම වෙනදාට වඩා වැඩියි කියන කාරණයත් මා කියනවා. දරුවන් පිළිබඳ අවධානය එක දවසකට පමණක් සීමා නොකොට හැමදාටම අවධානය යොමු කරන්න ඕනෑ කියන කාරණයත් මම සිහිපත් කරන්න ඕනෑ.

මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව අපේ ගරු මංජුලා දිසානායක මැතිනියට විශේෂයෙන් ස්තුතිවන්ත වෙමින් මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත් ගෞරවනීය ස්තුතිය පිරිනමමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.16]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැම අවුරුද්දේම ඔක්තෝබර් පළමුවැනි දා කියන්නේ විශ්ව ළමා දිනය. ඒ වාගේම, ජාත්‍යන්තර වැඩිහිටි දිනය. මේ දෙක සඳහා එක දවසක් යෙදුවේ මොකද කියන කාරණාව මා දන්නේ නැහැ. වැඩිහිටියන් විධියට අපි ඔක්තෝබර් පළමුවැනි දා වැඩිහිටි දිනය සමරනකොට ලෝකයේ අනාගත පරම්පරාව ගැන හිතන්න ළමා දිනයත් ඒ දිනයටම යෙදුවා කියලායි මා විශ්වාස කරන්නේ.

2023 වර්ෂයේ විශ්ව ළමා දිනයේ තේමා පාඨය "සියල්ලටම වඩා දරුවන් වටී" යන්නයි. මෙතැන මේ කාරණාව ගැන විනාඩි කිහිපයක විවාදයක් නොවෙයි, පැය ගණනක විවාදයක් පැවැත්විය යුතුයි. තාත්තා කෙනෙකු විධියට, දරුවන්ට ආදරය කරන වැඩිහිටියෙකු විධියට, මේ සමාජයට ආදරය කරන පුරවැසියෙකු විධියට මම මේ කාරණා ගැන පසු ගිය කාලයේත් ගොඩක් දේවල් කථා කරලා තිබෙනවා. නමුත් අවාසනාවකට මේ සමාජයේ ඒ දරුවන් සම්බන්ධයෙන් වන ප්‍රගමනය, එකතු වෙච්ච සාධනීය ලක්ෂණ ප්‍රමාණය අවම වෙමින් තිබෙනවා. අප මේ ගත කරන්නේ මේ සමාජයම හිරි වැටිච්ච කාලයක. දැවැන්ත ආර්ථික අර්බුදයක්, ඒ පිටුපස ආපු දේශපාලන අර්බුදයක්, ඒ පිටුපස ආපු සමාජ අර්බුදයක් අද තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සියල්ල පිටුපස එන දැවැන්ත සංස්කෘතික අර්බුදයකුත් අද නිර්මාණය වෙලා තිබෙනවා. ඒ සංස්කෘතික අර්බුදය තුළ පවුල හෙවත් කුටුම්භය කියන, සමාජයේ ප්‍රාථමික සංස්ථාව අද බොහෝ දුරට විනාශ වෙලා තිබෙනවා; තවදුරටත් විනාශ වෙමින් තිබෙනවා. මේ සෑම කාරණාවකදීම වැඩිම වින්දිතයා බවට පත්

[ගරු වීරසුමන වීරසිංහ මහතා]

වෙලා තිබෙන්නේ දරුවන්. ඒ නිසා මා විශ්වාස කරනවා, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225දෙනා විතරක් නොව, මේ සමාජයේ ඉන්න සෑම කෙනෙකුම දරුවන් ගැන ප්‍රමුඛතම අවධානය යොමු කරලා මේ මූලික කාරණාවලට මැදිහත් වෙන්න ඕනෑ බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබිච්ච කෙටි වෙලාව තුළ කරන මේ කථාවේදී එකම එක කාරණාවක් ගැන විතරයි මා කරුණු ඉදිරිපත් කරන්නේ. ඒ තමයි, මේ අර්බුදය විසඳීම සඳහා වන ප්‍රධානම කාරණාව. මේ පවතින අධ්‍යාපන ක්‍රමය සම්බන්ධව වැඩි මැදිහත්වීමක් කරන්න ඕනෑ. දරුවන්ට වැඩිම පීඩනයක් ලබා දෙන මේ අධ්‍යාපන ක්‍රමය ඒ අයට තවදුරටත් දරාගන්න බැහැ, ගරු කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමියනි. එම නිසා ඔබතුමියගේ අමාත්‍යාංශයට පැවරෙන වගකීම විශාලයි. ඇතැම් දරුවන් මේ සමාජයේ විෂම දරුවන් බවට පත් වෙන්න, මේ සමාජයේ පීඩිත දරුවන් බවට පත් වෙන්න, මේ සමාජයේ වැරදි කරන දරුවන් බවට පත් වෙන්න බලපාන ප්‍රධානම කාරණාවක් බවට මේ පවතින අධ්‍යාපන ක්‍රමය හේතු වෙලා තිබෙනවා. අද දරුවන්ට හොඳ පෙර පාසලක් හම්බ වෙනවාද? අද දරුවෙකු හොඳ පෙර පාසලකට යවාගන්න පුළුවන්කමක් තිබෙනවාද? ඒ යවන පෙර පාසලේ තිබෙන ගුණාත්මකභාවය මොකක්ද? අද අපේ රටේ අධ්‍යාපනයට ඉතා විශාල මුදලක් වෙන් කළා වුණත්, පෙර පාසල් පද්ධතිය අම්මෙක්, අප්පෙක් නැති දරුවකු ගානට දාලා තමයි කටයුතු කරමින් තිබෙන්නේ. අපි නිදහස් අධ්‍යාපනය ලබා දැනට අවුරුදු ගණනාවක් වෙනවා. අපේ රට 1945 ඉඳලා නිදහස් අධ්‍යාපනය භුක්ති විඳින රටක්. නමුත් අදටත් අපට පුළුවන්කමක් ලැබිලා නැහැ, පෙර පාසල් අධ්‍යාපනය, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අධ්‍යාපන අමාත්‍යාංශයේ පාලනය යටතේ නියාමනයට ලක් වන මධ්‍යස්ථාන බවට පත් කරන්න. අපේ රටට නිදහස ලැබිලා අවුරුදු 75ක් ගත වෙලාත්, අඩුම ගණනේ පෙර පාසල් දරුවන් සඳහා වන විෂය නිර්දේශයක් හදන්නවත් අපි අසමත් වෙලා තිබෙනවා.

පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල වාගේම, ප්‍රාථමික අධ්‍යාපනය ලබන 1-5 පන්තිවල සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙන්නේ දරුවන් විනාශ කරන අධ්‍යාපන ක්‍රමයක්. ඒ වාගේම ශිෂ්‍යත්ව විභාගය ලෝකයේ තිබෙන විෂම විභාගය බවට පත්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, එය දරුවන් කෘත්‍රිම දරුවන් බවට පත් කරන විභාග ක්‍රමයක් බවටත් පත්වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
එතැනින් එහාට තිබෙන සියලු අධ්‍යාපන ප්‍රවේශවලත් තිබෙන්නේ ඉතා බරපතළ ඛේදනීය තත්ත්වයක්. දරුවන් කැමැති, දරුවන්ගේ සහජ දක්ෂතා මතු කරන නිර්මාණශීලී අධ්‍යාපනයකට නොවෙයි, මේ සමාජය දරුවා තල්ලු කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් යම් අවධානයක් යොමු වෙලා තිබෙන මේ මොහොතේ දරුවන්ට දෙන්න පුළුවන් ලොකුම දායාදය වාගේම, මේ අර්බුදය තුළ කළ හැකි ලොකුම කාර්යය තමයි ඊළඟ පරම්පරාවවත් හොඳ පරම්පරාවක් බවට පත් කිරීම.

අපේ ළමා කාලය අපි යම් ප්‍රමාණයකට වින්දා. නමුත් අපේ දරුවන් ඒ ළමා කාලය විඳින්නේ නැහැ. අද ඒ දරුවන් ළමා කාලයේ දී විඳවනවා. ඒ නිසා විඳින්න පුළුවන් වින්දනීය ළමා කාලයක් වෙනුවෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් වහාම ඇති කරන්න කටයුතු කරන්න ඕනෑය කියන කාරණාව සිහිපත් කරනවා. ඒ වාගේම මේ කාරණාවට සමගාමීව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සම්බන්ධවත්, දරුවන්ගේ රැකවරණය සම්බන්ධවත් ගොඩක් කරුණු සාකච්ඡා කරන්න තිබෙනවා. අපි ඒවා වෙනම වෙලාවක කථා කරන්න ඉඩ තබා ගනිමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ සංකල්පය දරුවන්ට හොඳම දේ සහ වටිනාම දේ ලබා දීම නම්, ඒ සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් වැඩි මැදිහත්වීමක් දක්වමින් කටයුතු කරන්න ඕනෑය කියන කාරණය සිහිපත් කරමින් මා නිහඬවෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.20]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාවට අපි හදවතින්ම එකඟවෙනවා. විශේෂයෙන්ම නීති සම්පාදනය කරන්නේත්, මුදල්වලට වග කියන්නේත් පාර්ලිමේන්තුව. ඒ වාගේම මේ රටේ සෑම කාරණාවක් සම්බන්ධයෙන්ම මේ පාර්ලිමේන්තුවට වගකීමක් තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් වශයෙන් ලෝක ළමා දිනය දවසේ අපි ළමයින්ගෙන් සමාව අයදින්නට ඕනෑ. මොකද අපි හැමෝම අතින් ළමයින්ගේ ළමා කාලය දූෂණය වෙලා තිබෙනවා. අද අපේ ළමයින්ට හරියට ආහාරයක් ගන්න බැරි කාලයක් තමයි උදාවෙලා තිබෙන්නේ. සමහර දරුවන් මන්දපෝෂණයෙන් පෙළෙනවා. අද අම්මලා තාත්තලාට දරුවන් පෙර පාසලකට යවා ගන්න බැරි යුගයක් උදාවෙලා තිබෙනවා. ඒ වාගේම අද දරුවන්ට ඕනෑ විධියට ක්‍රීඩා කරන්න, දරුවන්ට ඕනෑ විධියට අඳින්න, පළඳින්න, නිසි අධ්‍යාපනයක් ලබා ගන්න, අවශ්‍ය බෙහෙත් ටික ලබා ගන්න බැරි යුගයක් තමයි තිබෙන්නේ. අපි ඇත්ත කථා කරන්න ඕනෑ. අපි සමාජයේ වැඩිහිටියන් වශයෙන් වගකීමෙන් තොරව ගන්නා තීන්දු -තීරණ, ක්‍රියාකාරකම් නිසා මේ ලෝකයේ ළමයි අනන්ත අප්‍රමාණ ප්‍රමාණයක් දුක් විඳිනවා. මම මේ ලෝකයේ හැම දරුවෙකුටම තාත්තා කෙනෙක් වෙන්න කැමති පුද්ගලයෙක්. අද ළමයින්ට සිදුවෙලා තිබෙන ඉරණම ගැන බලන්න. ළමයින්ගේ මුවෙන් ඔවුන්ගේ සතුට, සිනහව දුරස් වෙලා තිබෙන යුගයක ලෝක ළමා දිනය සමරපු පුද්ගලයෝ අපි. ඇත්තටම අපට ලෝක ළමා දිනය සමරන්න පුළුවන්ද කියන ගැටලුව තිබෙනවා. අපි හැමෝගෙම වගකීමක් තමයි දරුවන්ගේ අනාගතය සකස් කරන්නට දරුවන්ට හොඳ දේවල් ලබා දීම. ඒ වාගේම අපි දරුවන්ට ළමා කාලය, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ විනෝදයත් ලබා දෙන්න ඕනෑ. එහෙම ලබා දෙන්න නම් අපේ ආර්ථිකය ශක්තිමත් වෙන්නට ඕනෑ. ආර්ථිකය කඩා වැටුණු තැනකදී අපට ඒවා ලබා දෙන්න පුළුවන්ද කියන ගැටලුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මත්ද්‍රව්‍යවලින් මේ රට වෙළිලා තිබෙනවා. දරුවාගේ අම්මා මත්ද්‍රව්‍ය බොනවා නම්, දරුවාගේ තාත්තා මත්ද්‍රව්‍ය බොනවා නම් ඒ දරුවාගේ අනාගතය ගැන අපට කථා කරන්න දෙයක් නැහැ. ඒ නිසා මේ සමාජය තුළ පරිවර්තනයක් කරන්න ඕනෑ. අද තරුණ තරුණියන් අතර විවාහ සිදුවෙනවා. නමුත් ඔවුන්ට විවාහ ජීවිතය හරියට ගත කර ගන්න බැරිවෙලා තිබෙනවා. කෙටි කාලයක් තුළ ඔවුන්ගේ විවාහය විනාශවෙලා යනකොට මේ සමාජය තුළ ඔවුන්ගේ දරුවා අතරමං වෙනවා. එතකොට ඒ දරුවාට අම්මා කෙනෙකුත් නැහැ, තාත්තා කෙනෙකුත් නැහැ. ඒ දරුවන් සමාජයේ අතරමං වුණු දරුවෝ බවට පත් වෙනවා. ඔවුන්ට අනාථ නිවාසවල ජීවත්වෙන්න සිදු වෙනවා. මේ ලෝකයේ දරුවන්ට වන අසාධාරණය ගැන අපි කොච්චර කථා කළත් වැඩක් නැහැ. දරුවන්ට මේ ලෝකයෙන් අහිමිවෙලා යන සෙනෙහස, ආදරය, දයාව, කරුණාව යන ඒ සියල්ලම නීති සම්පාදනය කරලා හරි ලබා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් අපේ මේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරලා ගුණගරුකභාවයෙන් යුතු අධ්‍යාපන ක්‍රමයක් මේ රට තුළ ස්ථාපිත කරන්න ඕනෑ. ඒ වාගේම මව්පිය සබඳතා ගොඩනඟන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන් වෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)
මේ ලෝකය තුළ දරුවන්ට ලැබෙන්න තිබෙන ඔවුන්ගේ අයිතිය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනාම දේශපාලන මත භේදයකින් තොරව එකට එකතුවෙලා වැඩ කරන්න ඕනෑ. එහෙම කළොත් විතරයි අනාගතයේ දී අපට හොඳ දරුවෙක් නිර්මාණය කර ගන්න අවස්ථාවක් ලැබෙන්නේ. ඒ නිසා මේ යෝජනාව ගැන අපි දවසක් වෙන් කරලා හරි කථා කරන්න ඕනෑ. ඒක අපේ වගකීමක් වාගේම යුතුකමක්.

මේ වැදගත් යෝජනාව අද දවසේ පාර්ලිමේන්තුවට යොමු කළ මංජුලා දිසානායක මන්ත්‍රීතුමියට මගේ ගෞරවය පුද කරනවා. දරුවන්ගේ අනාගතය වෙනුවෙන් අපි හැමෝම එකට එකතුවෙලා වැඩ කරමු කියලා මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අද දින කාලෝචිත මාතෘකාවක් ගෙන ඒම පිළිබඳව ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා. සියල්ලටම වඩා දරුවන් වටිනවා කියලා අපි අවුරුද්දකට එක සැරයක් මතක් කර ගන්නවා. හැබැයි, දරුවන්ට සියලු ආකාරයේ හිංසනවලින්, ප්‍රචණ්ඩත්වයෙන්, අපචාරවලින් තොරව ළමා කාලය ගත කරන්න අවස්ථාව උදාකර දීම වැඩිහිටියන්ගේ යුතුකමක් සහ වගකීමක් බව අපි කියන්න ඕනෑ.

නමුත්, දරුවන්ට මුහුණ දෙන්න සිද්ධ වෙන ප්‍රචණ්ඩ ක්‍රියා ගැන අපි දන්නවා. මම මේ වෙලාවේ ප්‍රචණ්ඩත්වය කියන මාතෘකාව යටතේ මානසික ප්‍රචණ්ඩත්වය, මානසික හිංසනය ගැන කථා කරන්න කැමැතියි. මානසික හිංසනයට ලක් වන අයට ඒ තත්ත්වය සමනය කර දෙන්න අපේ රට තුළ තිබෙන ඉඩකඩ ඉතාම අඩුයි කියන එක මම මේ වෙලාවේ බොහොම කනගාටුවෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. උදාහරණයක් ගත්තොත්, මාධ්‍ය තුළ වුණත් දරුවන් දැඩි ලෙස හිංසනයට ලක් වෙන තැන් අපි දැක තිබෙනවා. මම ඒ websites ගැන කියන්න යන්නේ නැහැ. නමුත් සයිබර් අවකාශයේත්, ජනමාධ්‍ය තුළත් දරුවන් පාවිච්චි කිරීම නිසා ඒ දරුවන්ට ඇති වන පීඩන ගැන අද ගණනය කිරීමක් සිද්ධ වෙනවාද කියන එක පිළිබඳව ගැටලුවක් තිබෙනවා. වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අධ්‍යාපනය තුළ දරුවන්ට සිද්ධ වෙන මානසික හිංසනය ගැනත් බලන්න ඕනෑ.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, මම මේ කාරණය පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කරවනවා. ඔබතුමියලා අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක එකතු වෙලා ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. මොකද, මේ බර දරුවන්ට ඔරොත්තු දෙන්නේ නැහැ. මේක මහ බරක්. අවුරුදු 13ක් ඉගෙන ගෙන ඒ දරුවෝ සමාජයට එනකොට, ඒ දරුවන්ට මානසික සතුටක් තිබෙනවාද? මම මේ ඉගෙන ගත් දෙයින් මගේ ජීවිතය ඉදිරියට ගෙනයන්න පුළුවන් කියලා ඒ ළමයාට බයක්-සැකක් නැතුව සමාජයට එන්න පුළුවන්කමක් තිබෙනවාද කියන කාරණා නිවැරදිව සකස් වෙන්න ඕනෑය කියා මම මේ වෙලාවේ යෝජනා කරනවා. ඊයේ පෙරේදා සිදු වුණු කථා ගැන බලන්න. මෙවර උසස් පෙළ විභාගය පවත්වන්නේ කවදාද කියලා දරුවන්ට තවම දැන ගන්න විධියක් නැහැ. ඒ නිසා අද වනවිට දරුවෝ කොච්චර මානසික පීඩාවක ඉන්නවාද කියලා ඒ වගකිව යුත්තන්ට නොතේරෙන්නේ ඇයි කියන එක පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, විශේෂයෙන්ම මම කලින් කිව්වා වාගේ මාධ්‍ය තුළින් ළමයින්ට සිදු වෙන හිංසනය පිළිබඳවත්, ලිංගික අපචාර පිළිබඳවත්, සයිබර් අවකාශය තුළින් ළමයින්ට සිදු වෙන හිංසනය පිළිබඳවත් අපි මේ වෙනකොට ළමයින් උදෙසා වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදය තුළින් ක්‍රියාමාර්ග රාශියක් අරගෙන තිබෙන බව ඔබතුමිය දන්නවා. ඔබතුමියගේ අමාත්‍යාංශයත් එකතු කරගෙන, විශේෂයෙන්ම ලිංගික අධ්‍යාපනය පිළිබඳව දැනුම ලබා දීලා දරුවන් ලිංගික අපචාරවලින්, අපයෝජනවලින් බේරා ගන්න, ඒ සම්බන්ධයෙන් ඒ අය දැනුවත් කරන්න අපි වැඩ පිළිවෙළක් සකස් කර ගෙන යනවා. ඒ වාගේම සයිබර් අවකාශය තුළ සයිබර් අපරාධවලට ලක් වෙන දරුවන් සහ දරුවන් නොදැනුවත්ව ඒ අපරාධවලට සහාය දැක්වීම කියන මේ සියලු දේවල් පිළිබඳව දරුවන් දැනුවත් කරන්නට අපි මේ වෙනකොට අපේ සංසදය තුළින් කටයුතු කරනවා. ඒ සඳහා වැඩ පිළිවෙළ සකස් කරනවා. ඒ බවත් මතක් කරමින්, අවසාන වශයෙන් මේ රටේ දරුවන් සම්බන්ධයෙන් වන උපදේශනය පාසල් පද්ධතිය තුළ මීට වඩා ක්‍රමවත්ව ස්ථාපිත විය යුතුයි කියන කාරණයත් අවධාරණය කරනවා.

ඒ වාගේම මා කියන්න කැමැතියි, ජනාධිපතිවරයා යටතට ළමා ආරක්ෂණය කියන විෂය ව්‍යවස්ථාවෙන්ම එකතු වෙනවා නම් ජාත්‍යන්තර වශයෙන් පවා අපට ලොකු අවස්ථාවක් ලබා ගන්න පුළුවන් තත්ත්වයක් තිබෙන බව. ඒ නිසා ළමා ආරක්ෂණය කියන විෂය ජනාධිපතිවරයා යටතේ තිබිය යුතුයි කියන එක ව්‍යවස්ථාවට එකතු කළ යුතුයි කියා මම යෝජනා කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මැතිතුමා. ඔබතුමාට මිනිත්තු තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.28]

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙනා යෝජනාවට අදාළ මේ මාතෘකාව ඉතා සංවේදී එකක් බව. එය දිගින් දිගටම සමාජයේ අවධානය ලක් විය යුතු මාතෘකාවක්.

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවක සභාපතිවරයකු වන මම, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කර සිටින ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් එක්ක සාකච්ඡාවක් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව එම ප්‍රදේශ තුළ සිටින පාසල් නොයන දරුවන් 12 දෙනෙකු පිළිබඳ තොරතුරු සොයා ගන්න අපට හැකි වුණා. නමුත් අද වෙනකොට රත්මලාන, දෙහිවල ප්‍රදේශවල පාසල් නොයන දරුවෝ නැහැ. නිසි වයස තුළ ඒ දරුවන් පාසල් යනවා. මම හිතන විධියට අපේ කලාප තුළ සිටින ඒ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් සියලුදෙනාම දේශපාලනඥයන් වන අප සමඟ එකතු වෙලා යම් ආකාරයේ ක්‍රමවත් වැඩ පිළිවෙළක් තුළ වැඩ කරනවා නම්, විශේෂයෙන්ම දරුවන්ට අවශ්‍ය අධ්‍යාපනය නිවැරදිව ලබා දෙන්න අපට පුළුවන්. අපි දන්නවා, ග්‍රාම නිලධාරි කොට්ඨාසයක වුණත් රාජ්‍ය නිලධාරින් අටදෙනෙකු විතර ඒ කොට්ඨාසයට අදාළව සේවය සපයන බව. ඒ අය නිවැරදිව වැඩ කටයුතු කරනවා නම්, ඒ අය ගෙයක්-ගෙයක් පාසා ගිහිල්ලා ඒ ගම්වල සිටින අයට තිබෙන ප්‍රශ්න ගැන හොයනවා නම්, ඒ සඳහා නායකත්වය ලබා දීලා කටයුතු කරනවා නම්, දරුවන්ගේ අනාගතය ගැන, දරුවන්ගේ සුබසිද්ධිය සම්බන්ධයෙන් අපට හොයා බලන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද කියලා ළමා හිමිකම් නිලධාරියෙක් සේවය නිමවීමෙන් පස්සේ බයිසිකලයක පිටුපස පෙට්ටියක් බැඳගෙන කථා පොත් ටිකක් දමාගෙන, පොඩි පුස්තකාලයක් හදාගෙන ගමින් ගමට ගිහිල්ලා දරුවන් වෙනුවෙන් සේවය කළා. එක රාජ්‍ය නිලධාරියෙකුට එහෙම වැඩ කරන්න පුළුවන් නම්, ඇයි අනෙකුත් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්ට එහෙම වැඩ කරන්න බැරි කියන එකයි මම අහන්නේ. මෙවැනි නිලධාරින් සියලු දෙනා අත්වැල් බැඳගන්න ඕනෑ. මොකද, මෙවැනි නිලධාරින් තමයි ඒ ඒ ප්‍රදේශවල දරුවන් වෙනුවෙන් පෙනී ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද කියන ඒ තරුණයා ගැන ජපානයේ පෙළ පොත්වල පවා සඳහන් වෙලා තිබෙනවා. ඔහු අපේ රටේ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරියෙක්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රාජ්‍ය සේවකයෙක්. ඔහු කළේ මොකක්ද? බයිසිකලයේ පිටුපස පොඩි පෙට්ටියක් බැඳගෙන පොත් දමාගෙන ගිහිල්ලා දරුවන්ට හවස් වරුවේ පොත් කියවන්න පුස්තකාලයක් සකස් කර දීමයි කළේ. ඒක තමයි, අපේ රටේ රාජ්‍ය සේවකයෙක් පෙන්වූ ආදර්ශය. ඒ ආදර්ශය ලෝකයට ගිහිල්ලා ජපානයේ ඉගෙන ගන්නා දරුවන්ගේ පාසල් පෙළ පොතකත් සඳහන් වෙලා තිබෙනවා, අපේ රටේ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරියෙකු වූ මහින්ද ගැන.

මම කියන්නේ, අපි ඔක්කෝම එකතු වෙමු කියන එකයි. අපට මේ ගැන බලන්න වෙන්නේ සුළු වෙලාවක් විතරයි. මම ව්‍යවස්ථාදායකයේ -නීති හදන තැන- මන්ත්‍රීවරයෙකු වුණාට මට විධායකයේ කොටස ලැබෙන්නේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට. එතකොට මම ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක හරහා ඒ ගැන හොයා බලනවා. ගමේ ඉන්න රාජ්‍ය නිලධාරියාට එක ග්‍රාම නිලධාරි කොට්ඨාසයක විතරයි වැඩ කරන්න තිබෙන්නේ. ඉතින් එහෙම නම් මම ඉල්ලන්නේ මේ වෙලාවේ අපි නිවැරැදිව වැඩ කළොත්, අපි ඉන්න තැනින් වෙනස් වුණොත්, අපි හිතන පතන විධිය වෙනස් වුණොත්, ජපානයේ පෙළ පොතක සඳහන් වෙච්ච මහින්දලා 14,000ක් බිහි වුණොත් දෙවියන්ගේ පිහිටෙන් අපේ දරුවන්ගේ නැණස පාදාගෙන, අනාගත ශුභසිද්ධිය ඇති කරගන්න පුළුවන් බවයි. ඒ කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු සුමිත් උඩුකුඹුර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.31]

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ සහෝදර මන්ත්‍රීතුමියක් වන ගරු මංජුල දිසානායක මහත්මියට ස්තුතිවන්ත වෙනවා, අපේ රටට ඉතා වැදගත් වන "සියල්ලන්ටම වඩා දරුවන් වටී" කියන තේමාව යටතේ අද සභාව කල්තැබීමේ යෝජනාව ගෙන ඒම පිළිබඳව. අපේ දරුවෝ තමයි අපේ රටේ අනාගතය භාර ගන්න ඉන්නේ. පසුගිය කාලයේ ලංකාවේ සෑම ප්‍රදේශයකින්ම වාගේ ළමා හිංසන, ළමා අපචාර වැනි දරුවන්ට සිදු වූ නොයෙක් අසාධාරණකම් අපි දැක්කා. අපි බලාපොරොත්තු වෙන්නේ මෙවැනි සමාජයක් නොවෙයි. යහපත් සමාජයක් ඇති කර ගන්න නම් අපි මීට වඩා වෙනස්ව හිතලා වගකිව යුතු ආණ්ඩුවක් හැටියට, වගකිව යුතු රජයක් හැටියට මේ සෑම ක්ෂේත්‍රයක් ගැනම හිතලා වැඩ කටයුතු කළ යුතුයි කියන යෝජනාව මම මේ අවස්ථාවේ කරන්න කැමැතියි.

විශේෂයෙන්ම හොඳ, යහපත් දරුවෙකු හැටියට සමාජයට එකතු වෙන්න පුළුවන් විධියට දරුවන්ගේ ආකල්ප දියුණු වෙන විධියට පුංචි කාලයේ ඉඳන් දරුවා හැඩ ගස්වන්න අවශ්‍යයි. ඒකට විශාල පිටුවහලක් ලැබෙන්නේ පෙර පාසල් අධ්‍යාපනය තුළින්. රජයේ පාසලකට යන්න කලින් පෙර පාසල් ගුරුතුමිය තමයි දරුවාගේ මූලික අධ්‍යාපන අඩිතාලම දමන්නේ. මම විශ්වාස කරනවා, රජයක් හැටියට අපි පෙර පාසල් අධ්‍යාපනය කෙරෙහි මීට වඩා විශේෂ අවධානයක් යොමු කරලා, පෙර පාසල් පද්ධතිය ශක්තිමත් කරන්න ඕනෑ කියලා. ලෝකයට එන්න හදන දරුවා පෙර පාසල තුළින්ම හොඳ, යහපත් ගුණගරුක සිරිත් විරිත්වලින් පිරුණු දරුවෙකු හැටියට සමාජයට යොමු කරන්න ලැබුණොත් අපේ සමාජය මීට වඩා හොඳ වෙනවා. හොඳ, යහපත් දරුවෙකු සමාජයට බිහි වුණොත් අපේ රටේ පසුගිය කාලයේ දකින්න සිදු වුණු අමිහිරි සිදුවීම් නැවත අපට දකින්න ලැබෙන එකක් නැහැ. එහෙම වුණොත් ගෙවල් ගිනි තියන, නීතිය අතට ගන්න, මිනිස්සු මහ පාරේ මරා දමන සමාජයක් නම් බිහි වෙන්නේ නැහැ. අලුත් විධියට හිතලා හොඳ යහපත් දරුවෙකු සමාජයට බිහි කරන්න අප හැමදෙනාම එකතු වෙලා කටයුතු කළොත් අපේ රටේ අනාගතය මීට වඩා ශක්තිමත් වෙයි.

අපේ දරුවෝ ක්‍රීඩාවෙන්, සංස්කෘතියෙන් ඉදිරියට ගෙන යනවා වාගේම, ආධ්‍යාත්මික සිතුවිලිවලින් වර්ධනය වෙච්ච හොඳ යහපත් දරුවෙකු සමාජයට බිහි කිරීමත් අද අත්‍යවශ්‍යයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රට වැටිලා තිබෙන තත්ත්වයෙන් ඉස්සරහට එන්න හැම තනතුරක් දරන නිලධාරියෙකුම මනුෂ්‍යත්වය පෙරදැරි කරගෙන ඒ තනතුරු හොබවන්න ඕනෑ. මනුෂ්‍යත්වය පෙරදැරි කරගෙන ඒ තනතුරු හොබවන්න පුළුවන් පුරවැසියෙකු මේ රටට බිහි කරන්න නම්, ඒ නිවැරදි දැනුම ලබා දීලා අපේ දරුවන් ශක්තිමත් දරුවන් බවට පත් කරමු කියා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පිළිතුරු කථාව, ගරු ගීතා කුමාරසිංහ මැතිනිය. ඔබතුමියට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.34]

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය (කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Geetha Samanmale Kumarasinghe - State Minister of Women and Child Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පළමුවෙන්ම මංජුලා දිසානායක මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා, ඉතා කාලෝචිත ප්‍රශ්නයක් කාලෝචිත විධියට ඉදිරිපත් කරමින් සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන.

මා පළමුවෙන්ම කියන්න කැමැතියි, මේ සියලුදෙනාගේම කථාවලට බොහොම වුවමනාවෙන් මා සවන් දීගෙන හිටපු බව. ශ්‍රී ලංකාවේ වෙසෙන අපට පමණක් නොවෙයි, ලෝකවාසී සියලුදෙනාටම වැඩියෙන්ම වටින්නේ තමන්ගේ දරුවා. තමන්ගේ වස්තුව තමන්ගේ දරුවා කියන සිතුවිල්ල දෙමව්පියන්ගෙන් බැහැර කරන්න කාටවත් බැහැ. අපි අපේ දරුවන්ට යහපත් පුරවැසියන් හැටියට ඉදිරියට යන්න අවශ්‍ය සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපන පහසුකම් සහ ආරක්ෂාව කියන මේ සියල්ල සපයමින් තමයි අවුරුදු 18ක් වන කල් රැක ගෙන ඉදිරියට යන්නේ. ශ්‍රී ලංකාවේ වෙසෙන සියලු දරුවන් ළදරු අවධිය, පෙර පාසල් අවධිය හා පාසල් අවධිය කියන අවධි පසු කරමින් තමයි අවුරුදු 18ක් වන කල් ඉදිරියට යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තිබෙන කාල වේලාව අනුව මම කථා කරන්න කැමැතියි, පෙර පාසල් අධ්‍යාපනය ගැන. පෙර පාසල් අධ්‍යාපනය මෙතෙක් තිබුණාට වැඩිය ඉතා විශාල වෙනස් කිරීම්වලට භාජන කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. එදා ඕනෑම කෙනෙකුට කැමැති විධියට පෙර පාසලක් ආරම්භ කිරීමේ හැකියාව තිබුණා. ඒ සඳහා කිසිදු අධ්‍යාපන සුදුසුකමක් අවශ්‍ය වුණේ නැහැ. පෙර පාසලක් ආරම්භ කළා; දරුවෝ ටිකක් ඇතුළත් කර ගත්තා; ඒක ඔහේ කරගෙන ගියා. නමුත්, ඉදිරි කාලයේදී එසේ කටයුතු කිරීමට බැහැ. පෙර පාසල් ගුරුවරියකටත් යම් අධ්‍යාපන මට්ටමක් තිබීම අවශ්‍යයි. O/L හා A/L කියන විභාග දෙක සමත් වීමෙන් පසු, ඊට අමතරව ඩිප්ලෝමාවක්, එහෙම නැත්නම් උපාධියක් දක්වා යෑමට පුළුවන් තත්ත්වයට ඔවුන් ගෙනෙන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය සියලු කටයුතු දැන් අපි සම්පාදනය කරගෙන යනවා. ඒ සඳහා මට ලබා දෙන විශාල සහයෝගයට ගරු අධ්‍යාපන ඇමතිතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා.

පෙර පාසල් යන සමහර දරුවන් මන්දපෝෂණයෙන් පෙළෙනවාය කියන එක ඇත්ත කථාවක්. ඒ පිළිබඳව අපි සොයා බැලුවා. එහිදී ප්‍රදේශ ගණනාවක මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් සිටින බව අපි සොයා ගත්තා. එවැනි දරුවන් 15,000ක් පමණ දැන් සොයා ගෙන තිබෙනවා. ඔවුන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් ඉදිරියේදී ලබා දීමට අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කරමින් පවතිනවා. ඒ වාගේම දරුවන් 169,000කට අපි උදෑසන ආහාර වේල ලබා දෙනවා. ඒ සඳහා විශේෂිත වූ මුදලක් වෙන් කරගෙන ඒ මුදලින් අපේ දරුවන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීමට කටයුතු කරගෙන යනවා. නමුත් මගේ සිතුවිල්ල, මගේ ප්‍රාර්ථනය, පෙර පාසල් දරුවන්ට පමණක් නොවෙයි, පාසල් අධ්‍යාපනය ලබන සියලු දරුවන්ට උදෑසන ආහාර වේල ලබා දීමට අවශ්‍ය කටයුතු අපි සම්පාදනය කළ යුතු බවයි. මොකද, ගෙදරින් බඩගින්නේ එන දරුවන්ට අධ්‍යාපන කටයුතු නිසි ලෙස කරගෙන යෑමේ හැකියාව නැති වෙනවා.

ඒ වාගේම දරුවන්ගේ ආරක්ෂාවත් ඉතා වැදගත් වෙනවා. අපි ගමින් ගමට ගිහින්, ඒ සෑම ගමකම කමිටු පිහිටුවා, දරුවන්ට දැනමුතුකම් දෙන්න, දෙමව්පියන් දැනුවත් කරන්න ඕනෑ. මොකද සමහර දෙමව්පියෝ දන්නේ නැහැ, දරුවන් බලාගන්න ඕනෑ කොහොමද කියලා. ඔවුන්ට දිය යුතු ආරක්ෂාව පිළිබඳව ඇත්තටම දෙමව්පියන්ට ලොකු වගකීමක් තිබෙනවා. අද ගුරුවරුන්ගෙන් කෙලෙසෙන දරුවෝ ඉන්නවා. රටේ තිබෙන පොදු වාහනයක යන දරුවන්ට ලිංගික අඩන්තේට්ටම් වෙනවා නම්, ඒ පිළිබඳ තිබෙන නීතිය අනුව ඉහළම දඬුවම් ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම දරුවන් යොදාගෙන සිඟමන් යැදීම සම්පූර්ණයෙන්ම නීති විරෝධී වැඩක්. බාල වයස්කාරයන් නිවෙස්වල හෝ කොහේ හෝ රැකියාවක යොදා ගැනීමත් සම්පූර්ණයෙන් නීති විරෝධීයි. දරුවන්ට කෙනහිලිකම් කිරීම, අපයෝජනය කිරීම මොන තරම් අසාධාරණ ක්‍රියාවක්දැයි ඔබ සියලුදෙනාට තේරුම් ගන්න පුළුවන්. එසේ නම් අපේ පරම යුතුකම, රජයේ පරම යුතුකම දරුවන්ට අවශ්‍ය ආරක්ෂාව සැපයීමයි. ඒක මුළු රටේම ජනතාව විසිනුත් පිළිගෙන දරුවන්ගේ ආරක්ෂාව සහතික කළ යුතුයි.

මෙතෙක් පැවැති රජයන් පෙර පාසල් දරුවන්ට හරියට සැලකුවේ නැහැ. දරුවන්ගේ අධ්‍යාපනය ගැන හරියට බැලුවේ නැහැ. අද තමයි ඒ සඳහා අපි රාමුවක් හදලා තිබෙන්නේ. මේ විධියට අධ්‍යාපනය ලබා දෙන්න ඕනෑය කියන රාමුවට දැන් අපි ඇවිල්ලා ඉන්නේ. අද අපට දිගින් දිගටම අහන්න ලැබෙනවා, දරුවන් මත් ද්‍රව්‍යවලට යොමු කර ගැනීම් පිළිබඳව. ටිකෙන් ටික, ටිකෙන් ටික මත් රකුසා දරුවන් බිලි ගන්නවා. තාත්තා කංසා බීලා, එහෙම නැත්නම් කසිප්පු බීලා එනවා. එතකොට ඒ පවුල් සංස්ථාව කඩා වැටෙනවා. පවුලේ සමගිය නැති වෙනවා. හොඳ දරු පරපුරක් බිහි කර ගන්න නම්, කාන්තාවගේ සෞඛ්‍ය සම්පන්න බවත් ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒ සඳහා ගර්භිණී මවට විශේෂ ආරක්ෂාවක්, සෞඛ්‍ය ආරක්ෂණ විධිවිධාන සහ පෝෂ්‍යදායී අහාර වේලක් ලබා දිය යුතුමයි. එම නිසා අපි අඩු ආදායම්ලාභී පවුල්වල සිටින ගර්භිණී කාන්තාවන්ට සහ කිරිදෙන මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබා දීමට අවශ්‍ය සියලු කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම කියනවා, "සියල්ලටම වඩා දරුවන් වටී", "Children Above All"

[ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය ]

කියලා. එය මගේ තේමාවක්. දරුවන් තමයි මේ ලෝකයේ වැඩිම වටිනාකමක් ඇති වස්තුව. සමහරුන්ට ලෝක ළමා දිනය කියන්නේ ඔක්තෝබර් පළමුවැනි දා විතරයි. මට නම් දින තුන්සියහැටපහම දරුවන්ගේ දින. මම දරුවන් වෙනුවෙන් කැප වෙනවා. දරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් ඇත්තටම ඔක්තෝබර් 01වැනි දා වාගේ එක දවසක් හරි තිබීම ගැන මම සතුටු වෙනවා. එදාට විතරයි මේ මාධ්‍යවලට ඇස් ඇරෙන්නේ. සමහරුන්ට එදාට විතරයි, දරුවන් ගැන කථා කරන්න ප්‍රශ්න මතු වෙන්නේ. අනෙක් කිසි දවසක දරුවන් ගැන වචනයක්වත් කථා නොකරන අය ඔක්තෝබර් 01වැනි දාට ලෝක ළමා දිනය ගැන කථා කරනවා. එක විධියකට බැලුවාම ඒකත් ලොකු දෙයක්. අනාගතයේදී ශ්‍රී ලංකාවේ සිටින සියලු දරුවන්ට ආරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරන්න වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.41ට, 2023 ඔක්තෝබර් 04වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.41க்கு, பாராளுமன்றம் 2023 ஒக்ரோபர் 04, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.41 p.m. until 9.30 a.m. on Wednesday, 04th October, 2023.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා කොළඹ 5 කිරුළපන මාවතේ**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත කළ හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை கொழும்பு 5, கிருலப்பனை மாவத்தையிலுள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
Kirulapone Avenue, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.